

සන්න සහිත

# කුදුසික

සන්න සහිත

# කුදුසික.

පූජ්‍යාචාය්‍ය්‍ය

දොඩන්දූව ශෛලබිම්බාරාම මහා විහාරාධිපති

සරස්වතී මණ්ඩප පිරිවෙන් හිමි

—— භදන්ත ——

## හරුමල්ගොඩ ශ්‍රී සුමංගල මහා ස්ථවිර

ස්වාමිපාදයන් වහන්සේ විසින්

සංශොධිතයි.

---

කළුවාමෝදර

ඩබ්ලිව්. මිලිස් ද සිල්වා විසින්

අලුත්ගම විද්‍යාවිලාස යන්ත්‍රාලයෙහි

මුද්‍රණයෙන්

ප්‍ර කා ශී කෘ ත යි.

2471.

# KUDUSIKA

WITH

Parapharase

---

Revised and Edited by

**Venerable**

## Harumalgoda Siri Sumangala Maha Thera

Principal Saraswatimandapa Oriental College

**and**

High Priest of Sailabimbarama Maha Vihara

**DODANDUWA.**

---

Printed and Published by

W. MEELIS De SILVA

AT

**The Vidyavilasa Press**

ALUTGAMA.

---

1928.

# PREFACE.

**Kudusika** was written about a thousand years ago by **Dharmasri Thero,** of Maha Vihara in **Anuradhapura.** All rules of conduct Codified in the Vinayapitaka as laid down by the Master for the guidance of his disciples are dealt with in this work in such a manner as to bring them within the easy comprehension of everyone. This book has therefore always been of invaluable aid to the newly ordained Bhikkhu.

The text consists of as many as 467 Pali stanzas and 52 Vakyas (prose lines)

Two Pali Tikas (Commentaries) and two paraphrases in Sinhalese have been written to this by commentators of old.

On the invitation of **Rev. Moragalle Gnanobhasa Tissa Thero** of Kalyanarama in Kaluwamodara the present Editor went through the two old paraphrases and selected the better of the two which he carefully revised, adding his own explanations where he found it necessary to do so and get it ready for publication.

That this revised edition of the Kudhusika May be an aid to the members of the Order in bearing the rules of discipline (Vinaya) and thereby conduce to the firm establishment of the religion of Tathagata, the Enlightened One is the earnest wish of the present Editor,

**H. Sri Sumangala.**

Sailabimbaramaya
Dodanduwa
25 th, June 1928.

## සංඥාපනය.

---

නමඃ ශ්‍රීඝනාය

---

## කුදුසික

ශ්‍රීඝන ශාසනගත කුලපුත්‍රයන් විසින් උපසපත් ලත් තැන් පටන් හික්මිය යුතුවූ අධිශීලාදි ත්‍රිවිධ ශික්ෂාවන් සංක්ෂෙපනයින් සංගෘහීතහෙයින් මීට කුදුසික හෙවත් ඛුද්දසික්ඛා යන නාමය ව්‍යවහෘතය. "ඛුද්ද (අප්පිකා) සික්ඛා-ඛුද්දසික්ඛා" යනු මෙහි නිර්වචනයි. විනය සූත්‍රාගත ශික්ෂාවන්ගේ අර්ථසාරය මාතෘකා සංඛ්‍යාත සමපණස් උද්දෙසපදයෙක්හි ඇතුළත් කොට මෙහි දක්වන ලදී. විනයපාලිඅර්ථකථාටීකාගත ක්‍රමයන්ට අනුව ඒ ඒ පදයන්ගේ නිර්දේශ සංඛ්‍යාත විස්තරය කිරීමෙන් ඉතා පැහැදිලි සුගමක්‍රමයකට මෙය ගළපා තිබේ. මේ සමපණස් උද්දෙස පද විස්තරයෙහි ශාසනිකා කුලපුත්‍රයන් විසින් ග්‍රහණ ධාරණ ප්‍රතිපත්ති විසින් නිරන්තර පරිහරණය කටයුතුවූ විනයශික්ෂාවන්ගේ අර්ථසාරය සාකල්‍යයෙන් ඇතුළත්ය. නිරන්තර ධාරණොපයොගී නොවූ ඇතැම් ශික්ෂාවන් විෂයෙහි ග්‍රන්ථලාඝවාපෙක්ෂා හෙතුවෙන් උපෙක්ෂිත බැව් ද පෙනේ.

### ග්‍රන්ථප්‍රමාණය.

මෙහි ප්‍රමාණය ගාථා 500 කි; හෙවත් බණවර දෙකකි. ඒ බැව් ග්‍රන්ථාවසානයෙහි:—

"පඤ්චමත්තෙහි ගාථානං සතෙහි පරිමාණතො"

'පරිමාණහෙයින් පන්සියයක් පමණ ගාථාවෙන්' යනුවෙන් ප්‍රකාශිතය. ගාථා හැර චීවරවිකප්පන- නිස්සයසමාදාන- වස්සූපගමන නිස්සජ්ජන-ආපත්තිදෙසනා- ඡන්දපාරිසුද්ධි පවාරණ දූතාරොචන- උපොසථ- පවාරණ යනාදි ප්‍රස්තාවයන්හි උපයොගීවූ වාක්‍ය බොහෝ ගණනක් ද මෙහි ඇතුළත් ව තිබේ.

අපේ මේ සංස්කරණයෙහි සොදනලද සංඛ්‍යාවශයෙන් ගාථා 467 කි, වාක්‍ය 52 කි. මෙහි ගාථාවෙන් ඉතා වැඩිගණනක් අෂ්ටාක්ෂරයෙන් යුත් සතරපදයෙන් ද, 5 ක් ෂට්පදයෙන් ද, 8 ක් පද යුග්මයෙන් ද උපලක්ෂිතය. 23-37-62-132 යන සාංඛ්‍යා දරන ගාථාසතර වංශස්ථාදිවිශෙෂ වෘත්තයෙන් ඝටිතය. මේ සියල්ල දෙසිස්කුරුගත්විසින් ප්‍රමාණ කොට සැලකීමෙන් ග්‍රන්ථකර්තෘන්

විසින් පඤ්චසතපරිමාණගාථාසංඛ්‍යාව සඳහන් කරනලදැයි හඟිමු.

මෙහි වාක්‍යයන් පිළිබඳ දෙපණස් සංඛ්‍යාව නියමගණනක් නො වේ. එම් සංඛ්‍යා ඒ ඒ තැන සන්නකොටස් වෙන් කොට දැක්වීම ප්‍රයොජන කොට යොදනලදී. එහෙයින් මෙහි නොගැණුණු වාක්‍ය ද එක එක සංඛ්‍යාවෙහි ගැණුණු බොහෝ වාක්‍ය ද සංක්ෂෙපනයින් දක්වනලද වාක්‍ය ද වෙති. මේ සියල්ල වෙන් කොට ද ගිණුම වාක්‍යසංඛ්‍යාව මීට වඩා අතිශයින් අධික වේ.

## පුරාතනයන්ගේ සම්භාවනය.

මේ උතුම් විනය ග්‍රන්ථය පුරාතන පටන් ශාසනික කුලපුත්‍රයන් විසින් ගන්ධසාර වස්තුවක් සේ සලකණු ලැබේ. ලංකාවේ ද සියම් බුරුමාදි සම්බුද්ධධර්මය නිර්මල ව පවත්නා දෙශාන්තරයෙහි ද අත්‍යන්ත සම්භාවිත ය.

ලක්දිව වළගම්අබා රජදවස පටන් හවුරුදු දහසකට වැඩි කාලයක් භින්නව පැවති සංඝයා සමගියෙහි පිහිටුවීමෙන් නිකායත්‍රය එක්නිකායක් කරවා මහත් ශාසන සංග්‍රහයක් සිදුකළාවූ මහාපරාක්‍රමබාහු මහානරෙන්ද්‍රයන්ගේ ආරාධනාවෙන් තත්කාල ශාසනානුශාසක දිඹුලාගල කාශ්‍යපසංඝරාජ මහාසවාමිපාදයන් වහන්සේ ප්‍රධාන කාරක මහා සංඝ සභාව මගින් සම්පාදිතවූ පොළොන්නරු කතිකාවත නමින් ප්‍රසිද්ධ පුරාතන කතිකාවතෙහි ද, කලිකාලසාහිත්‍ය සර්වඥ පණ්ඩිත පරාක්‍රමබාහු මහරජාණන්ගේ ආරාධනාවෙන් තත්කාල ශාසන ශ්‍රී භාරධාරී ආරණ්‍යක මෙධංකරසංඝරාජ මහා සවාමිපාදයන් වහන්සේ ප්‍රධාන කාරක මහා සංඝයා වහන්සේ විසින් සම්පාදිතවූ දඹදෙණි කතිකාවත නම් ලත් මහාභිවූ කතිකාවතෙහි ද උපසම්පන් ලත් භික්ෂූන් විසින් වනපොත් කොට දැරිය යුතු ග්‍රන්ථ සංඛ්‍යාවෙහි ලා මේ බුද්ධසික්ඛා ග්‍රන්ථය ඇතුළත් කොට තිබේ. මහාපරාක්‍රමබාහු මහානරාධිපයන්ගේ නිකාය සාමග්‍රී සංවිධානයෙන් සවෙනි වර්ෂයෙහි බුරුම දෙශයෙන් ලක්දිව් පැමිණ පැවිදි උපසපන් ලැබ ධර්මවිනය ආදිය ඉගෙන සියරට බලා ගමන්ගත් ඡපට මහතෙරුන් සමග ලක්දිවින් පිටත් ව ගිය ව්‍යක්තතර ස්ථවිරවරයන් පස්නම අතුරෙන් ව්‍යක්තතමවූ රාහුල නම් මහ තෙරුන් විසින් මලේ අධීවීපයෙහි මහානරෙශ්වරයන්ට ටීකාව සහිත මේ බුද්ධසික්ඛා ග්‍රන්ථය ඉගැන්වීමෙන් සම්පූර්ණ විනය පාලියෙහි අර්ථාවබොධය ඇතිකළ බැව් කල්‍යාණීශිලාලිපියෙන් පෙනේ. මේ ආදි චිරන්තන ප්‍රවෘත්තීන්ගෙන් මේ බුද්ධසික්ඛාග්‍රන්ථය පිළිබඳ ව පුරාතන ශාසන සංරක්ෂක උතුමන්ගේ සම්භාවනය පැහැදිලි ය.

## කර්තෘ.

මේ ග්‍රන්ථයෙහි කර්තෘ වරයා වනාහි ධර්මශ්‍රී නම් මහාස්ථවිරොත්තමයකු බැව් මෙහි නිගමන ගාථාහි සඳහන් වේ. මේ මහාසවාමිපාදයාණන් ලොකයෙහි ව්‍යාප්තකීර්තිශ්‍රීන් විරාජමානවූ

මහා ප්‍රාඥයකු බැව් ද එහිම ප්‍රකාශිතය. නිකායසංග්‍රහයෙහි අර්ථකථාචාර්‍ය්‍ය බුද්ධඝොෂ මහාස්වාමීපාදයාණන් පටන් ධර්මවිනයානුගත මහාර්හ ධර්මප්‍රබන්ධයන් නිර්මාණයකළාවූ ආචාර්‍ය්‍ය උතුමන්ගේ නාම සඤ්ඥිතයෙහි ධර්මශ්‍රී නාමයෙන් සඳහන්වූයේ මේ බුද්ධසික්ඛා ග්‍රන්ථකර්තෘ උත්තමයා බැව් පිළිගත යුතු ව පෙනේ. මේ ආදි කරුණු හා බුද්ධසික්ඛා ග්‍රන්ථයාගේ මාහැඟිවූ අර්ථසාර සුකොමල පදවින්‍යාසාදි රචනාවිලාසයත් සැලකීමෙන් ධර්මශ්‍රී මහාස්ථවිර පාදයාණන් අනුරාධපුර මහාවිහාරාන්වයාගත මහාස්ථවිර රත්න මාලායෙහි අමූල්‍ය මහාරත්නශ්‍රීන් විරාජමානවූ මහොත්තමයකු බැව් පැහැදිලි වේ ම ය.

## කාලනිර්ණය.

මේ ග්‍රන්ථ රත්නය පිළිබඳ රචනාකාලය හෝ ධර්මශ්‍රී මහාස්වාමිපාදයාණන්ස්වීය ජීවනශ්‍රයෙන් මහාවිහාරාන්වය සශ්‍රීක කොට වැඩූළ කාලය හෝ නිශ්චය වශයෙන් සැලකීමට ඉවහල්වූ පුරාතන ලිපි ආදියක් නොදක්නා ලැබේ. එහෙත් යට දැක්වූ ග්‍රන්ථාන්තරාගත කරුණු හා මෙහි පරිවාරග්‍රන්ථයන්ගේ තත්ත්වයත් සලකා බැලීමේදී බුද්ධඝොෂමාහිමියාණන් ගේ අර්ථකථා නිර්මාණ කාලයට සමීපකාලයෙක්හි ධර්මශ්‍රී මහාස්වාමිපාදයාණන් විසින් මේ ග්‍රන්ථ නිර්මාණයෙන් ශ්‍රීසත්පර්‍ය්‍යාප්තිශාසනය ශොභා සහිත කළ බැව් හැඟියයි.

## පරිවාරග්‍රන්ථ.

මේ බුද්ධසික්ඛා ග්‍රන්ථයට පරිවාර වශයෙන් ටීකා දෙකක් හා සිංහලාර්ථව්‍යාඛ්‍යාන දෙකක් ද පුරාතනයන් විසින් කලින් කල විරචිත ය. මින් ප්‍රධානතරවූ ටීකාග්‍රන්ථයාගේ සම්පූර්ණතත්ත්වයක් ප්‍රකට කිරීමෙහි අපොහොසත් වෙමු. විනීය ටීකාග්‍රන්ථය වනාහි ජම්බුද්‍රොණිපුර නිර්මාණය කරවා එහි රජ සිරි පැමිණි වන්හිමි විජයබාහු මහරජාණන් සමයෙහි ලංකා ශාසන ශ්‍රී භාරධාරණයෙහි නියුක්තවූ සංඝරක්ෂිත සංඝරාජ මහාස්ථවිරපාදයන් වහන්සේ විසින් රචනාකරනලදි. ප්‍රත්නතරටීකාවෙන් බුද්ධසික්ඛා ග්‍රන්ථයාගේ අර්ථාවබොධය සාකල්‍යයෙන් සිදුනොකළහැකි බැවින් ප්‍රාඥවූ සුමංගලාභිධානස්ථවිරොත්තමයාගේ ආරාධනාවෙන් මේ ටීකාව කරනලද බැව් එහි ආරම්භයෙහි සඳහන් ව තිබේ. සුමඞ්ගලප්පසාදනී නම්වූ මේ ටීකාග්‍රන්ථය ගාලූපුර ජයවර්ධනාරාමාධිවාසී ගෞරවාර්හ සුමනජොති නායක මහාස්ථවිරපාදයාණන්ගේ සංශොධනයෙන් බුද්ධ වර්ෂ 2441 දී ප්‍රසිද්ධියට පමුණුවන ලදි. මෙහි සිංහලව්‍යාඛ්‍යානවයෙන් චිරත්නතර ව්‍යාඛ්‍යානය අපගේ දර්ශන

යට විෂය නොවී ය. එහෙත් විනය ව්‍යාඛ්‍යානයෙහි බොහෝ තැන්හි ඒ ව්‍යාඛ්‍යාවෙහි පාඨයන් නිදර්ශනය කොට තිබීමෙන් තරමක් දුර එහි තත්ත්වය සලකා ගත හැකි වේ. භාෂාවිලාසාදිය අනුව සැලකීමේදී මීට හවුරුදු දහසකට අධික පුරාතන කාල යෙක්හි එහි නිර්මාණය වූ බැව් සැලකිය හැකි ය.

## මෙම විනය ව්‍යාඛ්‍යානය.

කාලාතික්‍රමණයෙන් භාෂාව්‍යවහාරයාගේ දුර්බෝධත්වයට පැමිණීම නිසා හෝ උචිතප්‍රමාණ විස්තර ඇතුළත් නොවී තිබීම නිසා හෝ බුද්ධසික්ඛා ග්‍රන්ථයාගේ අර්ථාවබෝධයට ප්‍රත්නතර ව්‍යාඛ්‍යානය ප්‍රමාණ නොවීම හේතු කොට මේ විනය ව්‍යාඛ්‍යාන නිර්මාණය උචිතතා වූ බැව් සිතිය හැකි වේ. මේ ව්‍යාඛ්‍යානය බුද්ධ සික්ඛාග්‍රන්ථයාගේ සම්පූර්ණ අර්ථාවබෝධයට ඉවහල්වන පරිදි සම්පාදිත ව තිබීම ඉතා ප්‍රයෝජන සහිත ය. මෙහි ගාථාවන්ට සිංහල භාෂාවෙන් පදාර්ථ දක්වමින් විස්තර උචිතස්ථානයන්හි නොයෙක් පෙළ අටුවා ටීකා ප්‍රකරණ පාඨාදිය නිදර්ශන කෙරෙමින් අර්ථය පැහැදිලි කොට තිබේ. මෙහි නිදර්ශිත පාඨාදිය දක්වීමේදී නම් සඳහන්වූ ග්‍රන්ථයන්ගෙන් සමහරක් නම්: විනයපාළිය-විනය අටුවාව- විනයටීකාව- විනයවිනිශ්චය- නිස්සන්දේහ නම් විනය විනිශ්චය සන්නය- විනය සන්නය- කංඛාවිතරණී ගැටපදය- සංයුත්ටීකාව- විසුද්ධිමාර්ගය- විනය අටුවා සන්නය- මෙහි (කුදු සිකෙහි)පුරාතනසන්නය යනාදිය යි. මෙයිනුත් බොහෝ කොට නිදසුන් ගෙන තිබෙන්නේ විනයඅටුවාව විනයසන්නය හා මෙහි පුරාතනසන්නයෙනුත් ය. ඇතැම් තැන ග්‍රන්ථනාමය සඳහන් නොවූ නිදර්ශනපාඨයෝ ද වෙති. මේ ආදිකාරුණු අනුව සලකා බැලීමේදී මේ ව්‍යාඛ්‍යානය සම්පාදනය කළ කර්තෘ වරයා ධර්මවිනයෙහි හා නානා භාෂා ශාස්ත්‍රාදියෙහි ප්‍රවීණතර බුද්ධිමත් උත්තම යකු බැව් පෙනී යයි.

එහෙත් මේ ග්‍රන්ථයාගේද නිර්මාතෘ නිර්මාණ කාලයන්ගේ නිර්ණයට ප්‍රමාණවත්වූ චරිත්‍රලිපි ආදියක් දක්නට නොලදිමු. ඇතැම් පුරාතන ග්‍රන්ථකාරක උතුමන් විසින් ස්වකීය නාමය හා ග්‍රන්ථනිර්මාණකාලාදිය සවිස්තර ව ස්වකීය ග්‍රන්ථයන්හි සටහන් කර තැබීම සාර්ථකවශයෙන් නොසලකන ලද්දක් මෙන් ගැගේ. එහෙයින් පුරාතන බොහෝ සම්භාවනීය ග්‍රන්ථයන්ගේ කර්තෘ කාල නිර්මාණාදිය දක්වාලීම දුෂ්කර බවට පැමිණ තිබේ. මේ ව්‍යාඛ්‍යා නය සම්බන්ධයෙන් ද එම දුෂ්කරතාවය යෙදී තිබේ. මෙහි කර්තෘ උතුමා දිඹුලාගල ආරණ්‍යක මේධංකර මහාස්වාමි පාදයෝ යයි

ඇතැම් අය සලකත්. වන්හිමි විජයබාහු මහරජාණන් සමයෙහි සංඝරක්ඛිත සංඝරාජ මාහිමියාණන්ට සමකාලිකව ආරණ්‍යාවාස යෙහි සංඝයාවහන්සේට ප්‍රධාන ව මෙකී මාහිමියාණෝ ශාසන භාරොවහනය කළෝය. විජයබාහු වන්හිමියාණන්ගෙන් පසු රජසිරි පැමිණියාවූ එම නරශ්‍රෙෂ්ඨයන්ගේ අතිජාත පුත්‍රවූ කලි කාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත පරාක්‍රමබාහු මහාරාජයා විසින් විරචිතවූ නිස්සන්දෙහ නම් ලත් වනවිනිස සන්නයෙන් ගන්නා ලද නිදර්ශන පාඨයෝ මේ ඛුද්දසික්ඛා ව්‍යාඛ්‍යානයෙහි පෙනෙති. මෙය යට කී මෙධංකර මාහිමියාණන්ගේ කෘතියක් නම් මෙකී නිස්සන්දෙහයෙහි නිදර්ශනයන් ඇතුළත්වීම සිදුවිය හැකිද? යනු විමසිය යුත්තකි.

## සංශොධනය හා මුද්‍රණය.

මේ ඛුද්දසික්ඛා ග්‍රන්ථය හා යට දැක්වූ එහි විතීය ව්‍යාඛ්‍යානයත් බේරුවල සුමෙධංකර ස්ථවිරපාදයන්ගේ සංශොධනයෙන් යුක්ත ව මීට තෙතිස් වර්ෂයකින් පූර්වයෙහි මුද්‍රණයෙන් ප්‍රසිද්ධියට පමුණුවන ලද්දේ ය. ඉන් විනය පරිසීලනයෙහි නියුක්තවූවන්ට මහත් ප්‍රයොජන ලැබුණු බැව් නිසැක ය.

ඛුද්දසික්ඛා හා එහි මේ සිංහල පදාර්ථ ව්‍යාඛ්‍යානයත් දැනට දුර්ලභ ව පවත්නා හෙයින් ඒ විශෙෂ සංශොධනයෙන් හා සංස්කරණයෙන් යුක්ත කොට ප්‍රසිද්ධියට පැමිණවීම කාලානුරූපවූ ශාසන සංග්‍රහයක් බැව් සැලකූ අපගේ ධර්මාන්තෙවාසිවරයෙක් වූ කලුවාමෝදර කල්‍යාණාරාමාධිවාසී මොරගල්ලේ ඤාණොභාසතිස්ස ස්ථවිරයන් විසින් මේ ග්‍රන්ථය පිළිබඳ සංශොධන සංස්කරණාදිය සඳහා අපවෙත ආරාධනා කර සිටින ලද්දේය. එම ආරාධනය පිළිගත් අපවිසින් පැරණි ලියාපු පිටපත් කීපයකට හා විනය පෙළ අටුවා ටීකා ප්‍රකරණාදියට ද බුරුමරට මුද්‍රිත ඛුද්දසික්ඛා ග්‍රන්ථයට ද සම කොට බැලීමෙන් මේ ඛුද්දසික්ඛා ග්‍රන්ථයෙහි හා සන්නයෙහි ද පාඨශොධනය යථාශක්තීන් සම්පූර්ණ කොට සන්නයෙහි නිදර්ශනවශයෙන් ඒ ඒ තැන දක්වන ලද පාලිගාථා පාඨාදියට පදාර්ථ ව්‍යාඛ්‍යානයක් ද ලියා මුද්‍රණයට පිළියෙල කරන ලද්දේය. අපගේ මේ සදුත්සාහය ශ්‍රීඝනශාසනයාගේ චිරජීවනයට උපකාරී වේවා.

මෙවගට,

හරුමල්ගොඩ ශ්‍රී සුමංගල ස්ථවිරයෝ ය.

වර්ෂ 2471/1928 ජූනි මස 25 වෙනි දින

දෙඹන්දූව ශෛලබිම්බාරාම මහා විහාරයේදී ය.

# සොධුසන්දස්සනං.

———×———

1 ලංකාවාමෙතරුජෝතෙ දෙඩන්ද්‍ර පුර පාවනෙ
සෙලබිම්බො'වභාසෙ රම්මෙ යති සංඝ නිසෙවිතෙ

2 සමාපත්ති සමාසීන සම්මා සම්බුද්ධ රූපිනා
ජම්බුදීපාගතෙන'ස්ම මහා බිම්බෙන ලක්ඛිතෙ

3 රාමඤ්ඤවිසයානීතා සා'ති සුධාය වීරුයා
කල්‍යාණිවංස රූපිත්‍යා මූලඨාතාලවාලකෙ

4 ගුණරතනාසතිරාජ පාදසම්භූත භූමිකෙ
ධම්මසාරමහානෙත්‍ර පුඞ්ගවෙනාභිරොපිතෙ

5 සිරිසුමනතිස්සාඛ්‍ය තෙතුම්බ්‍යෙන වඩ්ඪිතෙ
පිඤාදිරතනාතිසෙසන තෙතුරතෙනන පුප්පිතෙ

6 සීලක්ඛන්ධා'භිධානෙන ඵලිතෙ තෙතුසාමිනා
ආරාමතල්ලජේ'දානි මුඛ්‍යෙන යති සාමිනා

7 පරායතෙන කල්‍යාණිවංසා'ලවාල පාලතෙ
පාමොක්ඛෙන සරස්සති මණ්ඩපා'වෙරමණ්ඩලෙ

8 ගුරූනං පාදසුස්සූසා සාරසම්භූත වුත්තිනා
සිරිසුමංගල ථෙරෙ ති'ච්ඡයා විනය ඨිතිං

9 අපෙක්ඛනෙන කල්‍යාණා'රාමිකස්ස මනීසිනො
ඤාණොභාසාදිකිස්සස්ස යතිසෙසා'නතවුත්තිනො

10 එකාදිසංඛතීබුද්ධ වස්සෙ'සාළ්හා සිතෙ දලෙ
බුද්ධසික්ඛාය සංසුද්ධි සව්‍යාඛ්‍යාය සමාපිතා'ති.

සිවං.

# පටුන


| පිටු | විසය | ගාථා |
|---|---|---|
| 1 | (ආරම්භො) | 1 |
| 3 | මාතිකා | 2 |
| 5 | චත්තාරො පාරාජිකා | 9 |
| 12 | නවගරුකා | 27 |
| 16 | චීවරං | 38 |
| 27 | රජතානි | 66 |
| 27 | පත්තො | 68 |
| 30 | ථාලකා | 79 |
| 31 | පවාරණා | 81 |
| 36 | කාලිකා | 92 |
| 44 | පටිග්ගාහො | 114 |
| 46 | මංසෙසු අකප්පියං | 121 |
| 47 | නිස්සග්ගියානි | 124 |
| 52 | පාචිත්ති | 129 |
| 54 | සමණකප්පා | 133 |
| 58 | භූමියො | 144 |
| 61 | උපජ්ඣාචෙර වත්තානි | 153 |
| 64 | වච්චපස්සාව ඨානිකං | 164 |
| 65 | ආපුච්ඡකරණං | 169 |
| 67 | නග්ගා | 174 |
| 67 | නහානකප්පො | 176 |
| 68 | අවන්දියා | 180 |
| 69 | චම්මං | 181 |
| 70 | උපාහනා | 183 |
| 72 | අනොලොකියං | 189 |
| 73 | අඤ්ජනී | 190 |
| 75 | අකප්පියානි සයනානි | 195 |
| 80 | සමානාසනිකො | 203 |
| 80 | අසංවාසිකො | 205 |
| 82 | කම්මං | 207 |

| පිටු | විසය | ගාථා |
|---|---|---|
| 84 | මිච්ඡාජීව විවජ්ජනා | 217 |
| 86 | වත්තං | 221 |
| 88 | විකප්පනා | 229 |
| 91 | නිස්සයො | 235 |
| 93 | කායබන්ධනං | 240 |
| 96 | පථවී | 247 |
| 100 | පරික්ඛාරො | 264 |
| 105 | භෙසජ්ජං | 279 |
| 108 | උග්ගහො | 286 |
| 114 | දූසනං | 302 |
| 120 | වස්සූපනායිකා | 314 |
| 125 | අවෙභඞ්ගියං | 327 |
| 129 | පකිණ්ණකං | 340 |
| 155 | දෙසනා | 387 |
| 168 | ඡන්දදානාදි | 399 |
| 172 | උපොසථො | 409 |
| 185 | පවාරණා | 431 |
| 192 | සංවරො | 444 |
| 192 | සුද්ධි | 446 |
| 193 | සන්තොසො | 450 |
| 194 | චතුරාරක්ඛා | 452 |
| 196 | විපස්සනා | 463 |
| 197 | (නිගමනං) | 464 |

# සන්නසගිත

# ඛුද්දසික්ඛා

නමො තස්ස භගවතො අරහතො
සම්මාසම්බුද්ධස්ස.

—:0:—

**1 ආදිතො උපසම්පන්න සික්ඛිතබ්බං සමාතිකං**
**ඛුද්දසික්ඛං පවක්ඛාමි වන්දිත්වා රතනත්තයං.**

---

1 රතනත්තයං, (බුද්ධාදි) රත්නත්‍රය; වන්දිත්වා, (කාය වාක් මනොද්වාරයෙන් සකස්කොට) වැඳ; ආදිතො, ආදියෙහි පටන්; උපසම්පන්න, උපසපුනුන් විසින්; සික්ඛිතබ්බං, (ග්‍රහණ ධාරණ ප්‍රතිපත්ති ආදී වශයෙන්) හික්මියයුතුවූ; (නිරන්තරයෙන් පරිහරණය කටයුතුවූ) සමාතිකං, මාතෘකා පදසහිතවූ; ඛුද්දසික්ඛං, (සංක්ෂෙප මධුර බහුවිධ ශික්ෂාවන් ප්‍රකාශකරන හෙයින්) ඛුද්දසික්ඛා නම්වූ ප්‍රකරණයක්; පවක්ඛාමි; (ආදරයෙන්) කියමි; (නොහොත් අනෙකප්‍රකාරයෙන් හදුරමි)

**"පාරාජිකා ච චත්තාරො"** යනාදි උදෙස් පදම විස්තරයට ජනිකාවන බැවින් විස්තරය ප්‍රසවකරන බැවින් මාතිකා නම්වේ;-

"බුද්ධසික්ඛං" යන්නෙහි සික්ඛා නම් ත්‍රිවිධ ශික්ෂායි. කියේමැනවි:-

"සික්ඛාති තිස්සො සික්ඛා අධිසීලසික්ඛා අධිචිත්තසික්ඛා අධිපඤ්ඤාසික්ඛා'ති, තත්‍ථ පඤ්චඞ්ගදසඞ්ගසීලං සීලමෙව, පාතිමොක්ඛසංවරසීලම්පන අධිසීලං, පාතිමොක්ඛසංවරතො'පි ච මග්ගඵලසම්පයුත්තමෙව සීලං අධිසීලං, කාමාවචරානි පන අට්ඨකුසලචිත්තානි ලොකියඅට්ඨසමාපත්තිචිත්තානි ච චිත්තමෙව, විපස්සනාපාදකඅට්ඨසමාපත්තිචිත්තං පන අධිචිත්තං, තතො'පි ච මග්ගඵලචිත්තමෙව අධිචිත්තං, අත්‍ථි දින්නං අත්‍ථි යිට්ඨන්ති ආදිනයප්පවත්තම්පන කම්මස්සකතාඤාණං පඤ්ඤා, තිලක්ඛණාකාරපරිච්ඡෙදකම්පන විපස්සනාඤාණං අධිපඤ්ඤා, තතො 'පි ච මග්ගඵලපඤ්ඤා 'ව අධිපඤ්ඤා, එතායෙව සික්ඛිතබ්බතො සික්ඛා 'ති අධිසීලසික්ඛා අධිචිත්තසික්ඛා අධිපඤ්ඤාසික්ඛාති වුච්චන්ති * යි.

---

* සික්ඛාති, ශික්ෂා යනු; අධිසීලසික්ඛා, අධිශීලශික්ෂාය; අධිචිත්තසික්ඛා, අධිචිත්තශික්ෂාය; අධිපඤ්ඤාසික්ඛාති, අධිප්‍රඥාශික්ෂාය යන; තිස්සො සික්ඛා, ත්‍රිශික්ෂාවෝයි; තත්‍ථ, ඔවුනතුරෙන්; පඤ්චඞ්ග දසඞ්ගසීලං, පඤ්චාඞ්ගශීල දසාඞ්ගශීල දෙක; සීලං එව, ශීලයම වේ; පාතිමොක්ඛසංවරසීලං පන, ප්‍රාතිමොක්ෂසංවරශීලය වනාහි; අධිසීලං, අධිශීල නම් වේ; පාතිමොක්ඛසංවරතොපිච, ප්‍රාතිමොක්ෂසංවරශීලයෙන්ද; මග්ගඵලසම්පයුත්තං, මාර්ගඵල සම්ප්‍රයුක්තාවූ; සීලං එව, ශීලයම්; අධිසීලං, අධිශීල නම් වේ. කාමාවචරානි අට්ඨකුසලචිත්තානි පන; කාමාවචර අෂ්ටකුශල චිත්තයෝද; ලොකිය අට්ඨසමාපත්ති චිත්තානිච, ලෞකික අෂ්ටසමාපත්ති චිත්තයෝද; චිත්තංඑව, චිත්තය මැයි; විපස්සනාපාදකඅට්ඨසමාපත්තිචිත්තං පන, විදර්ශනාපාදක අෂ්ටසමාපත්ති චිත්තයවනාහි; අධිචිත්තං, අධිචිත්ත නම් වේ; තතොපිච, එයිනුදු; මග්ගඵලචිත්තංඑව, මාර්ගඵල චිත්තයම්; අධිචිත්තං, අධිචිත්ත නම් වේ. දින්නං, දුන්දෙය; අත්‍ථි, ඇත්තේය; යිට්ඨං, මහායාගය, අත්‍ථිති, ඇත්තේයයි යන; ආදිනයප්පවත්තං, මේ ආදි ක්‍රමයෙන් පැවැත්තාවූ; කම්මස්සකතාඤාණං පන, කර්මස්වකතාඥානය වනාහි; පඤ්ඤා, ප්‍රඥා නම් වේ; තිලක්ඛණාකාරපරිච්ඡෙදකං, ත්‍රිලක්ෂණාකාරයෙන් පිරිසිඳීම කරන; විපස්සනාඤාණං පන, විදර්ශනා ඥානය වනාහි; අධිපඤ්ඤා, අධිප්‍රඥා නම් වේ; තතොපිච, එයිනුදු; මග්ගඵල පඤ්ඤාඑව, මාර්ගඵල ප්‍රඥාවම්; අධිපඤ්ඤා, අධිප්‍රඥා නම් වේ. එතා එව, මොහුම්; සික්ඛිතබ්බතො, හික්මියයුතු බැවින්; සික්ඛාති, ශික්ෂා නම් වෙත්නුයි; අධිසීල සික්ඛා, අධිශීලශික්ෂාය; අධිචිත්ත සික්ඛා, අධිචිත්ත ශික්ෂාය; අධිපඤ්ඤාසික්ඛාති, අධිප්‍රඥාශික්ෂාවයයි. වුච්චන්ති, කියනු ලැබෙති.

## තත්‍රායං මාතිකා

2 පාරාජිකා ච චත්තාරො ගරුකා නව චීවරං
රජනානි ච පත්තො ච ථාලකා ච පවාරණා.

3 කාලිකා ච පටිග්ගාහො මංසෙසු ච අකප්පියං
නිස්සග්ගියානි පාචිත්ති සමණකප්පා ච භූමියො.

4 උපජ්ඣාචෙරවත්තානි වච්චපස්සාවඨානිකා
ආපුච්ඡකරණං නග්ගො නහානකප්පො අවන්දියා.

5 චම්මං උපාහනා චෙව අනොලොකියමඤ්ජනී
අකප්පියානි සෙනානි * සමානාසනිකො'පි ච.

---

2 පාරාජිකා ච චත්තාරො, සතරපාරාජිකාවෝද; (මෙහි අනුක්ත සමුච්චයාර්ථ "ච" ශබ්දයෙන් වක්ෂ්‍යමාණ උබ්භජාණුමණ්ඩලිකාදිපාරාජි සමුච්චිතයයි ගතයුතු) ගරුකා නව, (විකුම්භනකරණයි ඇවැද්ද යුතු) නවවැදෑරුම් සඟවශෙස්හුද; චීවරං, (කැපඅකැප) සිවුරුද; රජනානි ච (කැපඅකැප) රජන්ද; පත්තා ච, (කැප අකැප) පාත්‍රද; ථාලකා ච, (කැපඅකැප)තලුද; පවාරණා, (පිළිකෙව්) පවුරුණුද.

3 කාලිකාච, (සිවු) කැල්ලෝද; පටිග්ගාහො, පිළිගැනුම්ද; මංසෙසු ච අකප්පියං, මාංසයෙහි අකැප මස්ද; නිස්සග්ගියානි, නිසගි (පචිති) ද; පාචිත්තී, (සුඛ) පචිතිද; සමණකප්පා ච, ශ්‍රමණ ව්‍යවහාරයෝද; භූමියො, (කැප) කිළිහුද.

4 උපජ්ඣාචෙරවත්තානි, උපාධ්‍යායවත් ආචාර්‍යවත්ද; වච්චපස්සාවඨානිකා, වච්චකුටි පස්සාවකුටියෙහි වත්ද; ආපුච්ඡකරණං, (මහලු සඟුන්) පිළිවිස කිරීම්ද; නග්ගො, නග්නාවත්ද; නහානකප්පා නහනවිදිද; අවන්දියා, (පකතත්තයා විසින්) නොවැන්ද යුත්තෝද.

5 චම්මං; (කැප අකැප) සම්ද; උපාහනා චෙව, (කැප අකැප) වහන්ද; අනොලොකියං, (මහණුන් විසින්) නොබැලිය යුත්තද; අඤ්ජනී, (කැප අකැප) අඳුන් (නළ) ද; අකප්පියානි සෙනානි, (උපසපුන් මහණුන් විසින්) අකැප ශයනා නිදියා දූද; සමානාසනිකොපි ච, එකඅස්නෙහි හින්ද යුත්තෝද.

---

* 'අකප්පියසයනානි' සිද, 'අකප්පියානි සයනානි' සිද. ඇතැම්.

6 අසංවාසිකො ච කම්මං මිච්ඡාජීවවිවජ්ජනා
වත්තං විකප්පනා චෙව නිස්සයො කායබන්ධනං.

7 පඨවී ච පරික්ඛාරො භෙසජ්ජුග්ගහදූසනං
වස්සූපනායිකා චෙවා ‘ වෙභඞ්ගියං පකිණ්ණකං.

8 දෙසනා ඡන්දදානාදි උපොසථපවාරණා
සංවරො සුද්ධි සන්තොසො * චතුරක්ඛා විපස්සනා ‘ති.

---

6 අසංවාසිකො ච, (එකකම්මාදි) සංවාසයට නොනිස්සාද; කම්මං, (චතුර්විධ) කර්මද; මිච්ඡාජීවවිවජ්ජනා, ලාමකජීවිකාවගේ දුරු කිරීමද; වත්තං, (ආගන්තුකවත්තාදි) වත්ද; විකප්පනාචෙව, විකපුන්ද; නිස්සයො, නිස (ගැනුම)ද; කායබන්ධනං, (කැප අකැප) පටිද.

7 පඨවීච, (කැප අකැප) පොළොව්ද; පරික්ඛාරො, (කැපඅකැප; පිරිකරද; භෙසජ්ජ, බෙහෙත් (කිරීම් කරවීම් ආදිය) ද; උග්ගහ,) අකැපවත් පිළිගැනුම්ද; දූසනං (කුල) දූෂණද; වස්සූපනායිකාචෙව, වස්එළඹීම්ද; අවෙභඞ්ගියං, (අවෙභඞ්ගියයි කියනලද) ගරුභාණ්ඩද; පකිණ්ණකං, (නොයෙක් පරිද්දෙන්) සංකීර්ණයද.

8 දෙසනා, ඇවැත් දෙසුම්ද; ඡන්දදානාදි, සැඳපිරිසිදු පවුරුණු දීම්ද; උපොසථ, පොහෝද; පවාරණා, පවුරුණුද; සංවරො (ඉන්ද්‍රිය) සංවරද; සුද්ධි, දෙශනා ශුද්ධි අශුද්ධිද; සන්තොසො, ප්‍රත්‍යය සන්තොෂද; චතුරක්ඛා, සිව්අරක්ද; විපස්සනාති, විදර්ශනාද (යන මෙතෙක් දෙන යථා ක්‍රමයෙන් මෙහි කියනු ලැබෙත්.)

මේ සත්ගයින් කී පනස්පදයෙහි ආදිය පටන් ‘පවාරණා’ යනු දක්වා පන්සාළිස් පදයකින් අධිශීල ශික්ෂාව කීහ, ‘සංවරො, යන්නෙහි පටන් ‘චතුරක්ඛා’ යනු දක්වා සතරපදයකින් අධිචිත්ත ශික්ෂාව කීහ, ‘විපස්සනා, යන එක පදයෙන් අධිප්‍රඥ ශික්ෂාව කීහයි දතයුතු.

---

* චතුරාරක්ඛා. ඇ. පෑම්.

## "පාරාජිකා ච චත්තාරො" ති.

9 මග්ගත්තයෙ අනික්ඛිත්තසික්ඛො සන්ථත ‘සන්ථතෙ
අල්ලොකාසෙ නිමිත්තං සං තිලමත්තම්පි සන්ථතං.

10 අසන්ථතමුපාදින්නං පවෙසෙන්තො චුතො ‘ථවා
පවෙසනට්ඨිතුද්ධාර පවිට්ඨක්ඛණසාදකො.

---

**"පාරාජිකා ච චත්තාරො"** ති, පාරාජිකා ච චත්තාරො යන් තෙහි සතර පාරාජිකාවෝ නම්.

9. 10 අනික්ඛිත්තසික්ඛො, නොපස්විකනලද සික ඇති මහණ; සන්ථතාසන්ථතෙ, (චම්මචොලතිපුපට්ටාදීන්) වසනලද හෝ නොවසනලද හෝ; මග්ගත්තයෙ, (වච්චමග්ගාදි) තුන්මගින් සම්කියි මගෙක්හි; අල්ලොකාසෙ, (එහිදු පියවි සුලඟ නොපහරන) තෙත් පියෙස්හි; සන්ථතං; වසනලද හෝ; අසන්ථතං, නොවසනලද හෝ, උපාදින්නං, අනෂ්ටකාය ප්‍රසාද ඇති; සං නිමිත්තං, ස්වාඞ්ගජාතය; තමාගේ නිමිත්ත; තිලමත්තම්පි, තලඇටක් පමණකුදු, පවෙසෙන්තො, ප්‍රවෙශකරන්නේ (සෙවුනා සිතින් මෙහෙයන්නේ;) චුතො, (ශාසනයෙන්) චුතවේ; අථවා, නොහොත්; (තමා නිමිත්හි මෙරමාගේ උපක්‍රමයක් ඇතිකල්හි) පවෙසන, ප්‍රවෙශක්ෂණය, ඨිති, ස්ථිතික්ෂණය; උද්ධාර, උද්ධාරක්ෂණය; පවිට්ඨක්ඛණ, ප්‍රවිෂ්ටක්ෂණය; (යන මොවුන් අතුරෙන් යම්කිසි ක්ෂණයෙක්හි;) සාදකො, ඉවසන්නේද; හෙවත් සෙවුනා සිත් එලවන්නේද; (චුතො, එකෙණෙහිම ශාසනයෙන්) චුතවේ.

("මග්ගො'ති වච්චපස්සාවබෙලාදීනං නික්ඛමනපථො *" "අඟපටන් මුල දක්වා මෙහෙයීම ප්‍රවෙශ නම්, සියලු මෙහෙයුසඳ පවිට්ඨ නම්, මෙහෙයුවා අදනාසඳ අතුරෙහි සිටිනා සඳද සුකුරුවිසට සමයෙහි මාගමව්‍යායාමයෙන් බැරම සිටිනා සඳද ඨිති නම්, අඟ දක්වා අදිනාසඳ උද්ධරණ නම්" යනු විනය සන්නයි.)

---

* මග්ගොති, මාර්ග යනු; වච්චපස්සාවබෙලාදීනං, මලමූත්‍රකෙළ ආදීන්; නික්ඛමනපථො, නික්මෙන මාර්ගයයි.

11 ආදියෙය්‍ය හරෙය්‍ය ‘වහරෙය්‍ය ඉරියාපථං
කොපෙය්‍ය ඨානා චාවෙය්‍ය සංකෙතං වීතිනාමයෙ.

12 අදින්නං ථෙය්‍යචිත්තෙන භවෙ පාරාජිකො‘ථවා
ථෙය්‍ය බලකුසච්ඡන්නපරිකප්පාවහාරකො
භණ්ඩකාලග්ඝදෙසෙහි පරිභොගෙනෙත්ථ නිච්ඡයො.

13 මනුස්සවිග්ගහං විච්ච ජීවිතා වා වියොජයෙ,
මරණචෙතනො සත්ථහාරකං උපනික්ඛිපෙ.

---

11. 12. අදින්නං, (ස්වාමීහු විසින් කයින් හෝ වචසින් හෝ) නුදුන් ආරාමාදි වස්තුව; ථෙය්‍යචිත්තෙන, සොරසිතින්; ආදියෙය්‍ය, (සවත් බැණ) ගතී නම්, හරෙය්‍ය, (ගෙනයමින් සිට ගතී නම්; අවහරෙය්‍ය, (තමා කෙරෙහි නගා තුබුවා මම නොගත්මි යනාදින් බොරු කියා) ගතීනම්; ඉරියාපථං කොපෙය්‍ය, (බඩුගෙනයන්නහුගේ පියවි) ඉරියව් කොවා (ගනී) නම්; ඨානා චාවෙය්‍ය; තුබූ තැනින් පහකොට ගනීනම්; සංකෙතං වීතිනාමයෙ, සූත්වක් ගන්නා තැන හෝ තමාවිසින් පිරිකැපූ තැන හෝ ඉක්මවා (ගනී) නම්; පාරාජිකො භවෙ, (කෙලෙස් සතුරන් විසින්) පරදවනලද වන්නේයි; අථවා, නොහොත්; ථෙය්‍ය, (සන්ධිච්ඡෙදාදි විසින්) නොදක්නාසේ; බල, බලාත්කාරයෙන්; කුස, කුසපත් පෙරලීමෙන්; ඡන්න, (තෘණ පණ්ණාදීන්) මුවහකිරීමෙන්, පරිකප්ප, (භාණ්ඩාවකාශ) පරිකල්පනාවෙන්; අවහාරකො, ගන්නේද; පාරාජිකො භවෙ, (කෙලෙස් සතුරන් විසින්) පරදවනලද වන්නේයි; භණ්ඩ, (සොරාගත්) වස්තුවය; කාල, (අවහාර)කාලය; අග්ඝ,(භාණ්ඩයෙහි)අගය; දෙසෙහි,(අවහාර) දෙශය යන මොවුන් විසින්ද; පරිභොගෙන, (භාණ්ඩයෙහි ස්වාමි) පරිභොග විසින්ද; එත්ථ, මේ අදින්නාදානයෙහි; නිච්ඡයො, විනිශ්චය කටයුතු.

13 මරණචෙතනො, වධකචෙතනා ඇති මහණ; විච්ච, මොහු මරමියි ප්‍රයොග කොට; මනුස්සවිග්ගහං, මිනිස්සතක්හු; ජීවිතා වා වියොජයෙ, රූපාරූපජීවිතයෙන් චුතකෙරේනම්; සත්ථහාරකං, දිවි ගෙන යන අසි ආදිශස්ත්‍රයක් හෝ; උපනික්ඛිපෙ, (මියනු කැමැත්තහු) සමීපයෙහි ගතහැකිසේ එළවා තබා නම්;

14 ගාහෙය්‍ය මරණූපායං වදෙය්‍ය මරණෙ ගුණං
චුතො පයොගා සාහත්ථි නිස්සග්ගාණත්ති ථාවරා.

15 ඉද්ධිවිජ්ජාමයා කාලවත්ථායුධිරියාපථා
ක්‍රියාවිසෙසො ඔකාසො ඡ ආණත්තිනියාමකා.

16 ඣානාදිභෙදං නොසන්තං මත්තානත්තූපනායිකං
කත්වා කොට්ඨාසමෙකෙකං පච්චුප්පන්නානවස්සිතං.

17 අඤ්ඤාපදෙසරහිතං දීපෙන්තො'නධිමානිකො,
කායෙන වාචා විඤ්ඤත්තිපථෙ ඤාතෙ චුතො භවෙ.

---

14 15 මරණූපායං, (“සත්ථං වා ආහර විසං වා ඛාද *” යනාදීන්) මරණට උපාය හෝ; ගාහෙය්‍ය, උගන්වානම්; මරණෙ ගුණං, මරණෙහි අනුසස් හෝ; වදෙය්‍ය, (ත්වං ඛොසි උපාසක කත කල්‍යාණො අකතපාපො මතං තෙ ජීවිතා සෙය්‍යො †” යනාදීන්) කියානම්; චුතො, (ශාසනයෙන්) චුතවේ; සාහත්ථි, ස්වහස්ත (යෙන් පැහැරීම) ය; නිස්සග්ගි, (ඉයු ආදීන්ගේ) නිස්සර්ජනය; ආණත්ති, ඇණවීමය; ථාවරා, (ඔපාතඛනනාදිවූ) ථාවරය (යන මොහුද;) ඉද්ධිවිජ්ජාමයා, (කර්මවිපාකජවූ) සෘද්ධියගේ යෙදීම හා (මරණ මන්ත්‍රාඛ්‍ය) විද්‍යාවගේ පරිජපනයද (යන මොහු සදෙන;) පයොගා, (වධ) ප්‍රයොගයෝයි; කාල, (පූර්වාහණාදි වශයෙන් යුක්ත) කාලය; වත්ථු, (මැරියයුතු) සත්ත්වය; ආයුධ, (මරණ) ආයුධය; ඉරියාපථා, (මැරියයුත්තහුගේ ස්ථාන නිසදනාදි) ඊර්‍ය්‍යාපථය (යන මොහුද;) ක්‍රියාවිසෙසො, (ඡෙදන භෙදනාදි) ක්‍රියාවිශෙෂයද; ඔකාසො, (ග්‍රාමවනාදි) අවකාශද (යන;) ඡ, සදෙන; ආණත්තිනියාමකා, ආණාපනය නියම කරන්නාහුයි.

16 17 අනධිමානිකො, (අදිට්ඨෙ දිට්ඨසඤ්ඤිතාදි විසින් අධිගත ධර්ම ඇත්තෙමි යන) අදිමන් නැති මහණ; අත්තනි, තමාසතන්හි; නොසන්තං, (මේ අත්බැව නොඋපදවූ බැවින්) නැත්තාවූ; ඣානාදිභෙදං ධ්‍යානාදිධර්මවිශෙෂඇති උත්තරිමනුෂ්‍යධර්මය; කොට්ඨාසං, (ධ්‍යානවිමොක්ෂාදි) කොටසක් හෝ; එකෙකං, (ප්‍රථම ධ්‍යානාදි) එකක් එකක් හෝ; අත්තූපනායිකං කත්වා; තමාකෙරෙහි

---

* සත්ථංවා, ආයුධයක් හෝ; ආහර, ගෙනුව; විසංවා, විෂ (වර්ගී) යක් හෝ; ඛාද; අනුභව කරව;

† උපාසක, උපාසකය; ත්වං ඛො, තෝවනාහි; කතකල්‍යාණො අසි, කළකුසල් ඇත්තෙහිය; අකතපාපො, නොකළ පව්ඇත්තෙහියා තෙ ජීවිතා, තාගේ ජීවත්වීමට වඩා; මතං, මරණයම; සෙය්‍යො; උතුම් වේ.

18 පාරාජිකෝ'තෙ චත්තාරො අසංවාසා යථා පුරෙ
අභබ්බා භික්ඛුභාවාය සීසච්ඡින්නෝ'ව ජීවිතුං.

19 පරියායො ච ආණත්ති තතියෙ දුතියෙ පන
ආණත්තියෙව සෙසෙසු ද්වයමෙතන්නලබ්භති.

20 සෙවෙතුකාමතාචිත්තං මග්ගෙ මග්ගප්පවෙසනං
ඉදං මෙථුනධම්මස්ස ආහු අඞ්ගද්වයං බුධා.

---

ඇතීවක්කොට; (තමාකරා එළවා) පච්චුප්පන්නානවයසිතං, වර්තමාන භවය ඇසුරුකොට; අඤ්ඤාපදෙසරහිතං, (යම් මහණෙක් තොපගේ වෙහෙර වෙසේද ඒ මහණ ප්‍රථමධ්‍යානාදිලද්දේය යනාදි) ව්‍යාජකථා මිස; විඤ්ඤත්තිපථෙ, ශ්‍රවණෝපචාරවූ දෙළොස් රියනින් ඇතුළත්හි (සිටි මිනිස් සතෙක්හට;) කායෙන, (හස්තමුද්‍රාදි) කායවිකාරයකින් හෝ; වාචාය; (ඔහු දන්නා යම්කිසි) බසකින් හෝ; දීපෙන්තො, (ප්‍රථම ධ්‍යානයට සමවදිමි යනාදි විසින්) පහළ කරන්නේ; ඤාතෙ, (වචන සමනන්තරයෙහි මොහු ධ්‍යානයට සමවදිත්ල යන මේපමණක්හු ඇසුවහු) දත් කෙණෙහිම, චුතොභවෙ, (ශාසනයෙන්) චුතවන්නේයි.

(අධිමාන නම් සුපරිශුද්ධශීලසම්පන්න පිහිටා සමාධිභාවක රූපාරූප සමාපත්ති විසීව පැවතුවහටහෝ විදර්ශනාහි යුක්තව සොපයෙල ශොඩශවිධඥානලදුවහට හෝ මේ ධර්ම මාවිසින් අධිගතයයි දෘෂ්ටි උපදනා මති.)

19 එතෙ චත්තාරො පාරාජිකා, පරිජි අවන් මේ සතර පුඟුලෝ; පුරෙයථා, තමන් ගෘහස්ථානුපසම්පන්න කාලයෙහිමෙන්; අසංවාසා, (සිල්වත් භික්ෂූන් හා එක්ව කරන එකකර්මාදි) සංවාසයට නොහිස්සෝය; ජීවිතුං, (එම ශරීර බන්ධනයෙන්) ජීවත්වන්නට (අභව්‍යවූ;) සීසච්ඡින්නොව, ශිරශ්ඡේදනයට පැමිණි (පුරුෂ) යකුමෙන්; භික්ඛුභාවාය, භික්ෂුභාවය (නැවත උපසම්පන්නවීම) ටද; අභබ්බා, අයොග්‍යයෝයි.

19 පරියායොච, පරියාය (තෙපුල්) ද ආණත්ති, (පරිජිකරු ඇණවූ) ඇණවීමද; තතියෙ, තුන්වන මනුෂ්‍යවිග්‍රහපාරාජිකාවෙහි; (ලබ්භන්ති;) ලැබෙයි; දුතියෙ පන, දෙවනඅදත්තාදාන පාරාජිකායෙහි වනාහි; ආණත්තියෙව, ආණත්තියම (ලැබෙයි;) සෙසෙසු, සෙසු (පළමුවන සතරවන) පාරාජිකාවන් කෙරෙහි; එතං ද්වයං, (පරියාය ආණත්තිය යන) මේදෙක; නලබ්භති, නොලැබේ.

20 සෙවෙතුකාමතාචිත්තං, (මෛථුන්දම්) සෙවියටි සිතය; මග්ගෙ (තුන්මගින් එක්තරා) මගෙක්හි; මග්ගප්පවෙසනං, (තමා) නිමිත් ප්‍රවෙශනීමය යන; ඉදං අඞ්ගද්වයං, මේ දෙඅඟ; මෙථුනධම්මස්ස මෛථුන්දම් පාරාජිකාවට; බුධා, විනයධරයෝ; ආහු, කීහ.

21 මනුස්සං තථාසඤ්ඤී ථෙය්‍යචිත්තඤ්ච වත්ථුනො
ගරුතා අවහාරො ච අදින්නාදානහෙතුයො.

22 පාණො මානුස්සකො පාණසඤ්ඤිතා ඝාතචේතනා
පයොගො තෙන මරණං පඤ්චෙතෙ වධහෙතුයො.

23 අසන්තතා අත්තනි පාපමිච්ඡතා
යාරොචනා තස්ස මනුස්සජාතිතා
නාඤ්ඤාපදෙසො ච තදෙව ජානනං
පඤ්චෙත්ථ අඞ්ගානි අසන්තදීපනෙ.

( " සෙවෙතුකාමතාය මෙථුනසේවාතණ්හාය සම්පයුත්තචිත්තං සෙවෙතුකාමතා චිත්තං " * )

21 මනුස්සං, මිනිස්සතක් අයත්බවද; තථාසඤ්ඤී, මිනිස්සතකු අයත් යන සංඥාද; ථෙය්‍යචිත්තඤ්ච, සොරසිතද; වත්ථුනො ගරුතා, වස්තුහු පාපොහොනා බව්ද; අවහාරොච, ගැන්මද (යනමොහු පස්දෙන;) අදින්නාදානහෙතුයො, අදත්තාදානපාරාජිකාවට අඞ්ගයෝයි.

22 මානුස්සකො පාණො, මිනිස්සත්ත්බවය; පාණසඤ්ඤිතා, සත්තක් යන සංඥා ඇති බවය; ඝාතචේතනා, වධකචෙතනාය; පයොගො, (සාහත්ථිකාදි සපියොවින් එක්) පියෝවෙක; තෙන මරණං, ඒ පියොවින් මරණය යන; එතෙ පඤ්ච, මොහු පස්දෙන; වධහෙතුයො, මනුෂ්‍යවිග්‍රහපාරාජිකාවට අඞ්ගයෝයි.

23 අත්තනි, තමා සතන්හි; අසන්තතා, (උතුරුමිනිස්දම්) නැති බවද; පාපමිච්ඡතාය, (අසන්තසම්භාවනාය ප්‍රත්‍යය ප්‍රතිලාභ පැතීමය යන) ලාමකවූ ඉච්ඡායෙන්; ආරොචනා, ඇරොජීමද; තස්ස මනුස්සජාතිතා, (යමක්හට ඇරොජාද) ඔහු මනුෂ්‍යජාතිඇතිබවද; නාඤ්ඤාපදෙසොච, පර්‍යායකථාමුක්තබවද; තදෙවජානනං, (සහසා උත්පාදක්ෂණයෙහි) එය දැන්මද යන; පඤ්ච, පස්දෙන; එත්ථ අසන්තදීපනෙ, මේ උත්තරිමනුෂ්‍යධර්මාරොචන පාරාජිකාවෙහි; අඞ්ගානි, අඞ්ගයෝයි.

* සෙවෙතුකාමතාය, සෙවනයට කැමැති බැවි සඞ්ඛාතවූ; මෙථුනසේවාතණ්හාය; මෛථුන සෙවින් තෘෂ්ණාවෙන්; සම්පයුත්තං චිත්තං, සම්ප්‍රයුක්තවූ සිත; සෙවෙතුකාමතාචිත්තං, සෙවතුකාමතා චිත්තය නම්වේ.

24 අසාධාරණා ච චත්තාරො භික්ඛුනී නමභබ්බකා
එකාදස ච විබ්භන්තා භික්ඛුනී මුදුපිට්ඨිකො.

25 ලම්බී මුඛෙන ගණ්හන්තො අඞ්ගජාතං පරස්ස ච
තස්සෙවාභිනිසීදන්තො චත්තාරො අනුලොමිකා

26 මග්ගෙ මග්ගප්පවෙසෙන මෙථුනස්ස ඉධාගතා
චත්තාරො'ති චතුබ්බීස සමොධානා පරාජිකාති

---

24 25 26 භික්ඛුනීනං, භික්ෂුණීන්ගේ; අසාධාරණා ච චත්තාරො, (භික්ෂූන් හා සාධාරණනොවූ උබ්භජාණුමණ්ඩලිකාය වජ්ජපටිච්ඡාදිකාය උක්ඛිත්තානුවත්තිකාය අට්ඨවත්ථුකාය යන) සතර පාරාජිකාවෝද, අභබ්බකා (මේ ජන්මයෙහි මහණවීමට) නොනිසිවූ; එකාදස ච, (පණ්ඩකාදි) එකොළොස්දෙනද; විබ්භන්තා භික්ඛුනී, ගිහිවූ මෙහෙණද; මග්ගෙමග්ගප්පවෙසෙන, (රාගවසයෙන් සදෘශවූ දෙදෙනකුගේ වයංවයසමාපත්තියක් නැතද) මාර්ගයෙහි මාර්ගප්‍රවෙශ කිරීමෙන්; මෙථුනස්ස, මෛථුනධර්ම පාරාජිකාවට; අනුලොමිකා, අනුලෝමවූ; මුදුපිට්ඨිකො, (හෙතෙම) මොලොක්කළ පිටු ඇත්තේය; ලම්බී, දික්වූ අඞ්ගජාත ඇත්තේය; පරස්ස අඞ්ගජාතං, මෙරමාගේ නිමිත්තය; මුඛෙන ගණ්හන්තො, (තමා) මුඛයෙන් ගන්නේය; තස්සෙව, මෙරමා නිමිත්හිම; අභිනිසීදන්තො, තමාවසම්හින් ප්‍රවෙශවනසේ හිඳින්නේය, (යන) චත්තාරො, සතරදෙනද; ඉධාගතා, මේ ක්‍ෂුද්‍රසික්‍ෂායෙහි (ස්වරූපයෙන්) ආවාවූ; චත්තාරොති, සතරදෙනදයි; පාරාජිකා, පාරාජිකාවෝ; සමොධානා, රැස්හෙයින් හෙවත් එක්කොට ගිණීමෙන්; චතුබ්බීස, සූවිස්සෙකි.

පණ්ඩකො ථෙය්‍යසංවාසකො තිත්ථියපක්කන්තකො තිරච්ඡානගතො මාතුඝාතකො පිතුඝාතකො අරහන්තඝාතකො භික්ඛුනීදූසකො සඞ්ඝභෙදකො ලොහිතුප්පාදකො උභතොබ්‍යඤ්ජනකොති ඉමෙ එකාදස අභබ්බපුග්ගලා නාම. *

---

* පණ්ඩකො, පස්වැදෑරුම්වූ පණ්ඩකය; ථෙය්‍යසංවාසකො, සොරට මහණවිලාස ගත්තැනැත්තේය; තිත්ථියපක්කන්තකො, උපසපන්ව සිට අන්‍යතීර්ථක නිකායකට ගිය තැනැත්තේය; තිරච්ඡානගතො, තිරිසන් ජාතියෙහි උපන් තැනැත්තේය; මාතුඝාතකො, මව්නැසූ තැනැත්තේය; පිතුඝාතකො, පියා නැසූතැනැත්තේය; අරහන්තඝාතකො, රහතුන් නැසූ තැනැත්තේය භික්ඛුනීදූසකො, මෙහෙණින් දූෂණය කළ තැනැත්තේය; (මේහි මාතුඝාතකාදි සතරදෙන අනුපසපන්බිම්හි සිටියාහුම ගැණෙති. උපසපන්බිම්හි සිටියාහු වනාහි මුල් තිදෙන මනුස්සවිග්ගහපාරාජිකාවෙහිද මෙහෙණින් දූෂණය කෙළේ මෛථුන පාරාජිකාවෙහිද ගැණෙති.) සංඝභෙදකො, සංඝභෙදකර්මය කළතැනැත්තේය; ලොහිතුප්පාදකො, දුෂිතසිතින් බුදුන් ඇඟින් ලේ සෙලවූ තැනැත්තේය; උභතොබ්‍යඤ්ජනකො ඉති, ස්ත්‍රීභාවපුරුෂභාව යන්ට හෙතුවූ උභයකර්මයෙන් උපන් නිමිති ඇති තැනැත්තේය යන; ඉමෙ එකාදස, මේ එකොළොස්දෙන; අභබ්බපුග්ගලා නාම, අභව්‍ය පුද්ගලයෝ නම් වෙති.

පණ්ඩකො ච තිරච්ඡානො උභතොබ්‍යඤ්ජනො'පි ච
තයො වත්ථුවිපන්නා හි අහෙතුපටිසන්ධිකා.

භික්ඛුභාවො වසති එත්ථා'ති වත්ථු. භික්ඛුභාවාරහතා. සා පන පබ්බජ්ජක්ඛන්ධකාගතසබ්බදොසවිරහිතගුණසම්පත්තියුත්තතා. තං විපන්නං පණ්ඩකභාවාදියොගෙන යෙසං තෙ වත්ථුවිපන්නා.

පඤ්චානන්තරිකා ථෙය්‍යසංවාසො පි ච දූසකො .
තිත්ථියපක්කන්තකො චෙ'ති ක්‍රියානට්ඨා පනට්ඨ තෙ.

ක්‍රියානෂ්ටයෝ නම් මාතෘවධාදික්‍රියායෙන් භික්ෂුභාවයට නොනිසිව නටුවෝයි.

පක්ඛාපක්ඛවිකාසිත්තා චතුත්ථො පන, ලූයකො
නපුංසකො'ති පඤ්චෙ'තෙ පණ්ඩකා පරිදීපිතා.
තෙසු ආසිත්තා'සූයානං පබ්බජ්ජා න නිවාරිතා
ඉතරෙසන්තු තිණ්ණ'ම්පි පණ්ඩකානං නිවාරිතා.*

---

* පණ්ඩකො ච, පණ්ඩකයාද; තිරච්ඡානො, තිරිසන්ජාති ඇත්තාද; උභතොබ්‍යඤ්ජනො පි ච, උභතොබ්‍යඤ්ජනකයාද යන; වත්ථුවිපන්නා, වස්තුවිපන්නවූ හෙවත් භික්ෂුභාවයට යොග්‍යගුණ සම්පත්තියෙන් තොරවූ; තයො හි, තිදෙන වනාහි; අහෙතුපටිසන්ධිකා, (අලොභඅදොසඅමොහසංඛ්‍යාත) ත්‍රිහෙතුවෙන් තොරවූ ප්‍රතිසන්ධිඇත්තෝයි.

එත්ථ, මෙහි; භික්ඛුභාවො, භික්ෂුභාවයතෙම; වසතීති, වසානුයි; වත්ථු, වත්ථු නම්. භික්ඛුභාවාරහතා, භික්ෂුභාවයට යොග්‍යබවයි. සා පන, ඒ භික්ෂුභාවාර්හතා තොමෝ වනාහි; පබ්බජ්ජක්ඛන්ධකාගත, පබ්බජ්ජක්ඛන්ධකයෙහි ප්‍රකාශිතවූ; සබ්බදොසවිරහිත, සියලුදොසින් තොරවූ; ගුණසම්පත්තියුත්තතා, ගුණසම්පත්තියෙන් යුක්තබවය. තං (වත්ථු), ඒ (භික්ෂුභාවාර්හතා යයි කියනලද) වස්තුව; පණ්ඩකභාවාදියොගෙන, පණ්ඩක බැව් ආදිය සමග යෙදීමෙන්; විපන්නං, නටුයේ; යෙසං, යම්කෙනෙකුන්ගේද; තෙ, ඔහු; වත්ථුවිපන්නා, වස්තු විපන්නා නම් වෙත්.

පඤ්චආනන්තරිකා, පස්ආනන්තරිය කර්මකළතැනැත්තෝද; ථෙය්‍යසංවාසො, ථෙය්‍යසංවාසකයාද; දූසකො අපි ච, භික්ඛුනීදූසකයාද; තිත්ථියපක්කන්තකො ච ඉති, තිත්ථියපක්කන්තකයාද යන; තෙ අට පන, ඔහු අටදෙන වනාහි; ක්‍රියානට්ඨා, ස්වක්‍රියාවෙන් නැසුණාහුයි.

## ගරුකා නවා'ති.

27 මොචෙතුකාමතා සුක්කස්සූපක්කම්ම විමොචයං
අඤ්ඤත්‍ර සුපිනන්තෙන සමණො ගරුකං ඵුසෙ.

28 ඉත්ථිසඤ්ඤී මනුස්සිත්ථිං කායසංසග්ගරාගවා
සම්ඵුසන්තො උපක්කම්ම සමණො ගරුකං ඵුසෙ.

---

**ගරුකා නවාති,** ගරුකා නව යන්නෙහි ගරුකාපත්තීහු නව දෙන නම්;

27 මොචෙතුකාමතාය, සුකුරුම්දියවී බැවින් හෙවත් මොචනාස්වාදයෙන්; උපක්කම්ම, (හස්තාදි යම් කිසිවකින් තමා නිමිත්ති) උපක්‍රම කොට; සුක්කස්ස, ශුක්‍රය; විමොචයං, මුදන; (තුඹුයිහතැනින් ගලවන) සමණො, මහණ; අඤ්ඤත්‍ර සුපිනන්තෙන, (කපිනිද්‍රාවස්ථා වෙති වන) ස්වප්නයෙහි ශුක්‍රමොචනය විනා; ගරුකං, සඞ්ඝාදිසෙස්; ඵුසෙ, අවදනේයි; මොචෙතු කාමතාය යී කිවමනා තන්හි මොචෙතු කාමතා යී ඡන්දස් පිණිස යකාර ලොපයෙන් ගාථායෙහි දක්වනලදී.

28 කායසංසග්ගරාගවා, (හස්තග්‍රහණාදි) කායසංසර්ගයෙහි රාගඇති; මහණො, සමණ; ඉත්ථිසඤ්ඤී, මිනිස්මාගමක යන සංඥා ඇතිව; උපක්කම්ම, කයින් පියෝ කොට; මනුස්සිත්ථිං, (තදහුජාත වූද නොමළ) මිනිස්මාගමක; සම්ඵුසන්තො, (යටත් පිරිසෙයින් ලොමයෙනුදු) ස්පර්ශ කරන්නේ; ගරුකං ඵුසෙ, සඞ්ඝාදිසෙස් අවදනේයි. කායසංසර්ගරාගයෙන් මළමාගම සිරුරු පුසත්‍රුවහට තුල්‍යයි වේ.

---

පක්ඛ, (කළුවරපක්ෂයෙහි පණ්ඩකව ශුක්ලපක්ෂයෙහි සංසිඳෙන පරිලාහ ඇති) පක්ඛපණ්ඩකය; ඔපක්කමික, (උපක්‍රමයෙන් ඉවත් කරනලද බිජුවට ඇති) ඔපක්කමිකපණ්ඩකය; ආසිත්තා, (පරා නිමිති මුවින් ගෙන අසූචින් ආසික්තවූ කල්හි සංසිඳෙන පරිලාහඇති,) ආසිත්තපණ්ඩකය යන මොහුද; චතුත්ථො පන, සතරවැනිවූ; උසූයකො, (පරා ව්‍යතික්‍රම දැක ඊර්ෂ්‍යා ඉපදීමෙන් සංසිඳෙන පරිලාහ ඇති) උසූයපණ්ඩකයාද; නපුංසකො ඉති, (භාවරූපරහිතප්‍රතිසන්ධිඇති.) නපුංසකපණ්ඩක යාද යන; එතෙ පඤ්ච පණ්ඩකා, මේ පස්පණ්ඩකයෝ; පරිදීපිතා; ප්‍රකාශකරනලදහ.

තෙසු, ඒ පස්පණ්ඩකයන් අතුරෙණ්; ආසිත්තඋසූයානං, ආසිත්ත උසූයපණ්ඩකයන් දෙදෙනාට; පබ්බජ්ජා, පැවිදි; න නිවාරිතා, නො වළකනලදී. ඉතරෙසන්තු, අන්‍යවූ වනාහි; තිණ්ණම්පි පණ්ඩකානං, තුන්පණ්ඩකයන්ටම; නිවාරිතා, පැවිදි වළකනලදී.

29 තථා සුණන්තිං විඤ්ඤුඤ්ච මග්ගං වා රබ්භමෙථුනං
දුට්ඨුල්ලවාචාරාගෙන ඔභාසන්තො ගරුං ඵුසෙ.

30 වත්වා'ත්තකාමු' පට්ඨාන වණ්ණං මෙථුනරාගිනො
වාචාමෙථුනයුත්තෙන ගරුං මෙථුනයාචනෙ

31 පටිග්ගහෙත්වා සන්දෙසං ඉත්ථියා පුරිසස්ස වා
වීමංසිත්වා හරං පච්චා සමණො ගරුකං ඵුසෙ.

---

29 තථා, එසේම; (මිනිස්මාගමක යන සංඥ ඇතිව) සුණන්තිං, (විඥප්තිපථයෙහි සිට) අසන්නාවූ; විඤ්ඤුඤ්ච, (සභ්‍යාසභ්‍යතෙපුල්) දන්නාමවූ; (මිනිස්මාගමකාට) මග්ගං වා, වසම්ගපසම්ග හෝ; මෙථුනං, මෙවුන්දම් හෝ, ආරබ්භ; අරබයා; දුට්ඨුල්ලවාචාරාගෙන, දුරුකතවචනයෙහි ආස්වාදයෙන්; ඔභාසෙන්තො, "තව වච්චමග්ගො ච පස්සාවමග්ගො ච සුභො සුසණ්ඨානො" * (යනාදී අනෙකප්‍රකාර අසභ්‍යතෙපුල්) බැණ; ගරුං ඵුසෙ, සඟවෙසෙස් අවදනේයි.

30 අත්තකාමුපට්ඨාන, තමහට මෙවුන්දම්න් මෙහෙකිරීමෙහි; වණ්ණං, ගුණ; අනුසස් වත්වා, (එතදග්ගං භගිනි පාරිචරියානං යා මාදිසං සීලවන්තං† යනාදීන්") කියා; මෙථුනයුත්තෙන වාචාය, (අරහසි ත්වං මය්හං මෙථුනධම්මං දාතුං + යනාදි) මෛථුනධර්මප්‍රතිසංයුක්ත වචනයෙන්; මෙථුනයාචනෙ, මෙවුන්දම් අයැදමෙහි; මෙථුනරාගිනො, මෙවුන්දම්රාඇති භික්ෂුහට; ගරුං, (හොති) සඟවෙසෙස්වේ.

31 ඉත්ථියා, ස්ත්‍රියගේ හෝ; පුරිසස්ස වා, පුරුෂයාගේ හෝ; සන්දෙසං, (කෙලෙස්පිළිබැඳි)හස්න; පටිග්ගහෙත්වා, (කයින් හෝ වචසින් හෝ) පිළිගෙන; වීමංසිත්වා, විමසා හෙවත් හසුන් කියයුතු ස්ත්‍රී පුරුෂයන්ට ඇරොජා; පච්චා හරං, නැවත ගෙනහැර ඇරොජන්නාවූ; සමණො, මහණ; ගරුකං ඵුසෙ, සඟවෙසෙස් අවදනේයි.

---

* තව, තීගේ; වච්චමග්ගො ච, වර්චස්මාර්ගයද; පස්සාවමග්ගො ච, යොනිමාර්ගයද; සුභො, මනොහරය; සුසණ්ඨානො, මනාසටහන් ඇත්තේය.

† භගිනි, නැගණියනි ! පාරිචරියානං, මෙහෙකිරීම් අතුරෙන්; එතං අග්ගං, මේ අග්‍රය. යා, යම්තැනැත්තියක්තොමෝ; මාදිසං, මාසම්නාවූ; සීලවන්තං, සිල්වත්වූ; (බ්‍රහ්මචාරියකුහට මෛවුන්දම්න් මෙහෙ කෙරේද.)

+ ත්වං, තී; මය්හං, මට; මෙථුනධම්මං, මෛථුනධර්මය; දාතුං, දෙන්ට; අරහසි, සුදුස්සෙහි.

32 සඤ්ඤාචිතපරික්ඛාරං කත්වා දෙසිතවත්ථුකං
කුටිං පමාණාතික්කන්තං අත්තුද්දෙසං ගරුං ඵුසෙ.

33 මහල්ලකං විහාරං වා කත්වා දෙසිතවත්ථුකං
අත්තනො වසනත්ථාය සමණො ගරුකං ඵුසෙ.

34 අමූලකෙන චොදෙන්තො චොදාපෙන්තොව වත්ථුනා
අන්තිමෙන ච චාවෙතුං සුණමානං ගරුං ඵුසෙ .

---

32 සංඥාචිතපරික්ඛාරං, තමාවිසින් ඉල්වනලද; (වෑපොරෝ ඈ) උපකරණඇති; අදෙසිතවත්ථුකං, නොදෙසනලද කුටිවස්තුඇති; පමාණාතික්කන්තං, (දිගට පුලුලට වඩාළ) ප්‍රමාණඉක්මුණාවූ; අත්තුද්දෙසං, ආත්මෝද්දේශඇති; (තමාවසනු සඳහා) කුටිං, (උල්ලිත්තාවලිත්තාදි) කුටිය; කත්වා, කොට; ගරුං ඵුසෙ, සඟවෙසෙස් අවදනේයි.

බිමපටන් බිතප්සෙවෙනි වසා මැටියෙන් හෝ සුන්නෙන් හෝ දොරකවුළු ආලොකාවකාශ හැර ඇතුළතින් ලිපනබැවින් උල්ලිප්ත නම්. මෙසේම බහිලිප්ත බැවින් අවලිප්තනම් ඇතුළතින් පිටතින් ලිප්තබැවින් උල්ලිප්තාවලිප්තනම්.

33 අදෙසිතවත්ථුකං, නොදෙසනලද විහාරවස්තු ඇති; මහල්ලකං, (කරවා දෙන ස්වාමීන් ඇති හෙයිනුදු ප්‍රමාණාතික්‍රාන්ත කොට කටහැකිහෙයිනුදු) මහත්වූ; විහාරං වා, (උල්ලිත්තාවලිත්තාදි) විහාරයද; අත්තනො වසනත්ථාය; තමාවසනු සඳහා; කත්වා, කොට; සමණො, මහණ; ගරුකං ඵුසෙ, සඟවෙසෙස් අවදනේයි.

34 අමූලකෙන,(දර්ශනශ්‍රවණපරිශංකාසංඛ්‍යාත)මුල්නැත්තාවූ; අන්තිමෙන වත්ථුනා, (භික්ෂුහට අනුරූපවූ එකුන්විසි පරිජිඅතුරෙන් එක්තරා) පරිජිකයෙකින්; සුණමානං, (විඥප්තිපථයෙහි සිට) අසන්නාවූ භික්ෂුහු; චාවෙතුං, (ශාසනයෙන්) චුතකරන පිණිස; චොදෙන්තො, “පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොසි අස්සමණොසි” * යනාදින් චොදනාකරනහෝ; චොදාපෙන්තො වා,(සමීපයෙහි සිටඅනිකකු. ලවා චොදනා කරවනහෝ මහණ;ගරුංඵුසෙ, සඟවෙසෙස් අවදනේයි

“පබ්බජ්ජාය පාතිමොක්ඛසංවරසීලස්ස වා අන්තො විනාසෙ භවං අන්තිමං පාරාජිකාපත්ති තදෙව විනාසකාරණත්තා වත්ථු තෙන අන්තිමෙන වත්ථුනා” †

---

* පාරාජිකං ධම්මං, පරිජි ඇවැතට; අජ්ඣාපන්නොසි, පැමිණියෙහි; අස්සමණොසි, නොමහණයෙහි.

† පබ්බජ්ජාය වා, ප්‍රව්‍රජ්‍යාවගේ හෝ; පාතිමොක්ඛසංවර සීලස්ස වා, ප්‍රාතිමොක්ෂසංවරශීලයාගේ හෝ; අන්තො, අන්තසිසේයි; විනාසෙ, විනාශයෙහි; භවං, වූයේ; අන්තිමං, අන්තිමනම්. පාරාජිකාපත්ති, පරිජිඇවතයි. තං එව, එම; විනාසකාරණත්තා, විනාශයට කාරුණු බැවින්; වත්ථු, වස්තුනම්වේ. තෙන අන්තිමෙන වත්ථුනා, ඒ අන්තිමවූ වස්තුවෙන්.

35 අඤ්ඤස්ස කිරියං දිස්වා තෙන ලෙසෙන චෝදයං
වත්ථුනා අනන්තිමෙන'ඤ්ඤං චාවෙතුං ගරුකං ඵුසෙ

36 ඡාදෙති ජානමාපන්නං පරිවාසො යාව තාවතා
චරෙය්‍ය සඞ්ඝ මානත්තං පරිවුත්ථො ඡ රත්තියො
චිණ්ණමානත්තම්'බ්භෙය්‍ය සඞ්ඝො තං වීසතිගණො.

37 ආපත්තිනුක්ඛිත්තමනන්තරාය
පහුත්තතායො තථසඤ්ඤිතා ච
ඡාදෙතුකාමො අථ ඡාදනාති
ඡන්නා දසඞ්ගෙහරුණුග්ගමම්හි

---

35 අඤ්ඤස්ස, (ක්ෂත්‍රියාදී) අනිකකුගේ; කිරියං, (මෛථුන සෙවනාදි) ක්‍රියාවක්; දිස්වා, දැක; තෙන ලෙසෙන, ඒ (ජාත්‍යාදි) ලෙසයෙන්, අඤ්ඤං, (ක්ෂත්‍රියාදි) අනික් මහණකු; චාවෙතුං, (ශාසනයෙන්) චුතකරනු පිණිස; අනන්තිමෙන වත්ථුනා, පරිජිවතෙකින්; චෝදයං, ( "ඛත්තියො මයා දිට්ඨො පාරාජිකං ධම්මං අජ්ඣාපජ්ජන්තො. ත්වං ඛත්තියො පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොසි" * යනාදීන්) චෝදනාකරන කරවන මහණ; ගරුකං ඵුසෙ, සඟවෙසෙස් අවදනේයි.

36 ආපන්නං, අවන් සඟවෙසෙස් ඇවැත්; ජානං, (ඇවැත් විසින් හෝ වත්විසින් හෝ නම ගොත්‍ර විසින් හෝ) දැන; යාව, යම්තාක් දවස් ඡාදෙති, සඟවාද; තාවතා, ඒතාක් දවස්; පරිවාසො (වසිතබ්බො,) පිරිවස් විසිය යුත්තේය; පරිවුත්ථො, පිරිවස් විසූ මහණ, ඡරත්තියො, සරයක්; සඞ්ඝ, සඞ්ඝයා කෙරෙහි; මානත්තං, මානත්; චරෙය්‍ය, පුරන්නේය; චිණ්ණමානත්තං, පුරනලද මානත් ඇති; තං, ඒ භික්ෂුහු; වීසතිගණො සඞ්ඝො, විංසතිවර්ගී සඞ්ඝ තෙමේ; අබ්භෙය්‍ය, අබ්භාන (කම්මවශයෙන් ඇතුළත්) කරන්නේයි.

37 ආපත්ති, (සඟවෙසෙස්) ඇවතක්බවය; අනුක්ඛිත්තං, උක්ඛෙපනීකම් නොලදබවය; අනන්තරාය (ගමනබාධකවූ රාජචෝරාදි) අන්තරායක් නැති බවය; පහුත්තතායො, (සබ්‍රම්සරුන් කරායන්නට ඇරොජන්නට) පොහොසත් බවය; (යන සතරදෙනද) තථසඤ්ඤිතා ච (සඟවෙසෙසක උක්ඛෙපනීකම් නොලදුයෙමි අන්තරාය නැතියෙමි පොහොසත්මි යනසතර) සංඥ ඇතිබවද; ඡාදෙතුකාමො, සඟවනුකැමති බවද; අථ, නැවත; ඡාදනාති, නොකිම්ද යන, දසඞ්ගෙහි (මේ) දසහින්; අරුණුග්ගමම්හි, අරුණු නැගී සඳ; ඡන්නා, (ඇවැත්) සඟවනලද වේ:

---

* ඛත්තියො, ක්ෂත්‍රියතෙම; පාරාජිකං ධම්මං, පරිජි ඇවතට; අජ්ඣාපජ්ජන්තො, පැමිණෙන්නේ; මයා, මාවිසින්; දිට්ඨො, දක්නාලදී. ත්වං, තෝ; ඛත්තියො, ක්ෂත්‍රියයෙහි; පාරාජිකං ධම්මං, පරිජි ඇවැතට; අජ්ඣාපන්නොසි, පැමිණියෙහි.

## චීවරනති.

38 ඛොම කොසෙය්‍ය කප්පාස සාණ භඞ්ගානි කම්බලං
කප්පියානි ඡළෙතානි සානුලොමානි ජාතිතො.

---

**චීවරනති, චීවරං යන්නෙහි කැප අකැප සිවුරු නම්.**

38 ඛොම, කොමු පිළිය; කොසෙය්‍ය, තිහිරි පිළිය; කප්පාස, කපුපිළිය; සාණ, සණවැහැරිපිළිය; භඞ්ගානි, මුසුහුපිළිය; කම්බලං, පලසය; (යන) එතානි ඡ, මොහු සදෙන; සානුලොමානි, අනුලොම් (සිවුරු) සහිතවූවාහු; ජාතිතො, ජාතිහෙයින්; කප්පියානි, කැපයෙත්සි.

"ඛොම" යනු ගසෙක් නම් ඒගස වැහැරෙන් වී සිවුරුද කාරණීයෙහි කාරණොපචාරව්‍යවහාරවිසින් 'ඛොම' නම් වෙයි: "කොස" නම් තිහිරිපණු යන කෘමිකොෂය. මිහිහුසින් කළ සිවුරු "කොසෙන නිබ්බත්තං– කොසෙය්‍යං" † යන තද්ධිතව්‍යවහාර විසින් උක්තයි. කප්පාස නම් කපුහුයින් වීපිළිය. "සාණ" නම් සණ වැහැරෙන් කළ සිවුරුය. යන මේ දෙක්හිදු ශබ්දප්‍රවෘත්ති ඛොමයෙහි කීනියාමැයි. 'භඞ්ග'නම් ඛොමාදි පස්හුයින් මුසුකොට වීසිවුරුය ඡෙහ් කරණප්‍රකාර විසින් ලද නම්. ගසෙක නමැ යේනම් මේ පක්‍ෂයෙහි ඛොමසේම ගත යුතු "කම්බලං" යනු මිනිස්ලොම් වල්ලොම් විනා සෙසු ලොමින් වියනලද කම්බිලය නම්.

"භඞ්ගන්නාම පඤ්චහි සුත්තෙහි මිස්සෙත්වා කතං වාකමයමෙව, ති පි වදන්ති" ‡ යනු අටුවායි.

---

+ කොසෙන, කෘමිකොෂයෙන්; නිබ්බත්තං, උපන්නේ; කොසෙය්‍යං, කොසෙය්‍ය නම්.

‡ භඞ්ගංනාම, භඞ්ගනම්; පඤ්චහි සුත්තෙහි, පස්හුයින්; මිස්සෙත්වා, මුසු කොට; කතං, කළසිවුරයි, වාකමයං එව ඉති අපි, වැහැරිමුවාම යයිද; වදන්ති, කියති.

39 දුකූලඤ්චෙව පත්තුණ්ණපට්ටං සොමාරචීනජං
ඉද්ධිජං දෙවදින්නඤ්ච තස්ස තස්සානුලොමිකං.

40 තිචීවරං පරික්ඛාරචොළං වස්සිකසාටිකා
අධිට්ඨෙ න විකප්පෙය්‍ය මුඛපුඤ්ඡනිසීදනං.

41 පච්චත්ථරණකං කණ්ඩුපච්ඡාදිමෙත්ථ තිචීවරං
න වසෙය්‍ය විනෙකාහං චාතුමාසං නිසීදනං.

---

39 දුකූලඤ්චෙව, දුහුල් පිළිද; පත්තුණ්ණපට්ටං, පත්තුණ්ණ (දෙශයෙහිවූ) පටද; සොමාරචීනජං, සොමාර (දෙශ) චීන (දෙශයෙහි උපන්) පටද; ඉද්ධිජං, (ඒහි භික්ෂූන්ට මෙන්) ඍද්ධිවශයෙන් නිර්මිත සිවුරුද; දෙවදින්නඤ්ච, (අනුරුත් මහතෙරුන්ට දෙවඟණන් සේ) දෙවියන් දුන්සිවුරුද; තස්ස තස්සානුලොමිකං, (ඛොමාදිවූ) ඒ ඒ සිවුරට අනුලොම් සිවුරුයි.

පත්තුන්නය සොමාරය චීනය යනු ඒ ඒ පිළි උපන් දෙශයන් ලදනම්.

* සාණස්සච දුකූලං හි ඉද්ධිජං දෙවදින්නකං
ඛොමාදිනං වසිට්ඨානං කොසෙය්‍යස්සානුලොමිකං

40. 41. (තිචීවරං, සඞ්ඝාටිය උත්තරාසඞ්ගය අන්තරවාසකය යන) තුන්සිවුරුද; පරික්ඛාරචොළං, පිරිකරණසාළුයද; වස්සිකසාටිකං, වැසිසළුසිවුරද; මුඛපුඤ්ඡ, මුවපිස්නාසිවුරද; නිසීදනං, නිසදුන්සිවුරද; පච්චත්ථරණකං, පසතරණසිවුරද; කණ්ඩු (පටි) ච්ඡාදිං, කස්පිළිසත්සිවුරුද (යන මේ නව සිවුරු) අධිට්ඨෙ † "ඉමං සඞ්ඝාටිං අධිට්ඨාමි" යනාදි වක්ෂ්‍යමාණ ක්‍රමයෙන් නම් ගෙන ඉටන්නේය; න විකප්පෙය්‍ය + "ඉමං සඞ්ඝාටිං විකප්පෙමි" යනාදීන් ඒ ඒ සිවුරෙහි නම් ගෙන නොවිකපන්නේයි; "ඉමං සඞ්ඝාටිං විකප්පෙමි" යනාදීන් ඒ ඒ නම් ගෙන විකපුව හොත් නොවිකැපුවා වේ. අයිරාසිවුරු තන්හි සිටි යනු විශෙෂයනැයි. ‡ "තිණ්ණං චීවරානං සමාහාරො

---

* දුකූලං හි, දුහුල්පිළිය වනාහි; සාණස්ස ච, සණවැහැරිපිළි යටද; ඉද්ධිජං දෙවදින්නකං, ඉද්ධිජදෙවදින්නක පිළිදෙක; ඛොමාදීනං, කොමුපිළිආදීන්වූද; අවසිට්ඨානං, සෙස්ස; හෙවත් පත්තුණ්ණ සොමාර, චීනපිළිවනාහි; කොසෙය්‍යස්ස, තිහිරිපිළියටද; අනුලොමිකං, අනුලොම් වේ.

† ඉමං සඞ්ඝාටිං, මේ සඟළසිවුර; අධිට්ඨාමි, ඉටමි.

× ඉමං සඞ්ඝාටිං, මේ සඟළසිවුර; විකප්පෙමි, විකපමි.

‡ තිණ්ණං චීවරානං, සිවුරුතුනක්; සමාහාරො, (සමූහයෙහියන්) එක්කොට සැලකීම; තිචීවරං, තිචීවර නමි.

තිචීවරං" යනු පමාණොපපන්නසඞ්ඝාටිආදිනමින් ඉටූ තුන්සිවුර වම නම්වූයින් ඒම කියත් මිස සංඛ්‍යාවශයෙන් යත් නවු තුන්සිවු රක් නොකිය යුතු. "පරික්ඛාරචොළං" යනු සඞ්ඝාටිආදිවිශිෂ්ටනාම යෙන් නොඉටු පශ්චිමචීවරාවසාන කළනොකළ යම් සිවුරකට රූඪි සංඥයි. "වස්සිකසාටික" යනු වැසිසාරමස හැඳ නහත්නට අනු දත් සිවුරට නමි. * "මුඛං සන්දමානලාලං පුඤ්ඡති එතෙනාති-මුඛ පුඤ්ඡනං" යනු තොලින් සිලියෙන කෙළ ඇත්තවුන් මුව පිස්නා සඳහා අනුඥාත විවරවිශෙෂයකට නමි. ¶ "නිසීදනති එතෙනා ති නිසීදනං" යනු සඟුන් අතුට හිඳිනට අනුදත් සිවුරකට නමි. "ප ච්චත්ථරණකං" යනු සඟසතු හැඳපුටුවෙහි වෙරපැහැරීමෙන් අව දනා ඇවතින් මුදනු සඳහා අනුඥාත විවරවිශෙෂයකට නමි. ‡ "කණ්ඩුම්පටිච්ඡාදෙතීති කණ්ඩුපටිච්ඡාදි" යනු කණ්ඩුයාදි රොග ඇති සඟුන් සඳහා අනුදත් සිවුරකට නම් යනු වනවිනිස්සනයයි.

එත්‍ථ, මේ නවසිවුරු අතුරෙහි; තිචීවරං විනා, (සඞ්ඝාටි ආදි නමින් ඉටූ) තුන්සිවුරෙන් වියෝව; (අත්පසින් දුරුව) එකාහං, එක දවසක්හුදු; න වසෙය්‍ය, නොවසන්නේය; නිසීදනං විනා, නිසීදන (නාමයෙන් ඉටූ) නිසඳුන්සිවුරෙන් වියෝව; චාතුමාසං, සාරමසක්: (න වසෙය්‍ය) නොවසන්නේයි.

සමුද්‍රයාගේ එකදෙශයක්හුදු සමුද්‍ර නම් වන්නා සේ ඉටූ තුන්සිවුරෙන් එකක්හුදු තිචීවර නම් වේ.

+ එකාහම්පි විනා භික්ඛු න වසෙය්‍ය තිචීවරං
න වසෙය්‍ය තථාධිට්ඨා චතුමාසං නිසීදනං. යනුවනවිනිසයි

† "අධිට්ඨාය වලඤ්ජියමානං නිසීදනං තථා විනා චතුමාසං න වසෙය්‍ය" යි යොදනු.

---

* සන්දමානලාලං, වැගිරෙන කෙළ ඇත්තාවූ; මුඛං, මුඛය. එතෙන, මෙයින්; පුඤ්ඡතීති, පිසිනුයි; මුඛපුඤ්ඡනං, මුඛපුඤ්ඡන නම්;

¶ එත්‍ථ, මෙහි; නිසීදන්ති ඉති, හිඳිත්නුයි; නිසීදනං, නිසීදන නම්.

‡ කණ්ඩුං, කැස්, පටිච්ඡාදෙතීති, පිළිසන් කෙරේනුයි; කණ්ඩුපටිච්ඡාදි, කණ්ඩුපටිච්ඡාදි නම්.

+ භික්ඛු, මහණතෙම; එකාහං අපි, එක්දවසක්හුදු; තිචීවරං, විනා, තුන්සිවුරෙන් තොරව; න වසෙය්‍ය, නොවසන්නේය;

† තථා, එපරිද්දෙන්; අධිට්ඨාය, ඉටා පරිභොග කරනු ලබන්නාවූ; නිසීදනං විනා, නිසීදනයෙන් තුරන්ව: චතුමාසං, සාරමසක්; න වසෙය්‍ය, නොවසන්නේය.

42 ඉමං සඞ්ඝාටිමධිට්ඨාමි සඞ්ඝාටිම්වාධිට්ඨයෙ
අහත්ථපාසමෙතනති සෙසෙසුපි අයං නයො
43 අධිට්ඨහන්තො සඞ්ඝාටිප්පභුතිං පුබ්බචීවරං
පච්චුද්ධරිත්වාධිට්ඨෙය්‍ය පත්තාධිට්ඨහනෙ තථා.
44 එතං ඉමං ච සඞ්ඝාටිං සංසෙ පච්චුද්ධරාමිති
එවං සබ්බානි නාමෙන වත්වා පච්චුද්ධරෙ විදූ.

---

42. සඞ්ඝාටිං, (අත්පස තුබූ රඳ කප්බිඳු එබූ) සඟළසිවුරු * "ඉමං සඞ්ඝාටිං අධිට්ඨාමි ඉති "ඉමං සඞ්ඝාටිං අධිට්ඨාමි"යි; අධිට්ඨයෙ, ඉටාගන්නේය; අහත්ථපාසං, (දෙරියන් වියත්) අත්පසින් දුරුව තුබූ සඞ්ඝාටිය; එතනති, තුබූතැන් සලකා; † එතං සඞ්ඝාටිං අධිට්ඨාමි යි ඉටන්නේය. සෙසෙසු පි, (උත්තරාසඞ්ග අන්තරවාසකාදි) සෙසු සිවුරෙහිදු; අයං නයො, මෙම නයයි. † (තිචීවරං අධිට්ඨහන්තෙන රජිත්වා කප්පබින්දුං දත්වා පමාණයුත්තමෙව අධිට්ඨාතබ්බං, යනු අටුවායි.)

43. අධිට්ඨහන්තො, (අයලින් උපන් සිවුරු) ඉටන මහණ; සඞ්ඝාටිප්පභුතිං, සඟළ ආදිවූ; පුබ්බචීවරං, (ඉටා වැළඳ ගත්) පරණ සිවුර; පච්චුද්ධරිත්වා, පළමුකොට පසුදුරාව, අධිට්ඨෙය්‍ය, පසුව ඉටන්නේයි; (තිචීවර වස්සිකසාටිකා නිසීදන කණ්ඩුප්පටිච්ඡාදි යන මේ සසිවුරෙහි එකෙකි සිවුරෙහි එකක් එකක්ම ඉටා වැළඳ ගනුත් මුත් දෙකක් දෙකක් ඉටා වැළඳ ගැන්ම නොලැබෙන බැවින් එබඳු අනික් අනික් සිවුරක් ඉටනු කැමැත්තහු විසින් ඉටූ පරණ සිවුරු පසුදුරා අයලින් ලද සිවුරු ඉටා වැළඳගත යුතුය යනු අභිප්‍රායයි.) පත්තාධිට්ඨහනෙ, පාත්‍ර ඉටීමෙහිදු; තථා, (දෙපාත්‍රයක් එකවිට නොවටනා බැවින් අධිට්ඨානක්‍රම) එසේමැයි.

44. විදූ, විනය දන්නා මහණ; එතං සඞ්ඝාටිං පච්චුද්ධරාමි ති, (අත්පසින් දුරු වූව) "එතං සඞ්ඝාටිං පච්චුද්ධරාමි"යි; වා, නොහොත් අත්පස වූව, ඉමං සඞ්ඝාටිං පච්චුද්ධරාමීති, ඉමං සඞ්ඝාටිං පච්චුද්ධරාමියි; සංසෙ. කියන්නේය; එවං, මෙසේම; සබ්බානි, (උත්තරා සඟාදි

---

* ඉමං සඞ්ඝාටිං, මේ සඟළසිවුර; අධිට්ඨාමි, ඉටමි.

† එතං සඞ්ඝාටිං, තෙල සඟළසිවුර; අධිට්ඨාමි, ඉටමි.

† තිචීවරං, තුන්සිවුර; අධිට්ඨහන්තෙන, ඉටන්නහු විසින්; රජිත්වා, පඬු පොවා; කප්පබින්දුං දත්වා, කප්බින්දු දී; පමාණයුත්තං එව, ප්‍රමාණයුක්තවම; අධිට්ඨාතබ්බං, අධිෂ්ඨාන කළයුතු.

45 සඞ්ඝාටි පච්ඡිමන්තේන දීඝසො මුට්ඨිපඤ්චකා.
උත්තමන්තේන සුගත චීවරූනාපි වට්ටති
මුට්ඨිත්තිකඤ්ච තිරියං තථා එකංසිකස්සපි.

46 අන්තරවාසකො වාපි දීඝසො මුට්ඨිපඤ්චකො
අඩ්ඪතෙය්‍යො විහත්ථො වා තිරියන්තේන වට්ටති.

---

පාත්‍රාවසාන ) සියල්ලත්, නාමෙන; ( උන් උන්ගේ) නාමින්; වුත්තා, කියා, පච්චුද්ධරෙ, පසුදුරන්නේයි.

45. සඞ්ඝාටි, සඞ්ඝාටි තොමෝ; පච්ඡිමන්තේන, යටත් පිරිසෙසින්; දීඝසො, දිගින්; මුට්ඨිපඤ්චකා; මිට්පස්රියන් ඇති; උත්තමන්තේන, උතුම්පිරිසෙයින්; සුගතචීවරූනාපි, සුගතචීවරයට උනුවීද; වට්ටති, වටී; තිරියං, සරස හෙවත් පුලුලෙහි; මුට්ඨිත්තිකඤ්ච, මිට්තුන්රියනක් පමණද සුගතචීවරයට උනුපමණද; (වට්ටති) වටී; එකංසිකස්සපි, උත්තරාසඞ්ගචීවරයාගේද; තථා, (දිගඟුලුලපමණ) එසේ මැයි. *"එකස්මිං අංසෙ නියුත්තා එකංසිකා" සුගතචීවරූනාපි යන්නෙහි අපිශබ්දය සම්භාවනායෙහි වැටේ. උත්කෘෂ්ටතායෙන් ඒසුගතචීවරය පමණකුදු වටී. ඉන් උනුව වඩාතවත්නැති යන අර්ථයි. අන්තවය සඞ්ගීනයෙන් උත්තම මධ්‍යයෙහි පොහොනා රිසියෙනපමණක් ගතයුතු යනු දක්වූවෝ වෙත්.

46. අන්තරවාසකොවාපි, අන්තරවාසකයද; දීඝසො, දිගින්; මුට්ඨිපඤ්චකො, මිට්පස්රියන් ඇත්තේ; තිරියන්තේන, සරසින්; අඩ්ඪතෙය්‍යො, දෙරියන් වියතක් ඇත්තේ හෝ; විහත්ථොවා, දෙරියනක් ඇත්තේ හෝ; වට්ටති, ( යටත් පිරිසෙයින්) වටී. උඩත් පිරිසෙයින් සුගතචීවරයට උනුවූයේද වටී. † අඩ්ඪතෙය්‍යො අඩ්ඪො උත්තරපදලොපෙන සො තෙය්‍යො තතියො යස්ස සො අඩ්ඪතෙය්‍යො.

---

* එකස්මිං අංසෙ, එක් අංසයෙක්හි; නියුත්තං, නියුක්තවූ චීවරයතෙම; එකංසිකං, එකංසිකනම්.

† අඩ්ඪතෙය්‍යො, අඩරියන හෙවත් වියත; අඩ්ඪො; අඩ්ඪනම් උත්තර පදලොපෙන, උත්තරපදලොපයෙන් සිඬයි. සො ඒ අඩරියනතෙම, තෙය්‍යො තෙය්‍යො යි සේයි; තතියො, තුන්වෙනිවූයේ; යස්ස යම්සංඛ්‍යාවකටද; සො, හෙතෙම; අඩ්ඪතෙය්‍යො, අඩ්ඪතෙය්‍ය නම්වේ.

47 නිසීදනස්ස දීඝෙන විදත්ථි වෙ විසාලතො
දියඩ්ඪං දසා විදත්ථි සුගතස්ස විදත්ථියා.

48 කණ්ඩුපටිච්ඡාදිකාස්ස තිරියං වෙ විදත්ථියො
දීඝන්තතො චතස්සොව සුගතස්ස විදත්ථියා.

---

* "තිචීවරං අධිට්ඨහන්තෙන රජිත්වා කප්පබින්දුං දත්වා පමාණයුත්තමෙව අධිට්ඨාතබ්බං තස්ස පමාණං උක්කට්ඨපරිච්ඡෙදෙන සුගතචීවරතො ඌනකං වට්ටති ලාමක පරිච්ඡෙදෙන සඞ්ඝාටියා උත්තරාසඞ්ගස්සච දීඝසො මුට්ඨිපඤ්චකං තිරියං මුට්ඨිත්තිකප්පමාණං වට්ටති අන්තරවාසකො දීඝසො මුට්ඨිපඤ්චකො තිරියං විහත්ථොපි වට්ටති පාරුපනෙනාපි හි සක්කා නාභිං පටිච්ඡාදෙතුන්ති. මුත්තප්පමාණතො පන අතිරෙකඤ්ච ඌනකඤ්ච පරික්ඛාරචොළන්ති අධිට්ඨාතබ්බං. යනු අටුවායි.

47 සුගතස්ස විදත්ථියා, සුගත්වියතින්; නිසීදනස්ස, නිසීදන චීවරයාගේ; දීඝෙන, දිගින්; වෙ විදත්ථි, දෙවියතක; විසාලතො, පුළුලින්; දියඩ්ඪං, යෙලවියතෙක; දසා, දහය; විදත්ථි, වියතෙකි.

48 සුගතස්ස විදත්ථියා එව, සුගත් වියතින්ම; කණ්ඩුපටිච්ඡාදිකාස්ස, කණ්ඩුපටිච්ඡාදිචීවරයාගේ; තිරියං, සරස, වෙ විදත්ථියො, දෙවියතෙක; දීඝන්තතො, දිගින්; චතස්සො, සතරවියතෙකි.

---

* තිචීවරං, තුන්සිවුර; අධිට්ඨහන්තෙන, ඉටන්නහු විසින්; රජිත්වා, පඬු පොවා; කප්පබින්දුං දත්වා, කප්බින්දු තබා; පමාණයුත්තං එව, නියමිත දිගපුළුලින් යුක්තවූයේම. අධිට්ඨාතබ්බං, අධිෂ්ඨාන කළයුතු. තස්ස, ඒ තුන්සිවුරෙහි; පමාණං, ප්‍රමාණය:- උක්කට්ඨ පරිච්ඡෙදෙන, උඩත්පිරිසෙයින්; සුගතචීවරතො, සුගත්සිවුරෙන් ඌනකං, අඩුවූයේ; වට්ටති, වටී. ලාමකපරිච්ඡෙදෙන, යටත්පිරි සෙයින්; සංඝාටියා, සඟළසිවුරටද; උත්තරාසඞ්ගස්ස ච, තනිපට සිවුරටද; දීඝසො, දිගින්; මුට්ඨිපඤ්චකං, මිටිපස්රියනක්ද; තිරියං පළලින්; මුට්ඨිත්තිකං, මිටිතුන්රියනක්ද; පමාණං, ප්‍රමාණය; වට්ටති, වටී. අන්තරවාසකො, අඳනයතෙම; දීඝසො, දිගින්; මුට්ඨි පඤ්චකො, මිටිපස්රියන් ඇත්තේ; තිරියං, පළලින්; විහත්ථොපි, දෙරියන් ඇත්තේද; වට්ටති, වටී. පාරුපනෙනාපි හි, පොරෝණ යෙන්ද; නාභිං, නාභිය; පටිච්ඡාදෙතුං, වසන්ට; සක්කා ඉති, හැකි හෙයිනි. මුත්තප්පමාණතො පන, කියනලද, ප්‍රමාණයෙන් වනාහි; අතිරෙකං ච, අධිකවූයේද; ඌනකං ච, අඩුවූයේද; පරික්ඛාර චොළන්ති, පරික්ඛාරචොළයයි; අධිට්ඨාතබ්බං, අධිෂ්ඨාන කළයුතුයි.

49 වස්සිකසාටිකායාපි දීඝසො ඡ විදත්ථියො
• තිරියං අඩ්ඪතෙය්‍යාව සුගතස්ස විදත්ථියා.

50 ඵාලෙච්ඡෙදනපාචිත්ති කරොන්තස්ස තදුත්තරිං
පච්චත්ථරමුඛචොළා ආකංඛිතප්පමාණිකා.

51 පරික්ඛාරචොළෙ ගණනා පමාණං වා න දීපිතං
තථා වත්වා අධිට්ඨෙය්‍ය ථවිකාදිං විකප්පියං.

52 අගතාගතකප්පානං සඞ්ඝාටි විගුණා සියා
එකච්චියුත්තරාසඞ්ගො තථා අන්තරවාසකො.

---

49 සුගතස්ස විදත්ථියා එව, සුගත් වියතින්ම; වස්සිකසාටිකායාපි, වැසිසළුසිවුරයාගේද; දීඝසො, දිගින්; ඡ විදත්ථියො, සවියතෙක; තිරියං, සරස; අඩ්ඪතෙය්‍යා, අඩුතුන් වියතෙකි. අඩ්ඪං තෙය්‍යං තතියං යස්සා සා අඩ්ඪතෙය්‍යා, අඩ්ඪතියා යු තැනි. මෙහි සුගත්වියත වඩුවියතින් තුන් වියතෙකි.

50 ඵාල, වේ සඞ්ඝාටිආදිසිවුරෙහි; තදුත්තරිං, ඒ ඒ සිවුරට කී පමණින් වඩා; කරොන්තස්ස, කරන්නාහට; ඡෙදනපාචිත්ති, ( අධික තැන් ) කපා දෙසිය යුතු පචිති වේ; පච්චත්ථරමුඛචොළා, පච්චත්ථරණමුඛපුඤ්ඡනචොළය යන මොහු; ආකඞ්ඛිතපමාණිකා, කැමතිවනලද පමණඇත්තාහුයි.

51 පරික්ඛාරචොළෙ, පිරිකරසළුය සිවුරෙහි; ගණනං, එකක දෙකක යන ගණනක් හෝ; පමාණං වා, ( දිග පුළුල ) පමණක් හෝ; න දීපිතං, ( පෙළඅටුවාහෙයි ) නොදක්වනලද. ථවිකාදිං, පාත්‍රපසි පොත්පසි ආදිවූ; විකප්පියං, විකපුන් පොහොණ, ( සිවුරු ) තථා වත්වා, “ඉමං චීවරං පරික්ඛාරචොළං අධිට්ඨාමි” යනාදි ප්‍රකාරයෙන් කියා; අධිට්ඨෙය්‍ය; ඉටන්නේයි.

52 අගතාගතකප්පානං, අලුත් අලුත්වන් වස්ත්‍රයන්සම්බන්ධවූ; සඞ්ඝාටි, සඞ්ඝාටිතොමෝ; විගුණා සියා, දෙපට වන්නීය; උත්තරාසඞ්ගො, උත්තරාසඞ්ගය; එකච්චි, එකපට වන්නේය; අන්තරවාසකො, අන්තරවාසකයද; තථා, එසේම; එකපට වන්නේයි;
* අහතතො කිඤ්චි ඌනානි ආහතකප්පානි තෙසං.

---

* අහතතො, අලුත්වස්ත්‍රයෙන්; කිඤ්චි, මඳක්; ඌනානි, උනුවූවාහු; අහතකප්පානි, අහතකප්ප නම් වෙති. තෙසං, ඔවුන් සම්බන්ධවූ.

53 උතුද්ධටානං දුස්සානං සඞ්ඝාටි ච චතුග්ගුණා
භවෙය්‍යුං දිගුණා සෙසා පංසුකූලෙ යථාරුචි.

54 තීසු ද්වෙ වා පි එකං වා ඡින්දිතබ්බං පහොති යං
සබ්බෙසු අප්පහොන්තෙසු අන්වාධිමාදියෙය්‍ය වා
අච්ඡින්නඤ්ච අනාදින්නං න ධාරෙය්‍ය තිචීවරං.

55 ගාමෙ නිවෙසනෙ උද්දොසිත පාසාද හම්මියෙ
නාවට්ටමාලආරාමෙ සත්ථඛෙත්තඛලෙ දුමෙ.

56 අජ්ඣොකාසෙ විහාරෙ වා නික්ඛිපිත්වා තිචීවරං
භික්ඛුසම්මුතියාඤ්ඤත්‍ර විප්පවත්ථුං න ලබ්භති.

---

53 උතුද්ධටානං, බොහෝකල් හැඳ හරනලද; දුස්සානං, වස්ත්‍රයන් සම්බන්ධිවූ; සඞ්ඝාටි, සඞ්ඝාටිතොමෝ; චතුග්ගුණා, ( සිව් ) සතරපට වන්නීය; සෙසා, උත්තරාසඞ්ගඅන්තරවාසකයෝ; දිගුණා භවෙය්‍යුං, දෙපටවන්නාහ; පංසුකූලෙ, සුසානාදියෙහි පතිතප්ලොතිකා චීවර යෙහි; යථාරුචි, කැමති පමණෙකි.

54 තීසු; තුන්සිවුරෙහි; ද්වෙවාපි; දෙසිවුරෙක් හෝ; ( කපාකට යුත්තේයි. ) යං, ( පස්අතු සත්අතු ආදි විසින් කපාකරනලද ) යම් සිවුරෙක්; පහොති, ( පශ්චිම ප්‍රමාණයට ) සෑහේද; ( තං ) ඡින්දිතබ්බං, ඒ කපා කටයුත්තේය; සබ්බෙසු, තුන් සිවුරම; අප්පහොන්තෙසු, ( කපා කරන්නට ) නොසෑහෙන කල්හි; අන්වාධිං වා, අනුවා පතුරු වී නම්; ආදියෙය්‍ය, ඇලවන්නේය;(අනුවාපත් නම් උවන් බහගත් සිවුරෙහි අසමැද දික් ලුහුඬු කොට අස ඇලවන ආගන්තුක පති.) අච්ඡින්නඤ්ච, ( උක්තක්‍රමයෙන් ) නොකැපූද; අනාදින්නං, අනුවා පත්නොඇල්වූද; තිචීවරං තුන් සිවුර; න ධාරෙය්‍ය, වැළඳ නොගන්නේයි. (සඞ්ඝාටිආදි නමින් ඉටා වැළඳගන්නාහට දුකුලා වෙයි යුතැයි.)

55 56 ගාමෙ, ඇතුළු ගම හෝ; නිවෙසනෙ, වටරැක් ඇ ගෙහි හෝ; උද්දොසිත, බඩුහල හෝ; පාසාදෙ, දික්පහයෙහි හෝ; හම්මියෙ, සඳලුඹුලුයෙහි හෝ; නාවා, නැව හෝ; අට්ට, දොරටුහල හෝ, මාල, කැණිමඬුලු එකක්ඇති සිවුරැස්සුලු පායෙහි හෝ; ආරාමෙ, පුෂ්පාරාමඵලාරාමයෙහි හෝ; සත්ථ, ජඞ්ඝසත්ථය සකටසත්ථය යන දෙවැදෑරුම් සත්ථාමුල හෝ; ඛෙත්ත, කුඹුරෙහි හෝ; ඛලෙ, ඛලපිට හෝ; දුමෙ, රුක්මුල හෝ; අජ්ඣොකාසෙ ( [illegible] යන ) අබවස හෝ; විහාරෙවා, වෙහෙර හෝ; තිචීවරං, තුන්සිවුර; නික්ඛිපිත්වා, තබා; භික්ඛුසම්මුතියාඤ්ඤත්‍ර, භික්ෂූන් විසින් දෙන ( අවිප්‍රවාස ) සම්මුතිය විනා; විප්පවත්ථුං ( එකරැයකුදු ; වියෝව ඉඳීම; ) න ලබ්භති, නොවටී.

57 රෝගවස්සපරියන්තා කණ්ඩුවජ්ජාදිකසාටිකා
තතො පරං විකප්පෙය්‍ය සෙසා අපරියන්තිකා.

58 පච්චත්ථරපරික්ඛාරමුඛපුඤ්ඡනචොළකං
සදසමප්‍ය රත්ත නාදින්න කප්පං ලබ්භං නිසීදනං *

59 අදසා රඤ්ජිතා යෙව සෙස චීවරපඤ්චකා
කප්පතාදින්නකප්පං ච සදසං ච නිසීදනං.

---

හම්මිය මතුයෙහි අහසි අඟුණු කොට සාල කරවඩුම්බුගේ යනු විනය සන්‍යාසි— මෙහි එකාසනස්නෙකුද්‍ර විහාරනම්. නිසිච්ඡි ඇති සිහෝතු ප්‍රචියොචිය † නම්වෙයි යනු මෙහි සන්‍ය බැවින් බඩසිංහා දිනන්සිම තුබුසිවුර අත්පස්හි වූවද නිසගිම වේ.

57 කණ්ඩුවජ්ජාදි කසාටිකා, කණ්ඩුප්පටිච්ඡාදි උදකසාටිකා දෙදෙන; රෝගවස්ස පරියන්තා, රෝගහා වස්සානකාලය කෙළවර කොට ඇත්තාහු; තතො පරං, ඒ රෝගවස්සාන කාලයෙන් මත්තෙහි: විකප්පෙය්‍ය, විකප්පත් කෙරේය; සෙසා, සෙසු චීවරයෝ; අපරියන්තිකා, වැළඳගැන්මෙහි කාලපරියන්තයක් නැත්තාහුයි.

58 පච්චත්ථර, පසතරණද; පරික්ඛාර, පිරිකරසොළයද; මුඛපුඤ්ඡනචොළකං, මුවපිස්නා සිවුරද; නිසීදනං, නිසදුන්සිවුරද; සදසම්පි, දහ ඇත්තේද නැත්තේද; අරත්තම්පි, නොරඳුයේද රඳුයේද; අනාදින්නකප්පම්පි, කප්බිඳුනොඑබූයේද එබූයේද; ලබ්භන්ති, වටී. *පච්චත්ථරණපරික්ඛාර මුඛපුඤ්ඡනචොළකම්පන නීලකම්පි පීතකම්පි ලොහිතකම්පි වට්ටන්ති එව ච එවරූපං නිවාසෙතුං පාරුපිතුං වා න වට්ටති. යනු මෙහි ටීකායි.

59 සෙසචීවරපඤ්චකං, අනික් සිවුරුපස; අදසා (යෙව), දහ නැත්තේම; රඤ්ජිතංයෙව, රඳුයේම; ආදින්නකප්පංච, කප්බිඳු එබූයේම; කප්පන්ති, වටී; නිසීදනං, නිසදුන් සිවුරද; සදසංච, දහ සහිතවූයේම ( වටී ) නිසදුන්සිවුර දහ නැත නොවටනා බැවින් සදසංච, යි අවධාරණ කළෝ.

---

* පච්චත්ථරණ, පසතරණද; පරික්ඛාර (චොළක,) පිරිකර සොළඳද; මුඛපුඤ්ඡනචොළකා පන, මුවපිස්නා සිවුරද වනාහි; නීලකම්පි, නිල්වන්වූයේද; පීතකම්පි, කසාවන්වූයේද; ලොහිතකම්පි, ලේවන්වූයේද; වට්ටන්ති, එව, වටීමය; එවරූපං මෙබඳු සිවුර; නිවාසෙතුං වා, හඳින්ට හෝ; පාරුපිතුං වා, පොරවන්ට හෝ; න වට්ටති, නොවටී. † මෙය විමසියතු

60 අනධිට්ඨිතං නිස්සට්ඨං කප්පෙත්වා පරිභුඤ්ජයෙ
හත්ථදීඝං තතොපඤ්චවිත්ථාරඤ්ච විකප්පියං.

61 තිචීවරස්ස භික්ඛුස්ස සබ්බමෙතං පකාසිතං
පරික්ඛාරචොළියො සබ්බං තථා වත්වා අධිට්ඨති.

62 අච්ඡෙදවිස්සජ්ජන ගාහවිබ්භමා
පච්චුද්ධරො මරණං ලිංගසික්ඛා
සබ්බස්සධිට්ඨානවියොගකාරකා
විනිවිද්ධඡිද්දඤ්ච තිචීවරස්ස.

---

60 අනධිට්ඨිතං ( තිචීවරාදිවිසින් ) නොඉටනලද; අනිස්සට්ඨං, අන්‍යනට නොදෙනලද; සිවුර (වි) කප්පෙත්වා, විකපා; පරිභුඤ්ජෙය, වැළඳගන්නේය; හත්ථදීඝං, ( වඩු ) රියනින් දිගඇති; තතො, එරියනින්; උපඩ්ඪවිත්ථාරඤ්ච, භාගයක් පළලදඇති; ( පශ්චිමචීවරයා විකප්පියං, විකපිය යුත්තේයි.

61 එතංසබ්බං, ( අධිට්ඨානය ප්‍රමාණය පරිහරණය යන ) ඒ හැමවිධානය; තිචීවරස්ස භික්ඛුස්ස, විනයතෙචීවරිකවූ භික්ෂුහට; පකාසිතං ( පරිභොගවිසින් ) කියනලද; පරික්ඛාරචොළියො, පිරිකර සොළය ඇති ( මහණ; ) සබ්බං, ( තිචීවරාදි ) සියලු සිවුරු; තථා වත්වා, (ඉමං පරික්ඛාරචොළං අධිට්ඨාමි) යන ක්‍රමයෙන් කියා; අධිට්ඨාති, ඉටා; "පරික්ඛාරචොළම්පස්ස අත්ථි තත්ථ වා නියුත්තොති පරික්ඛාරචොළියො," * මෙහි තෙචීවරිකෝත්තම විනයෙහි විහිත තුන් සිවුරු එකක්කොට තුන්සිවුරුගන්නේ විනය තෙචීවරික නම්. ධුතාඞ්ග තෙචීවරිකයා හටද තුන්සිවුරු විධි මෙමතෙක්ම බැවින් භෙද මෙයින් ගැනේ·

62 අච්ඡෙද. පැහැරගැනීමය; විස්සජ්ජන, අනිකෙකුට දීමය; ගාහ, විශ්වාස ග්‍රහය; විබ්භමා, ගිහිවීමය ( යන මොහුද ) පච්චුද්ධරො, පසුදිරීමය; මරණං, කාලක්‍රියාය; ලිංග, ලිඞ්ග ( පරිවර්තන )ය; සික්ඛා සිකපස් විකීමය (යන මොහුද) සබ්බස්ස, සියලු සිවුරෙහි; අධිට්ඨාන වියොග කාරකා, ඉටන් වියොග කරන්නාහ. විනිවිද්ධ ඡිද්දඤ්ච, විනිවිදි සිදුරු වනාහි; තිචීවරස්ස, තිචීවරයාගේ; (අධිට්ඨානවියොගකාරකා) ඉටන්වියෝග කරන්නේයි. හීනායාවත්තනෙනාත, සිකපස්නොවිකාම ගිහිවනුයෙන් එහි උසාහෙළන බැව් ගෙන කීහු වෙත්. යනු විනයසන්නයයි. දිගපුළුල එකනුයකුදුනැති සුලැඟිලිනිය පිටුසා සිදුරු "විනිවිද්ධඡිද්ද" නම්.

---

* පරික්ඛාරචොළං පිරිකරසොළය; අස්ස, මොහුට; අත්ථි වා, ඇත්තේනුයි හෝ; තත්ථ, ඒ පිරිකරසොළයෙහි; නියුත්තොති වා, යෙදුණේනුයි හෝ; පරික්ඛාරචොළියො, පරික්ඛාරචොළිය නම්.

63 කුසවාකඵලකචීරානි කම්බලං කෙසවාලජං
ඵුල්ලවච්චයං ධාරයතො ලූකපක්ඛාජිනක්ඛිපෙ
කදලෙරකක්කදුස්සෙ පොත්ථකෙ වාපි දුක්කටං.

64 සබ්බනීලකමඤ්ජෙට්ඨපීතලොහිතකණ්හකෙ
මහාරඞ්ගමහානාමරත්තෙසුවාපි තිරිටකෙ.

65 අච්ඡින්නදීඝදසකෙ ඵලපුප්ඵදසෙ තථා
කඤ්චුකෙ වෙඨනෙ සබ්බං ලභතාච්ඡින්නචීවරො 'ති

---

63 කුස, ශීතණ (ගොතා කළ) වාක; වැහිරි (ගොතා කළ) ඵලක, පුවරු (ගොතා කළ) චීරානි, සිවුරුද; කෙසවාලජං, මිනිස්කෙසෙයෙන් හෝ අස්වලින් සෙමරවලින් හෝ වූ; කම්බලං, පලස්ද; උලූකපක්ඛ, මහමුහුණුපියා (ගොතා කළ සිවුරු හා) අජිනක්ඛිපෙ, අඳුන්දිවිසම්ද, ධාරයතො, හඳනාපොරොණාහට; ඵුල්ලවච්චයං, තුලැසි (ඇවැත්) වේ;

මෙහි චීරශබ්දය චීවරපර්යායයි මේ කුසාදිගොතා කළ සිවුරුහිම වැටේ. චීවරසබන්ධකයෙහි කුසචීර- වාකචීර- ඵලකචීර- කෙසකම්බලවාලකම්බල-උලූකපක්ඛ-අජිනක්ඛිප-අක්කනාලය යනාදිවයෙහිම තුලැසි පැණවූ බැවින් මෙහි නොකී වැහිරිආදීන් වරාදඹු ගොතා කළ අක්කනාලයෙහි දු තුලැසි වෙසි දතයුතු.

කදලි, කෙසෙල්වැහැරින් කළ; එරක; එරුහුයෙන් කළ; අක්ක, වරාහුයෙන් කළ; දුස්ස, පිළියෙහි; පොත්ථකෙ වාපි, කැහිරිකඩයසි කිංනලද තියදවල්ලෙහිද; දුක්කටං, දුකුලා වේ.

64. 65. සබ්බනීලක, හැම නිල්වූ; මඤ්ජෙට්ඨ, (හැම) මදටවන් වූ; පීත, (හැම) රත්වන්වූ; ලොහිත, (හැම) ලේවන්වූ; කණ්හකෙ (හැම) කළුවූ (පිළියෙහි) ද; මහාරඞ්ග, රත්වාංගේ පිට පැහැසේ මහානාම, තුනුපියුම්පෙති පැහැසේ; රත්තෙසුවාපි රත්වූ පිළියෙහිද; තිරිටකෙ, ගිරිපුඹුලුයෙහිද; අච්ඡින්න, නොසුන්දහඇති, දීඝදසකෙ (මෑදින් කැපූ) දික්දහ ඇති (පිළියෙහිද) ඵල; ඵල (සේ ගෙතුදස) ඇති; පුප්ඵදසෙ (කැන් කැන්කොට බැන්ද සින්ද පුප්ඵාදි කළ) මල්දහ ඇති (පිළියෙහිද) කඤ්චුකෙ, අඟියෙහිද; වෙඨනෙ, හිස් වෙළුයෙහිද; තථා, එසේම (දුකුලා වේ) අච්ඡින්නචීවරො (නග්න කොට සොරුන් විසින්) පැහැර ගත් සිවුරු ඇති මහණ; සබ්බං, (කුසචීරාදි) සියලු (අකැප) සිවුරු; ලභති,

66 මූලක්ඛන්ධතචපත්තඵලපුප්ඵප්පභෙදතො
රජනා ඡප්පකාරානි අනුඤ්ඤාතානි සත්ථුනා.

67 මූලෙ හලිද්දිං ඛන්ධෙ ච මඤ්ජෙට්ඨං, තුඞ්ගහාරකෙ
අල්ලිං නිල්ලිඤ්ච පත්තෙසු තචෙ ලොද්දඤ්ච කණ්ඩුලං
කුසුම්භං කිංසුකං පුප්ඵෙ සබ්බං ලබ්භං විවජ්ජියා 'ති.

---

**පත්තාචා 'ති.**

68 අයොපත්තො මත්තිපත්තො ජාතියා කප්පියා දුවෙ
උක්කට්ඨො මජ්ඣිමො චෙව ඔමකො ච පමාණතො.

---

(හඳනට් පොරෝණාව) ලැබේ. එබැවින් ලිඟිනියගු විසින් මිහි යම්ක් ලද එයින් ගිරිඔතප් රකෝපැසුලු කැපසිවුරු ලද කල ඒ ඉවසා මේ අකැපසිවුරු හැරිය යුතු; පොත්ථකොති, වාකමයචීරං යනු අඬනු තනාර අටුවාය. සීසවෙඨන නම් හිස සිසාලපට යි.

**රජනානිචාති.**

රජනානි ච යන්නෙහි කැපඅකැපරජන් නම්.

66 මූලං, මුල්ය; ඛන්ධ, කඳය; තච, සුඹුලුය; පත්ත, පත්‍රය; ඵල, ඵලය; පුප්ඵ, මල්ය (යනමොවුන්ගේ) පභෙදතො, ප්‍රභෙදවියින් ඡප්පකාරානි, සවැදෑරුම්වූ; රජනා, රජන්හු; සත්ථුනා, සර්වඥයන් විසින් අනුඤ්ඤාතානි, අනුදන්නාලදහු 'රජ්ජතෙ තෙනාති රජනං' යි මූලාදිද්‍රව්‍යයම කියනු.

67 මූලෙ, මුල් (රජන්) හි; හලිද්දිං, කසාද; ඛන්ධෙ, කඳ (රජන්) හි; මඤ්ජෙට්ඨං, මදටද; හෙවත් පතංගිද; තුඞ්ගහාරකෙ, ඊහොල් හරද; පත්තෙසු, පත් (රජන්) හී; අල්ලිං, සිහින් කාසාකොළද; නිල්ලිඤ්ච, බෙරැකොළද; තචෙ, සුඹුලු (රජන්) හි; ලොද්දඤ්ච, ලොත්සුඹුලුද; කණ්ඩුලං, කඩොල් සුඹුලුද; පුප්ඵෙ, මල් (රජන්) හි; කුසුම්භං, වණුක්මල්ද; කිංසුකං කැහැලමල්ද; විවජ්ජිය, හැර; සබ්බං (යථාක්‍රමයෙන් සෙසු මුල්රජන් කඳරජන් ආදිවූ) සියලු රජන්; ලබ්භං, වටී; ඵලරජන්හී අකැප දෙයක් නැති.

**පත්තාචා 'ති**

පත්තා ච, යන්නෙහි කැපඅකැපපාත්‍ර නම්.

68 අයොපත්තො, යපාත්‍රය; මත්තිපත්තො, මැටිපාත්‍රය යන; දුවෙ, දෙපාත්‍රයෝ; ජාතියා, ජාතීනෙයින්; කප්පියා කැපයෝයි;

69 උක්කට්ඨො මාගධනාළිවියතණ්ඩුලසාධිතං
ගණ්හාති ඔදනං සූපං බ්‍යඤ්ජනඤ්ච තදූපියං.

70 මජ්ඣිමො තස්සූ පඩ්ඪො. ච තතො පඩ්ඪො ච ඔමකො
උක්කට්ඨතො ච උක්කට්ඨො අපත්තො ඔමකොමකො.

71 අතිරෙකපත්තො ධාරෙය්‍යො දසාහපරමං සකො
කප්පො නිස්සග්ගියො හොති තස්මිං කාලෙ තිනාමිතෙ.

---

උක්කට්ඨො, උත්කෘෂ්ට (පාත්‍ර) යද, මජ්ඣිමො ච, මධ්‍යම (පාත්‍ර) යද; ඔමකො ච, ලාමක (පාත්‍ර) යදැයි; පමාණතො, ප්‍රමාණය හයින්; තුන් පාත්‍ර කෙණෙකි.

69 උක්කට්ඨො (එහි) උත්කෘෂ්ට පාත්‍රය; මාගධනාළි (අටපත ගන්නා) මගධනැළියෙන්; වියතණ්ඩුල, දෙනැළියක් සාලින්; සාධිතං, පිසනලද; ඔදනං, බතද; සූපං, (ඒ බත සතරවන කොටස පමණවූ අතින් ගෙනයා හැකි) මුද්ගසූපයද; තදූපියං (පශ්චිමාලොපය දක්වා හැම ආලෝපයට) අනුරූපවූ; බ්‍යඤ්ජනඤ්ච, මත්ස්‍යමාංසාදි අවුලුද; ගණ්හාති, ගනී.

70 මජ්ඣිමො, මධ්‍යම (පාත්‍ර) ය, තස්ස, ඒ (උත්කෘෂ්ට පාත්‍රයා) ගේ; උපඩ්ඪො ච, භාගයක්ම (ගන්නේ) ය; ඔමකො, ඔමක (පාත්‍ර) ය, තතො, එ (මධ්‍යමපාත්‍ර) යෙන්; උපඩ්ඪො ච, භාගයක්ම (ගන් නේ) ය; උක්කට්ඨතො ච උක්කට්ඨො, උත්කෘෂ්ට (පාත්‍ර) යට වඩා උත්කෘෂ්ට (පාත්‍ර) යද; ඔමකොමකො, ලාමක (පාත්‍ර) යට වඩා ලාමක (පාත්‍ර) යද; අපත්තො, පාත්‍ර නම් නො වේ.

පාත්‍රලක්ෂණ නම් යථොක්ත ප්‍රමාණය. එබැවින් මොහු නො යිවා භාජනපරිභොගයෙන් අනුභව කටයුත්තාහුයි.. මෙහි උත්කෘෂ්ට පාත්‍රයෙහි ද්‍රව්‍යයෙන් භාගයක් ගන්නාම මධ්‍යම පාත්‍රය තස්සාඞ්ඪ වචනයෙන් උපඩ්ඪ යයි කියනලදී. තතොපඩ්ඪොච යන්නෙහිදු මෙසේසින් මැයි.

71 සකො, (කාකණිකමාත්‍රයකුදු පල් මිල නො තබා දුන් හෙයින්) ස්වසන්තකවූ; කප්පො, පාක (විධානයෙන් කළුකල බැවින් ඉටන්නට) කැපවූ; අතිරෙකපත්තො, නො ඉටු නො විකප්පූ පාත්‍රය; දසාහපරමං, දස දවසක් පරම කොට ඇති කාලයක්; ධාරෙය්‍යො, දැරිය යුත්තේය; තස්මිං කාලෙ, ඒ (දසාහපරම) කාලය; අතිනාමිතෙ, ඉක්මවූ කල්හි; නිස්සග්ගියො හොති, නිසජිය යුතු වේ.

72 අවෙජ්ජදූතගාහෙහි විබ්භමා මරණුඩ්ඩා
ලිඞ්ගසික්ඛාහි ජිද්දෙන පත්තො'ධිට්ඨානමුජ්ඣති.

73 පත්තං න පටිසාමෙය්‍ය සොදකං න ච ඔතපෙ
උණ්හෙ න නිඩ්ඩහෙ භූම්‍යා න ඨපෙනො ච ලග්ගයෙ

74 මිඪන්තෙ පරිභණ්ඩන්තෙ අඞ්කෙ වා ආතපත්තකෙ
පාදෙසු මඤ්චපීඨෙ වා ඨපෙතුං න ච කප්පති.

75 න නී හරෙය්‍ය උච්චිට්ඨොදකඤ්ච චලකට්ඨිකං
පත්තෙන පත්තහත්ථො වා කවාටං න පණාමයෙ.

---

72 අවෙජ්ජද, පැහැර ගැන්මෙන්ද; දූත, අන්නට දීමෙන්ද;
ගාහෙහි, විස්වසින් ගැන්මෙන්ද; විබ්භමා, ගිහිවීමෙන්ද; මරණ,
කාලක්‍රියායෙන්ද; උඩ්ඩා, පසුදිරීමෙන්ද; ලිඞ්ගසික්ඛාහි, ලිඟුපෙර
ලීමෙන් හා සික්ඛා පස්චික්ඛිමෙන්ද; ජිද්දෙන, (මුවවිටින්යට දෙඅඟුලක්
ඉක්ම තණඟුලක් වදනා පමණවූ) ජිද්‍රයෙන්ද; පත්තො, පාත්‍රය; අධි
ට්ඨානං, ඉවත්; උජ්ඣති, හරී.

73 සොදකං පත්තං, දියෙන්යුත් පාත්‍රය; න පටිසාමෙය්‍ය,
නොසඟවන්නේය; න ච ඔතපෙ, අව්වෙහි ගිනියෙහි නොද වියළන්
නේය; උණ්හෙ, එම හුණ; න නිඩ්ඩහෙ, දිය සිඳ ද නො දවන්
නේය; භූම්‍යා, (අකුරුපස් ඇඇති) බිම; න ඨපෙ, නො තබන්නේය;
නො ලග්ගයෙ ච (නාගදන්තාදියෙහි) නො ද එල්වන්නේයි. 'ඇල්
හරන පමණක් වනාහි වටී' යනු 'න නිඩ්ඩහෙ' යි ආධිකාර්‍යනිසංඛ
යෙන් උක්ත වේ. දඹුකෙළනාදූති මුදුනෙහි පාකට බහාලීවිද
ලග්න නම්.

74 මිඪන්තෙ, පිළකොළවර හෝ; පරිභණ්ඩන්තෙ, තිසවනු
කොළවර හෝ; අඞ්කෙ වා, ඇකයෙහි හෝ; ආතපත්තකෙ, සත්මත්
තෙහි හෝ; පාදෙසු, පතුල්පිට හෝ; මඤ්චපීඨෙවා, හැඳපුටුමත්
තෙහි හෝ; ඨපෙතුං, තබන්නට; න ච කප්පති, නොම වටී.

75 උච්චිට්ඨොදකඤ්ච, ඉඳුල්දියද; චලක, එල්සප ඈ සපද;
අට්ඨිකං, මස්ඇටදඹඇට ඈ ඇටද; පත්තෙන, පාත්‍රයෙන්; න නීහ
රෙය්‍ය, (පිටත පියන්නට) නොගෙන යන්නේය; පත්තහත්ථො වා,
පාත්‍රයත්අත් ඇති ව ද; කවාටං, දොරපොහොරු කවුළු පොහොරු;
න පණාමයෙ, නොහරනේය; නො ද පියන්නේ යි.

76 භූමිආධාරකෙ දාරුදණ්ඩාධාරෙ සුසජ්ජිතෙ
ද්වෙ පත්තෙ ඨපෙය්‍යෙකං නික්කුජ්ජිත්වාන භූමියං.

77 දාරුරූපියසොවණ්ණමණිවෙළුරියාමයා
කංසකාචතිපුසීසඵලිකතම්බලොහජා.

78 ඡවසීසමයොචාපි ඝටීතුම්බකටාහජා
පත්තා අකප්පියා සබ්බෙ වුත්තා දුක්කටවත්ථුකා'ති

**ථාලකා චා'ති.**

—— ○ ——

79 කප්පියා ථාලකා තිස්සො තම්බායොමත්තිකාමයා
දාරුසොවණ්ණරජතමණිවෙළුරියාමයා.

---

76 සුසජ්ජිතෙ, මනා කොට සැදූ; හෙවත් තර කොට ඉදිකළ; භූමිආධාරකෙ, දණ්ඩවෙත්‍රලතාදීන්ගෙන් කළ බිම්වලල්ලෙහිද; දාරු, වන් වැනි කොට කළ දැවතැන්නෙහිද; දණ්ඩාධාරෙ, බොහෝ දණ්ඩින් කළ දඬුවලල්ලෙහිද; ද්වෙ පත්තෙ ඨපෙය්‍යාථ, (පයක් මත්තෙහි අනික් පයක් තබන පිසින්) දෙපාත්‍රයක් තබන්නේය; භූමියං, කාළැල් ආ. අතුළ) භූමියෙහි; නික්කුජ්ජිත්වා, නිඹිසිනි කොට හෝ උඩුකුරු කොට හෝ; එකං, (ඨපෙය්‍ය) එක් පයක් තබන්නේය;

77 දාරු, දඬුමුවා; රූපිය, රිදීමුවා; සොවණ්ණ, රන්මුවා; මණි (ඉඳුනිල් ආ.) මිණිමුවා; වෙළුරියාමයා, වෛරෝඩිමිණිමුවා (පාත්‍රයෝ) ද; කංස, කස්ලෝ වටලෝහය; කාච, කාචය; තිපු, හෙලතුඹය; සීස, කළුතුඹය; ඵලික, පළිඟුමිණිය; තම්බ, ලෝහය; ලොහජා; තඹලෝහය යන මෙයින්වූ පාත්‍රයෝද.

78 ඡවසීසමයා චාපි, මිනිස්කබල්මුවා (පාත්‍රය) ද; ඝටීතුම්බකටාහජා, කළකබලින් ලබුකබලින්වූ (පාත්‍රයෝ) ද; (යන) සබ්බෙ පත්තා, සියලු පාත්‍රයෝ; අකප්පියා, අකැපයහ; දුක්කටවත්ථුකා, දුකුළාවත් හයි; වුත්තා'ති, කියනලදහුයි.

**ථාලකා චා'ති,**

ථාලකා ච යන්නෙහි කැපඅකැපතලි නම්.

79-80 කප්පියා, (ජාතින්) කැපවූ; තම්බායොමත්තිකාමයා, තඹලෝහමුවා යමුවා මැටිමුවා; ථාලකා, ථාලකයෝ; තිස්සො, තුන් වැදෙනක; දාරු, දඬුමුවා; සොවණ්ණ, රන්මුවා; රජත, රිදීමුවා; මණි, (ඉඳුනිල් ආ.) මිණිමුවා; වෙළුරියාමයා; වෛරෝඩිමිණිමුවා, (ථාල

80 අකප්පා ඵළිකාකාචකංසජා ගිහිසන්තකා
සංඝිකා කප්පියා තුම්බඝටිජා තාවකාලිකා.

### පවාරණාති.

—o—

81 යෙනිරියාපථෙනායං භුඤ්ජමානො පවාරිතො
තතො අඤ්ඤෙන භුඤ්ජෙය්‍ය පාචිත්ති නතිරිත්තකං.

---

කැයෝ) අකප්පා, අකැපයෝයි; ඵළිකා, පිළිවහන්ද; කාච, කාච යෙන්ද; කංසජා, කස්ලොහො වටලොහොයෙන් ද වූ ථාලකයෝ විනාශී) ගිහිසන්තකා, ගිහි (ගිහියන්) සතුවූවාහුද; සංඝිකා, සඟ සතුවූවාහුද; කප්පියා, කැපයෝය; තුම්බඝටිජා, ලබුයෙන් කළයෙන් වූ තලුකබල්හු තාවකාලිකා, තාවකාලිවූවාහු (කැපයෝයි.) එව්ගස වළඳ හරනට කැප යයි සේයි.

### පවාරණාති.

පවාරණා යන්නෙහි පිළිකෙව් පව්රුණු නම්.

81 අයං, මේ මහණ; යෙන ඉරියාපථෙන, යම් ඉරියව්වකින්; භුඤ්ජමානො, වළඳන්නේ; පවාරිතො, වැළකීද; තතො, ඒ (ඉරියව්ව) මිස; අඤ්ඤෙන, අනික් ඉරියව්වකින්; අනතිරිත්තකං, (වළඳනකැමින් හෝ ගිලනක්හු විසින් හෝ) අයිරිත් නො කළ යාවකාලිකභොජනයක්; භුඤ්ජෙය්‍ය, වළඳනම්; පාචිත්ති, පචිති (ඇවැත්) වේ.

එහෙයින්ම * "යාමකාලිකං සත්තාහකාලිකං යාවජීවිකං ආහාරත්ථාය පටිගණ්හාති ආපත්ති දුක්කටස්ස. අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති දුක්කටස්ස" යන පෙළ යම් කැල්ලෙන් පිටත් කැල්ලෙහි දුකුළා කියනලද.

---

* යාමකාලිකං, පිළිගෙන තබා දෙවෙනි දින අරුණ නගිනතුරු වැලඳිය හැකිවූ අෂ්ටපානකාදී දෙයද; සත්තාහකාලිකං, පිළිගෙන තබා සත්දිනක් තුළ වැලඳිය හැකිවූ ගිතෙල් වෙඬරු ආදිවූ දෙයද; යාවජීවිකං, පිළිගෙන තබා දිවි ඇතිතාක් වැලඳිය හැකිවූ බෙහෙත්වර්ගාදි දෙයද; ආහාරත්ථාය, ආහාර සඳහා; පටිගණ්හාති, පිළිගණ්නම්; ආපත්ති දුක්කටස්ස, දුකුළා ඇවැත් වේ අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ, ගිලින ගිලින වාරයෙහි; ආපත්ති දුක්කටස්ස, දුකුළා ඇවැත් වේ.

82 අසනං භොජනඤ්චෙව අභිහාරො සම්පතා
කායවාචාපටික්ඛෙපො පඤ්ච අඞ්ගා පවාරණා.

83 ඔදනො සත්තු කුම්මාසො මච්ඡො මංසඤ්ච භොජනං
සාලි වීහි යවො කංගු කුද්‍රූස වර ගොධූමා.

84 සත්තන්නමෙසං ධඤ්ඤානං ඔදනො භොජ්ජ යාගු ච
සාමාකාදිතිණං කුද්‍රූසකෙ වරකචොරකො
වරකෙ සාලියඤ්චව ච නීවාරො සඞ්ගහඞ්ගතො

85 භට්ඨධඤ්ඤමයො සත්තු කුම්මාසො යවසම්භවො
මංසො ච කප්පියො වුත්තො මච්ඡො උදකසම්භවො

---

82 පවාරණා, පවාරණතොමෝ; අසනං, වැළඳීමද (හෙවත්) අඩාල කළ බොජුන් ඇතිබවද; භොජනඤ්චෙව, (පැවරිජනක) භොජනයක්බවද; අභිහාරො, (කයින්) එළවීමද; සම්පතා, (දෙරියන්වියත්) අත්පසබවද; කායවාචාපටික්ඛෙපො, කයින් හෝ වච සින් හෝ වැළකීමය (යන) පඤ්චඅඞ්ගා, (මේ) පස්අඟින් යුක්තයි.

83 84 ඔදනො, බත්ද; සත්තු * හත්ද; කුම්මාසො, කොමුද; මච්ඡො, (දියෙහි) මස්ද; මංසඤ්ච, ගොඩමස්ද (යන මේ පස) භොජනං, භොජන (නම්) වෙයි; සාලි, හැල්ය; වීහි, සෙසුවීය; යවො, යවය; කංගු, තණ්ණය; කුද්‍රූස, හමුය; වර, හෙළවරාය; ගොධුමො, ගොධුමය; එසං සත්තන්නං ධඤ්ඤානං, මේ සප්තවිධධාන්‍යයන් සම් බන්ධිවූ; ඔදනො, බත්ද; භොජ්ජයාගුච, බොල්කැඳද; ඔදන නම්. සාමාකාදිතිණං, තෝඩහමු ආදිවූ තෘණධාන්‍යය; කුද්‍රූසකො, හමු යෙහි එක්වීමට ගියේ; වරකචොරකො, වරාසොර; හෙවත් සිහින් වරා; වරකෙ, හෙලවරායෙහි එක්වීමට ගියේ; නීවාරො, ඌරුහැල්; සාලියඤ්චව, හැල්හිම; සඞ්ගහං ගතො, එක්වීමට ගියේයි. සාමා කාදිතිණං, මහරතුඇති තෘණ යනු මෙහි අන්‍යයි.

85 භට්ඨධඤ්ඤමයො, කර කොට බැදී, සප්තවිධධාන්‍යයන්ගේ තණ්ඩුලයෙන් කරනලද්දේ; සත්තු, හත් නම්; යවසම්භවො, යව යෙන් වූයේ; කුම්මාසො, කොමු නම්; මංසො ච, මස් වනාහි; කප් පියො වුත්තො, කැපමස් කියනලද; උදකසම්භවො, දියෙහි උපන් නේ; මච්ඡො, මස් නම්.

---

* බැඳිපිටිකැවුන්ද. ඇතැම්.

86 භුඤ්ජන්තො භොජනං කප්පමකප්පං වා නිසෙධයං
වාරෙය්‍ය අභිහටං කප්පං තන්නාමෙන ඉමන්ති වා.

---

“ඛරපාකෙන භට්ඨානං වීහීනං කුණ්ඩකම්පි ච;
සත්තුනං මොදකො වාපි සඤ්ජනෙති පවාරණං, *

කකුළු ඉදුබ් ආදිහු දියෙහි උපදනා බැවින් “මච්ඡා” යන්නෙහිම ගැනෙත්– ගොඩමස නොවටනා මස් ඇතිබැවින් “මංසෙ ච කප්පියො වුත්තො” යි වෙසෙසා කියා දියෙහි මසැ නොවටනා මස් නැති බැවින් “මච්ඡා උදකසම්භවො” යි නො වෙසෙසා කියනලදී.

86 කප්පං වා, කැප හෝ; අකප්පං වා, අකැප හෝ; භොජනං (පැවරිජනක) භොජනයක්; භුඤ්ජන්තො, වළඳන මහණ; තන්නාමෙන, ඒ (ඔදනාදින්ගේ) නමින් හෝ; ඉමන්ති වා, මේ (ගන්ව) යි (සාමාන්‍ය කොට, හෝ (වචයින් කියා) අභිහටං, (කයින්) එළවන ලද; කප්පං, කැප (භොජන) යක්ම්; නිසෙධයං, (කයින් හෝ වචසින් හෝ) වළකන්නේ; (ප) වාරෙය්‍ය, පැවරි අවදනේයි.

“කප්පියමංසං ඛාදන්තො අකප්පියමංසං පටික්ඛිපති, න පවාරෙති. කස්මා අවත්ථුතාය. අකප්පියමංසං ඛාදන්තො කප්පියමංසං පටික්ඛිපති, පවාරෙති. කස්මා?, වත්ථුතාය. යං හි තෙන පටික්ඛිත්තං තං පවාරණාය වත්ථු. යම්පන ඛාදති තං කිඤ්චාපි පටික්ඛිපිතබ්බට්ඨානෙ ඨිතං ඛාදියමානං පන මංසභාවං න ජහාති තස්මා පවාරෙති,, යනු අටුවායි.

එකො අභිහටෙ හත්ථෙ පවාරණභයා පන
ආකිරාකිර කොට්ටෙත්වා කොට්ටෙත්වා පූරයාති ච
සචෙ වදති තස්සා පි න පනත්ථි පවාරණා

ඔදනෙන ච පුච්ඡන්තං මුහුත්තං ආගමෙහිති
ගණ්හනත්ථං ඨපෙන්තස්ස නෙව තස්ස පවාරණා +

---

* ඛරපාකෙන, කරපාකයෙන්; භට්ඨානං, බදින ලද්දවූ; වීහීනං, කුණ්ඩකම්පි ච, වීකුඩුද; සත්තූනං මොදකො වාපි, අග්ගලා වද; පවාරණං, පවාරණය; සඤ්ජනෙති, උපදවයි.

× කප්පියමංසා, කැපමස්; ඛාදන්තා, කමි; අකප්පියමංසං, අකැපමස්; පටික්ඛිපති, ප්‍රතික්ෂෙප කොරේද; න පවාරෙති, නො පවරයි. කස්මා, කවරහෙයින්ද? අවත්ථුතාය, අකැපමාංසය පවාරණයට වස්තු නොවන හෙයිනි. අකප්පිය මංසං, අකැපමස්; ඛාදන්තො,

87 ලාජා තංසත්තුභත්තානි ගොරසො සුඛභඤ්ජකො
තණ්ඩුලා භට්ඨපිට්ඨඤ්ච පුථුකා වේළුආදිනං.

88 භත්තං මුත්තාවසේසානං රසයාගු රසො පිච
සුඛයාගු ඵලාදිනි න ජනෙන්ති පවාරණං.

---

87. 88 ලාජා, විලඳද; තංසත්තුභත්තානි, ඒ විලඳයෙන් කළ හත් හා බත් ද; ගොරසො ('කිරි-දී-මෝහෝරු-ගිතෙල්-වෙඬරු' යන) පස්ගෝරසද; සුඛභඤ්ජකො, (භොජනයක් හා) නුමුසුවූ කනඳ ද; තණ්ඩුලා, බැදී නොබැදි සාල්ද; භට්ඨපිට්ඨඤ්ච, බැදිපිටිද; පුථුකා, පුළුද; (එයින් කරනලද හත් හා බත් ද) මුත්තාවසේසානං, යටකී සප්තවිධධාන්‍යයන් කෙරෙන් අවශේෂවූ; වේළුආදිනං, හුණගස් තල්ගස් ආදීන්ගේ; භත්තං, (තණ්ඩුල සාන්‍යාදියෙන් කළ) බත් ද; රසයාගු, (මස්නැති) රසයෙහි (පිසූ) හඹු ද; රසොපි ච, (මස්නැති) හුදුරස ද; සුඛයාගු (මංසාදි හා) නොමුසුවූ යාගුද; ඵලාදිනි, ඵලපත්‍රාදිහුද; පවාරණං, පැවරි; න ජනෙන්ති, නො උපදවත්.

---

කාවින්; කප්පියමංසං, කැපමස්; පටික්ඛිපති, ප්‍රතික්ෂෙප කෙරේද; පවාරෙති, පවරයි. කස්මා, කවරහෙයින්ද? වත්ථුතාය, කැපමංසය පවාරණයට වස්තුහෙයිනි. යං හි යමක් වනාහි; තෙන, ඔහුවිසින්; පටික්ඛිත්තං, ප්‍රතික්ෂෙපකරනලද්දේද; තං, එය; පවාරණාය, පවාරණයට, වත්ථු, වස්තු වේ. යං පන, යමක් වනාහි; ඛාදති, කාද; තං, එය; කිඤ්චාපි, කිසිලෙසකින්; පටික්ඛිපිතබ්බට්ඨානෙ, ප්‍රතික්ෂෙපකළ යුතුතන්හි; ඨිතා, සිටියේයි; ඛාදියමානං පන, කනු ලබන්නේ; වනාහි, මංසභාවං, මස්බැව්; න ජහාති, නො හරී; තස්මා, එහෙයින් පවාරෙති, පවරයි.

ඵකොපන, ඇතැම් මහණෙක් වනාහි; භුඤ්ජන්තො, බත; අභිහටෙ, එළවූකල්හි; "ආකිර ආකිර" ඉති ච, 'දමව දමව' සි ද; "කොට්ටෙත්වා කොට්ටෙත්වා පූරය" ඉති ච, 'කොටා කොටා පුරව' සී ද; සචෙ, ඉදින්; වදති, කියාද; තථාපි, ඔහුටද; පවාරණා පන, පවාරණය වනාහි; න අත්ථි, නැත්තේය.

ඔදනෙන, බතින්; පුච්ඡන්තං ච, විචාරන්නකු; මුහුත්තං, මොහොතක්; ආගමෙහීති, නවතුවයි; ගණ්හනත්ථං, ගන්නා පිණිස; ඨපෙන්තස්ස, තබතන්නාවූ, තස්ස, ඒ භික්ෂුහට; පවාරණා, පවාරණෙක්; නෙව, නොවන්නේමය.

89 පවාරිතෙන වුට්ඨාය අභුත්තෙන ච භොජනං
අතිරිත්තං න කාතබ්බං යෙන යං වා පුරෙ කතං.

90 කප්පියං ගහිතඤ්චුච්චාරිතං හත්ථපාසගං
අතිරිත්තං කරොන්තෙවං අලමෙතන්ති භාසතු.

---

පුථුකා වා තාහි කතසත්තුභත්තාදීනි වා න පවාරෙන්ති. ඨපෙත්වා වුත්තධඤ්ඤානං තණ්ඩුලෙ අඤ්ඤෙහි වෙළුතණ්ඩුලාදීහි වා කන්දමූලඵලෙහි වා යෙහි කෙහිචි කතභත්තම්පි පවාරණං න ජනෙති * යනු අටුවායි.

89 පවාරිතෙන, පැවරිඅවන්නහු විසින්; වුට්ඨාය (අස්නෙන්) නැගිද; භොජනං (පැවරිජනක) භොජනයක්; අභුත්තෙන ච (මද කුදු) නොවැළඳුවහු විසින්ද; යෙන යං වා පුරෙ කතං, යම්කු විසින් යම් භොජනයෙක් පළමු කැප කරණලදද; (තෙන තං වා, ඔහු විසින් ඒ භොජනයද;) අතිරිත්තං න කාතබ්බං, කැප නො කට යුත්තේයි.

සචෙ පන එවං කප්පියං කාරාපෙත්වා භුඤ්ජන්තස්ස පුන කිඤ්චි බ්‍යඤ්ජනං වා ඛාදනීයං වා, පත්තෙ ආකිරන්ති යෙන පඨමං කප්පියං කතං සො පුන කාතුං න ලබ්භති,, ‡ යනු අටුවායි.

90 කප්පියඤ්චෙව, කැපමවූ; ගහිතඤ්චෙව, පිළිගන්නාලදමවූ; උච්චාරිතඤ්චෙව, මදකුදු ඔසවා හෝ බහා හෝ පානාලදමවූ; හත්ථපාසගඤ්චෙව (දෙරියන්වියත්) අත්පසට එළවනලදමවූ (යාවකාලිකය) අතිරිත්තං කරොන්තො, කැපකරන මහණ; අලමෙතං (සබ්බං) ති අලමෙතං සබ්බං යි; එවං, මෙසේ; භාසතු, වාක්භෙද කොට කියාවා.

---

* පුථුකා වා, පුලු හෝ; තාහි, එයින්; කතසත්තු භත්තාදීනි වා, කළ හත්සුණුබත්ආදිය හෝ; න පවාරෙන්ති, පවාරණය නො කෙරෙත්. වුත්තධඤ්ඤානං, කියනලද ධාන්‍යයන්ගේ; තණ්ඩුලෙ, සාල්; ඨපෙත්වා, හැර; අඤ්ඤෙහි, අනික්; වෙළුතණ්ඩුලාදීහි වා, හුණසාල්ආදියෙන් හෝ; කන්දමූලඵලෙහි වා, අලමුඵලයෙන් හෝ; යෙහි කෙහිචි, යම්කිසිවකින්; කතභත්තම්පි, කළබතද; පවාරණං න ජනෙති, පවාරණය නො උපදවයි;

‡ සචෙ පන, ඉදින් වනාහි; එවං, මෙසේ; කප්පියං කාරාපෙත්වා, කැපකරවා; භුඤ්ජන්තස්ස, වළඳන්නහුගේ, පත්තෙ, පාත්‍ර

91 න කරෙනුපසම්පන්නා හත්ථගං පෙසයිත්වා පි
කාරෙතුං ලබ්භතෙ සබ්බො භුඤ්ජිතුං තමකාරකොති.

—o—

### කාලිකාචාකි.

92 පටිග්ගහිතා චත්තාරො කාලිකා යාවකාලිකං
යාමකාලිකසත්තාහකාලිකං යාවජීවිකං.

---

සිඟුරු ලුනුණු ඈ කැපකළ බැවින්ද ඇකපමස් නැති බැවින්ද කුලදූෂණාදින් නො උපන් බැවින්ද කප්පිය නම් වේ.

අලමෙතං සබ්බන්ති එත්ථ තිකාරං අවත්වාව අලමෙතං සබ්බං ඉති එත්තකං වත්තුං වට්ටති * යනු අටුවායි.

අලමෙතං සබ්බං යිය යුතුය ති සිටුවයි අලමෙතං සබ්බන්ති යු හොතිජ් නො කළා වෙයි. යනු විනය සන්නයයි.

91 අනුපසම්පන්නහත්ථගං, අනුපසම්පන්නයාගේ අත තිබුවා; න කරෙ, කැප නො කරන්නේය. පෙසයිත්වාපි, අතික්කත්හු අත යවාද; කාරෙතුං, කැප කරවන්නට; ලබ්භතෙ, වේ; තං, ඒ (කැප කළ භොජන) ය; අකාරකො, කැප නො කළ; සබ්බො (පැවරිඅවන් නොඅවන්) සියලුමහසඟ; භුඤ්ජිතුං, වළඳන්නට; (ලබ්භතෙ, ලැබේ)

### කාලිකාචාකි.

කාලිකා යන්නෙහි; කාලිකයෝ නම්:—

92 පටිග්ගහිතා, පිළිගන්නාලද; කාලිකා, කාලිකයෝ; යාවකාලිකං, යාවකාලිකය; යාමකාලිකං, යාමකාලිකය; සත්තාහකාලිකං, සත්තාහකාලිකය; යාවජීවිකං, යාවජීවික යයි; චත්තාරො, සතර දෙනෙකි.

---

යෙහි; පුන, නැවත; කිඤ්චි බ්‍යඤ්ජනං වා, කිසිව්‍යඤ්ජනයක් හෝ; ඛාදනීයංවා, ඛාද්‍යයක් හෝ ආකිරන්ති, බහාලත්ද; යෙන, යමකුවිසින්; පඨමං, පළමු; කප්පියං කතං, කැප කරනලදද; සො, හෙතෙම; පුන, නැවත; කාතුං, කැපකරන්ට; න ලබ්භන්ති, නොලබයි,

* අලමෙතං සබ්බං ඉති, “අලමෙතං සබ්බං” යන; එත්ථ, මෙහි තිකාරං, තිකාරය; අවත්වාව්, නොකියාම; අලමෙතං සබ්බං, අලමෙතං සබ්බං” යි එත්තකා, මෙපමණක්, වත්තුං, කියන්ට; වට්ටති වටී.

93 පිට්ඨං මූලං ඵලං ඛජ්ජං ගොරසො ධඤ්ඤභොජනං
යාගු සූපප්පභූතයො හොන්ති තෙ යාවකාලිකා.

94 මධු මුද්දික සාලූක චොච මොචම්බ ජම්බුජං
ඵාරුසං නග්ගිසන්තත්තං පානකං යාමකාලිකං

95 සානුලොමානි ධඤ්ඤානි ඨපෙත්වා ඵලජො රසො
මධුකපුප්ඵං අඤ්ඤත්‍ර සබ්බො පුප්ඵරසො පි ච.

96 සබ්බපත්තරසො චෙව ඨපෙත්වා පක්කඩාකජං
සීතොදමද්දිතොදිච්චපාකො වා යාමකාලිකො.

---

93 පිට්ඨං මූලං ඵලං ඛජ්ජං, පිටියෙන් කළ මුලින් කළ පලින් කළ කනද්ද ද; ගොරසො, (කිරිදිමෙමාහොරු යන ත්‍රිවිධ) ගෝරසද ධඤ්ඤභොජනං, සප්තවිධධාන්‍ය හා පඤ්චවිධභොජනය ද; යාගු, හඹුද; යූපප්පභූතයො, සූපාදිහුද (යන) එමෙත, (ඒ ඒ දේශයෙහි පිය විත් අහරකිස සපයන) මොහු, යාවකාලිකා හොන්ති, යාවකාලික නම් වෙති.

94 මධු, මීදෙහි සවරසය; මුද්දිකා, ඇල්පැනමැඩිම්දය; සාලූක, හෝළුය; චොච, ඇටකෙහෙල; මොච, සෙසුකෙහෙල; අම්බ, අඹය; ජම්බුජං, දඹය යන මෙයින් වූද; ඵාරුසං, බොරළු දමනයෙන්වූ ද; පානකං, (අෂ්ටවිධ) පානය; නග්ගිසන්තත්තං, ගින්නෙන් හුණු නො කරන ලද්දේ; යාමකාලිකං, යාම කාලිකයි.

මධු නම් මීද සියද්දරස හෙතෙම යම්කැලිය ඇල්පැන් වත්කොට පහරනලද්දේ යම්කැලි වේ. මිද ඇල්පැන මැඩ පෙරහා ගත් පැන මුද්දිකපාන නම හෝළු කෙහෙල් ආදිවූ සෙස්ස ද ඇල් පැන මැඩ හෝ සියද්දරස ඇල්පැන වත්කොට හෝ පහරන ලද්දේ යමකැලි වේ. ඵාරුසන්ති, අරියදෙසෙ ඒකො රුක්ඛො * යනු විනය ගන්‍ථයි.

95–96 සානුලොමානි (නව මහාඵල හා අපරණ්ණ යන) අනුලෝමසහිතවූ; ධඤ්ඤානි (සප්තවිධ) ධාන්‍යයන්; ඨපෙත්වා, තබා; ඵලජො රසො (සෙසු යාවකාලික) ඵලයෙන් වූ රසද; මධුකපුප්ඵං අඤ්ඤත්‍ර, මීපුප්ඵය; සබ්බො පුප්ඵරසොපි ච, සියලු (යාවකාලික) මල් රසද; පක්කඩාකජං ඨපෙත්වා, හිඳු (යාවකාලික) පත්‍රයෙන් වූ රස

---

ඵාරුසන්ති, ඵාරුස නම්; අරියදෙසෙ, ආර්‍ය්‍ය දෙශයෙහිවූ; ඒකො රුක්ඛො, එක් වෘක්ෂයෙකි.

97 සප්පිනොනීතතෙලානි මධුඵාණිතමෙව ච
සත්තාහකාලිකා සප්පි යෙසං මංසමවාරිතං.

98 තෙලං තිලවසෙරණ්ඩ මධුසාසපසම්භවං
ඛුද්දභමරමධුකරි මක්ඛිකාහි කතම්මධු.

---

තබා, සබ්බපත්තරසො චෙව, සියලු; (යාවකාලික) පත්‍රයන්ගේ රසද; සීතොදමද්දිතො, සිහිල්දියෙහි මඩනා ලද්දේ; ආදිච්චපාකො වා, අව්වෙහි තබා හුණුකරනලද්දේ හෝ නොකරනලද්දේ හෝ; යාමකාලිකො, යාමකාලිකයි.

තාලඤ්ච නාලිකෙරඤ්ච පනසං ලබුජම්පි ච
තිපුසාලාබු කුම්භණ්ඩං තථා පුස්සඵලම්පි ච
එවමෙලාලුකඤ්චාති නවෙතානි ඵලානි හි
අපරණ්ණඤ්ච සබ්බම්පි සත්තධඤ්ඤානුලොමිකං
යාවකාලිකපත්තානම්පි සීතුදකෙ කතො
මද්දිතාදිච්චපාකොපි විකාලෙ පන වට්ටති.

97 සප්පි, ගිතෙල; නොනීත, වෙඬරුද; තෙලානි, තෙල්යයන මොහු ද; මධු, මීද; ඵාණිතමෙව ච, සකුරුද යන මොහු පස්දෙන; සත්තාහකාලිකා, සත්තාහකාලිකයෝයි; සප්පි, (එහි) ගිතෙල් නම්; යෙසං (ගොමහිසාදි) යම් සත්ත්වකෙණෙකුන්ගේ; මංසං, මාංසය; අවාරිතං, නොවළකනලද්ද හෙවත් කැපද; (තෙසං සප්පි) ඔවුන්ගේ ගිතෙල්. වෙඬරුද එසේමැයි.

98 තිල, තලයෙන්ද; වසා, වසායෙන්ද; එරණ්ඩ, එරඬුඇටින්ද; මධු, මීඹියලින්ද; සාසප, අබයෙන්ද; සම්භවං, සම්භවවූයේ; තෙලං, තෙල් නම්; ඛුද්ද, කනවේමැස්සහ; භමර, බඹරමැස්සහ;

---

* තාලං ච, තල් ද; නාළිකෙරං ච, පොල් ද; පනසං කොස් ද; ලබුජං අපි ච, දෙල් ද, තිපුස, තියඹරා ද; අලාබු, ලබු ද; කුම්භණ්ඩ, කොමඩු ද; තථා, එසේ ම; පුස්සඵලං අපි ච, පුසුල් ද; එවං, මෙසේ; එලාලුකං ච ඉති, කැකිරි ද යි; එතානි නව ඵලානි හි, මේ නවවිධ මහාඵලයෝද; සබ්බං අපි අපරණ්ණං ච, සියලුම (මුං උඳු ආදි) අපරණ්ණවිශෙෂයද; සත්තධඤ්ඤානුලොමිකං, සප්තවිධ ධාන්‍යයට අනුලෝම වේ.

යාවකාලිකපත්තානං අපි, යාවකාලික පත්‍රයන්ගේද; සීතුදකෙ, සිහිල්දියෙහි; මද්දිතො, මැඩ; කතො, කරනලදරසය; ආදිච්චපාකො අපි, අව්වෙහි කකාරනලද්දේ හෝ; නොකරනලද්දේ හෝ; විකාලෙ පන, විකාලයෙහි; වට්ටති, වටී.

99 රසාදී උච්ඡුවිකති පක්කාපක්කා ච ඵාණිතං
සවත්ථුපක්කා සාවං වා වසා කාලෙ අමානුසා
අඤ්ඤෙසං න පචෙ වත්ථුං යාවකාලිකවත්ථුනං.

100 හලිද්දිං සිඞ්ගිවෙරඤ්ච වචත්තං ලසුනං වචා
උසීරං භද්දමුත්තඤ්චාතිවිසා කටුකරොහිණී
පඤ්චමූලාදි කඤ්චාපි මූලන්තං යාවජීවිකං.

---

මධුකරීමක්ඛිකානි, දඬුවැල්බැමැස්සහ නොහොත් මහමීමැස්සන යනමොවුන් විසින්; කතං කරනලද්දේ; මධු, මී නම්.

99 පක්කා, කකාරනලද හෝ; අපක්කා වා, නො කකාරනලද හෝ; රසාදී, උක්පැණි ආදිවූ; උච්ඡුවිකති, ඉඬුවිකෘති තෙමෝ උගින් වූයේ; ඵාණිතං සකුරු නම් වේ; අමානුසා, මනුෂ්‍යවසායෙන් අන්‍යවූ; වසා, (ගොමහිසාදින්ගේ) වසා තොමෝ; කාලෙ, පෙරවරු සාමං, තමා විසින්; සවත්ථුපක්කා වා, වස්තුව හා එක්කොට පිසහරන ලද්දේ (කාපති) සත්දවසකට වටී. යාවකාලිකවත්ථුනං, යාවකාලිකවස්තු කොට ඇති; අඤ්ඤෙසං (වසාතෙලයෙන්) අන්‍යවූ ගිතෙල්ආදින්ගේ; වත්ථුං, ක්ෂීරාදිවස්තුව; න පචෙ. නො පිසන්නේයි. මෙහි කාරණොපචාර විසින් වසා තෛලය වසා යයි කියන ලදි

අනුජානාමි භික්ඛවෙ වසානි භෙසජ්ජානි අච්ඡවසං මච්ඡවසං -පෙ- කාලෙ පටිග්ගහිතං කාලෙ නිප්පක්කං කාලෙ සංසට්ඨං තෙලපරිභොගෙන පරිභුඤ්ජිතුං. * යනු මෙහි පෙළයි සංසත්ථාගති පරිභාවිතං.

100 හලිද්දිං, කහ ද; සිඞ්ගිවෙරඤ්ච, ඉඟුරු ද; වචත්තං, වජපිරිබුලු ද; ලසුනං, හෙල ලූනු ද; වචා, වද ද; උසීරං, සුවඳහොට ද; නොහොත් ලමහ ද, භද්දමුත්තඤ්ච, වම්මුතු ද; අතිවිසා, ඉවද ද;

---

* භික්ඛවෙ, මහණෙනි! කාලෙ, කාලයෙහි; පටිග්ගහිතං, පිළිගන්නාලද; කාලෙ, කාලයෙහි; නිප්පක්කං, කකාරනලද; කාලෙ කාලයෙහි; සංසට්ඨං, පෙරනලද; අච්ඡවසං, වලස්තෙල; මච්ඡවසං, මස්තෙල; (යනාදි) වසානි භෙසජ්ජානි, වසා බෙහෙත්; තෙලපරිභොගෙන, තෛලපරිභොගයෙන්; පරිභුඤ්ජිතුං, පරිභොග කරන්නට; අනුජානාමි, අනුදනිමි.

101 බිළඞ්ගං මරිචං, ගොට්ඨඵලං පිප්ඵලී රාජිකා
තිඵලෙරණ්ඩකාදීනං ඵලන්තං යාවජීවිකං.

102 කප්පාසනිම්බකුටජ පටොලසුලසාදිනං
සූපෙය්‍යපණ්ණං වජ්ජෙත්වා පණ්ණන්තං යාවජීවිකං.

103 ඨපෙත්වා උච්ඡුනීය්‍යාසං සරසං උච්ඡුජං තචං
නීය්‍යාසො ච තචො සබ්බො ලොණං ලොහං සිලා තථා.

104 සුද්ධසිත්ථඤ්ච සෙවාලො යඤ්චකිඤ්චි සුක්ඛාපිතං
විකටාදිප්පභෙදඤ්ච ඤාතබ්බං යාවජීවිකං.

---

කටුකරෝහිණී, කුටුරුක ද; පඤ්චමූලාදිකඤ්චාපි, සුළුපස් මහපස් මුල් ආදිය ද යන; තම්මූලං, ඒ සියලු මුල්; යාවජීවිකං, යාවජීවිකය. වචත්තං, වජපිරිබුලු හෙළිවෙජේ සෙති මෙ යනු විනයසන්නයයි වචත්ත නම් සෙතවචා* යනු සංයුත්ටීකායි.

101 බිළඞ්ගං, වළඟසාල්ද; මරිචං, මිරිස්ද; ගොට්ඨඵලං, කුකුළු පත්ද; නොහොත් කුකුරුමුවන් පත්ද; පිප්ඵලී, වගපුල්ද; රාජිකා, රුද නොහොත් අබද; තිඵලං, අරළු බුළු ඇඹුල්ද; එරණ්ඩකාදීනං ඵලං, එරඬු ආදීන්ගේ ඵලද යන; තං, ඒ සියල්ල; යාවජීවිකං, යාවජීවිකයි.

102 සූපෙය්‍යපණ්ණං වජ්ජෙත්වා, සූපයට නිසිවූ මුඟුපලා ඈ පලා හැර; කප්පාස, කපුය; නිම්බ, කොසඹය; කුටජ, කෙළින් දය; පටොල, දුම්මැල්ලය; සුලසාදීනං, තලාය යනාදීන්ගේ; තම්පණ්ණං, ඒ සියලු කොළ; යාවජීවිකං, යාවජීවිකයි.

103 උච්ඡුනීය්‍යාසං, උක්ලහටු ද; සරසං, රසසහිතවූ; උච්ඡුජං තචං, උක්පොතුද; ඨපෙත්වා, තබා; සබ්බො, සියලු; නීය්‍යාසො ච, ලහටු ද; තචො, සුඹුලු ද; ලොණං, ලුණු ද; ලොහං, ලොහො ද; සිලා, ගල් ද; තථා, එසේම යාවජීවික යි.

104 සුද්ධසිත්ථඤ්ච, මීනැතිතිපිද; සෙවාලො, සෙවෙල්ද; සුක්ඛාපිතං, මතා කොට දවා දමු කරගලද; යංචකිඤ්චි; (මත්ස්‍යමාංසාදි) යම් කිසිවෙක්ද; විකටාදිප්පභෙදඤ්ච; මහවිකට ආදිභෙදද යාවජීවිකං, යාවජීවිකයයි, ඤාතබ්බං, දතයුතුයි. මලමූත්‍රහළුමැටි මහ විකට නමි.

---

* වචත්තං (වචං) ඉඟි, වචත්ත (වච) නම්; සෙතවචා, ළහළු වදකසාය.

105 මූලං සාරං තචො ඵෙග්ගු පණ්ණං පුප්ඵං ඵලං ලතා
ආහාරත්ථමසාධෙන්තා සබ්බන්තං යාවජීවිකං.

106 සබ්බකාලිකසම්භොගො කාලෙ සබ්බස්ස කප්පති
සති පච්චයෙ විකාලෙපි කප්පතෙ කාලිකත්තයං.

---

ඛාමකමහාභූතෙසු ඉදං නාම නවට්ටතීති නත්ථි දුජ්ඣාමිතම්පන න වට්ටති, සුජ්ඣාමිතම්බුලසාටකම්පි චුණ්ණං කත්වා ලෙහෙ උපනෙතුං වට්ටති. * යනු අටුවා යි.

105 ආහාරත්ථං, අහරින් වන ප්‍රයෝජන හෙවත් අහරකිස ; අසාධෙන්තං , නොසපයන්නාවූ; මූලං, මුලය; සාරං, හරය; තචො, සුඹුලය ; ඵෙග්ගු, කොවුල; පණ්ණං, පත; පුප්ඵං, මල ; ඵලං, ඵලය; ලතා, වැලය යන; තං සබ්බං, ඒ සියල්ල ; යාවජීවිකං, යාව ජීවික යි.

106 සබ්බකාලික, එදවස් පිළිගත් සියලු කාලිකයන් ෙ සම්භොගො, වැලඳීම ; කාලෙ, එදවස් පෙරවරු; සබ්බස්ස, (ගිලන් නො ගිලන්)සියල්ලහට ; කප්පති, වටී. (ආපත්තිජනක නො වේ.) කාලිකත්තයං, යාමකාලිකාදි තුන්කැල්ල ; පච්චයෙ සති, (ඒ ඒව තිසි පිපාසාදි) කරුණක් ඇති ; විකාලෙපි, පෙරවරු මිස අන් කල්හිදු ; කප්පතෙ, වටී. (පෙරවරු හැමකල් හැම අහර පිණිස වලඳත්. එදවස් පිළිගත් බැවින් නො පස්විකා වැලඳුව ද ඇවැත් නො වෙයි) පුරෙඅරුණෙහිම අතීතපස්විකුමෙන් පස්විකුව ඉණ පරිභොග ද නො ම වේ සත්තාහකාලි හා යාවජීවිකාලි † පුනදවස් පෙරවරු රොග පිණිස වලඳත් නො පස්විකු හොත් ඇවැත් වේ යැ මෙහි සන්නයි.

---

* ඛාමකාමහාභූතෙසු, හළුකළමහාභූතයන්හි; ඉදං නාම, මෙනම් දෙය; න වට්ටතී ඉතී, නො වටනේය යනු; නත්ථි, නැත; දුජ්ඣාමිතං පන, නපුරු කොට හළු කරනලද්දේ වනාහි; නවට්ටති, නො වටී. සුජ්ඣාමිතම්බුලසාටකම්පි, මනාව හළුකළ මිනීඇටපවා; චුණ්ණං කත්වා, සුණු කොට; ලෙහෙ, ලෙහයෙහි; උපනෙතුං, එළවන්ට; වට්ටති, වටී.

† සප්තාහ කාලිකය හා යාවජීවකාලිකය. සම්භර

107 කාලයාමමතික්කන්තා පාචිත්තිං ජනයන්ත්‍යුභො
ජනයන්ති උභොපෙතෙ අනොවුත්ථඤ්ච සන්නිධිං.

108 සත්තාහකාලිකො සත්තාහානි අතිනාමිතෙ
පාචිත්ති පාළිනාරූළ්හෙ සප්පිආදිම්හි දුක්කටං.

109 නිස්සට්ඨලද්ධං මක්ඛෙය්‍ය නඞ්ගං නජ්ඣොහරෙය්‍ය ච
විකප්පෙන්තස්ස සත්තාහෙ සාමණෙරස්ස චජෙතො
මක්ඛනාදීසු නාපත්ති අඤ්ඤස්ස දදතොපි ච.

---

107 උභො, යාවකාලික යාමකාලික දෙදෙන; කාලං, පෙරවරුවේ යාමං, පැසිළිගම; අතික්කන්තා, යථාක්‍රමයෙන් ඉක්මුණාහු හෙයින් ඉක්මවා වළඳනලද්දාහු; පාචිත්තිං ජනයන්ති, පචිති ඇවැත් උපදවත්; එතෙ උභොපි, මොහු දෙදෙනම; අනොවුත්ථඤ්ච, අයපතිලිතයෙහි විසීමෙන් දුකුළාද; සන්නිධිං, දෙවන දවස් වැළඳීමෙන් සන්නිධිපචිති ද; ජනයන්ති; උපදවත්.

සන්නිධිකතං යං කිඤ්චි යාවකාලිකං වා යාමකාලිකං වා අජ්ඣොහරිතුකාමතාය ගණ්හන්තස්ස පටිග්ගහණෙ තාව ආපත්ති දුක්කටස්ස අජ්ඣොහරතො පන එකමෙකස්මිං අජ්ඣොහාරෙ පාචිත්තියං. * යනු අටුවා සී.

108 සත්තාහකාලිකො, සත්තාහකාලිකය; සත්තාහානි, සත්දවසක්; අතිනාමිතෙ, ඉක්මවනලද කල්හි; පාචිත්ති, නිසගී පචිති වෙයි; පාළිනාරූළ්හෙ, පාළියෙහි ආරූඪ නොවූ පෙළ නො ආවාවූ; සප්පිආදිම්හි, මිනුෂ්‍ය සප්පි ආදියෙහි, දුක්කටං, සත්ය ඉකුත් කල්හි දුකුළා වේ.

සබ්බාකප්පියමංසානං වජ්ජෙත්වා මංසමෙව ච
ඛීරං දධි ච සප්පි ච නවනීතඤ්ච වට්ටති. ‡

109 නිස්සට්ඨලද්ධං, නිසදලද ගිතෙල් ආදී; අඞ්ගං, ශරීරයෙහි; න මක්ඛෙය්‍ය, නොගාන්නේය; න ච අජ්ඣොහරෙය්‍ය, නොවළඳන්නේයි; සත්තාහෙ, සත්දවස ඇතුළත්හි; සාමණෙරස්ස, සාමණෙරයකුහට;

---

* සන්නිධිකතං, පිළිගෙන තබනලද; යං කිඤ්චි, යම් කිසි; යාවකාලිකං වා, යව්කාලියක් හෝ; යාමකාලිකං වා, යම් කාලියක් හෝ; අජ්ඣොහරිතුකාමතාය, කනු කැමැත්තෙන්; ගණ්හන්තස්ස, පිළිගන්නහුට; පටිග්ගහණෙ තාව, පිළිගැන්මෙහි පළමුකොට; ආපත්ති දුක්කටස්ස, දුකුළා ඇවැත් වේ. අජ්ඣොහරතො පන, අනුභවකරන්නහුට වනාහි; එකමෙකස්මිං අජ්ඣොහාරෙ, එකඑකවර ගිලීමෙහි; පාචිත්තියං, පචිති වේ;

‡ සබ්බාකප්පියමංසානං, සියලු නොකැපමස් ඇති සතුන්ගේ; මංසමෙව ච, මස්පමණක්; වජ්ජෙත්වා, හැර; ඛීරං, කිරි ද; දධි ච, දී ද; සප්පි ච, ගිතෙල් ද; නවනීතං ච, වෙඬරු ද; වට්ටති, වටී.

110 යාවකාලිකආදීනි සංසට්ඨානි සගත්තනා
ගාහාපයන්ති සබ්භාවං තස්මා එවමුදීරිතං.

111 පුරෙ පටිග්ගහීතඤ්ච සත්තාහං යාවජීවිකං
සෙසකාලිකසම්මිස්සං පාචිත්ති පරිභුඤ්ජතො.

112 යාවකාලිකසම්මිස්සා ඉතරං කාලිකත්තයං
පටිග්ගහිතං තදහු තදහෙව පරිභුඤ්ජයෙ.

113 යාමකාලිකසම්මිස්සා සෙසමෙවං විජානියං
සත්තාහකාලමිස්සඤ්ච සත්තාහං කප්පතීතරන්ති.

---

ඕභාසප්පත්තස්ස, ( ඉදං සප්පිං තුය්හං විකප්පෙමි යනාදීන්) විකපත් නාහටද; මක්ඛිතාදිං, අභ්‍යඤ්ජනාදි කොට; අධිට්ඨහොව, සිතින් සලකා (නුවහට ද; අසඤ්ඤස්ස, අනික් උපසම්පන්නක්හට; දදතො, දෙව, (නිරාලයව) දෙන්නාහටද; අනාපත්ති, ආපත්ති නැති.

110 යාවකාලිකආදීනි, යවකැලිආදීහු; අත්තනා සහ, තමන්හා සමග; සංසට්ඨානි, රසවිසින් එක්වූවන්; සබ්භාවං, තමතමන්ගේ (යාවකාලිකාදි) භාවය; ගාහාපයන්ති, ගන්වති; තස්මා, එහෙයින්; එවමුදීරිතං, පෙළඅටුවාහි මෙසෙයින් කියනලදී.

111 පුරෙ පටිග්ගහිතං, පෙර * පිළිගන්නාලද; සත්තාහඤ්ච, සත්තාහකාලිකයද; යාවජීවිකං, යාවජීවිකයද; සෙසකාලිකසම්මිස්සං (එදවස් පිළිගත්) සෙසු යවකැලි යම්කැලි හා මුසු කොට; පරිභුඤ්ජතො, වළඳන්නාහට; පාචිත්ති, සන්නිධිපාචිත්ති වේ.

112 යාවකාලිකසම්මිස්සං, යාවකාලිකය හා මුසුවූ; ඉතරං කාලිකත්තයං, අනික් තුන්කැළල; තදහු පටිග්ගහිතං, එදවස් පෙරවරු පිළිගන්නාලදද; තදහෙව, එදවස් පෙරවරුම; පරිභුඤ්ජයෙ, වළඳන්නේයි.

113 යාමකාලිකසම්මිස්සං, යාමකාලිකය හා මුසුවූ; සෙසං, අනික් සත්තාහකාලිකය හා යාවජීවකය; එවං, එසේම; (යම්කැලි කොට වැළඳිය යුතු යයි) විජානියං, දතයුත්තේයි; සත්තාහකාලමිස්සඤ්ච, සත්තාහකාලිකය හා මුසුවූ; ඉතරඤ්ච, යාවජීවිකය වනාහි; සත්තාහං, සත්දවසක්ම; කප්පති, වෙයි.

---

* පෙරවරු. පොත්හි.

## පටිග්ගාහො හොති,-

114 දතුකාමාභිහාරො ච හත්ථපාසොරණක්කමං
තිධා දෙනෙන ද්විධා ගාහො පඤ්චඞ්ගෙවං පටිග්ගහො.

115 අසංහාරෙ තත්ථ ජාතෙ සුඛුමෙ චිඤ්චආදිනං
පණ්ණෙ වාසය්හභාරෙ ච පටිග්ගාහො න රූහති.

---

යාවකාලිකමාහාරො පානකං යාමකාලිකං
සත්තාහකාලිකන්නාම සප්පිආදිකපඤ්චකං.
සෙසම්පන හලිද්දාදිභෙසජ්ජං යාවජීවිකං
චතුධා කාලිකා වුත්තා උදකං හොත්‍යකාලිකං. *

## පටිග්ගාහො හොති,-

### පටිග්ගාහො යන්නෙහි පිළිගැනුම් නම්:-

114 දතුකාම, දෙනු කැමැත්තහුගේ ; අභිහාරො ච, කයින් එළවීමද; හත්ථපාසො, දෙරියන් වියත් අත්පසබවද; ඌරණක්කමං, බලමැදුම් පුරුෂයෙකු නැගියහැකි බවද; තිධා දෙනෙන,(කායය කායපටිබද්ධය නිස්සග්ගියය යන) තුන්පරිද්දෙන් දෙනකල්හි; ද්විධා, (කායය කාය පටිබද්ධය යන) දෙපරිද්දෙන්; ගාහො, ගැන්ම ද යන; එවං, මෙසේ; පටිග්ගහො, පිළිගැන්ම; පඤ්චඞ්ගො, පංචාඞ්ගයක් ඇත්තේ යි.

115 අසංහාරෙ, තුබූතැනින් පහ නො කොටහැකි එලකපාසාණාදී යෙහි ද; තත්ථ ජාතෙ, රුක්හීම් හටගෙන තුබූ නෙලුම්පත් කැහැල පත් ආදිවූ පත්හිද; චිඤ්චආදිනං, සිනිබලා ආදින්ගේ; සුඛුමේ පණ්ණෙ වා, සියුම්පත්හිද; අසය්හභාරෙ ච, බලමැදුම් පුරුෂයකු නොනැගියහැකි භාරයෙහි ද; පටිග්ගාහො, පිළිගැන්ම; න රූහති, නො නැගෙයි.

---

* ආහාරො, (ඔදනාදි) ආහාරය තෙම; යාවකාලිකං, යාවකා ලික නම්; පානකං, (අෂ්ටවිධ) පානය තෙම; යාමකාලිකං, යාමකා ලික නම්; සප්පිආදිකපඤ්චකං, ගිතෙල්ආදිපස; සත්තාහකාලිකා නාම, සත්තාහකාලික නම්. සෙසං හලිද්දාදිභෙසජ්ජං පන, සෙසු කහසාදි බෙහෙත් වනාහි; යාවජීවිකං, යාවජීවික නම්; චතුධා, (මෙසේ) සතර ප්‍රකාරයකින්. කාලිකා, කාලිකයෝ; වුත්තා, වදාළහ; උදකං ජලය; අකාලිකං හොති, අකාලික වේ.

116 සික්ඛාමරණලිඞ්ගෙහි අනපෙක්ඛවිසග්ගතො
අච්ඡින්දනුපසම්පන්නාදානා ගාහොපසම්මති.

117 අප්පටිග්ගහිතං සබ්බං පාවීහාති පරිභුඤ්ජතො
සුඛුමං නාතිබහලං කප්පතෙ උදකං තථා.

118 අඞ්ගලග්ගමවිච්ඡින්නං දන්තක්ඛිකණ්ණගූථකං
ලොණස්සුඛෙලසිඞ්ඝාණී සෙම්හමුත්තකරීසකං

119 ගූථමත්තිකමුත්තානි ඡාරිකඤ්ච තථාවිධෙ
සාමං ගහෙත්වා සෙවෙය්‍ය අසන්තෙ කප්පකාරකෙ.

---

භූමියං අත්ථතෙසු සුඛුමෙසු තින්තිනීකාදිපණ්ණෙසු පි පටිග්ගහණං න රුහති නහි තානි සඞ්ඛාරෙතුං සමත්ථානි. * යනු අටුවා යි. සිනිඹලං පත්හි නොවටනා සිටුවා සිනිඹලා ආදී කොල ද්‍රුරුයෙහි වපියනු අටුවාසන්නය යි.

116 සික්ඛාමරණලිඞ්ගෙහි, සිකාප්විකීමෙන් කාලක්‍රියායෙන් ලිඞ්ගපෙරලීමෙන් ද; අනපෙක්ඛවිසග්ගතො, නිරාලය ව හැරපීමෙන් ද; අච්ඡිද, පැහැර ගැන්මෙන් ද; අනුපසම්පන්නාදානා, අනුපසපනක්හට දීමෙන් ද; ගාහො, පිළිගැන්ම; උපසම්මති, බිඳේ.

117-118. අප්පටිග්ගහිතං, නොපිළිගත්තා ද; සබ්බං, සියලුකැලි; පරිභුඤ්ජතො, වළඳන්නාහට; පාවීහාති, පැමිණි වේ; සුඛුමං, රජස් රෙහෙණු නැති; නාතිබහලං, ඉතා බොල් නොවූ; උදකඤ්ච, හිමොදකසමුද්දොදකාදිය වනාහි; කප්පතෙ, වටී.

අඞ්ගලග්ගං, ශරීරයෙහි ඇලුණාවූ; අවිච්ඡින්නං, සියතැතින් පහනොනූ; දන්තක්ඛිකණ්ණගූථකං, දන්තමල අක්ඛිමල කණ්ණමල ද; ලොණ, (සිරුරෙහි) නැගි ලුණු ද; අස්සු, කඳුලු ද; ඛෙළ, කෙළ ද; සිඞ්ඝානි මුකුණු ද; සෙම්හ, සෙම් ද; මුත්ත, මූත්‍ර ද; කරීසකං, අහරමල ද; තථා, එසේම ( කැප) යි.

119 ගූථ, අහරමල ද; මත්තික, මැටි ද; මුත්තානි, මූත්‍ර ද; ඡාරිකඤ්ච, හළු ද; තථාවිධෙ, එබඳු කල්හි; හෙවත් සපිදෂ්ටකාලයෙහි; කප්පකාරකෙ, පිළිගන්වනකැපකරුවක්හු; අසන්තෙ, නැතිකල්හි; සාමං ගහෙත්වා, තමා ම ගෙන; සෙවෙය්‍ය, වළඳන්නේ යි.

---

* භූමියං අත්ථතෙසු, බිම අතුරනලද; සුඛුමෙසු සියුම්වූ; තින්තිනීකාදිපණ්ණෙසුපි, සිනිඹලාආදී පත්‍රයන්හිද; පටිග්ගහණං, පිළිගැන්ම; න රුහති, නො නැඟේ; තානි, ඕහු; සඞ්ඛාරෙතුං, දරන්ට; න හි සමත්ථානි, නො ම සමර්ථයෝ යි.

120 දුරුපවිසෙණෙණ රජොකිණෙණ අඞ්ගණහපවිගාහෙ
අනෙනතාවුතෙප සසංපෙක්ඛෙ අනෙපෙක්ඛෙ ච දුක්කටානි

මංසෙසු ච අකප්පියනානි,

121 මනුස්සහත්ථිඅස්සානං මංසං සුණඛදීපිනං
සීහබ්‍යග්ඝතරච්ඡානං අච්ඡස්ස උරගස්ස ච.

---

චත්තාරි මහාවිකටානි අසති කප්පියකාරකෙ සාමං ගහෙත්වා පරිභුඤ්ජිතුං වට්ටන්ති එසො ච දුබ්බලො පි අසමත්ථො පි කප්පියකාරකො අසන්තපක්ඛෙයෙව තිට්ඨති. * යනු අටුවා යි.

120 දුරුපවිසෙණෙණ, නොපිවිසිගත් ආමිසහත්ථතාපනාදි කෙළිවිසින් අතින් පිරිමැදීමෙහි ද; රජොකිණෙණ, රජස්වලපාත්‍රා නොපිළිගත් චාම අහරගැන්මෙහි ද; අථ, නැවත; උග්ගහපටිග්ගහෙ, නොපිළිගත් බව දැනදැන ගත් කාලද්දි නැවතත් පිළිගැන්මෙහි ද; අනෙනතාවුතෙප, අයපකිළිපිතබා අරුණු ඉක්මවූයෙහි ද; සසම්පෙක්ඛෙ, තමාපිදුයෙහි ද; අනෙපෙක්ඛෙ, අයපකිළිප ඇතුළෙහි පිහුණුයෙහි ද; දුක්කටං, දුකුළාවේ.

මංසෙසු ච අකප්පියනානි,-

මංසෙසු ච අකප්පියං යන්නෙහි අකප්පියමාංස නම්:—

121 මනුස්සහත්ථිඅස්සානං, මිනිසුන් හා ඇතුන් හා අසුන්ගේ ද; සුණඛදීපිනං, බල්ලන් හා දිවියන්ගේ ද; සීහබ්‍යග්ඝතරච්ඡානං, සිංහයන් ව්‍යාඝ්‍රයන් තරසුන්ගේ ද; අච්ඡස්ස, වලසුන්ගේ ද; උරගස්ස ච, අපාදකාදිසීජාතීන්ගේ ද, මංසං, මාංස; (න කප්පති, නො වටී;) අපාදකස්ස දීඝජාතිකස්සා ති, අභිජාති යෙව පච්ඡ්ඛිත්තා මලංකාදිමච්ඡා අපාදකා පි වට්ටන්තා ව + 'මලුඩක' ආදි, යනු විනය සනා යි.

---

* චත්තාරි මහාවිකටානි, (මල-මූත්‍ර-මැටි-හළුගන යෙ) සතර මහා විකටයෝ; කප්පියකාරකෙ අසති, කැපකරුවකු නැතිකල්හි; සාමං අපි, තෙමේම; ගහෙත්වා, ගෙන; පරිභුඤ්ජිතුං, වළඳන්ට; වට්ටන්ති, වටී; එසො ච, මෙහි ද; දුබ්බලො පි, නො කිසාවූ ද; අසමත්ථො පි, ශක්තිමත් නොවූද; කප්පියකාරකො, කැපකරුතෙම; අසන්තපක්ඛෙයෙව, අවිද්‍යමාන පක්ෂයෙහිම; තිට්ඨති, සිටී.

† අපාදකස්ස දීඝජාතිකස්සා ති, පානැතිදීසීජාතීන්ගේ යන වචනයෙන්; අභිජාතියෙව, සර්පජාතිය ම; පච්ඡ්ඛිත්තා, ප්‍රතික්ෂෙප කරනලදි; මලංකාදිමච්ඡා, ආදින් අංගු මත්ස්‍යයෝ; අපාදකාපි, පානැත්තෝද; වට්ටන්ති එව, වටීන් මැ යි.

122 උද්දිස්ස කතමංසඤ්ච යඤ්ච අප්පටිවෙක්ඛිතං
ථුල්ලච්චයං මනුස්සානං මංසෙ සෙසෙසු දුක්කටං.

123 අට්ඨිපි ලොහිතං චම්මං ලොමමෙපසං න කප්පති
සචිත්තකං'ව උද්දිස්ස කතං සෙසා අචිත්තකා.

**“නිස්සග්ගියානි”ති.**

124 අරූපියං රූපියෙන රූපියං ඉතරෙන ච
රූපියං පරිවත්තෙන්තස්ස නිස්සග්ගිය ඉධ රූපියං.

---

122 උද්දිස්ස කතමංසඤ්ච, (පස්සහද්ධියන් කෙරෙහි යම්කිසිවෙකු) උදෙසා මැරූ (ගොඩමස් දියෙහි) මස්ද; යඤ්ච, යම් මාංසයක්; අප්පටිවෙක්ඛිතං, (කවර මස් දැයි) නොවිචාරනලද ද; (තස්ස, එහද,) න කප්පති. නො වටී; මනුස්සානං මංසෙ, මනුෂ්‍යමාංසයෙහි; දුක්කටං, දුකුලා වේ.

(“අලං දෙවදත්ත මයා තිකොටිපරිසුද්ධං මච්ඡමංසං අනුඤ්ඤාතං අදිට්ඨං අසුතං අපරිසංකිතං”* යන පාඨයෙන් උදෙසා මැරූ මත්ස්‍ය යනුදු නොවටනාබව වදාළබැවින් “උද්දිස්ස කතමංසඤ්ච” යන්නෙහි “ච”, ශබ්දයෙන් දියෙහි මස්ද ගතයුතු. “සචෙ පන අසුකමංසන්ති ජානාති පච්චුවජනකිච්චනාපත්ති අජානන්තෙනාන පන පුච්ඡිත්වා ‘ව ඛාදිතබ්බං” + යනු අටුවායි. දියෙහි මස් නොවටනා නැතිබැවින් එළි විසුම් නැති.)

123 ඒසං, මේ දසදෙනාගේ; අට්ඨිපි, ඇටද; ලොහිතං, ලේහෙද; චම්මං, සම්ද; ලොමම්පි, ලොම්ද; නකප්පති, නොවටී; උද්දිස්ස කතං එව, උදෙසා කළ මත්ස්‍යමාංසම; සචිත්තකං, සචිත්තකය; සෙසා අවශෙෂ (මාංස) යෝ; අචිත්තකා, අචිත්තකයෝයි. (මෙහි සචිත්තකා නම් ආපත්තිය මෙතැන ඒ ඇවතවගේතුවූ මස්පලොපචාර විසින් සචිත්තක නම්වී–මෙහි සිත නම් තමා හෝ සහදම්මියන් හෝ උදෙසා කළබව දන්නාසිතී )

**“නිස්සග්ගියානි” ති,–**

නිස්සග්ගියානි යන්නෙහි නිස්සග්ගිපචිති නම්:–

124 125 රූපියෙන, නිසඟිවතින්; අරූපියං, කැපවත් හා දුකුලා වත් ද; රූපියං, අකැපවත් ද; ඉතරෙන, අරූපියයෙන්; රූපියසඳුව,

---

* දෙවදත්ත, දෙවදත්තය; අලං, (තාගේ, වරයෙන්) කම් නැත, මයා, මාවිසින්; අදිට්ඨං, (උදෙසා මරනු)නොදක්නාලද; අසුතං, නො අසනලද; අපරිසංකිතං, සැකනොකරනලද; (යනමේ) තිකොටිපරිසුද්ධං, තෙකොළ පිරිසිදුවූ; මච්ඡමංසං, මත්ස්‍යමාංස; අනුඤ්ඤාතං, අනුදන්නාලදී.

+ සචෙ පන, ඉදින් වනාහි; අසුකං මංසං ඉති, අසවල් මාංස යයි, ජානාති, දනී නම්; පච්චුවජනකිච්චං, විචාරීම් කටයුත්තක්; නත්ථි, නැත. අජානන්තෙන පන, නොදන්නහු විසින් වනාහි; පුච්ඡිත්වා එව, විචාරාම; ඛාදිතබ්බං, කෑයුතු.

125 කහාපණා සජ්ඣු සිඞ්ගී වොහාරූපගමාසකං
වත්ථමුත්තාදි ඉතරං කප්පං දුක්කටවත්ථු ච.

126 ඉමං ගණ්හෙත්වා භුත්වා වා ඉමං දෙහි කරානය
දෙහීවංති සමාපන්නෙ නිස්සග්ගි කයවික්කයෙ.

---

නිසගිවත් ද; පරිවත්තනාය, පෙරළී කෙරේ නම්; නිස්සග්ගි, නිසගී (පචිති) වේ; ඉධ, මෙහි; කහාපණා, (සුවර්ණාදියෙන් කළ) කහවුණු ද; සජ්ඣු, රිදී ද; සිඞ්ගී, රත්රන් ද; වොහාරූපගමාසකං, (ඒ ඒ දෙශයෙහි) ව්‍යවහාරයට යන්නාවූ (ලොහාදියෙන් කළ) මාසකය ද; රූපියං, රූපිය නම්; වත්ථමුත්තාදි, පිළි මුතු ආදිවූ; කප්පං දුක්කටවත්ථු ච, කැපවත් දුකුළාවත් ද; ඉතරං, අරූපිය නම්.

126 ඉමං ගණ්හෙත්වා, මේ (තණ්ඩුලාදිය) ගෙන, ඉමං භුත්වා, මේ(ඔදනාදිය) අනුභව කොට; ඉමං දෙහි වා, මේ(වස්ත්‍රාදිය) දෙවයි හෝ; ඉමං කරවා, මේ (රජනපචනාදිය) කරයි හෝ; ඉමං ආනය වා, මේ (රජනකාෂ්ඨාදිය) ගෙනෙවයි හෝ, දෙහි වා; (මේ තව) දෙහි(තව වනාහි මේ දෙව මේ කරව මේ ගෙනෙව)යි හෝ; ඉති, මෙසේ; කයවික්කයෙ සමාපන්නෙ, ගනුදෙනු කළ කල්හි; නිස්සග්ගි, නිසගිපචිති වේ.

(''අයං හි කයවික්කයො ඨපෙත්වා පඤ්ච සහධම්මිකෙ අවසෙසෙහි ගිහීහි පබ්බජිතෙහි අන්තමසො මාතාපිතූහි'පි සද්ධිං න වට්ටති, මාතරම්පන පිතරං වා ඉමං දෙහීති වදතො විඤ්ඤත්ති න හොති. ඉමං ගණ්හාහී'ති දදතො සද්ධාදෙය්‍යවිනිපාතනං න හොති, අඤ්ඤාතකං ඉමං දෙහී'ති වදතො විඤ්ඤත්ති, ඉමං ගණ්හාහී'ති දදතො සද්ධාදෙය්‍යවිනිපාතනං, ඉමිනා ඉමං දෙහී'ති කයවික්කයං ආපජ්ජතො නිස්සග්ගියං, තස්මා කප්පියභණ්ඩං පරිවත්තෙන්තෙන මාතාපිතූහි පි සද්ධිං කයවික්කයං අඤ්ඤාතකෙහි සද්ධිං තිස්සො ආපත්තියො මොචෙන්තෙන පරිවත්තෙතබ්බං, තත්‍රායං පරිවත්තන විධි:- භික්ඛුස්ස පාථෙය්‍යතණ්ඩුලා හොන්ති සො අන්තරාමග්ගෙ භත්තහත්ථං පුරිසං දිස්වා අම්හාකං තණ්ඩුලා අත්ථි න ච නො ඉමෙහි අත්ථො, භත්තෙන පන අත්ථො ති වදති පුරිසො තණ්ඩුලෙ ගහෙත්වා භත්තං දෙති වට්ටති, තිස්සො'පි ආපත්තියො න හොන්ති අන්තමසො නිමිත්තකම්මමත්තම්පි න හොති, කස්මා මූලස්ස අත්ථිතාය.

අයං තව පත්තො කිං අග්ඝතීති පුච්ඡති ඉමං නාමාති වුත්තෙ පන සචෙ තස්ස කප්පියභණ්ඩං මහග්ඝං හොති එවඤ්ච නං පටිවදති උපාසක මම ඉදං වත්ථු මහග්ඝං තව පත්තං අඤ්ඤස්ස දෙහීති, තං සුත්වා ඉතරො අඤ්ඤං ථාලකම්පි දස්සාමී'ති වදති ගණ්හිතුං වට්ටති. ඉදං අම්හාකං අත්ථීති වුත්තඵලකභණ්ඩෙ පතති සචෙ සො පත්තො මහග්ඝො භික්ඛුනො වත්ථු අප්පග්ඝං පත්තසාමිකස්සාවස්ස

අප්පග්ඝභාවං න ජානාති පවෙසෙතා න ගහෙතබ්බො, ඔමි වත්ථු අප්පග්ඝන්ති ආචික්ඛිතබ්බං, මහග්ඝභාවං ඤත්වා වදන්තස්ස ගණ්හන්තොපි භණ්ඩං අග්ඝාපෙත්වා කාරෙතබ්බතං ආපජ්ජති. සචෙ පන සාමිකො හොතු භන්තෙ සෙසං මම පුඤ්ඤං භවිස්සතීති දෙති වට්ටති." * යනු අටුවා යි.

"සහත්ථං පරභණ්ඩස්මිං පරහත්ථගතෙ අත්තනො.
භණ්ඩකෙ පන සම්පත්තෙ නිස්සග්ගියමුදීරිතං." ‡

---

අයං හි කයවික්කයො, මේ ගනුදෙනු කිරීම වනාහි; පඤ්ච සහධම්මිකෙ ඨපෙත්වා, පස් සහදම්මියන් හැර; අවසෙසෙහි, සෙසු; ගිහීහි, ගිහියන් හා ද; පබ්බජිතෙහි, පැවිද්දන් හා ද; අනාථමෙසො යටත්පිරිසෙයින්; මාතාපිතූහිපි සද්ධිං, මව්පියන් සමග පවා; න වට්ටති, නො වටී.

මාතරං පන, මවට හෝ; පිතරං වා; පියාට හෝ; ඉමං දෙහි ඉති, මෙය (මට) දෙව යි, වදතො, කියන්නාට; විඤ්ඤත්ති න හොති, විනවීම් ඇවත නො වේ. ඉමං ගණ්හාහි ඉති, මෙය (මාගෙන්) ගනුව යි; දදතො, දෙන්නහුට; සද්ධාදෙය්‍යවිනිපාතනං, සැදැහැයෙන් දුන්දෙය නැසීමෙහි ඇවත; න හොති, නො වේ. අඤ්ඤාතකං, නොනෑයෙකුට; ඉමං දෙහි ඉති, මෙය (මට) දෙව යි; වදතො, කියන්නහුට; විඤ්ඤත්ති, විනැවීම් ඇවැත් වේ. ඉමං ගණ්හාහි ඉති, මෙය (මාගෙන්) ගනුව යි; දදතො, දෙන්නහුට; සද්ධාදෙය්‍යවිනිපාතනං, සැදැහැයෙන් දුන්දෙය නැසීමෙහි ඇවැත් වේ. ඉමිනා, මෙයින් හෙවත් මෙය ගෙන; ඉමං, මෙය; දෙහි ඉති, දෙව යි; කයවික්කයං ආපජ්ජතො, ගනුදෙනු කරන්නහුට; නිස්සග්ගියං, නිසගී පචිති වේ. තස්මා, එහෙයින්; කප්පියභණ්ඩං, කැපබඩු; පරිවත්තෙන්තෙන, පෙරලී කරන්නහු විසින්; මාතාපිතූහි සද්ධිං අපි, මව්පියන් සමග වුවත්; කයවික්කයං, කයවික්කය නිසගිය ද; අඤ්ඤාතකෙහි සද්ධිං, නොනෑයන් සමග; තිස්සො ආපත්තියො, (විඤ්ඤත්ති-සද්ධාදෙය්‍යවිනිපාතන-කයවික්කය යන මේ) තුන් ඇවැත්ද; මොචෙන්තෙන, මුදන්නහු විසින්; පරිවත්තෙතබ්බං, පෙරලි කළ යුතු. තත්‍ර, එහි; අයං, මේ; පරිවත්තනවිධි, පෙරලිකරනක්‍රමයයි; භික්ඛුස්ස, භික්ෂුහුගේ; පාථෙය්‍යතණ්ඩුලා, මගවියදමට සාල්, හොන්ති, වෙති; සො, හෙතෙම; අන්තරාමග්ගෙ, අතරමග; භත්තහත්ථං, අතෙහි බත් ඇත්තාවූ; පුරිසං, පුරුෂයකු; දිස්වා, දැක; අම්හාකං, අපගේ; තණ්ඩුලා, සාල්; අත්ථි; ඇත්තාහ; නො, අපට; ඉමෙහි, මෙයින්;

අත්ථො, වැඩෙක්; න ච අත්ථි, නො ද ඇත; භත්තකාල පන, බතින් වනාහි; අත්ථො ඉති, වැඩ ඇතැයි; වදති, කියයි. පුරිසො, (බත් ඇති) පුරුෂතෙමේ; තණ්ඩුලෙ, සාල්; ගහෙත්වා, ගෙන; භත්තං බත්; දෙති, දෙයි. වදන්ති, (මෙසේ පි නඩ්) එවී. තිස්සොපි ආපත්ති යො, තුන්ඇවැත්හුම්; න හොන්ති, නො වෙති. අනාමසො, යටත්පිරි සෙයින්; නිමිත්තකම්මමත්තම්පි, නිමිත්තකර්මමාත්‍රයකුදු; න හොති, නො වේ. කස්මා, කවර හෙයින්ද? මූලස්ස අත්ථිතාය, මිලඇති හෙයිනි.

අයං තව පත්තො, මේ තාගේ පාත්‍රය; කිං අග්ඝති ඉති, කුමක් අගනේ දැයි; පුච්ඡති, විචාරයි; ඉමං නාම ඉති, මේ නම් අගනේ යයි; වුත්තෙ පන, කීකල්හි වනාහි; සචෙ, ඉදින්; තස්ස, ඒ භික්ෂුහුගේ; සාපපියනණ්ණං. කැපබඩුව; මහග්ඝං හොති, මහත්අගය ඇත්තේ වේ ද; එවං ච, මෙසේ ද; තං, ඒ පුරුෂයාට; පටිවදති, නැවත කියයි; උපාසක, උපාසකය; මම, මාගේ; ඉදං වත්ථු, මේ වස්තුව; මහග්ඝං මහත්අගය ඇත්තේ ය; තාව, තාගේ; පත්තො, පාත්‍රය; අප්පග්ඝො, ස්වල්පකාකුට්; දෙහි ඉති, දෙව යි; තං සුත්වා, ඒ අසා; ඉතරො, අනිකා; අ ඤ්ඤං, අනික්; ථාලකං අපි, තල්පකුදු; දස්සාමි ඉති, දෙන්නෙමි යි; වදති, කියයි වට්ටති, (ප්‍රක්‍රියත්ව) එවී, (ඇවැත් නැති) ‘ඉදං අම්හා කං අත්ථි ඉති, ඉදං අම්හාකං අත්ථි’ යනාදීන්; වුත්තලක්ඛණෙන, (කායවිඤ්ඤත්තියසිකාපද අනාපත්තිවාරයෙහි) කියනලද ලක්ෂණයෙනි; පතති, වැටේ; හෙවත් අන්තර්ගත වේ. සචෙ. ඉදින්; සො පත්තො, ඒ පාත්‍රය තෙමේ; මහග්ඝො මහත්අගය ඇත්තේ වේ ද; භික්ඛුනො, භික්ෂුහුගේ; වත්ථු,වස්තුව; අප්පග්ඝං, ස්වල්පවූ අගය ඇත්තේ වේ ද; පත්තසාමි කො ච, පාත්‍ර හිමි තැනැත්තේ ද; අස්ස, ඒ භික්ෂුසන්තකවස්තුහුගේ; අප්පග්ඝභාවං, ස්වල්පවූ අගය ඇතිබව; න ජානාති, නො දනී ද; ප ත්තො, පාත්‍රතෙමේ; න ගහෙතබ්බො, නො ගත යුත්තය. මම වත්ථු, මාගේ වස්තුව; අප්පග්ඝං ඉති, ස්වල්පවූ අගය ඇත්තේ යයි; ආචි ක්ඛිතබ්බං, කිය යුතු, මහග්ඝභාවං, මහත්අගය ඇතිබව; ඤත්වා,දැන: විසෙසම්පි ත්වා, රවටා; ගණ්හන්තොපි, ගන්නේ වනාහි; භණ්ඩං, බඩුව; අග්ඝාපෙත්වා, මිල නියම කරවා; කාරෙතබ්බො තං, ඇවැත් ආ රොපණය කළයුතු බවට; ආපජ්ජති, පැමිණේ. සචෙ, ඉදින්; පත්ත සාමිකො, පාත්‍රය හිමි තැනැත්තේ; භන්තෙ, ස්වාමීනි; හොතු, වේවා; සෙසං, සෙස්ස; මම, මට; පුඤ්ඤං භවිස්සති ඉති, කුසල් වන්නේ යයි; දෙති, දෙයි ද; වට්ටති, වටී.

‡ සභාවං, සියඅත, පරභණ්ඩසම්ං, අන්සතුබඩුවෙහි ද, පරභ භාවං ච,පරභාවය ද; අත්තනො භණ්ඩකෙ පන, තමාගේ බඩුවෙහි; සම්පත්තෙ, පැමිණි කල්හි; නිස්සඞ්ගියං, නිසඟිය; උදීරිතං, කියන ලදී. (මේ වංගටිනිසග්ගිය යි.)

127 අත්තනො අඤ්ඤතො ලාභං සඞ්ඝස්සඤ්ඤස්ස වා නතං
පරිණාමෙය්‍ය නිස්සග්ගි පාචිත්ති වා'පි දුක්කටං.

128 අනිස්සජ්ජිත්වා නිස්සග්ගිං පරිභුඤ්ජෙ න දෙය්‍ය වා
නිස්සට්ඨං සකසඤ්ඤාය දුක්කටං අඤ්ඤථෙතරන්ති.

---

127 සඞ්ඝස්ස, සඟහට හෝ; අඤ්ඤස්ස වා, අනිකෙකුහට හෝ; නතං ලාභං, (දෙමි කොරෙමි යි වාක්භෙද විසින්) පිරිනැමූ චීවරාදි ප්‍රත්‍යය; අත්තනො වා, තමහට හෝ; අඤ්ඤතො වා, අනිකෙකුහට හෝ; පරිණාමෙය්‍ය, පිරිනමා නම්; නිස්සග්ගි, නිසගිපචිති ද; පාචිත්තිවාපි, සුද්ධපාචිත්තී ද; දුක්කටං, දුකුළා ද වේ.

"සඞ්ඝස්ස නතං ලාභං අත්තනො පරිණාමෙය්‍ය නිස්සග්ගි, අඤ්ඤතො පරිණාමෙය්‍ය පාචිත්ති, අඤ්ඤස්ස නතං ලාභං අත්තනො අඤ්ඤතො වා සඞ්ඝස්ස වා පරිණාමෙය්‍ය දුක්කටං." * යි යොදනු.

128 නිස්සග්ගිං, නිසගියුතු (චීවරාදි) වස්තුව; අනිස්සජ්ජිත්වා, නො නිසජා; (විනයකම් නො කොට;) පරිභුඤ්ජෙ, වැළඳගත් කම් හෝ; නිස්සට්ඨං, (විනයකම් පිණිස නිසපුවා; සකසඤ්ඤාය, තමාගේ ය යන සිතින්; න දෙය්‍ය වා, නො දේ නම් හෝ; දුක්කටං, දුකුළා වේයි; අඤ්ඤථා, ඔහු සතුබව දැන දැන ලෙසයෙන් නො දේ නම්; ඉතරං, ඒ භාණ්ඩයෙහි අගයවූ පරිද්දෙන් පාරාජිකාදී ඇවැත් වේ.

"මය්හං දින්නං ඉමිනාති ඉමාය සඤ්ඤාය න දෙන්තස්ස දුක්කටං; තස්ස සන්තකභාවං පන ඤත්වා ලෙසෙන අච්ඡින්දන්තො භණ්ඩං අග්ඝාපෙත්වා කාරෙතබ්බො." † යනුද,

"මාසකෙ වා ඌනමාසකෙ වා දුක්කටං අතිරෙකමාසකෙ වා ඌනපඤ්චමාසකෙ වා ථුල්ලච්චයං පඤ්චමාසකෙ වා අතිරෙකපඤ්චමාසකෙ වා පාරාජිකා" × යනුද අටුවායි.)

---

* සංඝස්ස, සංඝයාට; නතං, (වචනයෙන්) පිරිනමනලද; ලාභං, ලාභය; අත්තනො, තමහට; පරිණාමෙය්‍ය, පිරිනමා නම්; නිස්සග්ගි, නිසගි වේ; අඤ්ඤතො, අනිකෙකුහට; පරිණාමෙය්‍ය, පිරිනමා නම්; පාචිත්ති, සුද්ධපචිති වේ; අඤ්ඤස්ස, අනිකෙකුට; නතං, නතු කළාවූ; ලාභං, ලාභය; අත්තනො වා, තමාට හෝ; අඤ්ඤතො වා, අනිකෙකුහට හෝ; සඞ්ඝස්ස වා, සඞ්ඝයාට හෝ; පරිණාමෙය්‍ය, පිරිනමා නම්; දුක්කටං, දුකුළා ඇවැත් වේ.

† ඉමිනා, මෙහු විසින්; මය්හං, මට; දින්නං ඉති, දෙනලද්දේය යන; ඉමාය සඤ්ඤාය, මේ සංඥාවෙන්; න දෙන්තස්ස, නො දෙන්නාහට; දුක්කටං, දුකුළා වේ. තස්ස සන්තකභාවං පන, ඔහු සතුබව වනාහි; ඤත්වා, දැන; ලෙසෙන, ව්‍යාජයෙන්; අච්ඡින්දන්තො, අසිදගන්නේ; භණ්ඩං, බඩුව; අග්ඝාපෙත්වා, මිල කොට; කාරෙතබ්බො, ඇවැත් නියම කළ යුතු.

× මාසකෙ වා, මස්සෙහි හෝ; ඌනමාසකෙ වා, ඌනමස්සෙහි හෝ; දුක්කටං, දුකුළා ඇවැත් වේ; අතිරෙකමාසකෙ වා, අති

"පාචිත්ති" ති,

129 මුසාවාදොමසවාදෙ පෙසුඤ්ඤහරණෙ තථා
පදසොධම්මසාගාර උජ්ඣාපනකඛීයනෙ.

130 තලසත්තිඅනාදර කුක්කුච්චුප්පාදනෙසු ච
ගාමප්පවෙසනාපුච්ඡා භොජනෙ ච පරම්පරා.

131 අනුද්ධරිත්වා ගමනෙ සෙය්‍යං සෙනාසනානි ච
ඉත්ථියද්ධාන ගමනෙ එකෙකාය නිසීදනෙ.

---

"පාචිත්ති" ති,

පාචිත්ති යන්නෙහි සුද්ධපාචිත්ති නමි.

---

129 මුසාවාදෙ, දැන දැන මුසාවාද කීමෙහි ද; ඔමසවාදෙ, උපසම්පන්නහට ජාත්‍යාදින් ගටා කීමෙහි ද; පෙසුඤ්ඤහරණෙ, කේලාම් කීමෙහි ද; තථා, එසේම; පදසොධම්ම, කැටි ව කියා (අනුපසම්පන්නහු හා) බණ හැදෑරීමෙහි ද; සාගාර, (අනුපසම්පන්නන් හා මාගමුන් හා) සමග එකගෙයි රෑ හෙවීමෙහි ද; උජ්ඣාපනක, (සංඝසම්මුති ලද මහණහු) ලාමක කොට සිතවීමෙහි ද; ඛීයනෙ, (ඔහුගේ) අගුණ කීමෙහි ද.

130 තලසත්ති, උපසම්පන්නහට (දැහැටිසිතින්) අත්සත් ඔසවීමෙහි ද; අනාදර (සංඝයෙහි වත් පුද්ගලයා කෙරෙහි වත්) අනාදර කිරීමෙහි ද; කුක්කුච්චුප්පාදනෙසු ච, (උපසම්පන්නහට නිෂ්කාරණෙහ්) කුකුස් ඉපදවීමෙහි ද; අනාපුච්ඡා, (දෙලොස්රියනක ඇතිමහණහු "විකාලෙ ගාමප්පවෙසනං ආපුච්ඡාමි" යි, * නොපිළිවිස; ගාමප්පවෙසෙ, (විකාල්) ගම්වැදීමෙහි ද; පරම්පරා භොජනෙ ච, (භොජනනාමයෙන් පැවරූ පිළිවෙළ මිස නොවිකප්පා උත්පටිපාටියෙන් වැළඳීමෙහි ද.

(මෙහි විකපීම් නම්: "මය්හං භත්තපච්චාසං තුය්හං විකප්පෙමි"† යනාදින් විකපීම යි.)

131 සෙය්‍යං, (හිඳිවිලිනාදි දසවැදෑරුම්) සෙය්‍යා ද; සෙනාසනානි ච, මඤ්චපීඨාදිචතුර්විධ) සයනාසන ද; අනුද්ධරිත්වා,

---

රෙකමාසකෙකෙහි හෝ; ඌනපඤ්චමාසකෙ වා, ඌනපස්මසුයෙහි හෝ; ථුල්ලච්චයං, තුලසි ඇවැත් වේ; පඤ්චමාසකෙ වා, පස් මසුයෙහි හෝ; අතිරෙකපඤ්චමාසකෙ වා, අතිරෙකපඤ්චමාසකයෙහි හෝ; පාරාජිකං, පරිජි ඇවැත් වේ.

* විකාලෙ, විකාලයෙහි; ගාමප්පවෙසනං, ගම්වැදීම; ආපුච්ඡාමි, පිළිවිසිමි.

† මය්හං, මාගේ; භත්තපච්චාසං, බත්ලැබීමෙහි බලාපොරොත්තුව; තුය්හං, තට; විකප්පෙමි, විකපමි; නෙවත් දෙමි.

132 හිංසාපනාකොටනඅංකුසවාද
විහෙසදුට්ඨුල්ලපකාසඡාදෙ
හාසොදකෙ නිච්ඡුහනෙ විහාරා
පාචිත්ති වුත්තා ‘නුපඛජ්ජ සායෙ ති-

---

නගා හො තිඩා; ගමනෙ, (යානාරූඪයෙන් උපචාරසීමා හා දෙනැවක තක් ඉක්ම බැහැර) යාමෙහි ද; ඉත්ථියා, මාගමක හාසමග; (ඩැංශ ගෙන) අද්ධානගමනෙ, (ගම්අතුරෑ අඩයොජන යන) දුරුමග යාමෙහි ද; එකො, හුදකලාව; එකාය, හුදකලා මාගමක හා සමග; නිසීදනෙ, (රහස්තැන) හිඳීමෙහිද,

132 හිංසාපන, (උපසපනක්හු) බැවීමෙහි ද; ආකොටන (උපසප නක්හු දැහැවීකිතිත්) පැහැරීමෙහි ද; අඞ්කුරවාද, (වත් ඇවැත් මිසින් සඟමැද විචාල දෙය තබා) අනිකක් කීමෙහි ද; විහෙස,(එ සේම විචාලදෙය නොකීයා) වෙහෙසීමෙහි ද; දුට්ඨුල්ල, (උපසප නක්හු අවත්) සඟමෙවෙසස් ඇවැත්; පකාස, (සඬසම්මුතිය නැ තිව අනුපසපන්නහට) කීමෙහි ද; ඡාදෙ, (උපසපනක්හට) සැ හවීමෙහි ද; හාසෝදකෙ, අඞ්ගුලිපතොදකායෙන් කෙළීම හා දියෙහි කෙළීමෙහි ද; විහාරා, සඟරමින්; නිච්ඡුහනෙ, (රැහැණිව උපසපනක්හු) නෑසීමෙහි ද; අනුපඛජ්ජසායෙ, (උපසපනක්හු) ආසන්නයට වැද හැහැට වන සේ) නොවීම් හිඳීමෙහි ද; පාචිත්ති වු ත්තා, පචිති ඇවැත් කියනලදු.

("භිසි චිමිලිකා භූමත්ථරණං උත්තරත්ථරං
තට්ටිකා චම්මඛණ්ඩා ච පච්චත්ථර නිසීදනං
සන්ථාරො තිණපණ්ණානං සෙය්‍යා දසවිධා සියා." *
" මඤ්චො පීඨං භිසි කොච්ඡන්ති චතුබ්බිධං සෙනාසනං".†)

---

* භිසි, (ඇඳපුටුවෙදක්හි ලන) බිසි ද; චිමිලිකා,පිරියම්කලබිම රක්නා පිණිස අතුරන) සිවිලියාව ද; භූමත්ථරණං, සාලාලආදි බිමඅතුරන දේ ද; උත්තරත්ථරං, ඇඳපුටුමත්තෙහි අතුරන ඇතිරිලි ද; තට්ටිකා, (පතින් හෝ වැහැරින් කළ) පැදුරු ද; චම්මඛණ්ඩා ච, සම් කඩ ද; පච්චත්ථර, (පලස් ආදි) පසතුරුණු ද; නිසීදනං, නිසි දනම්බරය ද; තිණපණ්ණානං සන්ථාරො. තණඇතිරිය හා කොළ ඇතිරිය දැයි; සෙය්‍යා, සෙය්‍යාව; දසවිධා, දශප්‍රකාරයකින්; සියා, වන්නේ යි.

† මඤ්චො, ඇඳද; පීඨං, පුටුවද; භිසි, බිස්සද; කොච්ඡං ඉති, හද්දපීඨ යයි; සෙනාසනං, සෙනාස්න; චතුබ්බිධං, සතර ආකාර වේ.

“සමණකප්පා චා” ති:-

133 භූතගාමසමාරම්භෙ පාචිත්ති ඝාතකප්පියා
ගාහාපනවා'ග්ගිසත්ථෙහි භවෙ සමණකප්පියා.

134 සමූලඛන්ධබීජග්ගඵළුබීජප්පභාවිතො
ආරම්භෙ දුක්කටං බීජං භූතගාමවියොජිතං.

---

“සමණකප්පා චා”ති,
සමණකප්පා ච යන්නෙහි ශ්‍රමණව්‍යවහාර නම්.:

133 භූතගාම, (රුක්ඛලතාදී) භූතගාමයාගේ; සමාරම්භෙ, ඡේදනභේදනාදියෙහි; පාචිත්ති, පචිති වේ; ගාහාපන වා, ගැන්වීයෙන් හෝ; අග්ගිසත්ථෙහි, ගින්නෙන් හෝ ශස්ත්‍රයෙන් හෝ; ඝාතකප්පියං, කැපකරනලද්දේ; සමණකප්පියං භවෙ, ශ්‍රමණකැප නම් වන්නේ යි.

“භවන්ති අහෙසුං චාති භූතා, ජායන්ති වඩ්ඪන්ති ජාතා ච වඩ්ඪිතා චා ති අත්ථො. ගාමො'ති රාසි. භූතානං ගාමො'ති භූතගාමො, භූතා එව වා ගාමො ‘භූතගාමො,’ පතිට්ඨිතහරිතතිණරුක්ඛාදීනමෙතමධිවචනං.” *

134 සො, ඒ (භූතගාමය) තෙම; මූල, මුල් (බිජු) ය; ඛන්ධ, කඳ (බිජු)ය; බීජ, ඇට (බිජු)ය; අග්ග, කොළ (බිජු)ය; ඵළුබීජ, පුරුක්බිජුය; (යන පඤ්චවිධ බීජයෙන්) පභාවිතො, වූයේ ද; භූතගාමවියොජිතං, භූතගාමයෙන් වෙන්කරනලද; බීජං, බීජගාමය; ආරම්භෙ, ඡේදනභේදනාදියෙහි; දුක්කටං, දුකුළා වේ.

“පඨමං කප්පියං කාරෙහී'ති භූතගාමපරිමොචනං කාරෙත්වා බීජගාමපරිමොචනත්ථං පුනපි කප්පියං කාරෙතබ්බං.”†

---

* භවන්ති, වැඩෙති; අහෙසුං ච ඉති, වැඩුණාහු ද වූයි; භූතා, භූත නම් වෙති; ජායන්ති, උපදිති; වඩ්ඪන්ති, වැඩෙති; ජාතා, උපන්හ. වඩ්ඪිතා ච ඉති, වැඩුණාහු දැයි යනු; අත්ථො, අර්ථ යි, ගාමො ඉති, ගාම නම්; රාසි, රැසයි; භූතානං, භූතයන්ගේ; ගාමො ඉති, රැස වූයි; භූතගාමො, භූතගාම නම්. වා, නොහොත්; භූතා එව, භූතයෝම; ගාමො, රැස, භූතගාමො, භූතගාම නම්. පතිට්ඨිතහරිත, පිහිටි නිල්වණ්ණඇති; තිණරුක්ඛාදීනං, තෘණවෘක්ෂාදීන්ට; එතං අධිවචනං, මේ නම්.

† පඨමං, පළමු කොට ‘කප්පියං කාරෙහි’ ඉති, කැප කරම යනු කියා; භූතගාමපරිමොචනං, භූතගාමයෙන් මිදවීම, කාරෙත්වා, කරවා; බීජගාමපරිමොචනත්ථං, බීජගාමයෙන් මිදවීම පිණිස; පුනපි, නැවතත්; කප්පියං කාරෙතබ්බං, කැපකරවිය යුතු.

135 නිබ්බට්ටබීජං නොබීජං අකතඤ්චාපි කප්පති
කටාහබද්ධබීජානි බහිද්ධා වාපි කාරයෙ.

136 එකාබද්ධෙසු බීජෙසු භාජනෙ වාපි භූමියං
කතෙ ච කප්පියෙ'කස්මිං සබ්බෙ එව කතං භවෙ.

137 නික්ඛිත්තෙ තත කප්පියං කත්වා මූලපණ්ණානි ජායරුං
කප්පියං පුන කාරෙය්‍ය භූතගාමො හි සො තදා.

---

"මූලබීජං නාම හලිද්දි සිඞ්ගිවෙරාදි-ඛන්ධබීජං නාම අස්සත්ථ නිග්‍රොධ පිලක්ඛාදි-බීජබීජං නාම පුබ්බණ්ණාපරණ්ණාදි- අග්ගබීජං නාම අජ්ජකඵණිජ්ජහිරිවෙරාදි— ඵළුබීජං නාම උච්ඡුවෙළුනළාදි.'* පිලක්ඛ නම්, පුලිල යි, අජ්ජක නම්, අඳු යි.

135 නිබ්බට්ටබීජං, ඇට වෙන්කර හැකි දිලිසුන් අඹ කොස් ආදී ද; නොබීජං, ලාඅඹපත් ආදී ද; අකතඤ්චාපි කප්පති, කැප නොකරනලද්දේ ද වටී; කටාහබද්ධබීජානි, කටල හා එක් ව බැඳිබිජුඇති (කපුආදී) බීජයන්; බහිද්ධා වාපි, කබලෙන්පිට ද; කාරයෙ, (කැප) කරවන්නේ යි.

136 භාජනෙ වා, බඳුනෙක හෝ; අපි, නැවත; භූමියං වා, බිම හෝ; එකාබද්ධෙසු, එක් ව බැඳී තුබූ; බීජෙසු (තිලමාසාදි) බීජයන් අතුරෙහි; එකස්මිං එව, එක්බීජයක්හිදු; කප්පියෙ කතෙ, කැපකරනලද කල්හි; සබ්බෙ එව, සියල්ලෙහිම; කතම්භවෙ, කරනලද වන්නේ යි.

137 කප්පියං කත්වා, කැප කොට; නික්ඛිත්තෙ, තුබූ(බීජගාම)යෙහි; මූලපණ්ණානි, මුල් හා (නීල) පණියෝ; ජායරුං, උපන්නාහු නම්; පුන, නැවත; කප්පියං කාරෙය්‍ය, කැප කරවන්නේ යි; සො, හෙතෙම; තදා, එකල්හි; (මුල්පත්හටගත්කල්හි) භූතගාමො හි, භූතගාම ම වේ.

("සචෙ පන කප්පියං කාරාපෙත්වා සීතලෙ පදෙසෙ ඨපිතස්ස සිඞ්ගිවෙරාදිනො මූලං සඤ්ජායති උපරිභාගෙ ඡින්දිතුං වට්ටති සචෙ අංකුරො ජායති හෙට්ඨාභාගෙ ඡින්දිතුං වට්ටති මූලෙ ච නීලඞ්කුරෙ ච ජාතෙ න වට්ටති." යනු අටුවා යි.

---

* මූලබීජං නාම, මුල්බිජු නම්; හලිද්දිසිඞ්ගිවෙරාදි, කහ ඉඟුරු ආදියයි. ඛන්ධබීජං නාම, කඳබිජු නම්; අස්සත්ථ නිග්‍රොධ පිලක්ඛාදි, ඇසටු නුග පුලිල ආදියයි. බීජබීජං නාම, ඇටබිජු නම්; පුබ්බණ්ණාපරණ්ණාදි, හැල්වීආදිය හා මුංඋඳුආදි යයි. අග්ගබීජං නාම, කොළබිජු නම්; අජ්ජකඵණිජ්ජහිරිවෙරාදි, අඳුනිරිවේරිය ආදී යයි; ඵළුබීජං නාම, පුරුක්බිජු නම්; උච්ඡුවෙළුනළාදි, උක්හුණබට ආදී යයි.

\+ සචෙ පන, ඉදින් වනාහි; කප්පියං කාරාපෙත්වා, කැප කරවා; සීතලෙ පදෙසෙ, සිහිල් පෙදෙස්හි; ඨපිතස්ස, තබනලද; සිඞ්ගිවෙරාදිනො, ඉඟුරු ආදීන්ගේ; මූලං, මුල්; සඤ්ජායති, හටගනී නම්;

133 සපණ්ණො වා අපණ්ණො වා සෙවාලො'දකසම්භවො
චෙතියාදිසු සෙවාලා නික්ඛන්තාවගතිපත්තකා
භූතගාමො'ච බීජම්පි මූලපණ්ණෙ විනිග්ගතෙ.

134 ඝටාදීපිට්ඨසෙවාලා මකුළං අහිච්ඡත්තකං
දුක්ඛටලෙසොව වුත්තන්ති පුප්ඵම්බ්‍යවහාරිකං,

---

“මූලෙ වා පණ්ණෙ වා නික්ඛන්තෙ බීජගාමො'ව මූලෙ ච නික්ඛන්තෙ පණ්ණෙ ච හරිතෙ ජාතෙ භූතගාමො'ව හොති”.)

133 සපණ්ණො වා, පත් ඇති හෝ; අපණ්ණො වා, පත් නැති හෝ; උදකසම්භවො, දියෙහි උපන්නාවූ; සෙවාලො, (තිලබීජාදි) සෙවෙල් ද; නික්ඛන්තාවගතිපත්තකා, නිකුත් එදතුන්පතක්ඇති; චෙතියාදිසු සෙවාලො, චෛත්‍යාදීන්හි සෙවෙල් ද; මූලපණ්ණෙ විනිග්ගතෙ, මුල් හා නිල්පත් නිකුත්කල්හි; බීජම්පි, බීජගාමය ද; භූතගාමොව, භූතගාම නම් වේ. (තිලබීජ නම් තලඇට පමණ සිහින්පත්ඇති සෙවෙලි )

139 ඝටාදිපිට්ඨසෙවාලො, කළගෙඩිතලාදීපිට්හිසෙවෙල්ද: අහිච්ඡත්තකා මකුළං, හියතුකැකුළු ද; (හතු ගෙම්බු) දුක්ඛටලෙසොව වුත්තන්ති, දුකුළාවට ම වසන්නෙහ; පුප්ඵං, පිපියය සත්ත; අබ්‍යවහාරිකං, ආපත්තක්‍ෂිග නො වේ.

---

උපරිභාගෙ, මතුකොටසෙහි; ඡින්දිතුං, සිඳින්ට; වට්ටති, වටී; සචෙ, ඉදින්; අංකුරො, අංකුර (පැල) යක්; ජායතෙ, හටගනී නම්; හෙට්ඨාභාගෙ, යටකොටසෙහි; ඡින්දිතුං, සිඳින්ට; වට්ටති, වටී. මූලෙ ච, මුල් ද; නීලංකුරෙ ච, නිල්පාට අංකුර ද; ජාතෙ, හටගත් කල්හි; න වට්ටති, සිඳින්ට නො වටී.

† මූලෙ වා, මුල් හෝ, පණ්ණෙ වා, කොළ හෝ; නික්ඛන්තෙ හටගත් කල්හි; බීජගාමො එව, බීජගාමය ම වේ; මූලෙච, මුල් ද; නික්ඛන්තෙ, නික්මීකල්හි; පණ්ණෙ ච, කොළ ද; හරිතෙ ජාතෙ, නිල් පාටවූ කල්හි; භූතගාමො එව හොති; භූතගාමය ම වේ.

140 ලාබුනියාසඡත්තානි අඵලරුක්ඛෙ විකොපයං
ගණ්හතො තත්ථ පාචිත්ති ඡින්දතො වා'පි අඞ්කුරං.

141 පීළෙතුං නාළිකෙරාදිං දාරුමක්කටකාදිනා
ඡින්දිතුං ගණ්ඨිකං කාතුං තිණාදිං න ච කප්පති.

---

“ගෙහපමුඛපාකාරවෙදිකාචෙතියාදිසු නීලවණ්ණො සෙවාලො හොති, යාව වෙ තීණි පත්තානි න සඤ්ජායන්ති තාව අග්ගබීජ සඞ්ගහං ගච්ඡති, පත්තෙසු ජාතෙසු පාචිත්තියවත්ථු. පානීයඝටාදීනං බහි සෙවාලො දුක්කටවත්ථු. අන්තො අබ්බොහාරිකො. දන්තකට්ඨපූවාදිසු කණ්ණකම්පි අබ්බොහාරිකමෙව”* යනු අටුවායි.

140 අඵලරුක්ඛෙ, නොමලරුකවූ; ලාබු, ලා ද; නියාස, ලහමු ද; ඡත්තානි, හතු ද; විකොපයං, (රුක්සුඹුළු) කැපකිරුවමින්; ගණ්හතො, ගන්නාහට ද; තත්ථ, ඒ (නොමලරුක;) අඞ්කුරං ඡින්දතො වාපි, අඞ්කුරු ලියන්නාහට ද; පාචිත්ති, පචිති වෙයි.

“තචං විකොපෙත්වා” යි බැවින් රුක හතු ද පපටිකා ද මල්ලහටු ද රුක නොමළසුඹුළු නොකැපකිරුවා මතුයෙන් ගනුත් දෙස් නැති යනු අටුවාසන්‍ය යි.

141 දාරුමක්කටකාදිනා, දාරුමක්කටකාදියෙන්; නාළිකෙරාදිං, පොල්ගස් ආ, පීළෙතුං, පෙළන්නට ද; තිණාදිං, තෘණලතාදීන්; ඡින්දිතුං, සිඳිනා පිණිස හෙවත් සිදෙන සේ; ගණ්ඨිකං කාතුං, ගැට ලන්ට ද; න ච කප්පති, නො ම වටී.(තියුණු කොට ඇණ කවා අතුරෙහි කටු ඔබින් ල, ගේ දාරුමක්කටක නම් යනු මෙහි සන්‍යයි.)

---

* ගෙහපමුඛ පාකාර වෙදිකා චෙතියාදිසු, ගෙහි පිල්කඩ පවුරු වේදිකා චෛත්‍යාදීයෙහි; නීලවණ්ණො, නිල්වන්වූ; සෙවාලො හොති, සෙවෙල් වේ ද; යාව, යම්තාක්; වෙ තීණි පත්තානි, දෙ තුන්පත්‍රයකෙනෙක්; න සඤ්ජායන්ති, නො හටගනිද්ද; තාව, ඒතාක්; අග්ගබීජසඞ්ගහං, අග්‍රබීජයෙහි ඇතුළත්වීමට; ගච්ඡති, යෙයි. පත්තෙසු ජාතෙසු, කොළ හටගත් කල; පාචිත්තිවත්ථු, පචිතිවස්තු වේ. පානීයඝටාදීනං, පැන්කල ආදීන්ගේ; බහි, පිටත; සෙවාලො, සෙවෙල; දුක්කටවත්ථු, දුකුළාවස්තු වේ; අන්තො, ඇතුළතවූ සෙවෙල; අබ්බොහාරිකො, ව්‍යවහාරයෙහි නො පැවැත්තේය; දන්තකට්ඨපූවාදිසු, දැහැටිපූ ආදීයෙහිවූ; කණ්ණකම්පි, පුස් ද; අබ්බොහාරිකමෙව, ව්‍යවහාරයෙහි නො පැවැත්තේමය.

142 භූතගාමං ච බීජං වා, ඡින්ද භින්දොචිණාහි වා,
ඵාලෙහි විජ්ඣ පච වා නියමෙත්වා න භාසයෙ.

143 ඉමං කරොහි කප්පියං ඉමං ගණ්හෙදමාහර
ඉමං දෙහි ඉමං සොධෙහෙවං වට්ටති භාසිතුං.

“භූමියො” ති-

144 සම්මුත්‍යුස්සාවනන්තා ච ගොනිසාදි ගහපති
කප්පියා භූමියො යාසු වුත්තං පක්කඤ්ච කප්පති.

---

142 භූතගාමං වා, භූතගාමය හෝ; බීජං වා, (භූතගාමයෙන් තොරවූ) බීජගාමය හෝ; ඡින්ද, සිඳ යි හෝ; භින්ද, බිඳ යි හෝ; ඔචිණාහි වා, පසිඳපිය යි හෝ; ඵාලෙහි, පල යි හෝ; විජ්ඣ, විද යි හෝ; පච වා, පිස යි හෝ; නියමෙත්වා, (“ඉමං රුක්ඛං ඡින්ද භින්ද” යනාදීන්) නියම කොට, න භාසයෙ, නො කියන්නේ යි.

143 ඉමං කප්පියං කරොහි, මේ කැප කර; ඉමං ගණ්හ, මේ ගණු, ඉදමාහර, මේ ගෙන; ඉමං දෙහි, මේ දෙව; ඉමං සොධෙහි, මේ සුඹ කර යි හෝ; එවං, මෙසේ; භාසිතුං, කියන්නට; වට්ටති, වටී.

“රුක්ඛං ඡින්ද ලතං ඡින්ද කන්දං මූලම්පි උද්ධර
උප්පාටෙහීති වත්තුම්පි වට්ටතෙවානියාමතො
අම්බං ජම්බුම්පි නිම්බං වා ඡින්ද භින්දුද්ධරාති වා
ගෙහෙත්වා පන නාමම්පි වට්ටතෙවානියාමතො”

“භූමියො” ති-

භූමියො යන්නෙහි කැපකිළිනු නම්:

144 යාසු, යම්කුටියෙක්හි; වුත්තං, විසූයේ ද; පක්කඤ්ච, පිසූයේ ද; කප්පති, කැප ද; (තා) කප්පියා භූමියො, (ඒ) කැපකිළිනු; සම්මුති, සම්මුතිකුටිය; උස්සාවනන්තා ච, උස්සාවනන්තිකාකුටිය; ගොනිසාදි, ගොනිසාදිකුටිය; ගහපති, ගහපතිකුටිය; යන මොහු යි.

---

* රුක්ඛං, රුක; ඡින්ද, සිඳු; ලතං, ලිය; ඡින්ද, සිඳු; කන්දං, අල; උද්ධර, උදුර; මූලං අපි, මුල් ද; උප්පාටෙහි ඉති, උපුටව යි; අනියාමතො, අනියමින්; වත්තුම්පි, කියන්ට ද; වට්ටති එව, වටනේ මය. අම්බං, අඹය හෝ; ජම්බුං අපි, දඹය හෝ; නිම්බං වා, කොසඹය හෝ; ඡින්ද ඉති වා, සිඳුව යි හෝ; භින්ද ඉති වා, බිඳුව යි හෝ; උද්ධර ඉති වා, උදුරව යි හෝ; නාමං අපි, නම ද; ගෙහෙත්වා පන, ගෙන වනාහි; අනියාමතො, අනියමින්; වට්ටති එව, (කියන්ට), වටනේ ම ය.

145 වාසත්ථාය කතෙ ගෙහෙ සංඝිකො වෙකසන්තකො
කප්පියා කුටි ලද්ධබ්බා සහසෙය්‍යප්පහොනකෙ.

146 ගෙහෙ සඞ්ඝස්ස වෙකස්ස කරමානෙවමීරයං
පඨමිට්ඨකථම්භාදිං කප්පෙය්‍යුස්සාවනන්තිකා.
කප්පියකුටිං කරොම කප්පියකුටිං කරොමාති.

---

145 වාසත්ථාය කතෙ, වසනු සඳහා කරනලද්‍ද; සංඝිකො වා, සඞ්ඝ සතු හෝ; එකසන්තකො වා, එක් උපසපනක්හු සතු හෝ; සහසෙය්‍යප්පහොනකෙ, සහසෙය්‍යප්පමාණ නාවූ; ගෙහෙ, ගෙයි; කප්පියා කුටි, කැපකිළිතොමෝ; ලද්ධබ්බා ලැබිය යුතු යි.

146 සඞ්ඝස්ස වා, සඟහට හෝ; එකස්ස වා, එක්උපසපනක්හට හෝ; ගෙහෙ, ගෙයක්; කරමානෙ, කරනුලබන කල්හි; පඨමිට්ඨකථම්භාදිං, පළමු (කොට පිහිටුවන) උළුවැම්ආදිය; "කප්පියකුටිං කරොම කප්පියකුටිං කරොමා"ති, "කප්පියකුටිං කරොම කප්පියකුටිං කරොම"යි; එවං, මෙසේ; ඊරයං, කියමින්; කප්පෙය්‍ය, පිහිටුවන්නේයි; උස්සාවනන්තිකා, (මේතොමෝ) උස්සාවනන්තිකා (කුටි) නමු.

("ගොනිසාදිකා දුවිධා ආරාමගොනිසාදිකා විහාරගොනිසාදිකා'ති, තාසු යත්‍ථ නෙ'ව ආරාමො න සෙනාසනානි පරික්ඛිත්තානි හොන්ති අයං ආරාමගොනිසාදිකා නාම, යත්‍ථ සෙනාසනානි සබ්බානි වා එකච්චානි වා පරික්ඛිත්තානි ආරාමො අපරික්ඛිත්තො අයං විහාරගොනිසාදිකා නාම, ඉති උභයත්‍රා'පි ආරාමස්ස අපරික්ඛිත්තභාවො යෙව පමාණං" * යනු අටුවා යි.

---

* ගොනිසාදිකා ගොනිසාදිකාකුටිතොමෝ; ආරාමගොනිසාදිකා, ආරාමගොනිසාදිකාය; විහාරගොනිසාදිකා ඉති, විහාරගොනිසාදිකා යයි; දුවිධා, දෙයාකාරවන්නීය. තාසු, ඔවුනතුරෙන්; යත්‍ථ, යම්තැනෙක්හි; ආරාමො, ආරාමයතොම; නෙව (පරික්ඛිත්තො හොති,) වටා ඇහිරීම් නො කරනලද්දම වේ ද; සෙනාසනානි, සෙනසුන්; න පරික්ඛිත්තානි හොන්ති, වටා වැට පවුරු ආදිය නො යොදනලදහු වෙත් ද; අයං, මේ; ආරාමගොනිසාදිකා නාම, ආරාමගොනිසාදිකා නමි; යත්‍ථ, යම්තැනෙක්හි; සෙනාසනානි, සෙනාසනයෝ; සබ්බානි වා, සියල්ලෝ හෝ; එකච්චානි වා, සමහරක් හෝ; පරික්ඛිත්තානි, පරික්ෂේප කරනලදහු වෙත් ද; ආරාමො-

147 යෙභුයෙ‍්‍යනාපරික්ඛිත්තො ආරාමො සකලො'පි වා
වුච්චතෙ ගොනිසාදීති සම්මුතී සඞ්ඝසම්මතා.

148 භික්ඛුං ඨපෙත්වා අඤ්ඤෙහි දින්නො තෙසං ච සන්තකො
අත්ථාය කප්පකුටියා ගෙහො ගහපතී මතො.

149 අකප්පකුටියා වුත්ථසප්පිආදිවිමිස්සිතං
වජ්ජෙය්‍ය අන්තොවුත්ථත්තං පුරිමං කාලිකද්වයං.

150 තෙනෙව භික්ඛුනා පක්කං කප්පතෙ යාවජීවිකං
නිරාමිසං ච සත්තාහං සාමිසෙ සාමපාකතා.

---

147 යෙභුයෙ‍්‍යන, බොහෝසෙයින් හෝ; සකලොපි වා, සියලු හෝ; අපරික්ඛිත්තො, (වැටආදීන්) පරික්ෂෙප නොකරනලද; ආරාමො, විහාරය; ගොනිසාදීති, ගොනිසාදින මැයි; වුච්චතෙ, කියනු ලැබෙයි; සඞ්ඝසම්මිතා, සඞ්ඝයා විසින් . (ඤත්තිදුතියකම්මයෙන් සම්මත කොට ගන්නාලද්දී; සම්මුති, සම්මුතිකුටි නමි.

148 භික්ඛුං ඨපෙත්වා, උපසම්පන්නභික්ෂු තබා; අඤ්ඤෙහි, (සාමණේරාදි) සෙස්සවුන් විසින්; කප්පකුටියා අත්ථාය, කැපකිළිපිණිස; දින්නො, ("කප්පියකුටිං දෙම පරිභුඤ්ජථ"යි කියාද නොහොත්, "කප්පියකුටිං කාතුං දෙම"යි කියාද) දෙනලද හෝ; තෙසං සන්තකො වා, ඔවුන්ම සතු හෝ; ගෙහො, ගෙය; ගහපති මතො, ගෘහපති කුටි යයි දන්නාලදි.

149 අකප්පකුටියා වුත්ථ, අකැපකිළියෙහි (ඇතුළෙහි) ලැගි; සප්පිආදිවිමිස්සිතං, සප්පිආදි (සත්තාහකාලිකයාවජීවිකයන්) හා මුසුවූ; පුරිමං කාලිකද්වයං, පළමු දෙකැල්ල; අන්තොවුත්ථත්තං, (අකැපකිළිය) ඇතුළෙහි ලැගිබවට; වජ්ජෙය්‍ය, යන්නේයි.

150 තෙනෙව, ඒ (අකැපකිළියෙහි ම ලැගිසප්පිආදිසත්තාහකාලිකයන්) හා එක් කොට ම; භික්ඛුනා, භික්ෂූහු විසින්; පක්කං, පිස නලද; යාවජීවිකං, යාවජීවිකය; නිරාමිසං ච, ආමිසරහිත ව ම; සත්තාහං, සත්දවසකට; කප්පතෙ, කැප යි; සාමිසෙ, ආමිස හා මුසු කල්හි; සාමපාකතා, තමාපිසූබව වේ.

---

ආරාමයතෙම; අපරික්ඛිත්තො, පරික්ෂෙප නො කරනලද වේ ද; අයං, මේ; විහාරගොනිසාදිකා නාම, විහාරගොනිසාදිකා නම්; ඉති, උභයත්‍ර අපි, මේ දෙතන්හිම; ආරාමස්ස, ආරාමයාගේ ; අපරික්ඛිත්තභාවො එව, වට නො කළබවම; පමාණං, පමණි.

151 උස්සාවනන්තිකා යෙහි ථම්භාදීහි අධිට්ඨිතා
තෙසු යෙවාපනීතෙසු තදඤ්ඤෙසු'පි තිට්ඨති.

152 සබ්බෙසු අපනීතෙසු භවෙ ජහිතවත්ථුකා
ගොනිසාදිපරික්ඛිත්තා සෙසා ඡදනවිබ්භමා ති.

**“උපජ්ඣාචරියවත්තානි” ති–**

153 නිස්සායුපජ්ඣාචරියෙ වසමානො සුපෙසලො
දන්තකට්ඨාසනං තොයං යාගුං කාලෙ දදෙ සදා.

---

151 උස්සාවනන්තිකා, උස්සාවනන්තිකා කුටි තොමෝ; යෙහි ථම්භාදීහි, යම් ටැම් ආදියකින්; අධිට්ඨිතා, පිහිටුවනලද ද; තෙසු අපනීතෙසු, ඒ ටැම්ආදීන් හළකල්හි තදඤ්ඤෙසුපි, එයින් අන්‍යයන් කෙරෙහි දු; තිට්ඨති යෙව, සිටී මැ යි.

152 සබ්බෙසු අපනීතෙසු, සියල්ලන් හළකල්හි; ජහිතවත්ථුකා භවෙ, හරනලද කුටිවස්තු ඇතිවන්නී ය; ගොනිසාදි, ගොනිසාදි කුටි තොමෝ; පරික්ඛිත්තා, (වැටආදීන්) පරික්‍ෂෙපකළ කල්හි (ජහිතවස්තුක වන්නීය;) සෙසා, (සම්මුතිකුටිගහපතිකුටි යන) සෙසු දෙකිළිහු; ඡදනවිබ්භමා, සෙවෙනි විදූහීමෙන් (ජහිතවස්තුක වෙත්)

(“ගොවනැසිම්තිමෙය එකිපැකිවසා මැඩිලි ඇතිහොති ගිකි ප රාළි ඇතිහොති පරාළි මතිසෙයහි එකිදෙනි ඇම්හොති නම්නම් නොවෙයි” යනු මෙහි සන්න යි)

(“ආරාමො පන උපඩ්ඪපරික්ඛිත්තො'පි බහුපරික්ඛිත්තො'පි පරික්ඛිත්තො යෙව නාමා'ති කුරුන්දියමහාපච්චරියු වුත්තං, තත්ථ කප්පියකුටිං ලද්ධුං වට්ටති” * යනු අටුවා යි.)

---

**“උපජ්ඣාචරියවත්තානි” ති,**

උපජ්ඣාචරියවත්තානි යන්නෙහි (උපාධ්‍යායවත් ආචාර්‍ය්‍යවත් නම්:)

153 උපජ්ඣාචරියෙ, උපාධ්‍යාය ආචාර්‍ය්‍ය දෙදෙනා; නිස්සාය, නිසා; වසමානො, වසන්නාවූ; සුපෙසලො, ශික්‍ෂාකාමී (භික්‍ෂු) තෙමේ; කාලෙ, (එයට නිසි) කාලයෙහි; දන්තකට්ඨං, දැහැටි දඬුද; ආසනං, හිඳිනා අසුන් ද; තොයං, (හුණුදියහැල්) දිය ද; යාගුං, ගඹු ද; සදා, හැමකල්හි; දදෙ, දෙන්නේ යි.

---

* ආරාමො පන, ආරාමය වනාහි; උපඩ්ඪපරික්ඛිත්තොපි, අඩක් අවුරනලද ද; බහුපරික්ඛිත්තොපි, ඉන්බොහෝ පෙදෙසක් අවුරනලද ද, පරික්ඛිත්තො යෙව නාමඉති, අවුරනලදම නමැයි; කුරුන්දියමහාපච්චරීසු, කුරුන්දිය මහාපච්චරිය යන අටුවාදෙක්හි; වුත්තං කියන ලදි; තත්ථ, එහි; කප්පියකුටිං, කැපකිළියක්; ලද්ධුං, ලබන්ට, වට්ටති, වටී.

154 පත්තෙ වත්තං චරෙ ගාමප්පවෙසෙ ගමනාගමෙ
ආසනෙ පාදපීඨෙ ච කථලොපාහණචීවරෙ

155 පරිභොජියපානීයෙ වච්චපස්සාවඨානිසු
විහාරසොධනෙ වත්තං පුන පඤ්ඤපනෙ තථා.

156 න පප්ඵොඨෙය්‍ය සොධෙන්තො පච්චාතෙ ච පඞ්ගණෙ
විහාරං භික්ඛු පානීයසාමන්තා සයනාසනං.

157 නහානෙ ච නහාතස්ස රඞ්ගපාකෙ'ථ ධොවනෙ
සිබ්බනෙ චීවරෙ ථෙවෙ රජන්තො න වජෙ'ට්ඨිතෙ.

---

154 පත්තෙ, (හඹුවැළඳූ) පාත්‍රයෙහි ද; ගාමප්පවෙසෙ, (ආචාර්‍ය්‍ය උපාධ්‍යායයන්) ගම්වදනාකල්හි ද; ගමනෙ, (පසු මහණ වැ) ගම්වැදීමෙහි ද; ආගමෙ, (නැවත) ඊමෙහි ද; ආසනෙ, (ඔවුන් හුන්) ආසනයෙහි ද; පාදපීඨෙ ච, දෙවිපාතබන පෝරුවෙහි ද; කථලෙ, නොදෙවිපාතබන පෝරුවෙහි ද; උපාහණෙ, වහන්හි ද; චීවරෙ, සිවුරෙහි ද; වත්තං චරෙ, වත් පුරන්නේ යි.

155 පරිභොජිය, (බාහ්‍ය) පරිභොගජලයෙහි ද; පානීයෙ, බොන පැනෙහි ද; වච්චපස්සාවඨානිසු; මලකිස වටන්කිස සපයන තැන්හි ද; විහාරසොධනෙ (ඔවුන් වසන) සෙනසුන්හැමදීමෙහි ද; පුන පඤ්ඤපනෙ හැඳපුටු ඈ නැවත පැනවීමෙහි ද; වත්තං, (කටයුතු) වත් ද; තථා, එසේම (පුරන්නේ) ය.

156 විහාරං, (ආචාර්‍ය්‍ය උපාධ්‍යායයන් වසන) සෙනසුන්; සොධෙන්තො භික්ඛු, හමදනා මහණ; පච්චාතෙ ච, උඩුසුලඟෙහි ද; පඞ්ගණෙ, බොහෝදෙනා රැස්වන මිදුලෙහි ද; පානීයසාමන්තා, පැන් සමීපයෙහි ද; සයනාසනං (භූමත්ථරණාදි) සෙනසුන්; න පප්ඵොඨෙය්‍ය, නො ගසන්නේ යි.

157 නහානෙ ච, නහනකල්හි ද; නහාතස්ස, (ස්නානකළ) නැවා හට කටයුත්තෙහි ද; රඞ්ගපාකෙ, පඬුපිසීමෙහි ද; අථ, නැවත; ධොවනෙ, (සිවුරු) සේදීමෙහි ද; සිබ්බනෙ, ගෙත්තම් කිරීමෙහි ද; (තථා, එසේම වත් පුරන්නේ යි;). රජන්තො, සිවුරු රඳන්නේ; චීවරෙ, සිවුරෙහි; ථෙවෙ, පඬුපෙත්; අට්ඨිතෙ, නො සිටිකල්හි; න වජෙ, නොයන්නේ යි.

158 එකවච්චස්ස අනාපුච්ඡා පත්තං වා චීවරානි වා
න දදෙය්‍ය න ගණ්හෙය්‍ය පරික්ඛාරං ච කඤ්චි යං.

159 එකවච්චං පච්ඡතො කාතුං ගන්තුං වා තස්ස පච්ඡතො
පිණ්ඩපාතංච නිහාතුං නීහරාපෙතුමත්තනො.

160 කිච්චයං පරිකම්මං වා කෙසච්ඡෙදංච අත්තනො
කාරාපෙතුං ච කාතුං වා අනාපුච්ඡා න වට්ටති.

161 ගාමං සුසානං නිස්සීමං දිසං වා ගන්තුමිච්ඡතො
අත්තනො කිච්චයං වා'පි අනාපුච්ඡා න වට්ටති.

162 උප්පන්නං අරතිං දිට්ඨිං කුක්කුච්චං වා විනොදයෙ
කාරෙය්‍ය වා'පි උස්සුක්කං සඞ්ඝායත්තෙසු කම්මසු.

---

158 එකවච්චස්ස, ආචාය්‍ය්‍යී උපාධ්‍යායයන්ට විපක්ෂපුද්ගලයෙකුට; පත්තං වා, පාත්‍රයක් හෝ; චීවරානි වා, සිවුරු හෝ; කංචියං පරික්ඛාරං වා, යම් කිසි පිරිකරක් හෝ, අනාපුච්ඡා, (ආචාය්‍ය්‍යී උපාධ්‍යායයන්) නො පිළිවිස; නදදෙය්‍ය (තමා ගෙන්) නො දෙන්නේ ය; න ගණ්හෙය්‍ය, (ඔවුන් අතින්) නො ගන්නේ සි.

159 එකවච්චං, ගුරුන්ට විපක්ෂපුද්ගලයා; පච්ඡතො කාතුං, (තම හට) පසු (මහණ) කරන්නට ද; තස්ස පච්ඡතො, ඔහට පසු (මහණ ව;) ගන්තුං වා, (තමා) යන්ට ද; පිණ්ඩපාතං, පිඬු; නිහෙතතුං වා, ඕහට තමා ගෙනයන්ට ද; අත්තනො, තමහට; නීහරාපෙතුං, ඔහු ලවා ගෙන්වන්ට ද.

160 කිච්චයං, (කුදුමහත්) මෙහෙයක් හෝ; පරිකම්මං වා, (හස්තපරිකර්මාදි) පරිකර්මයක් හෝ; කෙසච්ඡෙදං වා, හිසකේ බෑමක් හෝ; අත්තනො, තමහට; කාරාපෙතුං වා, (ඔහු ලවා) කරවන්ට ද; කාතුං වා, (ඕහට තමා) කරන්ට ද; අනාපුච්ඡා, නො පිළිවිස; න වට්ටති, නො වටී.

161 ගාමං, ගමට හෝ; සුසානං, සොහොනට හෝ; නිස්සීමං, සීමින් පිටතට හෝ; දිසං වා, දිසාවකට හෝ; ගන්තුමිච්ඡතො, යනු කැමැත්තාහට ද; අත්තනො කිච්චයං වාපි, (ඇතුළුවෙහෙර) තමාගේ (පාත්‍රපචනාදි) කෘත්‍යයෙක් ද; අනාපුච්ඡා, නො පිළිවිස; න වට්ටති, නො වටී.

162 උප්පන්නං, (ආචාය්‍ය්‍යී උපාධ්‍යායයන් ට) උපන්; අරතිං, (ශාසනයෙහි) උකටලී ද; දිට්ඨිං, මිථ්‍යාදෘෂ්ටි ද; කුක්කුච්චං වා; (විනයෙහි පිළිබඳ) කුකුසක් ද; විනොදයෙ, දුරු කරන්නේ සි; සඞ්ඝායත්තෙසු, සඟහු අයත්වූ; කම්මසු, (පරිවාසතජ්ජනීයාදිවූ) කර්මයෙහි; උස්සුක්කං වාපි, උත්සාහ ද; කාරෙය්‍ය, කරන්නේ සි.

163 ගිලානෙ ච උපට්ඨෙය්‍ය වුට්ඨානං තෙසමාගමෙ
වත්තභෙදෙන සබ්බත්ථ අනාදරෙන දුක්කටනයි.

“වච්චපස්සාවට්ඨානිකානි”–

164 න කරෙය්‍ය යථාවුඩ්ඪං වච්චං යථානුපුබ්බියා
වච්චපස්සාව කුටියො නහාන තිත්ථඤ්ච ලබ්භති.

165 පවිසෙය්‍යුබ්භාසිත්වා නො සහසා පවිසෙය්‍ය ච
උක්කාසිත්වා වුබ්භජෙය්‍ය පාදුකාසෙවව සණ්ඨිතො.

166 න කරෙ නිත්ථුනං වච්චං දන්තකට්ඨං ච ඛාදයං
වච්චපස්සාවදොණීනං න කරෙය්‍යුභයං බහි.

---

163 ගිලානෙ ච, ගිලන්වූවන්ට ද; උපට්ඨෙය්‍ය, උපස්ථාන කරන්නේය; තෙසං, ඔවුන්ගේ; වුට්ඨානං, (රොගයෙන්) නැඟීම ද; ආගමෙ, බලන්නේ යි; සබ්බත්ථ, (මෙකී) සියලුතන්හි; අනාදරෙන, අනාදර විසින්; වත්තභෙදෙන, වත් නො කිරීමෙන්; දුක්කටං, දුකුලා වෙ යි.

---

“වච්චපස්සාවට්ඨානිකානි”

වච්චපස්සාවට්ඨානිකා යන්නෙහි (වච්චකුටි පස්සාවකුටියෙහි වත් නම්:)

164 වච්චං, මලකිස, යථාවුඩ්ඪං, මහලුපිළිවෙළින්; න කරෙය්‍ය, නො කරන්නේ යි; වච්චපස්සාවකුටියො, වච්චපස්සාවකුටිහු ද; නහානතිත්ථඤ්ච, නහනතොට ද; යථානුපුබ්බියා, ගියපිළිවෙළින්; ලබ්භති, ලැබේ.

165 උබ්භාසිත්වා, පිටතදී ම හඳනය නගාගෙන ද; සහසා ච, වෙලෙවී ව ද; නො පවිසෙය්‍ය, (කුටියට) නොවදනේය; උක්කාසිත්වාව, (බැහැර සිට) උකැසම හෙවත් සෙම් බහා ම; පවිසෙය්‍ය ච, වදනේය; පාදුකාසෙවව, පාදුකායෙහි ම; සණ්ඨිතො, සිටියේ; උබ්භජෙය්‍ය, හඳනය නගන්නේ යි.

166 නිත්ථුනං, තතනමින් හෝ; දන්තකට්ඨං ඛාදයං වා, දැහැටි කමින් හෝ; වච්චං, ශරීරවලඤ්ජනය; න කරෙ, නො කරන්නේ යි; වච්චපස්සාවදොණීනං, වච්චදොණිපස්සාවදොණීන්ගේ බහි, පිටත; උභයං, මලමූත්‍රදෙක; න කරෙය්‍ය, නො කරන්නේ යි.

167 කූපෙ ඛාටකං න පාතෙය්‍ය ඛෙළං පස්සාවදෙණියා
නාවලෙඛෙය්‍ය ඵරුසෙනුගහතස්සාපි ධොවයෙ.

168 න නික්ඛමෙය්‍ය සහසා උබ්භජිත්වා න නික්ඛමෙ
චපු චපු නාචමෙය්‍ය උකලාපඤ්ච විසොධයෙ'ති.

ආපුච්ඡකරණන්ති,-

169 අනජ්ඣිට්ඨො'ව ථෙරෙන පාතිමොක්ඛං න උද්දිසෙ
ධම්මං න කථයෙ පඤ්හං න පුච්ඡෙය්‍ය න විස්සජෙ.

---

(දන්තකට්ඨං ඛාදනෙනාති අයං වච්චකුටියා'පි අවච්චකුටියා'පි සබ්බත්ථෙව පටික්ඛෙපො * යතු අටුවාහි.)

167 කූපෙ, (අශුචි) කූපයෙහි; කට්ඨං, (පුසන්) දඬු ද; පස්සාව දෙණියා, වටන්දෙණ; ඛෙළං, කෙළ ද; න පාතෙය්‍ය, නො ලන්නේ ය; ඵරුසෙන, කොරොස්, (පුසන්) දඬෙන්; නාවලෙඛෙය්‍ය, නො ගස්නේය; උගහතස්සාපි, කෙලෙසුණු තැනුදු; ධොවයෙ, සෝදන්නන් සි.

168 සහසා, වෙලෙවි ව ද; න නික්ඛමෙය්‍ය, නො නික්මෙන්නේ ය; උබ්භජිත්වා, හඳනය නගාගෙන ද; න නික්ඛමෙ, නො නික්මෙන්නේ ය; චපු චපු ඉති, චපු චපු යන හඬ ඇති කොට ද; නාචමෙය්‍ය, දිය නො ගන්නේ ය; උකලාපඤ්ච, කසළ ද; විසොධයෙ, හමදන්නේ සි.

ආපුච්ඡකරණන්ති,-

ආපුච්ඡකරණං යන්නෙහි මහලු සඟුන් පිළිවිස කිරීම නම්:

169 ථෙරෙන, තෙරුන් විසින්; අනජ්ඣිට්ඨො, අනාණත්ත ව; පාතිමොක්ඛං, පාමොක්; නෙව උද්දිසෙ, නොම උසුරුවන්නේ ය; ධම්මං, බණ; න කථයෙ, නො කියන්නේ ය; පඤ්හං, පැණ; න පුච්ඡෙය්‍ය, නො පුළුවුස්නේ ය; න විස්සජෙ, (පුළුවුත් පැණ) නොවිසඳන්නේ සි.

---

* දන්තකට්ඨං ඛාදනෙනාති, දැහැටි කන්නහු විසින් යනාදීන් දක්වූ; අයං පටික්ඛෙපො, මේ ප්‍රතික්ෂෙපය; වච්චකුටියා අපි; වැසිකිළියෙහි ද; අවච්චකුටියා අපි, නො වැසිකිළිගෙහි ද යනු; සබ්බත්ථෙව, සියලුතැන්හි මැ යි.

170 ආපුච්ඡිත්වා කථෙන්තෙන පුන වුඩ්ඪතරාගමේ
පුන ආපුච්ඡනං නත්ථි භත්තග්ගෙ චානුමොදතො.

171 වසන්තො ච අනාපුච්ඡා බුඩ්ඪෙනෙකවිහාරකෙ
න සජ්ඣායෙය්‍ය උද්දෙසං පරිපුච්ඡං ච නො දදෙ.

172 ධම්මං න භාසයෙ දීපං න කරෙ න ච විජ්ඣාපෙ
වාතපානකවාටං වා විවරෙය්‍ය ථකෙය්‍ය ච.

---

170 ආපුච්ඡිත්වා, (තෙරුන්) පිළිවිස; කථෙන්තෙන, බණ කියන්නහු විසින්; පුන, නැවත; වුඩ්ඪතරාගමෙ, හැමදෙනාට වැඩිමහලු කෙනෙකුන් ඒමෙහි; පුන ආපුච්ඡනං නත්ථි, නැවත පිළිවිස්මෙක් නැත, භත්තග්ගෙ, බතග; අනුමොදතො ච, (දනපතිහුගේ අයැමෙන්) අනුමෙවෙනි බණ කියන්නාහට ද; (ආපුච්ඡනං නත්ථි, පිළිවිස්මෙක් නැති.),

171 බුඩ්ඪෙන, වැඩිමහල්ලන් හා; එකවිහාරකෙ, එකසෙනස්නෙහි; වසන්තො ච, වසන්නේ ද; අනාපුච්ඡා, නො පිළිවිස; න සජ්ඣායෙය්‍ය, නො හදුරන්නේ ය; (නො පිරිවහන්නේ ය) උද්දෙසං, පෙළ හෝ; පරිපුච්ඡං වා, අටුවා හෝ; නො දදෙ, නො දෙන්නේ සි.

172 ධම්මං, බණ; න භාසයෙ, නො කියන්නේ සි; දීපං, පහන්; න කරෙ, නො නගන්නේ ය; න ච විජ්ඣාපෙ, නො ද නිවන්නේ ය; වාතපාන කවාටං වා, කවුළුපොහොරු ද; (න) විවරෙය්‍ය, නො හරනේය; (න) ථකෙය්‍ය ච, නො ද පියන්නේසි.

(“චාරං නාම යස්මා මහාවලඤ්ජං තස්මා තත්ථ ආපුච්ඡනකිච්චං නත්ථි සෙසානි පන උද්දෙසදානාදීනි ආපුච්ඡිත්වා’ව කාතබ්බානි”* යනු අටුවා සි.),

---

* යස්මා, යම්හෙයකින්; චාරං නාම, චාරය නම්; මහාවලඤ්ජං, බොහෝදෙන ප්‍රයෝජන ගන්නේ ද; තස්මා, එහෙයින්; තත්ථ, එහි; ආපුච්ඡනකිච්චං නත්ථි, විචාරිමෙන් කම් නැත; සෙසානි, සෙසු; උද්දෙසදානාදීනි පන, පෙළ කියාදීම් ආදීහු වනාහි; ආපුච්ඡිත්වා එව, විචාරාම; කාතබ්බානි, කළයුත්තාහු සි.

173 චඞ්කමෙ චඞ්කමන්තො'පි බුඩ්ඪස්ස න පරිවත්තයෙ
යෙන බුඩ්ඪො ස සඞ්ඝාටිකණ්ණෙනෙතං න ඝට්ටයෙ'ති.

නග්ගොති:-

174 නග්ගො මග්ගං වජෙ භුඤ්ජෙ පිවෙ ඛාදෙ න සායයෙ
න ගණ්හෙ න දදෙ නෙව වන්දෙ වන්දාපයෙය්‍ය වා.

175 පරිකම්මං න කාරෙය්‍ය න කරෙ පටිච්ඡාදිසු
පරිකම්මෙ ද්වෙ වත්ථච්ඡාදි සබ්බත්ථ කප්පියා'ති.

---

නහානකප්පො ති:-

176 න ච නහායෙය්‍ය ථෙරානං පුරතො'පරිවා තථා
දදෙය්‍ය ඔතරන්තානං මග්ගමුත්තරමානකො.

---

173 බුඩ්ඪස්ස, වෘද්ධමහල්ලන් හා; චඞ්කමෙ, (එක) සක්මන්හි; චඞ්කමන්තොපි, සක්මන් කරන්නේද; යෙන බුඩ්ඪො, යම් පාශ්වයෙක බුඩ්ඪ ද; (තෙන) ඒ පාශ්වයෙන්; පරිවත්තයෙ, (මහල්ලන්ට අභිමුඛව) නැමෙන්නේ ය; සො, ඒ (සඟ)මහණ; සඞ්ඝාටිකණ්ණෙන, සිවුරුකනින්; එතං, ඒ බුඩ්ඪයා; න ඝට්ටයෙ, නො පහරන්නේ යි.

---

නග්ගොති,-

නග්ගො යන්නෙහි නග්නවත් නම්:

174 නග්ගො, නග්නව; මග්ගං, මාර්ගයෙහි; න වජෙ, නො යන්නේ ය; න භුඤ්ජෙ, නො වළඳන්නේ ය; න පිවෙ, නො බොන්නේ ය; න ඛාදෙ, නො කන්නේ ය; න සායයෙ, නො ලෙවන්නේ ය; න ගණ්හෙ, (ආමිස පිළි) නො ගන්නේය; න දදෙ, (ආමිස අනුන්ට) නො දෙන්නේ ය; නෙව වන්දෙ, නො ම වඳනේ ය; නෙව වන්දාපයෙය්‍ය වා, තමා ද නො ම වඳවන්නේ යි. (අනුන් වඳුත් නො ඉවසන්නේ ය යුතැයි.)

175 පරිකම්මං, පිරියම්; න කාරෙය්‍ය, තමහට නො කරවන්නේ ය; න කරෙ තමා ද අන්නට නො කරන්නේ ය; පටිච්ඡාදීසු, උදකපටිච්ඡාදි ජන්තාඝරපටිච්ඡාදි වත්ථපටිච්ඡාදීන් කෙරෙහි; පරිකම්මෙ, පරිකර්මයෙහි; ද්වෙ, උදකපටිච්ඡාදි ජන්තාඝරපටිච්ඡාදි දෙදෙන; කප්පියා, කැපයෝය; වත්ථච්ඡාදි, වත්ථපටිච්ඡාදි තොමෝ; සබ්බත්ථ, (මාර්ගගමනාදී) සියල්ලෙහිම; (කප්පියා) කැපයි.

---

"නහානකප්පො"ති,-

නහානකප්පො යන්නෙහි නහන විධි නම්:-

176 ථෙරානං, මහල්ලන්ට; පුරතො, පෙරට; න ච නහායෙය්‍ය, නො ම නහන්නේ ය; උපරි වා, උඩුභාග ද; තථා, එසේම; (නො නහන්නේ ය.) උත්තරමානකො, (නහා ඒගෙන්) නැගෙන්නේ; ඔතරන්තානං, (නහන්ට) බස්නා මහල්ලන්ට; මග්ගං, මග; දදෙය්‍ය, දෙන්නේ යි.

177 කුඩ්ඩට්ඨම්භතරුට්ඨානෙ න්හායමානො න සංඝංසයෙ
කායං ගන්ධබ්බහත්ථෙන කුරුවින්දකසුත්තියා.

178 මල්ලකෙනාඤ්ඤමඤ්ඤං වා සරීරෙන න සංඝංසයෙ
කපාලිට්ඨකඛණ්ඩානි වත්ථවට්ටි ච වට්ටති.

179 සබ්බෙසං පුථුපාණි ච ගිලානස්සාකතමල්ලකං
පාසාණඵෙණකඨලා කප්පියා පාදඝංසනෙ'ති.

“අවන්දියා”ති,–

180 උක්ඛිත්තො'නුපසම්පන්නො නානාසංවාස ඉත්ථියො
නවො ච ගරුකට්ඨො ච පණ්ඩකො ච අවන්දියා'ති.

---

177 න්හායමානො, නහන්නේ; කුඩ්ඩ, (උළුමුවා ගල්මුවා දූවමූ වා) පවුරෙහි ද; ථම්භ, (නහන තොට හිඳුවූ) වැඹි ද; තරු, රුක් හි ද; අට්ඨානෙ, අට්ඨානඵලකයෙහි ද; කායං, ශරීරය; න සංඝංසයෙ, නො ගහන්නේ ය; ගන්ධබ්බහත්ථෙන, (වඳුරන් අත්වැනි) දඬු අතින් හෝ; කුරුවින්දකසුත්තියා, කුරුඳුවැලයෙන් හෝ;

178. 179 මල්ලකෙන, (මොහොරුදූති සිඳ පියුම් කොමියක් සෙයින් කළ) මල්ලකයෙන් හෝ; අඤ්ඤමඤ්ඤං සරීරෙන වා, ඔවුනොවුන් සිරුරෙන් හෝ; න සංඝංසයෙ, (සිරුරු) නො ගහන්නේ ය; කපාලිට්ඨකඛණ්ඩානි, කබල්කඩ හා පතුලුකඩද; වත්ථවට්ටි ච, (ඇඹරූ) පිළිමැවිය ද; පුථුපාණි ච, හස්තපරිකර්ම ද; (අතින් ඔවුනොවුන් පිට ඉලීම ද) සබ්බෙසං, ගිලන් නොගිලන් සියල්ලන්ට ම; වට්ටති, වටී; ගිලානස්ස, ගිලන්හට; අකතමල්ලකං, දූති නොසුන් මල්ලක ය; (වටී) පාසාණ, පහණ ය; ඵෙණ, (මූදුපෙණ ය; කඨලා, කැබිලි තිය (යන මොහු) පාදඝංසනෙ, පාගැහීමෙහි; කප්පියා, කැපයෝ යි

(“අට්ඨානඵලක”නම්. පොහොරුවක් මෙන් දූවයක් සැස සුණු පූරා එහි පිට ගහා නහනු සඳහා දූපෝරූ ආකාරයෙන් හිරි සිඳ නහනතොට හිඳුවන පොහොරුවයි. “ගන්ධබ්බහත්ථ” නම් නහනතොප් තබන දඬුමුවා අත යි. එයින් සුණු ගෙන සිරුරු ගහා නහත් ලූ. කුරුඳු ලා හා මුසු කොට ලා වැලිසෙයින් වටා කදුරු මල් පෙළ සෙයින් අවුනා පිට ගහා නහති වේ “කුරුඳුවැල” නම්.

---

“අවන්දියා”ති

අවන්දියා යන්නෙහි පුවකතන්නු විසින් නො වැන්ද යුක්තෝ නම්,–

180 උක්ඛිත්තො, උක්ඛෙපණීකම්ලද්දූයේ ද; අනුපසම්පන්නො, අනුපසම්පන්නක ද; නානාසංවාස ඉත්ථියො, ලබ්ධිනානාසංවාසක ය මාගම ය යන මොහු ද; නවො ච (තමහට) සඟමහණ ද; හෙවත් තමහට පසු මහණවුවෝ ද; ගරුකට්ඨො ච, ගරුකස්ථ ද; පණ්ඩකො ච, පණ්ඩක ද; (යන මොහු) අවන්දියා, නො වැඳිය යුත්තෝ යි.

### චම්මනති:-

181 මිගාජෙළකචම්මානි කප්පන්ති පරිභුඤ්ජිතුං
රොහිතෙණිපසදා ච කුරුඞ්ගා මිගජාතිකා

182 අනුඤ්ඤාතත්තයා අඤ්ඤං චම්මං දුක්කටවත්ථුකං
ථවිකොපාහනෙ චම්මං සබ්බං කප්පතමානුසන්ති.

---

පරිවාසපූරණාදී විසින් සඟවෙසසට පිළියම් කෙරෙමින් සිටියේ ගරුකට්ඨ නම්. නික්ඛිත්තවත්තයා ද පරිවාසාදිසමාදන් නොවූයේ ද මෙහි ගරුකට්ඨ නම් නො වේ.

"ආපත්තියා අදස්සනෙ තථා අප්පටිකම්මිකෙ
උක්ඛිත්තකා අනිස්සග්ගෙ පාපිකාය ච දිට්ඨියා

අබ්භානමානත්තාරහා මූලාය පටිකස්සකො
පාරිවාසිකමානත්තා චාපී'මෙ ගරුකට්ඨකා" †

---

### චම්මනති:-

චම්මං යන්නෙහි කැපඅකැප සම් නම්.-

181 මිග, මුවන්ගේ ද; අජ, එළුවන්ගේ ද; එළක, තිරළුවන්ගේ ද; චම්මානි චර්මයෝ; පරිභුඤ්ජිතුං (මඤ්චපීඨාදියෙහි) අතුරා හෝනට හිඳිනට; කප්පන්ති, වටිත්; රොහිතෙණිපසදච, රොහිත ය ඒණි ය පසද ය (යන මොහු ද) කුරුඞ්ගා, කුරඟයෝ ද; මිගජාතිකා, මෘගජාතීහු යි. (පසදයෝ නම් තිත්මුවෝ යි.)

182 අනුඤ්ඤාතත්තා, අනුදන්නා ලද තුන්සම් මිස; අඤ්ඤං චම්මං, සෙසුසම්; දුක්කටවත්ථුකං, දුකුළාවත; ථවික, (කෙඩිපසි ඈ) පසියෙහි ද; උපාහනෙ, වහන්හි ද; අමානුසං, මිනිස්සම් හැර; සබ්බං චම්මං, සියලු සම්; කප්පති, වටී.

---

† ආපත්තියා අදස්සනෙ, ඇවත නො දක්මෙහි; උක්ඛිත්තකො, උක්ඛෙවිනිලදුයේ ද; තථා, එසේම; (ආපත්තියා) අප්පටිකම්මකෙ, ඇවතට පිළියම් නො කිරීමෙහි (උක්ඛෙවිනිලදුයේ) ද; පාපිකාය දිට්ඨියා, ලාමක දෘෂ්ටිය; අනිස්සග්ගෙ ච, නො හැරීමෙහි (උක්ඛෙවිනිලදුයේ) දැයි; (ඉමෙ තයො උක්ඛිත්තකා,) මේ තුන් උක්ඛෙවිනිලදුවෝ යි.

අබ්භානමානත්තාරහා, අබ්භානාර්හ-මානත්තාර්හ දෙදෙනා ද; මූලාය පටිකස්සකො, මූලාය පටිකස්සනකම් ලදුයේ ද; අපි, නැවත; පාරිවාසිකමානත්තා ච, පිරිවෙස්පුරන මානත්පුරන දෙදෙන ද; ඉමෙ, යන මොහු (පස්දෙන;) ගරුකට්ඨකා, ගරුකට්ඨයෝ යි.

### උපාහනා චෙවා ති:—

183 මජ්ඣදෙසෙ න කප්පන්ති ගණඞ්ගණූපාහනා නවා
සබ්බස්ස කප්පන්ත්‍යාරාමෙ සබ්බත්ථාකල්ලකස්ස ච.

184 සබ්බනීලකඔදාතපීතලොහිතකණ්හකා
මහාරඞ්ගමහානාමරඞ්ගරත්තා චුපාහනා.

185 සබ්බමඤ්ජෙට්ඨිකා චිත්‍රා නීලපීතාදිවද්ධිකා
තිත්තිරපත්තිකා මෙණ්ඩඅජවිසාණවද්ධිකා.

186 බල්ලබද්ධා පුටබද්ධා තූලපුණ්ණා චුපාහනා
පාළිගුණ්ඨිමකා මොරපිඤ්ජෙන පරිසිබ්බිතා.

---

### උපාහනා චෙවාති,-

උපාහනා චෙව යන්නෙහි කැපඅකැප වහන් නම්:-

183 නවා, අලුත්වූ; (එකවරෙක ද පය නොලූ) ගණඞ්ගණූපාහනා, සතරපට ඈ බොහෝ පට ඇති වහන්හු; මජ්ඣදෙසෙ; මැදුම්පියස්හි; න කප්පන්ති, නො වටිත්; (මෙයින් එකවරෙක ද පය ලා අනුභව කළ පරණිවහන් මධ්‍යදෙශයෙහි කැප සේ ද අලුත් වහනුදු පරණිවහනුදු ප්‍රත්‍යන්ත දෙශයෙහි කැපසේද කියූ ද වෙත්.) සබ්බස්ස, (මධ්‍යදෙශයෙහිදු ප්‍රත්‍යන්තදෙශයෙහි දු ගිලන්නොගිලන්) සියල්ලන්හට; ආරාමෙ, අභ්‍යාරාමයෙහි; කප්පන්ති, වටිති; අකල්ලකස්ස ච, ගිලන්හට වනාහි; සබ්බත්ථ (ග්‍රාමය විහාරය යන) හැම තැන්හිම (වටිත්.)

184 සබ්බනීලකා, හැම නිල්වූ; ඔදාත, (හැම) සුදුවූ; පීත, (හැම) රන්වන්වූ, ලොහිත; (හැම) රත්වූ; කණ්හකා, (හැම) කලුවූ; (වහන්ද;) මහාරඞ්ග, රත්වායන් පිටපැහැ සේ; මහානාමරඞ්ග, තුනුපිසුම්පෙති පැහැසේ; රත්තා, රත්වූ; උපාහනා ච, වහන් ද;

185 සබ්බමඤ්ජෙට්ඨිකා, සියලු මදටවන් වහන් ද; චිත්‍රා, (මාලාකම්ම ලතාකම්මයෙන්) විසිතුරුවහන් ද; නීලපීතාදිවද්ධිකා, නිල්වන් රන්වන් ඈ වැටි (වර) ඇතිවහන් ද; තිත්තිරපත්තිකා, තිතුරුපත පිටපැහැ බදු වර ඇති වහන් ද; මෙණ්ඩඅජවිසාණවද්ධිකා, මැඩෙළුවන් කිරළුවන් අං වැනි වැටි (වර) ඇතිවහන් ද;

186 බල්ලබද්ධා, විලුඹ වසා සිටිනා වහන් ද; පුටබද්ධා, කකුලෙහි පමක් සියලු පය වසා සිටිනා තැලිවහන් ද; තූලපුණ්ණා උපාහනා ච, පුලුන් පිරූ වහන් ද; පාළිගුණ්ඨිමකා, පිටිපතුල්වසාසිටිනා වහන්ද; මොරපිඤ්ජෙන පරිසිබ්බිතා, මොණරපිල් ඈ පිළියෙන් වටා සිවනලද වහන්ද.

187 විච්ඡිකාලිකතා සීහව්‍යග්ඝුද්දජිනදිපිනං
මජ්ජාරකාලකොලූකචම්මෙහි ච පරික්ඛටා,
පාදුකා සංකමනීයා කොචි ධාරෙය්‍ය දුක්කටං.

188 නීලාදිවණ්ණං සකලං පුඤ්ජිත්වාවෙකදෙසකං,
උපාහනා වලඤ්ජෙය්‍ය හාරෙත්වා බල්ලකාදිකන්ති.

---

("බල්ලබද්ධා"ති පණ්හිපිධානත්ථං තලෙ බල්ලං බන්ධිත්වා කතා. "පුටබද්ධා"ති යොනකඋපාහනා වුච්චති. යාව ජඞ්ඝතො සබ්බපාදං පටිච්ඡාදෙති. "පාළිගුණ්ඨිමා"ති පළිගුණ්ඨිත්වා කතා. උපරිපාදමත්තමෙව පටිච්ඡාදෙති, න ජඞ්ඝං. "මොරපිඤ්ජපරිසිබ්බිතා"ති තලෙසු වා වද්ධෙසු වා මොරපිඤ්ජෙහි සුත්තකසදිසෙහි පරිසිබ්බිතා"* යනු අටුවා යි.)

187 විච්ඡිකාලිකතා, ගෝනුස්සන් නගුටු වැනි වර ඇති වහන් ද; සීහ, සිංහයා; ව්‍යග්ඝ, ව්‍යාඝ්‍රයහ; උද්ද, මස්කායහ; † අජිනදිපිනං, අඳුන්දිවියහ යන මොවුන් ගේ (චර්මයෙන් ද) මජ්ජාර; බළල්හ; කාලක, ලේනහ; උලූක, පියාබළල්හ යන මොවුන්ගේ; චම්මෙහි ච, චර්මයෙන් ද; පරික්ඛටා, සිතාරා තිවනලද වහන් ද; සංකමනීයා, (පය ලා) සක්මන් කාට හැකිවූ; පාදුකා, පාදුකා වහන් ද; කොචි, (ගිලන් නොගිලන් යම්) කිසි මහණෙක්; ධාරෙය්‍ය, පය ලා වැළඳගනී නම්; දුක්කටං, දුකුළා වේ.

188 නීලාදිවණ්ණං, නීලාදිවර්ණය; සකලං වා, සියල්ල හෝ; එකදෙසකං වා, එකදේශයක් හෝ; පුඤ්ජිත්වා, පිස ද; බල්ලකාදිකං, විලුම් වසා සිටින බල්ලකාදිය; හාරෙත්වා, (සියල්ල) හැරද; උපාහනා, වහන්, වලඤ්ජෙය්‍ය, වැළඳ ගන්නේ යි ("බල්ලකාදිකං" යන්නෙහි "ආදි" ශබ්දයෙන් තිත්තිරපත්තිකා මෙණ්ඩක අජ විසාණ වද්ධිකා උපාහනාද ගතයුතු.)

---

* බල්ලබද්ධාති, බල්ලබද්ධ උපාහන නම්;, පණ්හිපිධානත්ථං, විලුඹ වසනු පිණිස; තලෙ, තෙලෙහි; බල්ලං, බල්ලකය; (බල්ලක නම් වස්ත්‍රවිශේෂයෙකැයි කියති.) බන්ධිත්වා, බැඳ; කතා, කරනලද වහන් ය. පුටබද්ධාති, පුටබද්ධඋපාහන නම්; යොනකඋපාහනා, යොන්වහන්; වුච්චති, කියනු ලැබේ. (ඒ උපාහනය) යාව ජඞ්ඝතො, කකුලපටන්; සබ්බපාදං සියලු පාදය; පටිච්ඡාදෙති, වසයි; පාළිගුණ්ඨිමාති, පාළිගුණ්ඨිම උපාහන නම්; පළිගුණ්ඨිත්වා, පිටිපතුල වසා; කතා, කරනලද වහන්ය. (ඒ වහන) උපරිපාදමත්තමෙව, උඩුපතුල පමණක් ම; පටිච්ඡාදෙති, වසයි. න ජඞ්ඝං (පටිච්ඡාදෙති,) කෙණ්ඩ නො වසයි. මොරපිඤ්ජපරිසිබ්බිතාති, මොනරපිලින් හිදිකම්කළ වහන් නම්; තලෙසු වා, තෙලෙහි හෝ; වද්ධෙසු වා, වැටියෙහි හෝ; මොරපිඤ්ජෙහි, මොනර පිලියෙන්; සුත්තක සදිසෙහි, හුසින්මෙන්; පරිසිබ්බිතා, හිදිකම්කළ වහන් ය.

---

† මසයහ. සමහර. සවාහය. ඇතැම්.

---

### අනපලොකියන්ති,-

189 සාරත්තො ඉත්ථියා යොනිං මුඛං වා භික්ඛුදායියා,
පරස්ස පත්තං උජ්ඣාන සඤ්ඤී වා අත්තනො මුඛං.
ආදාසෙ උදපත්තෙ වා ඔලොකෙන්තස්ස දුක්කටන්ති.

---

("න භික්ඛවෙ බල්ලබද්ධා උපාහනා ධාරෙතබ්බා. න පුටබද්ධා න පාළිගුණ්ඨිමා. න තූලපුණ්ණිකා. න තිත්තිරපත්තිකා. න මෙණ්ඩවිසාණවද්ධිකා. න අජවිසාණවද්ධිකා. න විච්ඡිකාළිකා. න මොරපිඤ්ඡපරිසිබ්බිතා. න චිත්‍රා උපාහනා ධාරෙතබ්බා. යො ධාරෙය්‍ය ආපත්ති දුක්කටස්ස" † යනු පෙළයි.)

---

### අනපලොකියන්ති,-

අනපලොකියං යන්නෙහි මහණුන් විසින් (නො බැලිය යුතු දෙය නම්.)

189 සාරත්තො, සාරත්ත ව (රාසිත් ඇති ව) ඉත්ථියා, (තදගුජාත ද වූ) මාගමගේ; යොනිං, දියමුනුමග හෝ, භික්ඛුදායියා, බික් දෙන් නියගේ; මුඛං වා, මුහුණ හෝ; උජ්ඣානසඤ්ඤී, කිපිසිත්ඇති ව; පරස්ස පත්තං වා, මෙරමා (වළඳන) පාත්‍රය හෝ; ආදාසෙ, ආදශීතල යෙහි ද; උදපත්තෙ, උදපාත්‍රයෙහි ද; අත්තනො මුඛං වා, තමා මුහුණ හෝ; ඔලොකෙන්තස්ස, (යම්) මහණෙක්) බලා නම්; අස්ස, ඕහට; දුක්කටං, දුකුළා වේ.

---

† භික්ඛවෙ, මහණෙනි! බල්ලබද්ධා උපාහනා, (විලුඹ වැසෙන ලෙස කළ) බැඳැ බැඳිවහන්; න ධාරෙතබ්බා, නො දැරිය යුතු. පුටබද්ධා (උපාහනා) (ජංඝාව පටන් සියලුපාදය වැසෙන ලෙස කළ) පුට බැඳිවහන්; න (ධාරෙතබ්බා,) නො දැරිය යුතු. පාළිගුණ්ඨිමා, (ජංඝාව හැර උඩුපතුල පමණක් වැසෙන ලෙස) පයහාත්පස වසා කළ වහන්; න, නො දැරිය යුතු. තූලපුණ්ණිකා, පුලුන් පිරූ වහන්; න, නො දැරිය යුතු. තිත්තිරපත්තිකා, තිතුරුපත්සෙ විසිතුරු කොට බැඳි වහන්; න, නො දැරිය යුතු. මෙණ්ඩවිසාණවද්ධිකා, බැටළු අංවැනිවැටිඇති වහන්; න, නො දැරිය යුතු: අජවිසාණවද්ධිකා; නිරෙළුඅංවැනි වැටිඇති වහන්; න, නො දැරිය යුතු. විච්ඡිකාළිකා, ගෝනුසුනකුටු වැනිවැටිඇති වහන්; න, නො දැරිය යුතු. මොරපිඤ්ඡපරිසිබ්බිතා, (තෙලෙහි හෝ වැපියෙහි හෝ හුසින් මෙන්) මොණරපිලියෙන් හිඳිකාවීකළ වහන්; න, නො දැරිය යුතු. චිත්‍රා උපාහනා, (මල්කම්ලියකම්න්) විසිතුරුවහන්; න ධාරෙතබ්බා, නො දැරිය යුතු. යො, යමෙක්; ධාරෙය්‍ය, දරා නම්; දුක්කටං ආපත්ති අස්ස, දුකුළා ඇවැත් වන්නේ යි.

"අඤ්ජනී"ති-

190 වට්ටාට්ඨසොළසංසා වා මට්ඨා වට්ටති අඤ්ජනී
තිලෙඛා'පි මූලෙ ගීවායං ලෙඛා එකා'ව බන්ධිතුං.

---

(සඞ්ඝෙ'පි පටසතං නිවත්ථා හොති පුරතො පච්ඡතො වා ඨත්වා ඉමස්මිං නාමො'කාසෙ නිමිත්තානි උපනිජ්ඣායන්තස්ස දුක්කටමෙව. අනිවත්ථානං ගාමදාරිකානං නිමිත්තං උපනිජ්ඣායන්තස්ස පන කිමෙව වත්තබ්බං තිරච්ඡානගතානම්පි නිමිත්තෙ එසෙව නයො.*

ඉත්ථී වා හොතු පුරිසො වා සිඛාදූනසමයෙ මුඛං නඔලොකෙතබ්බං"† යනු අටුවා යි.)

("එසිබටදියම්ව දෙවියම්ව බිලනුගුහම නිරවති එකතිසෙනී ගරහන් වෙළෙලවැනි විසිති බොජුම්නි හුනු යුපයු බැලිය නොලැබෙයි" යනු මෙහි සනස්යි- මුහුණ පෑනෙන ලොහභාජනාදි "ආදස" යන්නෙහි ම ගැනෙ යි. හබුහුණුකැද ඈ "උදපතත" යන්නෙහි ම ගැනේ.)

---

"අඤ්ජනී"ති,

අඤ්ජනී යන්නෙහි අඳුන්නල නම්-

190 වට්ට, වට හෝ; අට්ඨසොළසංසා වා, අටැස් හෝ සොළොසැස් හෝ; මට්ඨා, මාලාකම්මාදි විකාර රහිතවූ; අඤ්ජනි, අඳුන් නල; වට්ටති, වටී; මූලෙ, පත්ලෙහි; තිලෙඛාපි ලෙඛා, තුන්රේඛාවකුණක් ද; (වට්ටනති, වටිත්) බන්ධිතුං, පියන බඳිනා පිණිස; ගීවායං, කර; එකාව ලෙඛා, එක ම රෙඛාවක්; (වට්ටති, වටී)

---

* සඞ්ඝෙ, ඉදින්; පටසතං අපි, පිළිසියයකුදු; නිවත්ථාහොති, හැඳි ස්ත්‍රියක් වේ ද; පුරතො වා, ඉදිරියෙහි හෝ; පච්ඡතො වා, පස්සෙහි හෝ; ඨත්වා, සිට; ඉමස්මිං නාම ඔකාසෙ, මෙ නම් ස්ථානයෙහි; නිමිත්තං ඉති, යොනිය වේ යයි; උපනිජ්ඣායන්තස්ස, සලකන්නහුට; දුක්කටං එව, දුකුලා ම ය, අනිවත්ථානං, වස්ත්‍ර නො හැඳී; ගාමදාරිකානං, ගම්දැරියන්ගේ; නිමිත්තං, යොනිය; උපනිජ්ඣායන්තස්ස පන, සලකා බලන්නහුට වනාහි; කිමෙව වත්තබ්බං, කියයුතු කිම්? තිරච්ඡානගතානං අපි, තිරිසනුන්ගේ ද; (නිමිත්ත බැලීමෙහි) එසො එව නයො, මෙම ක්‍රම යි.

† ඉත්ථි වා හොතු, ස්ත්‍රියක් හෝ වේවා, පුරිසො වා, පුරුෂයෙක් හෝ වේවා; සිඛාදූනසමයෙ, අහර බෙදන කල්හි; මුඛං, මුහුණ නඔලොකෙතබ්බං, නො බැලිය යුතු.

191 යං කිඤ්චි රූපං මාලාදි කම්මං මකරදන්තකං
ගොමුත්තකඩ්ඪචන්දාදි විකාරං නෙත්ථ වට්ටති

192 ලබ්භෙකවණ්ණසුත්තෙන සිබ්බිතුං ථවිකා තථා
සිපාටිකුඤ්චිකාකොසා සලාකා'පි අචිත්තකා

193 සංඛනාභිවිසාණට්ඨිනළදන්තමයා තථා
ඵලකට්ඨමයා වෙළු ලාඛාලොහමයා'පි ච.

194 අඤ්ජනියො සලාකායො ධූමනෙත්තා ච ලබ්භරෙ
තථා සත්ථකදණ්ඩානි නත්ථුදානා ච තම්මයා'ති.

---

("උජුකමෙව පන චතුරස්සා වා අට්ඨංසා වා සොළසංසා වා අඤ්ජනී වට්ටති" †යනු අටුවා බැවින් "වා" ශබ්දයෙන් සිව්රැස් අඤ්ජනිය ද ගත යුතු;)

191 යං කිඤ්චි රූපං, (පක්ෂිරූපාදි) යම්කිසි රූපයක් ද; මාලාදිකම්මං, මාලාදිකම් ද; මකරදන්තකං, මෝරදූති ද; ගොමුත්තක, ගොමූත්‍රවංක ය; අඩ්ඪචන්දාදි, අඩසඳ ය යනාදිවූ; විකාරං, (නොයෙක්) විකාර ද; එත්ථ, මේ අඤ්ජනියෙහි; න වට්ටති, නොවටී;

192 ථවිකා, අඳුන්පසිය; එකවණ්ණසුත්තෙන, එක් පැහැ ඇති හුයින්; සිබ්බිතුං, විදිනට; ලබ්භා, වටී; සිපාටිකුඤ්චිකා කොසා, කරබියලි කොපුයි; (දෙක ද) තථා, එසේමැයි; සලාකාපි, අඳුන් ලග ද; අචිත්තකා, විසිතුරු නොවී (ලබ්භා) වටී.

193 සංඛනාභි, සක්නැබමුවාවූ; විසාණ, ඇමුවාවූ; අට්ඨි, ඇටමුවාවූ; නළ, රණහුණමුවාවූ; දන්තමයා, දළමුවාවූ ද; තථා, එසේම; ඵලකට්ඨමයා, ජලමුවාවූ දඬුමුවාවූ ද; වෙළු, හුණමුවාවූ; ලාඛා, ලාමුවාවූ; ලොහමයාපි ච, ලොහොමුවාවූ ද;

194 අඤ්ජනියො, අඳුන්නළ ද; සලාකායො, අඳුන්ලග ද; ධූමනෙත්තා ච, දුම්නළද යන මොහු; ලබ්භරෙ, වටිත්; සත්ථකදණ්ඩානි, සැත්මිටි ද; නත්ථුදානා ච, නැහොරු ද; තම්මයා, ඒ (සංඛනාභිවිසාණාදි) මයවූවාහු; තථා, එසේම වටිත්. ("නතී වත් ලාවැටු සැත්දඹුදු ඩබරිදු අඳුන්නැලිජු නොම වපී යෙත්" යනු විනය සන්නයයි.)

---

† උජුකමෙව පන, සෘජුවම වනාහි; චතුරස්සා වා, සිව්රැස්වූ හෝ; අට්ඨංසා වා, අටැස්වූ හෝ; සොළසංසා වා, සොළොසැස්වූ හෝ; අඤ්ජනී, අඳුන් නල; වට්ටති, වපී.

"අකප්පියානි සයනානි"ති,

195 ආසන්දි තූලි පල්ලඞ්කො පටිකං ගොනචිත්තකං
පටලී විකති උද්දලොමි එකන්තලොමිකා

196 කුත්තං කොසෙය්‍යකට්ටිස්සං හත්ථිඅස්සරථත්ථරං
අජිනප්පවෙණිකාදලි මිගවරපච්චත්ථරං

197 සලොහිතවිතානඤ්ච උභතො රත්තූපධානකං
අකප්පියානි එතානි දුක්කටං පරිභුඤ්ජතො.

198 ආසන්දිත්තයං සෙසෙ ලබ්භතෙ ගිහිසන්තකෙ
ධම්මාසනෙ ච භත්තග්ගෙ ඝරෙවාපි නිසීදිතුං
භූමත්ථරණසංඛෙපෙ සයිතුඤ්චාපි කප්පති.

---

"අකප්පියානි සයනානී"ති,

අකප්පියානි සයනානි යන්නෙහි (උතුසුන් මහඅසුන් විසින් අකැප වන්නා හිඳිනා දෑ නම්:-

195 ආසන්දි, පමණ ඉකුත් දික්ගත් පුටු ද; තූලි, තිලි ද; පල්ලඞ්කො, (ඇරුගිඳුම් වයාලරූප ඇති) පලඟ ද; පටිකං, ලොම් මුවහළ ඇතිරි ද; ගොන, සතරඟුලෙන් දික්ලොම් ඇති ඇතිරි ද; චිත්තකං, චීමෙන් විසිතුරු ඇතිරි ද; පටලී, ඝනපුප් ඇතිරි ද; විකතී, සිංහාදිරූපයෙන් විසිතුරු ඇතිරි ද; උද්දලොමි, එක පිටෙක ලොම්ඇති ඇතිරි ද; එකන්තලොමිකා, දෙපිටලොම් ඇති ඇතිරි ද;

196 කුත්තං, මාගමුන් සොළොස්දෙනෙකු සිට නැටිය හැකි අවශ් මහඇතිරි ද; කොසෙය්‍ය, රන්කසුකම් කළ හිරිපසතරණ ද; කට්ටිස්සං, රන්කසුකම් කොට කැටි * තිසිරිපුසින් කළ පසතරණ ද; හත්ථිඅස්සරථත්ථරං, ඇතුන් පිට අසුන්පිටරථයෙහි අතුරන ඇතිරි ද; අජිනප්පවෙණි, (හැඳපමණ කොට හිවනලද) අඳුන් දිවි සම්න්කළ; පසතරණ ද; කාදලිමිගපවරත්ථර, උතුම්කෙසෙල්මුව සම්පසතරණින්; අත්ථතං, අතුරන ලද්දේ ද,

197 සලොහිතවිතානඤ්ච, රත්වියන් ඇත්තේ ද; උභතො, දෙපාශ්වයෙහි; හෙවත් හිස්දෙපා මුල; රත්තූපධානකං, රත්කන්වයින් ඇත්තේ ද යන; එතානි, මේ සයනාසනයෝ; අකප්පියානි, අකැපයහ; පරිභුඤ්ජතො, අනුභව කරන්නාහට; දුක්කටං, දුකුළාවේ.

198 ආසන්දාදිත්තයං සෙසෙ, ආසන්දිආදී තුනින් අන්‍යවූ; ගිහිසන්තකෙ, ගිහිසන්තක (වූ සයනාසන) යෙහි ද; ධම්මාසනෙ ච, ධම්මාසනයෙහි ද; භත්තග්ගෙ, බත්ඇගෙහි ද; ඝරෙ වාපි, ගිහිගෙයි දා

---

* කරවිට: ඇතැම්.

199 චතුරස්ස පීඨං සත්ත * පඤ්චඞ්ගඤ්චුච්චපාදකං
තූලොනද්ධං ඝරෙයෙව මඤ්චපීඨං නිසීදිතුං

(පනවනලදකල්හි;) නිසීදිතුං, හිඳිනට; ලබ්භතෙ, වේ; භුම්මත්ථරණසංඛෙපෙ, බුමුතුරුණු කොට පනවනලද කල්හි; සයිතුඤ්චාපි, (තමාගේ කැප ඇතිරියක් ඒ මත්තෙහි ලා) හොනට ද; කප්පති, කැප යි.

(“හත්ථකෙහි ච, බත් ඈගෙහිද වෙහෙරෙහි දවසි පිරිවෙසන තැන්හි එව් බොජුනු හල්හි එව්” යනු මෙහි සන්නයයි.

“අනුජානාමි භික්ඛවෙ පච්චත්ථරිත්වා නිපජ්ජිතුන්ති වුත්තත්තා පරිභණ්ඩකතං භූමිං වා භුම්මත්ථරණසෙනාසනං වා සඞ්ඝිකං මඤ්චපීඨං වා අත්තනො සන්තකෙන පච්චත්ථරණෙන පච්චත්ථරිත්වා’ව නිපජ්ජිතබ්බං” † යනු අටුවා යි.)

199 උච්චපාදකං, වඩුරියනින් උස්පා ඇති; චතුරස්සපීඨං, චතුරශ්‍ර පීඨයෝ; සත්ත, (තුන්පසවැනතුවෙහෙළි හා සතරපා විසින්, සත්අඟක් ඇත්තාහු ද; පඤ්චඞ්ගඤ්ච, (පිටිපසවැනතුවෙහෙල්ල හා සතරපා විසින්) පස්අඟක් ඇත්තාහු ද; (කප්පන්ති, වෙත්;) තූලොනද්ධං; පුළුන් එවූ වළඳනාලද; මඤ්චපීඨං, මඤ්චපීඨයෝ; ඝරෙයෙව, ගිහිගෙයි ම; නිසීදිතුං, හිඳිනට (වෙත්).

(“සත්තඞ්ගො, නාම තීසු දිසාසු අපස්සයං කත්වා කතමඤ්චො අයම්පි පමාණාතික්කන්තො වට්ටති” † හුබැවින් සප්තාඞ්ග පඤ්චාඞ්ග මඤ්ච ද වඩුරියනින් උස් පා ඇත්තේ වේ.)

---

† භික්ඛවෙ, මහණෙනි; පච්චත්ථරිත්වා, පසතුරුණු ලා; නිපජ්ජිතුං, හොනට; අනුජානාමි ඉති, අනුදනිමි යි; වුත්තත්තා, වදාළ හෙයින්; පරිභණ්ඩකතං, පිරිබඩකළ; භූමිං වා, බිම හෝ; භුම්මත්ථරණසෙනාසනං වා, බුමුතුරුණුවත් සෙන සුනහෝ; සංඝිකං මඤ්චපීඨං වා, සඟසතු ඇඳපුටු හෝ; අත්තනො සන්තකෙන, තමා අයත්වූ; පච්චත්ථරණෙන, පසතුරුණුයෙන්; පච්චත්ථරිත්වා එව, පසුතුරාම; නිපජ්ජිතබ්බං, නිදියයුතු.

† සත්තඞ්ගො, නාම, සත්තාඞ්ගය නම්; තීසු දිසාසු, තුන් දිසාවන්හි; අපස්සයං කත්වා, ඇඳි යොද; කතමඤ්චො, කළඇඳ යි; අයම්පි, මේ ද; පමාණාතික්කන්තො, පමණ ඉක්මවූයේ, වට්ටති, වේ.

---

* සත්තඞ්ග: ඇතැම්.

200 චොලවාකුණ්ණපණ්ණානං තිණානඤ්ච ව පූරිතා
චීවරවජ්ජිමයො පඤ්චභිසී සඞ්ඛතා කප්පියා.

201 තූලත්තයං භිසිගබ්භො ලොමානි මිගපක්ඛිනං
බිම්බොහනෙ අනුඤ්ඤාතං තූලවජ්ජා මසූරකෙ.

---

"අනුජානාමි භික්ඛවෙ ඔනද්ධං මඤ්චං ඔනද්ධං පීඨන්ති වච නතො පන චම්මාදීහි ඔනද්ධං මඤ්චපීඨං වට්ටති" *)

200 චොල, කඩින් ද; වාක, වැහිරෙන්ද; උණ්ණ, ලොමින් ද, පණ්ණානං, පතින් ද; තිණානඤ්ච, තණයෙන් ද; පූරිතා, පුරන ලද; චීවරවජ්ජිමයො,, සිවුරුකඩම ජවිකොට ඇති; පඤ්ච භිසි, පඤ්ච විධ භිසිහු; සඞ්ඛතා, (මඤ්චපීඨගතාගතාදි) හැමතැන්හි ම; කප්පියා, කැපයෝයි.

201 තූලත්තයං, (රුක්ඛතූල ලතාතූල පොටකීතූල යන) තුන්පුලුන් ද; භිසිගබ්භො; චොල (වාකාදි පඤ්චවිධ භිසි) ගර්භ ද; මිගපක්ඛිනං, (සිංහාදි) චතුස්පදයන් හා (හංස මයූරාදි) පක්ෂීන්ගේ; ලොමානි ලොමයෝ ද; (යන මේ සියල්ල;) බිම්බොහනෙ, කන්වටිනෙහි; අනුඤ්ඤාතං, අනුදන්නාලදි; මසූරකෙ, සමින් කළ භිසිආදියෙහි; තූලවජ්ජා, තූලය හැර; (සෙස්ස අනුදන්නාලදී,)

† "රුක්ඛතූලන්ති" සිම්බලිරුක්ඛාදීනං යෙසං කෙසඤ්චි රුක්ඛානං තූලං, "ලතාතූලන්ති" ඛීරවල්ලි ආදීනං යාසං කාසඤ්චි වල්ලීනං තූලං, "පොටකීතූලන්ති" පොටකීතිණාදීනං යෙසං කෙසඤ්චි

---

* භික්ඛවෙ, මහණෙනි; ඔනද්ධං, (සම් ආදීන්) වෙළඳනාලද; මඤ්චං, හැඳ; ඔනද්ධං, (සම්ආදීන් වෙළඳනාලද; පීඨං, පුටුව; අනුජානාමි ඉති, අනුදනිම් යි; වචනතො පන, වදාළහෙයින් වනාහි; චම්මාදීහි ඔනද්ධං, සම් ආදියෙන් වැළඳි; මඤ්චපීඨං, හැඳපුටු; වට්ටති, වටී.

† රුක්ඛතූලං ඉති, ගස්පුලුන් නම්; සිම්බලිරුක්ඛාදීනං, ඉඹුල් රුක් ආදිවූ; යෙසං කෙසං චි, යම්කිසි; රුක්ඛානං, වෘක්ෂයන්ගේ; තූලං, පුලුනි, ලතාතූලං ඉති, ලියපුලුන් නම්; ඛීරවල්ලි ආදීනං, කිරි වැල් ආදිවූ; යාසං කාසං චි වල්ලීනං, යම් කිසි ලිය ජාතියක්හුගේ; තූලං, පුලුනි, පොටකීතූලං ඉති, පොටකී පුලුන් නම්; පොටකීති ණාදීනං, පොටකිතෘණ ආදිවූ; යෙසං කෙසං චි, යම් කිසි, තිණජාති

202 මනුස්සලොමමුණ්ණායං පණ්ණෙ පුප්ඵං තමාලකං;
සුද්ධං න ආසනෙ යෙව ලබ්භමප්පටිවෙක්ඛිතං.

---

තිණජාතිකානං අන්තමසො උච්ඡුනළාදීනම්පි තූලං' යනුදු "අගිලා-නස්ස සීසූපධානඤ්ච පාදූපධානඤ්ච,'ති එවං එව වට්ටති. ගිලානස්ස බිම්බොහනානි සන්ථරිත්වා උපරි පච්චත්ථරණං දත්වා නිපජ්ජිතුම්පි වට්ටති" යනු අටුවායි.

"හිසහි ඔනාට අනුජති පට්ටණ කී එව පමණ ඉකිතගෝති කොට්ටකන්වයි තිකාව නොලැබෙයි යම් කාවරි එව පමණිගිම කර ණී" යනු මෙහි සනායි.

"තිරියං මුට්ඨිරතනං හොති බිම්බොහනවිත්ථාරං
දීඝතො හි දියඩ්ඪං වා විහත්ථං තිකුරුන්දියං."*

202 උණ්ණායං, ලොම්බිස්සෙහි; මනුස්සලොමං, මිනිස් ලොම් ද; පණ්ණෙ, කොළබිස්සෙහි; පුප්ඵං (පුවඟුමල් මුනුණ්මල් ආදිවූ) මල් ද; සුද්ධං, අමිශ්‍රවූ; තමාලකං, තමලුපත් ද; අප්පටිවෙක්ඛිතං, අපරීක්ෂිතවූ; (අත් ගහා විමසනු නොලද) ආසනෙයෙව, (පිඩාවි ඈ අතුරනලද) ආසනය ද; න ලබ්භං, නොවරි.

("අප්පටිවෙක්ඛිතන්ති" එත්ථ කීදිසං ආසනං පටිවෙක්ඛිතබ්බං කීදිසං න පටිවෙක්ඛිතබ්බං, යං සුද්ධං ආසනමෙව හොති අපච්ච

---

ත්ථානං, තෘණජාතියක්හුගේ; අන්තමසො, යටත් පිරිසෙයින්; උච්ඡු නළාදීනං අපි, උක්බට ආදින්ගේද; තූලං, පුලුනි. අගිලානස්ස, නො ගිලනාට; සීසූපධානං ච, හිසතබන කොට්ටය ද; පාදූපධානං ච ඉති, පා තබන කොට්ටයද්දයි; එතං එව, කොට්ට දෙකක්ම; වට්ටති, වටී, ගිලානස්ස, ගිලනාට; බිම්බොහනානි, කොට්ට; සන්ථරිත්වා, අතුරා; උපරි, මත්තෙහි; පච්චත්ථරණං දත්වා, ඇතිරිලි එලා ; නිප ජ්ජිතුං අපි, නිදන්ට ද; වට්ටති, වටි.

* බිම්බොහනවිත්ථාරං, කොට්ටයෙහි ප්‍රමාණය; තිරියං සරස; මුට්ඨිරතනං හොති, මිට්රියන් වේ, දීඝතො හි, දිගින් වනාහි; දියඩ්ඪං වා, එක්රියන් බාගයක් හෝ වේ; විහත්ථං ඉති, දෙරියන කැයි; කුරුන්දියං, කුරුන්දිය අටුවායෙහි; (කියනලදී.)

† අප්පටිවෙක්ඛිතං ඉති එත්ථ, නො විමසනලද සත මෙහි; කී දිසං ආසනං, කෙබඳු ආසනයක්; පටිවෙක්ඛිතබ්බං; විමසිය යුතු ද? කීදිසං, කෙබඳු ආසනයක්; න පටිවෙක්ඛිතබ්බං, නො විමසිය යුතු ද? යං, යමක්; සුද්ධං කෙවලවූ; ආසනං එව, ආසන පමණක්;

ත්ථරණකං යඤ්ච ආගන්ත්වා ඨිතානං පස්සතං යෙව අපනීයති තං න පච්චවෙක්ඛිතබ්බං නිසීදිතුං වට්ටති යම්පි මනුස්සා සයං හත්ථෙන අක්කමිත්වා ඉධ භන්තෙ නිසීදථා'ති දෙන්ති තස්මිම්පි වට්ටති, සචෙ'පි පඨමමෙව ආගන්ත්වා නිසින්නා පච්ඡා උද්ධං වා අධො වා සඞ්කමන්ති පච්චවෙක්ඛණකිච්චං නත්ථි යම්පි තනුකෙන වත්ථෙන යථා තලං දිස්සති එවං පටිච්ඡන්නං හොති තස්මිම්පි පච්චවෙක්ඛණකිච්චං නත්ථි'යම්පන පටිගච්චෙව ! පාවාරකොජවකාදීහි අත්ථතං හොති, තං හත්ථෙන පරාමසිත්වා සල්ලක්ඛෙත්වා නිසීදිතබ්බං, මහාපච්චරියම්පන ඝනසාටකෙනාපි අත්ථතෙ යස්මිං වලි න පඤ්ඤායති තං 'න පච්චවෙක්ඛිතබ්බන්ති වුත්තං" † යනු අටුවා යි.

---

හොති, වේ ද; අපච්චත්ථරණකං, ඇතිරිලිනැත්තේ ද; යං ච, යමක් ද; ආගන්ත්වා, අවුත්; ඨිතානං, සිටියවුන්; පස්සතං එව, බලා සිටියදීම; අපනීයති, අතුරනු ලැබේද; තං, ඒ ආසනය; න පච්චවෙක්ඛිතබ්බං, නො විමසිය යුතු. නිසීදිතුං, හිඳින්ට; වට්ටති, වටී, යං අපි, යම් ආසනයක් ද; මනුස්සා, මනුෂ්‍යයෝ; සයං, තුමූ; හත්ථෙන, අතින්; අක්කමිත්වා, මැඩ; භන්තෙ, වහන්ස! ඉධ, මෙහි; නිසීදථ ඉති, හිඳිව්යයි; දෙන්ති, දෙත් ද; තස්මිං අපි, එහි ද; වට්ටති හිඳින්ට වටි, සචෙ අපි, ඉදින් වනාහි; පඨමං එව; පළමු ව ම; ආගන්ත්වා, අවුත්; නිසින්නා, හුන්නාහු; පච්ඡා, පසුව; උද්ධං වා, උඩට හෝ; අධො වා, යටට හෝ; සඞ්කමන්ති, සඞ්ක්‍රමණය (මාරුවීම) කෙරෙත්ද,; පච්චවෙක්ඛණකිච්චං, විමසීමෙන් කටයුත්තක්; නත්ථි, නැත; යම්පි, යම් ආසනයක් වනාහි; තනුකෙන වත්ථෙන, තුනී වස්ත්‍රයෙන්; යථා, යම් සේ; තලං, යට; දිස්සති, දක්නාලැබේ ද; එවං, එසේ; පටිච්ඡන්නං හොති; වසනලද්දේ වේ ද; තස්මිං අපි, එහි ද; පච්චවෙක්ඛණකිච්චං, විමසීමෙන් කටයුත්තක්; නත්ථි, නැත; යම්පන, යම් ආසනයෙක් වනාහි; පටිගච්චෙව, පළමු කොට ම; පාවාරකොජවකාදීහි, උතුරුසළු කොඳුපලස් ආදියෙන්; අත්ථතං හොති, අතුරනලද්දේ වේ ද; තං, එබඳු ආසනය; හත්ථෙන, අතින්; පරාමසිත්වා, පිරිමැද; සල්ලක්ඛෙත්වා, සලකා; නිසීදිතබ්බං, හින්ද යුතු, මහාපච්චරියං පන, මහාපච්චරිය අටුවාවෙහි වනාහි; ඝනසාටකෙන අපි, ඝන සළුවෙන් ද; අත්ථතෙ, අතුළකල්හි; යස්මිං, යමක; වලි, රැලි; න පඤ්ඤායති, නො පැනේ ද; තං, ඒ ආසනය; න පච්චවෙක්ඛිතබ්බං ඉති, නො විමසිය යුතු යයි; වුත්තං, කියනලදි.

සමානාසනිකො’පි වා’ති,-

203 තිවස්සන්තර’නුඤ්ඤාතං භික්ඛූනමෙකමාසනං
සත්තවස්ස තිවස්සෙහි පඤ්චවස්සො නිසීදති

204 ඨපෙත්වා පණ්ඩකං ඉත්ථිං උභතොබ්‍යඤ්ජනං මුනි,
දීඝාසනෙ අනුඤ්ඤාසි සබ්බෙහෙව නිසීදිතුං.

205 අන්තං දීඝාසනං තිණ්ණං යං පහොති නිසීදිතුං
මඤ්චකෙ වා’පි පීඨෙ වා විනා ලබ්භං නිසීදිතුන්ති

"අසංවාසිකො වා"ති,

206 උක්ඛිත්තො’නුපසම්පන්නො භික්ඛුනී ඡින්නමූලකො
නානාසංවාසනිස්සීමට්ඨිතවෙහාසසණ්ඨිකො
එකාදස අභබ්බා ච අසංවාසා’ති දීපිතා ති

---

"සමානාසනිකොපි වා"ති,-

සමානාසනිකො පිව යන්නෙහි එක අස්නෙහි හින්ද යුත්තෝ නම්

203 භික්ඛූනං, භික්ෂූන්ට; තිවස්සාන්තරං, තුන්වසක් ඇතුළෙහි; එකමාසනං, එකාසනය; අනුඤ්ඤාතං, අනුදන්නාලදී; (එසේම) පඤ්චවස්සො, පස්වසක් ඇති මහණ; සත්තවස්ස, සත්වසක් ඇත්ත වුන්හා ද; තිවස්සෙහි, තුන්වසක් ඇතියවුන් හා ද සමග; නිසීදති, (එක අස්නෙහි) හිඳී.

204 මුනි, සර්වඥතෙම; පණ්ඩකං, පඬකයා ද; ඉත්ථිං, මාගම ද; උභතොබ්‍යඤ්ජනං, උභතොබ්‍යඤ්ජනකයා ද; ඨපෙත්වා, තබා; සබ්බෙහෙව, (සමානාසනික අසමානාසනික) සියල්ලන් හා ම එක්ව; දීඝාසනෙ, දිග අස්නෙහි; නිසීදිතුං, හිඳිනට; අනුඤ්ඤාසි, අනුදැනී.

205 යං, යම් අස්නක්; තිණ්ණං, තුන්දෙනෙකුට; නිසීදිතුං, (පලක් බැඳ) හිඳිනට; පහොති, සෑහේ ද; තං, ඒ; අන්තං දීඝාසනං, පශ්චිමදීඝාසනය නම් වේ; මඤ්චකෙ වාපි, හැඳ හෝ; පීඨෙ වා, පුටුවෙහි හෝ; නිසීදිතුං, හිඳිනට; විනා, (සමානාසනික) දෙන්නෙකුට; ලබ්භං, වටී.

"අසංවාසිකො වා"ති,

අසංවාසිකො ච යන්නෙහි එකකම්මාදි සංවාසයට නොනිස්සෝ නම්-

206 උක්ඛිත්තො, උක්ෂෙපනීකම් කරනලද්දේ ද; අනුපසම්පන්නො, උපසම්පන්නනොවූයේ ද; භික්ඛුනී, මෙහෙණ ද; ඡින්නමූලකො, පරිජි අවන් ද; නානාසංවාසො, (ලබ්ධි) නානාසංවාසක ද; නිස්සීමට්ඨිත, සීමින් බැහැර සිටියේ ද, වෙහාසසණ්ඨිතො, ආකාසයෙහි සිටියේ ද; එකාදස අභබ්බා ච, එකොළොස් අභව්‍ය පුද්ගලයෝ ද; අසංවාසාති, අසංවාසක යි; දීපිතා, දක්වනලදහු.

කම්මුනා ලද්ධිසීමාහි නානාසංවාසකා තයො
උක්ඛිත්තො තිවිධො කම්මනානාසංවාසකො මතො

අධම්මවාදිපක්ඛස්මිං නිසින්නො ච විචින්තයං
ධම්මවාදී පනෙතෙති උප්පන්නෙ පන මානසෙ

නානාසංවාසකො නාම ලද්ධියායං පකාසිතො
තත්‍රට්ඨො පන සො උභින්නං කම්මං කොපෙති සඞ්ඝිකං

බහිසීමගතො සීමානානාසංවාසකො මතො
නානාසංවාසකා එවං තයො වුත්තා මහෙසිනා *

("ලද්ධිනානාසංවාසක,, යන්නෙහි ලබ්ධි නම් ධර්මවාදීහ යි ගත් සිති.)

---

* කම්මුනා, කර්මයෙන් ද; ලද්ධිසීමාහි, ලබ්ධිසීමා දෙකින් ද; නානාසංවාසකා, නානාසංවාසකයෝ; තයො, තිදෙනෙක්; තිවිධො; තුන් ආකාරවූ; උක්ඛිත්තො; උක්ෂේපනීයලත් තැනැත්තේ; කම්මනානාසංවාසකො, කම්මනානාසංවාසක යයි; මතො, දත්නාලදී.

විචින්තයං, (මේ උක්ඛිත්තානුවත්තකයෝ ධර්මවාදී දෝ හෝ, තෙල උක්ෂේපකයෝ ධර්මවාදී දෝ හෝ යි, විවිධසිත් සිතමින්; අධම්මවාදිපක්ඛස්මිං, අධර්මවාදී (උක්ඛිත්තානුවත්තක) පක්ෂයෙහි; නිසින්නො එව, හුන්නේ ම; එතෙ පන, තුලු හෙවත් උක්ෂේපකයෝ වනාහි; ධම්මවාදී ඉති, ධර්මවාදීහ යි; මානසෙ, සිත; උප්පන්නෙ පන, උපන් කල්හි වනාහි;—

අයං, මේ තෙම; ලද්ධියා; ලබ්ධිය හෙතු කොට ගෙන; නානාසංවාසකො නාම, නානාසංවාසක නමැයි; පකාසිතො, ප්‍රකාශකරනලදී; සො පන, හෙතෙම වනාහි; තත්‍රට්ඨො, එහි හෙවත් අධර්මවාදිපක්ෂයෙහි සිටියේ: උභින්නං, දෙපක්ෂයෙහි ම; සඞ්ඝිකං කම්මං, සංඝකර්ම; කොපෙති, කොප කෙරේ.

බහිසීමගතො, සීමාවෙන් පිට සිටියේ; සීමානානාසංවාසකො, සීමානානාසංවාසක යයි; මතො, දත්නාලදී. එවං, මෙසේ; මහෙසිනා, සර්වඥයන් වහන්සේ විසින්; නානාසංවාසකා, නානාසංවාසකයෝ; තයො, තිදෙනෙක්; වුත්තා, වදාරනලදහ.

## කම්මත්ත

207 වග්ගේන අධම්මකම්මං සමග්ගේන අධම්මිකං
වග්ගේන ධම්මකම්මඤ්ච සමග්ගේන ච ධම්මිකං
චතුත්ථං යේව'නුඤ්ඤාතං සේසකම්මේසු දුක්කටං.

208 චතුවග්ගෝ පඤ්චවග්ගෝ දසවීසතිවග්ගිකෝ
* තිරේකවීසතිවග්ගෝ පඤ්චසඞ්ඝා විභාවිතා.

209 චතුවග්ගෝ ච අබ්භානූපසම්පදපවාරණං
පඤ්චවග්ගෝ ච අබ්භානං මජ්ඣිමේසූපසම්පදං.

210 දසවග්ගෝ'ව අබ්භානං ඨපෙත්වා සබ්බකම්මිකෝ,
ඉතරෝ සබ්බකම්මේසු කම්මප්පත්තා'ති දීපිතා.

---

### "කම්මන්ති"

කම්මං යන්නෙහි චතුර්විධකර්ම නම්;

207 වග්ගේන, වර්ගසංඝයා විසින් කරන; අධම්මකම්මං අධර්මකර්මය ද; සමග්ගේන, සමග්‍රසංඝයා විසින් කරන; අධම්මිකං, අධර්මකර්මය ද; වග්ගේන, වර්ගසඞ්ඝයා විසින් කරන; ධම්මකම්මඤ්ච, ධර්මකර්මය ද; සමග්ගේන, සමග්‍රසඞ්ඝයා විසින් කරන; ධම්මිකඤ්ච, ධර්මකර්මය දැයි (කර්මසතරක් වේ.) චතුත්ථං යේව; සතරවනකර්මය ම; අනුඤ්ඤාතං, අනුදන්නාලද; සේසකම්මේසු, සෙසු (තුන්) කර්මයෙහි; දුක්කටං, දුකුළා වේ.

208 චතුවග්ගෝ, චතුර්වර්ගසඞ්ඝ ය; පඤ්චවග්ගෝ. පඤ්චවර්ගසඞ්ඝ ය; දසවීසතිවග්ගිකෝ, දශවර්ගසඞ්ඝ ය විංශතිවර්ගසඞ්ඝ ය, අතිරේකවීසතිවග්ගෝ, අතිරේකවිංශතිවර්ගසඞ්ඝ ය යන, පඤ්චසඞ්ඝා, සඞ්ඝ පස්දෙනෙක්; විභාවිතා, විභාග කොට දක්වන ලද්හු.

209 210 චතුවග්ගෝ, (එකී) චතුර්වර්ගසඞ්ඝතෙමේ අබ්භානඤ්ච, අබ්භානකර්මය ද; උපසම්පදං, උපසම්පදාකර්මය ද; පවාරණං, පවාරණය ද; පඤ්චවග්ගෝ, පඤ්චවර්ගසඞ්ඝතෙමේ; අබ්භානඤ්ච, අබ්භානකර්මය ද; මජ්ඣිමේසූපසම්පදං; මධ්‍යදෙශයෙහි උපසම්පදා ද; දසවග්ගෝ, දශවර්ගසඞ්ඝතෙමේ; අබ්භානං ච, අබ්භානකර්මය ම; ඨපෙත්වා, තබා; සබ්බකම්මිකෝ, (සියලුකර්මයෙහි) කර්මප්‍රාප්තය; ඉතරෝ, විංශතිවර්ග අතිරේක විංශතිවර්ග සඞ්ඝතෙමේ; සබ්බකම්මේසු, සියලු (සඞ්ඝ) කර්මයෙහි; කම්මප්පත්තාති, කර්මප්‍රාප්ත ය යි (කර්මයට නිසි ය යි) දීපිතා, දක්වනලදී.

---

* අතිරේක:-

211 චතුවග්ගෙන කත්තබ්බෙ චත්තාරො පකතත්තකා
කම්මප්පත්තා පරෙ ඡන්දාරහා සෙසෙ'ප්‍යයං නයො.

212 චතුවග්ගාදිකත්තබ්බං අසංවාස ගණපූරකං
කම්මාරහගණපූරං වා කතං කුප්පඤ්ච දුක්කටං.
පරිවාසාදි කම්මෙසුච ගරුකඤ් ගණ පූරකං.

213 අධම්මකම්මං වාරෙය්‍ය අන්තරායෙ දුවෙ තයො
දිට්ඨාවිමෙකො'ධිට්ඨානං වාරෙනෙන්තෙ'ව තතො'ධිකා.

---

(විසිවග්ගසඟුන් විසින් සියලු සඞ්ඝ කර්ම සිඬවැදු අයිරාවිසිවග් සඟුන් ගැන්ම චතුවර්ගාදි සඟුන් විසින් කටයුතු කර්ම අතිරෙකයන් විසින් කටහැකි සේ ඌනයන් විසින් නොකට හැකි සේ දක්වනු පිණිස යයි දත යුතු.)

211 චතුවග්ගෙන, චතුර්වර්ග සඞ්ඝයා විසින්; කත්තබ්බෙ, කටයුතු කර්මයෙහි; පකතත්තකා, (පරිජී නො අවන් උකෙව්නි කම් නොලද නන්සංවැසි නො වූ බැවින්) ප්‍රකෘතාත්මවූ; චත්තාරො, සතර දෙනෙක්; කම්මප්පත්තා, කර්මයට යොග්‍යහ; අපරෙ, (එකසීමායෙහි සිටි) සෙසු ප්‍රකෘතාත්මහු; ඡන්දාරහා, ඡන්ද දෙන්නට; නිස්සෝයි; සෙසෙපි, (පඤ්චවර්ගසඞ්ඝාදීන් විසින් කටයුතු) සෙසු කර්මයෙහි දු; අයංනයො, මේම නය යි.

212 චතුවග්ගාදි, චතුර්වර්ගසඞ්ඝාදීන් විසින්; කත්තබ්බං, කටයුතු සඞ්ඝකර්මය; අසංවාස ගණපූරකං වා, අසංවාසකයා ගණපූරක කොට හෝ; කම්මාරහ ගණපූරකං වා, කර්මලබන්නට නිසි සඟු ගණපූරක කොට හෝ, (කතං, කරන ලද්දේ; පරිවාසාදි කම්මෙසුච, පිරිවෙස් ආදිවූ කර්මය වනාහි; ගරුකට්ඨ ගණපූරකං, ගරුකස්ථයා ගණපූරක කොට; කතං, කරන ලද්දේ; කුප්පඤ්ච කොප්‍යද වෙයි; දුක්කටං, (කාරක යන්ට) දුකුළු ද වේ.

213 අධම්මකම්මං, අධර්මකර්මය; වාරෙය්‍ය, වළකන්නේය; අන්තරායෙ, (ජීවිතයට බ්‍රහ්මචරියාවට) අන්තරායක් ඇති කල්හි; දුවෙ තයො, දෙන්න තුන්දෙන; දිට්ඨාවිං, (කරෙය්‍යුං, "අධම්මකම්මං ඉදං න මෙතං ඛමති"යි ඔවුනොවුන්ට තමන්ගේ) ලබ්ධි ප්‍රකාශකරන්නාහුය; එකො, හුදකලා මහණ; අධිට්ඨානං, (කරෙය්‍ය "න මෙතංඛමති"යි; සිතින්) ඉටන්නේ ය. තතො, ඒ තුන්දෙනා කෙරෙන්; අධිකා, බොහෝදෙන; වාරෙනෙතව, වළකත් මැයි.

214 කම්මාරහඅසංවාසඛිත්තචිත්තාදුක්ඛට්ටිතා
එතෙසං සඞ්ඝමජ්ඣම්හි පටික්ඛෙපො න රූහති.

215 පකතත්තෙකසීමට්ඨසමසංවාසභික්ඛුනො
ආරොචෙන්තස්ස'න්තමසො 'නන්තරස්සාපි රූහති.

216 කොපෙතුං ධම්මිකං කම්මං පටික්කොසෙය්‍ය සම්මුඛා
තිරොක්ඛා කායසාමග්ගිං ඡන්දං නො දෙය්‍ය දුක්කටන්ති

---

“මිච්ඡාජීවවිවජ්ජනා”ති,-

217 දරුං වෙළුං ඵලං පුප්ඵං චුණ්ණං න්හානමුඛොදකං
මත්තිකං දන්තකට්ඨාදිං න දදෙ කුලසංගහා.

---

214 කම්මාරහ, කර්මලබන්නට නිස්සේ ය; අසංවාස, සංවාසාභී නොවන්නේ ය; ඛිත්තචිත්ත, උම්මත්තක ය; දුක්ඛට්ටිතා, වෙදනාතී ය යන; එතෙසං මොවුන්ගේ, සඞ්ඝමජ්ඣම්හි, සඟ මැද; පටික්ඛෙපො, ප්‍රතික්ෂෙපය; න රූහති, නො නැගේ.

215 අන්තමසො, යටත්පිරිසෙයින්; අනන්තරස්සාපි, ආසන්නයෙහි හුන්නාහට ද; ආරොචෙන්තස්ස, කියන්නාවූ; පකතත්ත, ප්‍රවතත්වූ; එකසීමට්ඨ, එකසීමාවෙහි සිටි; සමසංවාස භික්ඛුනො, සමාන සංවාස ඇති භික්ෂුහුගේ; (පටික්ඛෙපො) වැළකිම; රූහති, නැගේ.

216 ධම්මිකං, ධර්මයෙන් යුක්තවූ; කම්මං, (අපලොකනාදි චතුර්විධ) සඞ්ඝකර්මය; කොපෙතුං, කොප කරන්නට; සම්මුඛා, හමුයෙහි; පටික්කොසෙය්‍ය, වළකා නම්; තිරොක්ඛා, නො හමුයෙහි, කායසාමග්ගිං, කායසාමග්‍රිය හෝ; ඡන්දං, සඳ හෝ; නො දෙය්‍ය; නො දේ නම්; දුක්කටං, දුකුළා වේ.

---

“මිච්ඡාජීවවිවජ්ජනා”ති,-

මිච්ඡාජීවවිවජ්ජනා යන්නෙහි ලාමක ජීවිකාවගේ දුරු කිරීම නම්:-

217 දරුං, දැව ද; වෙළුං, (කිරිඳෙලුයට ඈ) හුණ ද; ඵලං, (තාලපනසාදි) ඵල ද; පුප්ඵං, (පුවඟුමල් ඈ) මල් ද; චුණ්ණං, (මහරිසුණු ඈ) සුණු ද; න්හානමුඛොදකං, නහන දිය හා මුවසොදනදිය ද; මත්තිකං, (පියවිමැටි ඈ) මැටි ද; දන්තකට්ඨාදිං, දැහැටිදඬු ආදි ද; කුලසංගහා, කුලයන් සඟැන්මු හෙතු කොට ගෙන; න දදෙ, නො දෙන්නේ යි.

218 පාරිභට්‍යකතා මුග්ගසූප්‍යතා වත්ථුවිජ්ජයා
පහෙණදූතකම්මෙන ජඞ්ඝපෙසනියෙන වා.

219 අනුප්පදානපතිපිණ්ඩවෙජ්ජකම්මෙන වා පුන
නාසෙඤ්ඤනවා'පි සම්බුද්ධපතිකුට්ඨෙන ජීවයෙ.

220 විඤ්ඤත්තිනෙසනාහුතුල්ලපනාකුහනාදිහි
කුලදූසාදිනුප්පන්නපච්චයෙ පරිවජ්ජයෙ'ති.

---

218 පාරිභට්‍යකතා, (ලාභාසායෙන්) කුලදරුවන් (ඔරලන ආදී විසින්) වැඩීමෙන් හෝ; මුග්ගසූප්‍යතා, තිවු මුංසේ අනුන් සගත් කට සැබෑ මිද නොවා බොරු බොහෝ කොට කීමෙන් හෝ; වත්ථුවිජ්ජයා, (ලිංබිම් ගෙබිම් ඈ පානා) වයතු විද්‍යාවෙන් හෝ; පහෙණ; (කොත්වත් අරම් ආදියට) මෙහෙවර යන කමින් හෝ; දූත කම්මෙන, (පත් හසුන් උඩුරු ගෙන යන) දූත කමින් හෝ; ජඞ්ඝපෙසනියෙන වා, හසුන් ගෙන එගෙන් එගෙට යන කුදු මෙහෙයෙන් හෝ.

219 අනුප්පදාන, (ලාභාසායෙන්) අත්ලස් ඈ දීමෙන් හෝ; පතිපිණ්ඩ, පිළිපිඩු දීමෙන් හෝ; වෙජ්ජකම්මෙන වා, පිළියම් කිරීමෙන් හෝ; පුන, නැවත; සම්බුද්ධපතිකුට්ඨෙන, බුදුන් විසින් නින්‍දා කොට හරනලද; අසෙඤ්ඤන වාපි, (අඞ්ගවිද්‍යා නක්ෂත්‍රවිද්‍යාදි) අනිකෙකින් හෝ; න ජීවයෙ, ජීවත් නො වන්නේ යි.

තමා ලද මද පසයක් කුලයන්ට දී උන් දෙනු ගැන්ම "පති පිණ්ඩදාන" නම් වේ. "අඞ්ගවිද්‍යා" නම් අඟපසඟ ලකුණු දන්නා විද්‍යා යි. "නක්ෂත්‍රවිද්‍යා" නම් නකත් දන්නා විද්‍යා යි.

220 විඤ්ඤත්ති, (නොනෑ නොපැවරුවන්) ඉල්වීමෙන් ද; අනෙසනා, නුසුදුසු පියොවින් පස සෙවීමෙන් ද; අහුතුල්ලපනා, තමා කෙරෙහි නැති උතුරු මිනිස්දම් කීමෙන් ද; කුහනාදිහි, කුහන ලපනාදියෙන් ද; කුලදූසාදිනා, කුලදූසනාදියෙන් ද; උප්පන්න පච්චයෙ, උපන් (සතර) පසය; පරිවජ්ජයෙ, (විෂමිශ්‍ර දෙයක් සෙයින් දුරින්) දුරුකරන්නේ යි.

("කුලදූසාදි" යන්නෙහි "ආදි" ශබ්දයෙන් රූපියපටිග්ගහණ රූපියසංවොහාර ගත යුතු.)

“වත්තකථා”-

221 ආගන්තුකො න ආරාමං පවිසෙ සඋපාහනො
සඡත්තො'ගුණ්ඨිතො සීසෙ කරිත්වා වා'පි චීවරං.

222 පානීයෙන න ධොවෙය්‍ය පාදෙ වුඩ්ඪතරෙ'පි ච
ආවාසිකෙ'භිවාදෙය්‍ය පුච්ඡෙය්‍ය සයනාසනං.

---

“වත්තකථා”-

වත්තං යන්නෙහි ආගන්තුකවත්තාදි වත් නම්:-

221 ආගන්තුකො, අමුතු මහණ; සඋපාහනො, (පාසලු) වහන් ඇති ව හෝ; සඡත්තො, (හිසට කුළ) සත් ඇති ව හෝ; ඔගුණ්ඨිතො, හිස් වසා පෙරව හෝ; චීවරං, සිවුරු; සීසෙ කරිත්වා වාපි, හිස තබා හෝ; ආරාමං, (ලග්න සදහා වදනා) වෙහෙරට; න පවිසෙ, නො වදනේ යි. (උපසරයිම සිට මේ හැම හැර වැද්ද යුතු.)

222 පානීයෙන, බොන පැනින්; පාදෙ න ධොවෙය්‍ය, පා නො සෝදන්නේ ය; වුඩ්ඪතරෙ, තමහට වැඩිමහලුවූ; ආවාසිකෙපිච, තන්වැසියනුදු; අභිවාදෙය්‍ය, වඳනේ ය; සයනාසනං, ලග්නා සෙනසුන් ද; පුච්ඡෙය්‍ය, (කවර සෙනස්න මට පැමිණේ ද; අජ්ඣාවුත්‍ථ අනජ්ඣාවුත්‍ථ දැ යි) පුළුවුස්නේ යි.

(“සචෙ සඞ්ඝස්ස ද්වෙ තිස්සො පොක්ඛරණියො වා උදකසොණ්ඩියො වා හොන්ති කතිකා ච කතා එත්‍ථ නහායිතබ්බං ඉතො පානීයං ගහෙතබ්බං ඉධ සබ්බපරිභොගො කාතබ්බො'ති කතිකා වත්තෙනෙව සබ්බං කාතබ්බං, යත්‍ථ කතිකා නත්‍ථි තත්‍ථ සබ්බපරිභොගො වට්ටති” * යනු අටුවා යි.)

---

*සචෙ, ඉදින්; සඞ්ඝස්ස, සඞ්ඝයාගේ; ද්වෙ තිස්සො, දෙකක් තුනක්; පොක්ඛරණියො වා, පොකුණු හෝ; උදකසොණ්ඩියො වා, පැන් ඇති ගල්කොබි හෝ; හොන්ති, වෙත් ද; එත්‍ථ, මෙහි; නහායිතබ්බං, නෑයුතුය; ඉතො, මෙයින්; පානීයං, බොන පැන්; ගහෙතබ්බං, ගතයුතුය; ඉධ, මෙහි; සබ්බපරිභොගො, සියලු පරිභොග, කාතබ්බො ඉති, කළ යුතු යයි; කතිකා ච, කතිකා ද; කතා, කරන ලද ද, කතිකාවත්තෙන එව, කතිකාවතින් ම; සබ්බං, සියල්ල; කාතබ්බං, කළයුතු; යත්‍ථ, යම්තැනක; කතිකා, කතිකාවක්; නත්‍ථි, නො වේ ද; තත්‍ථ, එහි; සබ්බපරිභොගො, සියලු පරිභොගය; වට්ටති, වටී.

223 ගමිකො පටිසාමෙත්වා දාරුමත්තිකභණ්ඩකං
විහාරඤ්ච ථකෙත්වාන ආපුච්ඡ සයනාසනං.

224 ආපුච්ඡිතබ්බෙ අසති සඞ්ගොපෙත්වාන සාධුකං
පක්කමෙය්‍යඤ්ඤථා තස්ස පක්කන්තුං න ච කප්පති.

225 ආවාසිකො පඤ්ඤපෙය්‍ය වුඩ්ඪාගන්තුස්ස ආසනං
උපනික්ඛිපෙ පාදොදප්පභුතිං පත්තචීවරං.

226 පච්චුග්ගන්ත්වාන ගණ්හෙය්‍ය පානීයෙන ච පුච්ඡයෙ
ආගන්තුමභිවාදෙය්‍ය පඤ්ඤපෙ සයනාසනං.

227 අජ්ඣාවුත්ථමවුත්ථං වා ගොචරාගොචරං වදෙ
වච්චපස්සාවඨානානි කතිකං සෙඛසම්මුතිං.

228 පවෙසනික්ඛමෙ* කාලං පරිභොජියපානියං †
නිසින්නකො'ව නවකස්ස එතං සබ්බං සමුද්දිසෙ'ති.

---

223 ගමිකො, බැහැර යන මහණ; දාරුමත්තිකභණ්ඩකං, (මඤ්චපීඨාදි) දාරුභාණ්ඩ හා (රජනභාජනාදි) මත්තිකාභාණ්ඩ ද; පටිසාමෙත්වා, සඟවා තබා; විහාරඤ්ච, සෙනස්න ද; ථකෙත්වාන, සුරැකි කොට දොරකවුළු පියා; සයනාසනං, (මඤ්චපීඨාදි) සයනාසන ද; ආපුච්ඡ, (ඇවත මේ රක්‍ෂා කර යි ආරාමිකාදීන්) පිළිවිස; (පක්කමෙය්‍ය, යන්නේ යි.)

224 ආපුච්ඡිතබ්බෙ අසති, පිළිවිස්නට තිසි ආරාමිකාදි යමක්හු නැති කල්හි; සාධුකං, මනා කොට; සඞ්ගොපෙත්වාන, සඟවා තබා; පක්කමෙය්‍ය, යන්නේ යි; අඤ්ඤථා, එසේ නො කොට; පක්කන්තුං, ගමන් යාම; තස්ස, ඔහට; න ච කප්පති, නො ම වටී.

225 226 ආවාසිකො, තන්වැසිමහණ; වුඩ්ඪාගන්තුස්ස, වැඩිමහලු ආගන්තුකයහට; ආසනං, හිඳිනාඅසුන්; පඤ්ඤපෙය්‍ය, (දුර (දුක ම) පණවන්නේ ය. පාදොදප්පභුතිං, පාදොදක පාදකඨලිකා දීන්; උපනික්ඛිපෙ, එළවා තබන්නේ ය; පච්චුග්ගන්ත්වාන, පෙර මගට ගොස්; පත්තචීවරං, පාසිවුරු; ගණ්හෙය්‍ය, ගන්නේ ය; පානීයෙන ච, බොනපැනින්ද; පුච්ඡයෙ, විචාරන්නේ ය; ආගන්තුං, ආගන්තුකයා; අභිවාදෙය්‍ය, වඳනේ ය; සයනාසනං, ලග්නා සෙනසුන්; පඤ්ඤපෙ, (මේ සෙනස්න තුඹට පැමිණෙයි) පනවන්නේයි.

227 228 අජ්ඣාවුත්ථමවුත්ථං වා, වසනලද බව ද නොවසනලද බව ද, ගොචරාගොචරං, සිඟිය යුතු නො සිඟිය යුතු ගම ද; වච්ච

---

*පවෙසනිග්ගමෙ. †පරිභොජනීය පානීයං.

### විකප්පනා චෙවාති,-

229 සම්මුඛාසම්මුඛාභෙදා¶ දුවෙ වුත්තා විකප්පනා
සම්මුඛාය විකප්පෙන්තො ව්‍යත්තස්සෙකස්ස සන්තිකෙ
"ඉමං චීවරං තුය්හං විකප්පෙමි"ති භාසයෙ.

230 එත්තාවතා නිධෙතුං ච කප්පතී න ච කප්පති
පරිභොගාදිකං තෙන අපච්චුද්ධටභාවතො.

---

පස්සාවට්ඨානානි, මලකිය වටන්කිය සාදන තැන් ද; කතිකං, (ඒ වෙහෙර සඞ්ඝයාගේ) කතිකාවත් ද; සෙඛසම්මුතිං, සෙඛසම්මුති (ලදකුල) ද; පවෙසනික්ඛමෙ කාලං, (වෙහෙරට) වැදීම් නික්මීමෙහි කල් ද; පරිභොජියපානීයං; නහනපැන් බොනපැන් ද; වදෙ, කියන්නේ යි; නිසින්නොව, (තන්වැසි මහණ) හුන්නේ ම; නවකස්ස, (ආගන්තුක) නවකයාහට; එතං සබ්බං, මේ හැම වත්; සමුද්දිසෙ, කියන්නේ යි. ("නිසින්නොව" යනු අනාපත්තිමාත්‍රයක් දක්වයි. හුන් තැනින් නැඟී මේ හැමවත් කරත් වටී මැ යි.)

---

### "විකප්පනා චෙවා"ති,-

විකප්පනා චෙව යන්නෙහි විකප්පනම්:-

229 සම්මුඛාසම්මුඛාභෙදා, සම්මුඛපරම්මුඛභෙද විසින්; විකප්පනා, විකප්පනාවෝ; දුවෙ, දෙදෙනෙක්; වුත්තා, කියනලදහු; සම්මුඛාය, හමුයෙහි සිටියහුට; විකප්පෙන්තො, විකප්පන්නේ; ව්‍යත්තස්ස, (විකප්පනප්‍රදර්ශනසේ දන්නා හෙයින්) වියත්වූ; එකස්ස සන්තිකෙ, එක් උපසම්පන්නයෙකු සමීපයෙහි; "ඉමං චීවරං තුය්හං විකප්පෙමී"ති, "ඉමං චීවරං තුය්හං විකප්පෙමී" යි; භාසයෙ, කියන්නේ යි. (ඉමං චීවරං, මේ සිවුරැ; තුය්හං, තට; විකප්පෙමීති, විකප්මි යි, යනු මෙහි අර්ථ යි.)

230 එත්තාවතා, මෙපමණකින්; නිධෙතුං ච, නගා තබන්නට ම; කප්පති, කැප යි (නිසගි නො වේ) තෙන, ඒ වියත්හු විසින්; අපච්චුද්ධටභාවතො, නො පසුඋළ බැවින්; පරිභොගාදිකං, පරිභොගවිස්සජ්ජනාදිය; න ච කප්පති, නො ම වටී, (ආදි ශබ්දයෙන් විසර්ජන අධිෂ්ඨාන ගත යුතු.)

---

¶ සම්මුඛා පරම්මුඛාභෙදා.

(1) "මය්හං සන්තකං පරිභුඤ්ජ වා විස්සජ්ජෙහි වා යථාපච්චයං වා කරොහී"ති.

231 තෙන පච්චුද්ධටෙයෙව පරිභොගාදි කප්පති,
අපරා සම්මුඛාවෙකා භික්ඛුස්සෙකස්ස සන්තිකෙ
ගහෙත්වා නාමමෙකස්ස පඤ්චන්නං සහධම්මිනං.

(2) "ඉමං චීවරං තිස්සස්ස භික්ඛුනො, තිස්සාය භික්ඛුනියා, තිස්සාය සික්ඛමානාය, තිස්සස්ස සාමණෙරස්ස, තිස්සාය සාමණෙරියා විකප්පෙමී"ති වත්තබ්බං.

(3) තෙන භික්ඛුනා "තිස්සස්ස භික්ඛුනො, තිස්සාය භික්ඛුනියා, තිස්සාය සික්ඛමානාය, තිස්සස්ස සාමණෙරස්ස, තිස්සාය සාමණෙරියා සන්තකං පරිභුඤ්ජ වා, විස්සජ්ජෙහි වා, යථාපච්චයං වා කරොහී" ති වත්තබ්බං.

---

(1) "මය්හං සන්තකං පරිභුඤ්ජ වා =පෙ= කරොහී"ති, "මය්හං සන්තකං පරිභුඤ්ජ වා විස්සජ්ජෙහි වා යථාපච්චයං වා කරොහි" යි:-

231 තෙන, ඔහු විසින්; පච්චුද්ධටෙයෙව, පසුදුළු කල්හි ම; පරිභොගාදී, පරිභොගවිස්සජ්ජනාදිය කප්පති, කැප යි. (මය්හං සන්තකං, මා සතු සිවුර; පරිභුඤ්ජ වා, වැලඳගනැයි හෝ; විස්සජ්ජෙහි වා, අන්නට දෙයි හෝ; යථාපච්චයං, තා රුස්නක්; කරොහීති වා; කරයි හෝ; යනු මෙහි අර්ථ යි.) අපරා, අනික්; එක් සම්මුඛාව, එක් සම්මුඛා (විකප්පනා) වක් ම (කියනුලැබේ) එකස්ස භික්ඛුස්ස සන්තිකෙ, එක් උපසපනක්හු සමීපයෙහි; පඤ්චන්නං සහධම්මිනං, පඤ්ච සහධර්මිකයන් අතුරෙන්; එකස්ස නාමං ගහෙත්වා, (තමා කැමැති) එකක්හුගේ නම ගෙන:-

(2) ඉමං චීවරං, මේ සිවුර; තිස්සස්ස භික්ඛුනො (විකප්පෙමීති වා,) තිස්ස නම් භික්ෂුහට විකපමි යි හෝ =පෙ= තිස්සාය සාමණෙරියා විකප්පෙමීති වා, තිස්සා නම් හෙරණියට විකපමි යි හෝ; වත්තබ්බං, කිය යුතු.

(3) තෙන භික්ඛුනා, ඒ භික්ෂුහු විසින්; තිස්සස්ස භික්ඛුනො සන්තකං, තිස්ස නම් භික්ෂුහු අයත් සිවුර =පෙ= තිස්සාය සාමණෙරියා සන්තකං, තිස්සා නම් හෙරණිය අයත් සිවුර; පරිභුඤ්ජ වා, අනුභව කරයි හෝ; විස්සජ්ජෙහි වා; විසජයි හෝ; යථාපච්චයං කරොහීති වා, තා රුස්නක් කරයි හෝ; වත්තබ්බං, කිය යුත්තේ යි.

232 පරම්මුඛාවිකප්පනෙ එකස්සන්තිකෙවමීරයෙ;
"ඉමං චීවරං තුය්හං විකප්පනත්ථාය දම්මී"ති.

(4) තෙන වත්තබ්බො. "කො තෙ මිත්තො වා සන්දිට්ඨො වා"ති. ඉතරෙන එවං වත්තබ්බං. "තිස්සො භික්ඛූති වා තිස්සා භික්ඛුනීති වා, තිස්සා සික්ඛමානාති වා, තිස්සො සාමණෙරොති වා, තිස්සා සාමණෙරී"ති වා.

(5) පුන තෙන අහං තිස්සස්ස වා භික්ඛුනො, තිස්සාය වා භික්ඛුනියා, තිස්සාය වා සික්ඛමානාය, තිස්සස්ස වා සාමණෙරස්ස, තිස්සාය වා සාමණෙරියා දම්මීති, විකප්පෙත්වා; තෙනෙව "තිස්සස්ස භික්ඛුනො, තිස්සාය භික්ඛුනියා, තිස්සාය සික්ඛමානාය තිස්සස්ස, සාමණෙරස්ස, තිස්සාය සාමණෙරියා සන්තකං පරිභුඤ්ජ වා විස්සජ්ජෙහි වා, යථාපච්චයං වා කරොහී"ති පච්චුද්ධරිතබ්බං *

233 දූරසන්තිකතෙකත්තං බහුභාවං විජානිය
එතං ඉමන්ති එතානි ඉමානීතෙත්ථ යොජයෙ.

---

232 පරම්මුඛාවිකප්පනා, පරම්මුඛවිකප්පනා තොමෝ (කියනු ලැබෙ) එකස්සන්තිකෙ, එක්මහණෙක්හු කෙරෙහි; ඉමං චීවරං; මේ සිවුර, විකප්පනත්ථාය, විකපන පිණිස; තුය්හං, තට; දම්මීති, දෙමි යි; එවං; මෙසේ; ඊරයෙ, කියන්නේ යි.

(4) තෙන, ඔහු විසින්; තෙ, තාගේ; මිත්තො වා, දැඩිමිත්‍රයෙක් හෝ; සන්දිට්ඨො වා, දුටුවිරූ මිතුරෙක් හෝ; කො ඉති, කවරෙක්දැ යි; වත්තබ්බො, කියයුක්තේ යි; ඉතරෙන ච, සිවුරහිමි මහණහු විසින්; තිස්සො භික්ඛූති වා, තිස්ස නම් මහණ යැයි හෝ; -පෙ- තිස්සා සාමණෙරීති වා, තිස්සා නම් හෙරණි යැයි හෝ; එවං වත්තබ්බං මෙසේ කිය යුතු.

(5) පුන, ඉක්බිත්තෙන්; තෙන, ඒ (සිවුර විකපන) මහණහු විසින්; අහං, මම; තිස්සස්ස භික්ඛුනො දම්මීති වා, තිස්ස නම් මහණහට දෙමි යි හෝ=පෙ=තිස්සාය සාමණෙරියා දම්මීති වා; තිස්සා නම් හෙරණියට දෙමි යි හෝ; විකප්පෙත්වා, විකපා; තෙනෙව, ඔහු විසින් ම; තිස්සස්ස භික්ඛුනො සන්තකං, තිස්ස නම් මහණහු සන්තක ය —පෙ— තිස්සාය සාමණෙරියා සන්තකං, තිස්සා නම් හෙරණිය සන්තක ය; පරිභුඤ්ජ වා විස්සජ්ජෙහි වා යථාපච්චයං වා කරොහීති; පරිභුඤ්ජ වා විස්සජ්ජෙහි වා යථාපච්චයං වා කරොහි යි, පච්චුද්ධරිතබ්බං, පසුදිරිය යුතු.

233 දූරසන්තිකත්තං, දුරබව සමීපබව ද; එකත්තං, එකක්බව ද; බහුභාවං බොහෝබව ද; විජානිය, දැන; එත්ථ, මේ දූරාදියෙහි;

234 දසාහං මාසමෙකං වා පඤ්ච වා කඨිනත්ථතෙ
පාරිපූරත්ථමූනස්ස පච්චාසා සති මාසකං.
නුප්පාදයති නිස්සග්ගිං නාධිට්ඨිතවිකප්පිතන්ති.

---

**"නිස්සයො" ති,-**

---

235 වස්සතස්ස පඤ්චවස්සස්ස නත්ථි නිස්සාය කාරියං
යාවජීවම්පි අබ්‍යත්තො නිස්සිතොයෙව ජීවති.

236 එකංසං චීවරං කත්වා පග්ගණ්හිත්වාන අඤ්ජලිං
උක්කුටිකං නිසීදිත්වා වදෙ යාවතතියකං.

(6) **"ආචරියො මෙ භන්තෙ හොහි ආයස්මතො නිස්සාය වච්ඡාමී"** ති.

---

එතං ඉති, එතං (චීවරං) කියා ද; ඉමං ඉති, ඉමං (චීවරං) කියා ද; එතානීති, එතානි (චීවරානි) කියා ද; ඉමානීති, ඉමානි (චීවරානි) කියා ද; යොජයෙ, යොදන්නේ යි.

234 නාධිට්ඨිතවිකප්පිතං, නොඉටු නොවිකප් සිවුර; දසාහං, දසදවසක් හෝ; එකං මාසං වා, (කෙළින් නො අතුළුවෙහෙර) එකම චීවරමාසය හෝ; කඨිනත්ථතෙ, කෙළින් අතුළුකල්හි; පඤ්ච වා, පස්මසක් හෝ ඌනස්ස, ඌනචීවරයාගේ; පාරිපූරත්ථං, පරිපූරණය පිණිස; පච්චාසාසති (කෙබඳක් ලැබෙ යි යන) ප්‍රත්‍යාසාවක් ඇතිකල්හි; මාසකං, (නැවත) මසක් හෝ; නිස්සග්ගිං, නිසගිපැවිති; නුප්පාදයති, නූපදවා.

---

**"නිස්සයො" ති.**

**නිස්සයො සන්ගෙනසි, නිසශැනුම් නම්:-**

235 වස්සතස්ස, (නිසයෙන් මිදෙන්නට සුදුසු බණ අසාදත් බැවින්) වියත්වූ; පඤ්චවස්සස්ස, පස්වසක් ඇති භික්ෂුහට; නිස්සාය, නිසා විසීමෙන්; කාරියං, කටයුත්තෙක්; නත්ථි, නැත; අව්‍යත්තො, නොවියත් මහණ; යාවජීවම්පි, දිවිහිමිකොට ද; නිස්සිතොයෙව, (ආචාර්‍ය්‍යොපාධ්‍යායයන්) නිසා ම; ජීවති, ජීවත් වේ.

236 (6) චීවරං, උත්තරාසඞ්ගය; එකංසං කත්වා, එකස් කොට; අඤ්ජලිං පග්ගණ්හිත්වාන, ඇඳිලිබැඳ; උක්කුටිකං නිසීදිත්වා, එලිල් ලන්හිඳ. "ආචරියො=මෙ=වච්ඡාමී" ති. 'ආචරියො මෙ භන්තෙ හොහි ආයස්මතො නිස්සාය වච්ඡාමී' යි; යාව තතියකං, තුන්

237 පක්කන්තෙ පක්ඛසඞ්කන්තෙ විබ්භන්තෙ වා'පි නිස්සයො
මරණාණත්තුපජ්ඣායසමොධානෙහි සම්මති.

238 නිස්සාය නවසෙ' ලජ්ජිං අපුබ්බට්ඨානමාගතො
ආගමෙ චතුපඤ්චාහං ඤාතුං භික්ඛුසභාගතං.

239 අද්ධිකස්ස ගිලානස්ස ගිලානුපට්ඨාකස්ස ච
යාචිතස්සාරඤ්ඤෙ වා සල්ලක්ඛෙන්තෙන ඵාසුකං
සභාගෙ දායකෙ සන්තෙ වසිතුං තාව ලබ්භතී'ති.

---

සලක්; වදෙ, කියන්නේයි. (භන්තෙ, ස්වාමීනි; මෙ, මට; ආචරියො හොහි, ආචාර්‍ය්‍ය වූව; ආයස්මතො, ආයුෂ්මත්හු; නිස්සාය, ආශ්‍රය කොට; වච්ඡාමි, වෙසෙමි; යනු මෙහි අර්ථ යි.)

237 පක්කන්තෙ, බැහැරගියකල්හි ද; පක්ඛසඞ්කන්තෙ, තීර්ථකයන්(ගේ ලබ්ධිවෙස රූස්වා ගෙන උන්) කරාවත් කල්හි ද; විබ්භන්තෙ වා'පි, ගිහිවූ කල්හි ද; මරණ, කාලක්‍රියායෙන් ද; ආණත්ති, මෙයට නො වැද යනාදි නිශ්‍රයප්‍රණාමයෙන් ද; උපජ්ඣායසමොධානෙහි, උපාධ්‍යායයන් හා (දර්ශන ශබ්දශ්‍රවණ වශයෙන්) එක්විමෙන් ද; යන මේ සපරිද්දෙන්; නිස්සයො (ආචාරීන් කෙරෙන් ගත්) නිස; සම්මති, බිඳේ. උපාධ්‍යායයන් කෙරෙන් ගත්නිස වනාහි උපාධ්‍යායසමොධාන විනා අනික් පස්පරිද්දෙන් බිඳේ.

238 අලජ්ජිං, අලජ්ජීහු; නිස්සාය, නිසා; න වසෙ, නොවසන්නේය; අපුබ්බට්ඨානං, පෙර (නිය ගෙන) නොවිසූවිරූ තැනකට; ආගතො, එළඹියේ; භික්ඛුසභාගතං, (විනය හා ආචාර්‍ය පරම්පරායෙන්) භික්ෂූන් හා එක්වැනිබව (හෙවත්) නිශ්‍රයදායකභික්ෂූහුගේ ලජ්ජිභාවය; ඤාතුං, දන්නා පිණිස; චතුපඤ්චාහං, සතර පස්දවසක්; ආගමෙ, බලන්නේ යි.

239 අද්ධිකස්ස, ගමන් යනුවහට ද; ගිලානස්ස, ගිලන්හට ද; යාචිතස්ස, (ගිලන්හු විසින්) ආරාධනා කරනලද්දහු; ගිලානුපට්ඨාකස්ස ච, ගිලන්වත් කරනුවහට ද; අරඤ්ඤෙ, වල්හි; ඵාසුකං, (සමථවිදර්ශනාවන්ගේ ප්‍රතිලාභයෙන්) සුඛවිහාරය; සල්ලක්ඛෙන්තෙන වා, සලකන්නහු විසින් ද; සභාගෙ, (විනය හා ඇදුරොල් විසින්) එක්කොටසක්වූ; දායකෙ, (නිශ්‍රය) දායකයක්හු; අසන්තෙ නැතිකල්හි; තාව, (යම්තාක් ඇසළපුණුපොහෝය ද) එතාක් කල්; වසිතුං; (නිස නො ගෙන) වසන්නට; ලබ්භති, වේ.

## කායබන්ධනනති,-

240 අකායබන්ධනො ගාමං දුක්කටං පවිසෙය්‍ය චෙ
බන්ධෙය්‍ය යත්‍ථ සරති තත්‍ථෙ'වා'සතියා ගතො.

241 පට්ටිකා සූකරන්තන්ති දුවිධං කායබන්ධනං,
දුස්සපට්ටො ච රජ්ජු ච එකා තදනුලොමිකා.

("සචෙ යාචාහි මන්ති වුච්චමානො'පි මානෙන න යාචති ගන්තබ්බං ,, ‡ යනු අටුවා යි. "සචෙ ආසාළ්හිමාසෙ නිස්සයදායකං න ලභති යත්‍ථ අත්‍ථි තත්‍ථ ගන්තබ්බං, අන්තොවස්සෙ පන අනිස්සිතෙන වත්‍ථුං න වට්ටති" × යනු මෙහි ටීකා යි.)

### 'කායබන්ධනනති'

කායබන්ධනං යන්නෙහි (කැපඅකැප පටි නම්.)

240 අකායබන්ධනො, කාබාන් නැතිව හෙවත් කාබාන් නොබැඳ; ගාමං, ගමට; පවිසෙය්‍ය චෙ, වදනේ වී නම්; දුක්කටං, දුකුළා වේ; අසතියා ගතො, සිහි නොකොට ගියේ; යත්‍ථ, යම් තැනෙක්හි ලා; සරති, සිහි කෙරේ ද; තත්‍ථෙව, එතැන ම (සිට;) බන්ධෙය්‍ය, බඳනේ යි.

241 කායබන්ධනං, කාබාණ; පට්ටිකා, හැඳපටරටාපටිය; සූකරන්තන්ති, (දුනුපසියක් බදු) හූරු අතුණුපටි ය යි; දුවිධං, දෙවැදෑරුම් වේ; දුස්සපට්ටො ච, පිළිවැටිය ද; එකා රජ්ජු ච, එක්වැලරැහැණ ද (යන මොහු;) තදනුලොමිකා (යථා ක්‍රමයෙන්) ඒ දෙපටියට අනු ලොම්හු යි. ("මැජබිඳ පිළිතුලු කොට බඳුත් නොම වටී. එක් පිළි තුලු බාණින් මැඟින පුන පුනා සිසාරා බඳුත් වනාහි වටී" යනු විනයසන්නය යි.)

‡ සචෙ, ඉදින්; මං, මා; යාචාහි ඉති, අයදුවයි; වුච්චමානො අපි, කියනු ලබන්නේ ද; මානෙන, මානයෙන්; න යාචති, යාච්ඤා නො කෙරේ ද; ගන්තබ්බං, යායුතු.

× සචෙ, ඉදින්; ආසාළ්හිමාසෙ, ඇසළමස; නිස්සයදායකං, නිසදෙනආචාර්යයකු; න ලභති, නො ලබා ද; යත්‍ථ, යම් තැනෙක; අත්‍ථි, (නිසදෙනආචාර්යයෙක්) වේ ද; තත්‍ථ, එහි; ගන්තබ්බං, යායුතු; අන්තොවස්සෙ පන, වසතුළ වනාහි; අනිස්සිතෙන, නිස නොගත්තාවිසින්; වත්‍ථුං, වසන්ට; න වට්ටති, නො වටී.

242 මච්ඡකණ්ටකඛජ්ජුරිපත්තා මට්ටා ච පට්ටිකා,
ලම්බා දසා චතස්සො'පි අනන්ත විගුණසුත්තකං.

243 මාලාදිං කක්කටච්ඡාදිං දස්සෙත්වා ගුණසුත්තකං
කොට්ටිතා කුඤ්ජරච්ඡාදිං පට්ටිකා න ච කප්පති.

244 ඝටකං මකරමුඛාදිං න කප්පන්ති දසාමුඛෙ
උභන්තෙ ඝටකා ලෙඛා පීළකෙ අඤ්ඤඤ්ච චිත්තකං

245 දෙඩ්ඩුභකඤ්ච මුරජං මද්දවීණං කලාබුකං
න කප්පන්ති දසාසු ච මජ්ඣිමායෙව කප්පරෙ.

---

(“එකරජ්ජුකං පන මුද්දිකාකායබන්ධනඤ්ච සූකරන්තකං අනුලොමෙති” + යනු අටුවා යි. “මුද්දිකාකායබන්ධනං නාම චතුරස්සං අකත්වා සජ්ජිතං” † යනු විනයසන්න යි)

242 මච්ඡකණ්ටක, මස්කටුරමා ඇති; ඛජ්ජුරිපත්තා, කිඳිපත් රටා ඇති; පට්ටිකා, පටිය; මට්ටාච, මාලාකම් ලතාකම්ාදි විකාර නැති ව ම; ලම්බා, (තදනු ලොම් ව එහි ම ඇතුළත් වන බැවින්) වටී; දසා, (කාබාණෙහි) දහවැල; චතස්සොපි, (උඩතින්) සතරෙ කුදු (වටී) අනන්ත, පටිය දෙකෙළවර; විගුණ සුත්තකං, (දහකන් කුරුන්ගුලා කන් තරවන පිණිස) දෙතුන් දිගුණු හුයෙක් (වටී)

243 මාලාදිං, මාලාදිකම්ය ද; කක්කටච්ඡාදිං, කකුළුඇස් ආදී ද; ගුණසුත්තකං, (අතරතුරෙහි) දිගුණුහු ද; කුඤ්ජරච්ඡාදිං, ඇත් ඇස් ආදී ද; දස්සෙත්වා, දක්වා; කොට්ටිතා, ගසනලද; පට්ටිකා, පටිය; න ච කප්පති, නො ම වටී.

244 දසාමුඛෙ, දහකෙළවර; ඝටකං, කොතුරුපත් ද; මකරමුඛාදිං, මකරමුඛදෙඩ්ඩුභකසීසාදි යම් කිසි විකාර රූපයෙක් ද යන මොහු; න කප්පන්ති, නො වටිත්; පීළකෙ, (දහමුල තරබව පිණිස වෙළෙඳන්නාදියෙන් කළ) පිළ්ලෙයහි; උභන්තෙ, දෙකෙළවර; ඝටකා, කළවටු ද; ලෙඛා, පරිවෙෂ්දරේඛා ද තබා; අඤ්ඤඤ්ච චිත්තකං, (අවමඟලාදිවූ) අන්විසිතුරු ද; (න කප්පති නො වටී.)

245 දෙඩ්ඩුභකඤ්ච, බරණගිස් වැනි (මල ඇති කාබාණ ද,) මුරජං (නන් හුයින් සිසාරා ගත්) දෙණ්ඩිමයක් වැනි (කාබාණ) ද;

---

+ එකරජ්ජුකං පන, එක්වැලරැහැන්පටිය ද; මුද්දිකාකාය බන්ධනං ච, මුද්දිකාකායබන්ධනය ද; සූකරන්තකං, හූරු අතුණු පටියව; අනුලොමෙති, අනුලොම් වේ.

† මුද්දිකාකායබන්ධනං නාම, මුද්දිකාකායබන්ධනය නම්; චතුරස්සං අකත්වා, සතරස් නො කොට; සජ්ජිතං, සාදන ලද්දකී.

246 වෙළුදන්තවිසාණට්ඨිකට්ඨලාඛාඵලාමයා
සඞ්ඛනාභිමයා සුත්තනළලෝහමයා'පි ච
විධා කප්පන්ති කප්පන්ති ගණ්ඨියො වා'පි තම්මයා'ති-

# පඨමක භාණවාරං.

මද්දවීනං, පමුවක්සේ (සිව්රස් කාබාණ) ද; කලාබුකං, බොහෝ රෝජු ඇති (කාබාණ) ද; යන මොහු සතරදෙන; න කප්පන්ති නො වටිත්; දසාසු, දහයෙහි; මජ්ඣිමා, මැදතුරෙහි වූ; වෙ යෙව (මුරජමදුවිණ) දෙදෙන ම; කප්පරෙ, වටිත්.

(“මුරජන්නාම මුරජවට්ටිසණ්ඨානං වෙඨෙත්වා කතං; යනු අටුවාසි. “මුරජවට්ටිසණ්ඨානා” නන්හුයින් සියාරාගත් දෙණ්ඩිම වැනි යි සේ යි” යනු විනය සන්න යි “මද්දවීණන්නාම පාමඞ්ගසණ්ඨානං” යනු අටුවා යි. පමුදම් සේ සිව්රස් සටහන් ඇතිඑද යනු තිසාරඳහ යි.

“පාමඞ්ගසණ්ඨානං පන” යනුයෙහි පුවක්මල් රටාවට ගෙතූ සෙයින් වනාහි පමුදම්සටහන් නම් නොවෙ යි” යනු විනය සන්න යි. “කලාබුකන්නාම බහුරජ්ජුකං,, යනු අටුවා යි. “බොහෝ රෝජු ඇති,, යනු එයට සන්න යි. “බහුරජ්ජුකෙ එකතො කත්වා එකොන තිරන්නාරං වෙඨෙත්වා කතං බහුරජ්ජුකන්ති න වත්තබ්බං තං වට්ටති.,, යනු අටුවා, බැවින් බොහෝ රෝජු එක් කොට දෙකෙළවර මතු බඳනාලද්දේ බහුරජ්ජුක නමැ යි දතයුතු.)

246 වෙළු, හුණමුවාවූ; දන්ත, දළමුවාවූ; විසාණ, හංමුවාවූ; අට්ඨි, ඇටමුවාවූ; කට්ඨ, දඬුමුවාවූ; ලාඛා, ලාමුවාවූ; ඵලාමයා, ඵල මුවාවූ ද; සඞ්ඛනාභිමයා, සක්නැබමුවාවූ ද; සුත්ත, හුනුවාවූ ද; නළ, රණාහුනමුවාවූ ද; ලොහමයාපි ච, ලොහොමුවාවූ ද; විධා, විධයෝ; කප්පන්ති, වටිති; තම්මයා, ඒ (කී) වෙළු ආදීමයවූ; ගණ්ඨියොවාපි, (ඕමුරෙති) ගැටවටුවෝ ද; කප්පන්ති, වටිත්. ආමලක කල් කාදීන් කළ “ඵලමුවා” නමි.)

**පඨමභාණවාරං, පළමුවෙනි බණවරයි.**

---

† විධා. ඇතැම්—වීධා. බුරුම:

"පණ්ච්චාති"-

247 ජාතාජාතා'ති දුවිධා සුඛමත්තිකපංසුකා
ජාතා දඩ්ඪා ච පඨවි බහුමත්තිකපංසුකා
චාතුමාසාධිකොවට්ටපංසුමත්තිකරාසි ච.

248 සුඛසක්ඛරපාසාණමරුම්බකඨලවාලුකා
දඩ්ඪා ච භූමි යෙභුය්‍ය සක්ඛරාදිමහී පි ච
දුතියා මූත්තාරාසි ච චාතුමාසොමවට්ටකා.

---

"පණ්චිචා"ති,
පඨවිච යන්නෙහි (කැප අකැප පොළොව් නම්.)

247 ජාතා, ජාතපඨවි ය; අජාතාති, අජාතපඨවි ය යි; දුවිධා, (පඨවි තොමෝ) දෙවැදෑරුම් වේ; අදඩ්ඪා, (උඛනපාත්‍රපචනාදියෙන් නොදූ; සුඛමත්තිකපංසුකා ච, හුදු මැටි හුදු පස් ඇති භූමි ද; බහුමත්තිකපංසුකා, බොහෝ මැටි බොහෝ පස් ඇති භූමි ද; චාතුමාසාධිකොවට්ට, වැසිවට සාරමසක් ඉක්මුණු; පංසුමත්තිකරාසි ච, පස්රැස් මැටිරැස් ද; ජාතා පඨවි, අකප පොළොව් නමු.

"බහුමත්තිකපංසුකා" යන්නෙහි "බහු" ශබ්දය යෙභුය්‍යපරියාය යි. "උදකෙන, යනු ඉදිව ආසින් ම වසිනං දියෙන් අන්ක් තෙනක පැහැර ගී තෙමේ හොතුජු වටි යෙත්" යනු අටුවාසන්‍ය යි.)

248 සුඛසක්ඛර, හුදුසකුරු ඇති; පාසාණ, (හුදු) පහණ ඇති, මරුම්බ, (හුදු) කළුසකල ඇති; කඨල, (හුදු) කැබිලිති ඇති; වාලුකා (හුදු) වැලි ඇති භූමි ද; දඩ්ඪා ච භූමි, (උඛනපාත්‍රපචනාදින්) දැවීය භූමිය ද; යෙභුය්‍යසක්ඛරාදිමහි පි ච, බොහෝ සකුරු ආදිය ඇත්තී ය යි සලකනලද භූමි ද; චාතුමාසොමවට්ටකො, වැසිවට සාරමසක් නො ඉකුත්; මුත්තරාසි ච, කියන ලද පස්රැස් මැටිරැස් ද, දුතියා, දෙවෙනිවූ කැපපොළොව් නමු.

"මුට්ඨිප්පමාණතො උපරි පාසාණො වෙදිතබ්බො මුට්ඨිප්පමාණා සක්ඛරා කඨලා'ති කපාලඛණ්ඩානි. මරුම්බාති † කටසක්ඛරා වාලුකාති වාලුකා යෙව" ¶ යනු අටුවා යි. "යෙභුය්‍යසක්ඛරාදි" යන්නෙහි "ආදි" ශබ්දයෙන් බොහෝ පහණ බොහෝ කළුසකල බොහෝ කැබිලිති බොහෝ වැලි ඇති භූමි ගත යුතු.

---

¶ මුට්ඨිප්පමාණතො උපරි, මිටින් ගත හැකි පමණින් මහත් බූයේ; පාසාණො, පාසාණ නම් යි; වෙදිතබ්බො, දතයුතු. මුට්ඨිප්ප

---

† පාකටසක්ඛරා. සියම්

249 ද්වෙ භාගා තීසු භාගෙසු මත්තිකා යස්ස භූමියා
යෙභුය්‍යමත්තිකා එසා සෙසෙසු'පි අයන්නයො.

250 පාචිත්ති ඛණනෙ ජාතෙ ජාතසඤ්ඤිස්ස දුක්කටං
† වෙල්හස්සා' ජාතසඤ්ඤිස්ස නා'පත්තා'ණාපනෙ තථා

251 පහාරෙ පහාරා'පත්ති ඛණමානස්ස අත්තනා
එකායා'ණත්තියා එකා නානාණත්තීසු වාචසො.

252 ඉමං ඨානම්මං කන්දමිධ වාපිං ඛණෝ'ත්ථ ච
ජාලෙහ'ග්ගිං'ති වා වත්තුං නියමෙත්වා න වට්ටති.

---

249 යස්ස භූමියා, යම් භූමියකගේ; තීසු භාගෙසු, තුන්කොටසකින්; ද්වෙ භාගා, දෙකොටස් කෙනෙක්; මත්තිකා, මැටි ද; එසා, මේ තොමෝ; යෙභුය්‍යමත්තිකා, බොහෝ මැටි ඇත්තී නම්; සෙසෙසුපි, (යෙභුය්‍යපංසු යෙභුය්‍යසක්ඛරාදිවූ) සෙස්සෙහි ද; අයන්නයො, මේ ම නය යී.

250 ජාතෙ, අකප්පිය පඨවියෙහි; ජාතසඤ්ඤිස්ස, අකැප පොළොව ය යන සංඥ ඇත්තාහට; ඛණනෙ (තමා ම) කැණීමෙහි; පාචිත්ති, පචිති ඇවැත් වෙයි; වෙල්හස්ස, විමති ඇත්තාහට; දුක්කටං; දුකුළා වෙ යි; අජාතසඤ්ඤිස්ස, කැප ය යන සංඥ ඇත්තාහට; න ආපත්ති, ඇවැත් නැති; ආණාපනෙ, ඇණවීමෙහි ද; තථා, එසේ මැ යි.

251 අත්තනා, තමා විසින්; ඛණමානස්ස, කණනහට; පහාරෙ පහාරෙ; පහර පහර; ආපත්ති, ඇවැත් (වේ;) එකාය ආණත්තියා, එක වරෙක ඇණවීමෙහි; එකා, එක ඇවතක් වෙයි; නානාණත්තීසු, නොයෙක්වට ඇණවීමෙහි; වාචසො, තෙපුල් ගණනින්(වේ.)

252 ඉමං ඨානං, මෙ තෙන; ඉමං කන්දං, මේ අලය;(ඛණ වා,) කණ යි හෝ; ඉධ, මෙ තැන; එත්ථ, එතන; වාපිං ඛණ, වැවක් කණයි හෝ; අග්ගිං ජාලෙහි වා, ගිනි දල්ව යී හෝ; ඉති, මෙසේ; නියමෙත්වා, නියම් කොට; වත්තුං, කීම; න වට්ටති, නො වටී.

---

මාණා, මිටින් ගත හැකි පමණ ඇත්තී; සක්ඛරා, සක්ඛරා නම්, කඨලාති, කඨල නම්; කපාලඛණ්ඩාති, කබල් කැබලි යි. මරුම්බාති, මරුම්බ නම්; කටසක්ඛරා, කළුසකල යි; හෙවත් බොරළුයි. වාලුකාති, වාලුකා නම්; වාලුකා සෙව, වැලි මැ යි.

† විමතිස්ස. ඇතැම්.

253 ථම්භස්සිමස්සාවාටං වා මත්තිකං ජානමාහර,
කරොහි කප්පියං චෙති වචනං වට්ටතෙ'දිසං.

254 අසම්බන්ධං පඨවියා සුක්ඛකද්දමආදිකං
කොපෙතුං තනුකං ලබ්භමුස්සිඤ්චනීයකද්දමං.

255 ගණ්ඩුප්පාදමුපචිකා මත්තිකං මූසිකුක්කුරං
චතුමාසාධිකොවට්ඨං ලෙඩ්ඩාදිඤ්ච න කොපයෙ.

256 පතිතෙ වාපිආදීනං කූලෙ උදකසන්තිකෙ,
පාසාණෙ ච රජෙ ලග්ගෙ පතිතෙ නවසොණ්ඩියා

257 වම්මිකෙ මත්තිකාකුඩ්ඩෙ අබ්භොකාසුට්ඨිතෙ තථා,
යෙභුය්‍යකථලට්ඨානෙ තිට්ඨති'ට්ඨකකුඩ්ඩකෙ.

---

253 ඉමස්ස ථම්භස්ස, මේ ටැඹට; ආවාටං, වළක්; ජාන වා (වන සේ) දනැ යි හෝ; මත්තිකං, මැටි, ජාන වා,(වන සේ) දනැ යි හෝ; ආහර වා, ගෙනෙවයි හෝ; කප්පියං කරොහි වා ඉති, කැප කර යි හෝ යන; එදිසං වචනං, මෙබඳු (කැප) නෙපුල්; වට්ටති, (කියන්) වටී.

254 පඨවියා, පොළොව හා; අසම්බන්ධං, එකාබද්ධනොවූ; සුක්ඛකද්දමආදිකං, වියළිමඩආදී ද; තනුකං, ඝනා බොල්වූ; උස්සිඤ්චනීයකද්දමං, ඉස්ස හැකි මඩ ද; කොපෙතුං (කඩනඇ විසින්) කළකිරුවන්ට; ලබ්භං, වටී. (මෙහි ආදිශබ්දයෙන් "උදකෙන ගතට්ඨානෙ උදකප්පප්පටකො නාම හොති. වාතප්පහාරෙන චලති තං අප නෙතුං වට්ටති,,යි අටුවායෙහි කියනලද උදකපප්පට ගත්හු උදක පප්පටක නම් රොම්මඩ වියළි කබලු යි.)

255 චතුමාසාධිකොවට්ටං, වැසි වට සාරමසක් ඉකුත්; ගණ්ඩුප්පාදං, ගැඩවිලුන් නැගූ මැටි ද; උපචිකාමත්තිකං, වේ පස් ද; මූසිකුක්කුරං, මීයන් නැගූ පස් ද, ලෙඩ්ඩාදිඤ්ච, සාණතැන නඟුලෙන් කැඩී නැඟී මැටිකැටි ආදී ද; න කොපයෙ, නො කළකිරුවන්නේයි. (මූසිකානං උක්කුරො මූසිකුක්කුරො මූසිකාහි උද්ධටං පංසු *)

256 257 උදකසන්තිකෙ, දියසමීපයෙහි; පතිතෙ, හුණු; වාපි ආදීනං, වැව් ආදීන්ගේ; කූලෙ, ඉවුරෙහි ද; පාසාණෙ, පහණ පිට;

---

* මූසිකානං, මීයන්, විසින්; උක්කුරො, නගනලද්දේ; මූසිකුක්කුරො, මූසිකුක්කුර නම්. මූසිකාහි, මීයන් විසින් උද්ධටං, නගනලද; පංසු, පස් ය.

258 ථම්භාදිං ගණ්හිතුං භූමිං සඤ්චාලෙත්වා විකොපයං.
ධාරාය භින්දිතුං භූමිං කාතුං වා විසමං සමං.

259 සම්මජ්ජනීහි ඝංසිතුං කණ්ටකාදිප්පවෙසිතුං,
දස්සෙස්සාමීති භින්දන්තො භූමිං චඞ්කමිතුං පදං.

260 ඝංසිතුං අඞ්ගපච්චඞ්ගං කණ්ඩුරොගී තටාදිසු,
හත්ථං වා ධොවිතුං භූමිං ඝංසිතුං න ච කප්පති.

261 ථම්භාදිමුජ්ජුකුද්ධාරෙ පාසාණාදිපවට්ටනං,
සාඛාදිනාකඩ්ඪනං රුක්ඛලතාච්ඡෙදනඵාලනං.

262 සෙකො පස්සාවආදීනං සුඛවිතාණස්ස වට්ටති,
අල්ලහත්ථං ඨපෙත්වාන රජග්ගාහො ච භූමියා.

---

ලගෙන, ඇලූණු; රජෙච, රජස්හි ද; නවසොණ්ඩියා, අලුත්කළ දිය නැති කෙම්; පතිතෙ, වගුළ රජස්හි ද; අබ්භොකාසුට්ඨිතෙ, අබවස නැගි; වම්මිකෙ, තුඹස්හි ද; මත්තිකාකුඩ්ඩෙ; මැටිපව්රෙහි ද; තථා, එසේ මැයි; (වැසිවට සාරමසක් ඉකුත්කල්හි නොකළකිරුවන් ගේයි;) ඉට්ඨකකුඩ්ඩකො, අබවසනැගූ උළුපවුර; යෙභුය්‍යකඨලට්ඨාණෙ, බොහෝසේ කැබිලිති ඇති පොළෝ තන්හි; තිට්ඨති, සිටී.

258 259 භූමිං, අකැප පොළොව, විකොපයං, කළකුරුවමින්; සඤ්චාලෙත්වා, (ඔබිණනාව) සලා; ථම්භාදිං, (අබවස සිට) ටැම්ආදි; ගණ්හිතුං, ගන්නට ද; ධාරාය, ධාරාවෙගයෙන්; භූමිං, (අකැප) පොළොව; භින්දිතුං, බිඳින්ට ද, විසමං, නොසමතැන්; සමං කාතුං, සමකරනු පිණිස; සම්මජ්ජනීහි, මුස්නෙන්, ඝංසිතුං වා, ගගන්නට ද; කණ්ටකාදිප්පවෙසිතුං, කටුආදිරුවන්නට ද; පදං දස්සෙස්සාමීති, පියවරක් දක්වම් යි, භූමිං, (අයප) බිම; භින්දන්තො, (පත්ලෙන්) බිඳිමින්; චඞ්කමිතුං, සක්මන් කරන්නට ද:-

260 කණ්ඩුරෝගී, කණ්ඩුතිරොග ඇත්තහු; තටාදිසු, ඉවුරු ආදියෙහි; අඞ්ගපච්චඞ්ගං, අඟපසඟ; ඝංසිතුං වා, ගගන්නට ද; හත්ථං, අත; ධොවිතුං, සොධන පිණිස; භූමිං, (අයප) බිම; ඝංසිතුං වා, ගගන්නට ද; න ච කප්පති, නො ම වටි.

261 ථම්භාදිමුජ්ජුකුද්ධාරෙ, ටැම්ආදි ඉදුරා නැගීම ද; පාසාණාදිපවට්ටනං, පහණ ඈ පෙරළාගෙන යාම ද; සාඛාදිනාකඩ්ඪනං, අතුආදි බිම ගගා ඇදගෙන යාම ද; රුක්ඛලතාච්ඡෙදනඵාලනං, මළ රුක්වැල් (බිමතබා) කැපීම් පැළීම් ද, -

262 පස්සාවආදීනං, දිය මුතු ආදීන්ගේ; සෙකො, සිඤ්චනය ද (වැගිරවීම ද;) අල්ලහත්ථං, තෙත්අත්ල; භූමියා, භූමියෙහි; ඨපෙත්වාන, (පමණින් මොලොක් කොට) ඔබා; රජග්ගාහො ච, රජස්

263 අග්ගිස්ස අනුපාදනෙ කපාලෙ ඉට්ඨකාය වා,
පාතෙතුං ලබ්භති අග්ගිං භූමියං වා ‘වසෙ සති ‘ති.

---

“පරික්ඛාරො”ති-

264 පඤ්චවණ්ණෙහි සුත්තෙහි අන්තො බහි ච සිබ්බිතුං
ගිරිකූටඩ්ඪචන්දාදිං ඡත්තපණ්ණෙ ච ඡින්දිතුං.

---

ගැන්මද; සුද්ධචිත්තස්ස, පොළෝ බිඳුම් යන සිත් නැත්තාහට; වට්ටති, වේ.

(හස්තකාදෙශවූ හස්තතලය ම මෙහි හස්ත නම්.)

263 අග්ගිස්ස, ගින්නට; අනුපාදනෙ, ඉන්ධන නො වූ හෙවත් ගිනි ගෙන නොදැවිය හැකිවූ; කපාලෙ, කබලෙක හෝ; ඉට්ඨකාය වා, උළුයෙක හෝ; අග්ගිං, ගිනිදැල්වීම ද; අවසෙ සති, තමා විසිතුවක් නැති කල්හි (හෙවත්) හස්ත්‍යාදිභයාදි ආපදයක් ඇතිකල්හි; භූමියං වා, (හිස්) බිම හෝ; පාතෙතුං, හෙළීම් ද, ලබ්භති, වේ.

(උපාදියතීති උපාදනමින්ධනං, න උපාදනං අනුපාදනං, කපාලාදි.) (“තිණුක්කං ගහෙත්වා ගච්ඡන්තො හත්ථෙ ඩය්හමානෙ භූමියං පාතෙති අනාපත්ති පතිතට්ඨානෙයෙව උපාදනං දත්වා අග්ගිං කාතුං වට්ටති,,) † යනු අටුවා යි,

---

“පරික්ඛාරො”ති-

පරික්ඛාරො යන්නෙහි කැප අකැප පිරිකර නම්-

264 පඤ්චවණ්ණෙහි සුත්තෙහි, පස්වණක් පැහැ ඇති හුයින්, අන්තො, (පත්කුඩය) ඇතුළෙහි ද; බහි ච, පිටත්හි ද; සිබ්බිතුං; රූ ඇති කොට හිවන්නට ද; ඡත්තපණ්ණෙ, කුඩයෙහි සෙවූ පත්හි; ගිරිකූටඩ්ඪචන්දාදිං, මෝරදති අඩසඳ ඈ; ඡින්දිතුං, කපන්නට ද; (න වට්ටති,) නො වේ. (මුවවිටින් නමා ඇතුළුකළ පත හෝ මැඩිලිපත අග හෝ ගිරිකූටාදි කොරත්.

---

† තිණුක්කං, තණසුලක්; ගහෙත්වා, ගෙන, ගච්ඡන්තො, යන්නේ; හත්ථෙ, අත, ඩය්හමානෙ, දනු ලබනකල්හි, භූමියං, බිම, පාතෙති, හෙළා ද, අනාපත්ති, ඇවැත් නැති; පතිතට්ඨානෙ යෙව; වැටුණු තැන ම, උපාදනං දත්වා, දර දමා, අග්ගිං කාතුං, ගිනි දල්වන්ට, වට්ටති, වේ.

265 සටකං වාලරූපං වා දණ්ඩෙ ලෙඛා න වට්ටති
වට්ටති දණ්ඩබුන්දම්හි අහිච්ඡත්තකසාදිසං.

266 සිබ්බිතුං එකවණ්ණෙන පඤ්ජරං වා විනන්ධිතුං
ථිරත්ථං වට්ටති ජතුනා දණ්ඩෙ ලෙඛා ච බන්ධිතුං.

---

265 දණ්ඩෙ, (සත්) දණ්ඩෙහි; සටකං, කොතුරු පත් ද; වාළරූපං වා, ව්‍යාලරූප ද; ලෙඛා, ගිරි ද; න වට්ටති, නො විටී; දණ්ඩබුන්දම්හි, සත්දඬුමුල හෙවත් කුඩපුඩුමුල; අහිච්ඡත්තකසාදිසං, පිපිඹිය සත්තක් බඳු සටහන; වට්ටති, වටී.

266 ථිරත්ථං, තරවන පිණිස; එකවණ්ණෙන, නිල් ඈ එක් පැහැ ඇති හුයින්; සිබ්බිතුං, (පත්කුඩය ඇතුළෙහි පිටත) හිවන්නට ද; පඤ්ජරං, කුඩනන; විනන්ධිතුං වා, වෙළන්නට ද; වට්ටති, වටී; ජතුනා, සැත්මැඩිල්ලෙනි; බන්ධිතුං, (සුලඟින් නොසැලෙනසේ රැහැණ ගත්වා දණ්ඩෙහි) බඳනා පිණිස; දණ්ඩෙ, සත් දඬෙහි; ලෙඛාච, (ලණු බඳනා තැන වලල්ලක් මෙන් නැගූ) රෙඛාවක් ම (වටී.)

(“එකවණ්ණෙන පන නීලෙන වා පීතකෙන වා යෙන කෙනචි සුත්තෙන සිබ්බිතුං ඡත්තදණ්ඩගාහකසලාකපඤ්ජරං වා විනන්ධිතුං වට්ටති තඤ්ච ඛො ථිරකරණත්ථං න වණ්ණමට්ඨත්ථාය-වාතප්පහාරෙන වා අචලනත්ථං ඡත්තමණ්ඩලිකං රජ්ජුකෙහි ගාහෙත්වා දණ්ඩෙ බන්ධන්ති, තස්මිං බන්ධනට්ඨානෙ වලයම්ව උක්කිරිත්වා ලෙඛං ඨපෙන්ති සා වඩ්ඪති” † යනු අටුවා යි.

“වඩති, බඳුත් බඳනට නිසිතැන් බැවින් ලණු නො බඳුතුදු වටීම” යනු විනයසන්න යි.)

---

† එකවණ්ණෙන පන, සමානවණී ඇත්තාවූ වනාහි; නීලෙන වා, නිල්වූ හෝ; පීතකෙන වා, කසාවන්වූ හෝ; යෙන කෙනචි සුත්තෙන, යම් කිසි හුයකින්; සිබ්බිතුං, හිඳිකම් කිරීම ද; ඡත්තදණ්ඩගාහකසලාකපඤ්ජරං, කුඩම්ටගෙන සිටින ලහමැදිරිය; විනන්ධිතුං වා, වෙළීම ද; වට්ටති, වටී. තං ච ඛො, හෙද වනාහි; ථිරකරණත්ථං, තරකිරීමට ය; න වණ්ණමට්ඨත්ථාය, හෙබවීමට නො වේ. වාතප්පහාරෙන වා, සුළන් පහරින් හෝ; අචලනත්ථං, නොසැලෙනු පිණිස; ඡත්තමණ්ඩලිකං, සත්මඬුල්ල; රජ්ජුකෙහි, රැහැණින්; ගාහෙත්වා, ගත්වා; දණ්ඩෙ, කුඩ දඬුයෙහි; බන්ධන්ති, බඳිත්. තස්මිං බන්ධනට්ඨානෙ, ඒ බඳිනතැන; වලයං ඉව, වලල්ලක් මෙන්; උක්කිරිත්වා, නගා; ලෙඛං, රෙඛාවක්; ඨපෙන්ති, තබත්; සා, ඕ තොමෝ; වඩති, වටී.

267 අඤ්ඤත්‍ර පත්තමුඛෙ වා'පි වෙණි සඞ්ඛලිකා'පි වා
සූචිවිකාරමඤ්ඤං වා චීවරෙ න ච කප්පති
කප්පබින්දුවිකාරම්පි පාළිකණ්ණිකආදිකං.

268 ගණ්ඨිපාසකපට්ටා'පි චතුකොණා'ව අග්ඝිකං
මුග්ගරං කක්කටච්ඡාදිවිකාරං නෙ'ත්ථ වට්ටති.

269 කොණසුත්තා ච පිළකා දුවිඤ්ඤෙය්‍යාව කප්පරෙ
ගන්ධං තෙලං ච ලාඛං වා රජනෙ න ච පක්ඛිපෙ.

270 රත්තං සඞ්ඛෙන මණිනා ඝට්ටෙය්‍ය'ඤ්ඤෙන වා න ච
ඝංසෙය්‍ය දෙණියං කත්වා පහරෙ න ච මුට්ඨිනා.

---

267 අඤ්ඤත්‍ර, නුවායෙහි හෝ; පත්තමුඛෙ වාපි, දෙපත් අග හැලපුතැන හෝ; වෙණි, (හමුකරල් වැනි) වෙණි ද; සඞ්ඛලිකාපි වා, (බලල්දම් වැනි) දම් ද; අඤ්ඤං, (මේ හීයෙන්) අන්‍යවූ; සූචිවිකාරං වා, (නන්හුයින් සතපදි ආකාරාදීන් කරන යම්කිසි) සූචිකර්ම විකාර ද; පාළිකණ්ණිකආදිකං, වැලරූ සේ ඔබන පෙළකප් කන් කප් ආදිවූ; කප්පබින්දුවිකාරම්පි, කප්බිඳුවිකාර ද, චීවරෙ, සිවුරෙහි; න ච කප්පති, නො ම වටී.

268 ගණ්ඨිපාසකපට්ටාපි, ගැටපත් මලපත්හු ද; චතුකොණාව, සිව්රැස්වූවාහු ම; (වටිති) අග්ඝිකං, ඇගෑසටහන් ද; මුග්ගරං, මුගුරු සටහන් ද; කක්කටච්ඡාදිවිකාරං, කකුළු ඇස් ඈ සූචිවිකාර ද; එත්ථ, මේ ගැටවටුපස් වටුයෙහි; න වට්ටති, නො වටී.

269 කොණසුත්තා ච (පස්වටුයෙහි සතර) කොණින් නිකුත්හු ද; පිළකා ච, (එ ම හුය නවතා හෙළා නැගූ) පසහුකෙළ ද; යන මොහු; දුවිඤ්ඤෙය්‍යාව, (රැඳුකල්හි) නොදතහැක්කාහු ම; කප්පරෙ, වටින්; ගන්ධං (සුවඳ පිණිස) ගඳ ද; තෙලං වා, (උජ්ජ්වලබව පිණිස), තෙල් ද; ලාඛා වා (පැහැ පිණිස) ලා ද; රජනෙ, රජන්පඹුයෙහි; න ච පක්ඛිපෙ, නො ලන්නේ යි.

270 රත්තං, රැඳුසිවුර; සඞ්ඛෙන, සකින් හෝ; මණිනා, පහණින් හෝ; අඤ්ඤෙන වා, (ඔප් නැගෙන මුගුරු ඈ) අන්කිසිවකින් හෝ; න ච ඝට්ටෙය්‍ය, නො ද ගටන්නේ ය; දෙණියං කත්වා, (රදන්) දෙණ තබා, න ඝංසෙය්‍ය, (අතින් ගෙන) නො ද ගහන්නේ ය; මුට්ඨිනා, මිටින්; න ච පහරෙ, නො ද පහරන්නේයි.

රජනදෙණිපකිරති එව්තවත්තියේ යි යනුදු අස්වදුකාබාන් ගෙන ඉත් වනාහි වරි යනුදු විනයසංග්‍රහ යි.

271 කණ්ණකොණකසුත්තානි රජෙත්ත ඡින්දෙය්‍ය චීවරෙ
ලෙඛා න වට්ටතී ධම්මකරකෙ ඡත්තවට්ටියං.

272 ලෙඛං ඨපෙත්වා මණිකා පිළකා කුඤ්චිකාය ච
පිප්ඵලෙ ච පරිච්ඡෙදලෙඛා දණ්ඩම්හි වට්ටති.

---

271 272 කණ්ණ, (සිවුරෙහි) කන්ගු ද; කොණකසුත්තානි, (පස්වටුයෙහි) කොන්ගු ද; චීවරෙ රජෙත්වා, සිවුර රඳූකල්හි; ඡින්දෙය්‍ය, කපන්නේ යි; (මෙහි සිවුරෙහි දිග පුළුල ද නුවායෙන් ඉවතට නික්මවූ හූ ද සිවුර රඳූ වියළනකල එල්වන පිණිස නුවා යෙහි බඳනාහූ ද කණ්සුතු නම්.

චීවරස්ස කණ්ණසුත්තකං න වට්ටති, රජිතකාලෙ ඡින්දිතබ්බං. යං පන 'අනුජානාමි භික්ඛවෙ කණ්ණසුත්තකන්ති, එවං අනුඤ්ඤාතං, තං අනුවාතෙ පාසකං කත්වා බන්ධිතබ්බං රජනකාලෙ ලග්ගනත්ථාය. * යනු අටුවා යි. "කොණසුත්තං යි කී පස්වටුයෙහි කණින් කෙලගු" යනු වනවිනිසසනා යි.)

ඡත්තවට්ටියං, සත්මුවවිට; ලෙඛං ඨපෙත්වා, රේඛාවක් තබා; ධම්මකරකෙ, ධමරායෙහි; ලෙඛා, (අන්‍ය) රේඛාවක්; න වට්ටති, නො වටී; කුඤ්චිකාය ච, කොස්සෙහි ද; පිප්ඵලෙ ච, කඩකතුරෙහි ද; මණිකා, මහත් බුබුළු ද; පිළකා, කුඩා බුබුළු ද; න වට්ටති, නො වටී; දණ්ඩම්හි, කඩකතුරු දණ්ඩෙහි; පරිච්ඡෙදලෙඛා, පරිච්ඡෙදරේඛාවක්; වට්ටති, වටී.

("කුඤ්චිකාය වණ්ණමට්ඨකම්මං න වට්ටති, පිප්ඵලකෙපි මණිකං වා පිළකං වා යං කිඤ්චි ඨපෙතුං න වට්ටති, දණ්ඩකෙ පන පරිච්ඡෙද ලෙඛා වට්ටති" ‡ යනු අටුවා යි.)

---

* චීවරස්ස, සිවුරට; කණ්ණසුත්තකං, කන්ගු; න වට්ටති, නො වටී. රජිතකාලෙ, රඳූ නිමවූ කල්හි; ඡින්දිතබ්බං, (එ) කැපිය යුතු. යං පන, යමක් වනාහි; 'අනුජානාමි භික්ඛවෙ කණ්ණසුත්තකං ඉති, මහණෙනි! කන්ගුය අනුදනිමි යන මේ ශික්ෂාපදයෙන්; එවං, මෙසේ; අනුඤ්ඤාතං, අනුදන්නාලද ද; තං, එය, අනුවාතෙ, නුවාවෙහි; පාසකං කත්වා; පාසයක් කොට; රජනකාලෙ ලග්ගනත්ථාය, රඳන කල්හි එල්වනු පිණිස; බන්ධිතබ්බං, බැඳිය යුතු.

‡ කුඤ්චිකාය, කොස්සෙහි; වණ්ණමට්ඨකම්මං, වණමට්ඨකම්; න වට්ටති, නො වටී. පිප්ඵලකෙපි, කතුරෙහි ද; මණිකං වා, මහබුබුළක් හෝ; පිළකං වා, කුඩාබුබුළක් හෝ; යං කිඤ්චි, යම් කිසිවක් ඨපෙතුං, තබන්ට; න වට්ටති, නො වටී. දණ්ඩකෙ පන, දණ්ඩෙහි වනාහි; පරිච්ඡෙදලෙඛා, පරිච්ඡෙදරේඛාව; වට්ටති, වටී.

273 මාලාදූරණියං පත්තමණ්ඩලෙ භත්තිකම්ම ච
හෙට්ඨා ලෙඛා වයං උද්ධං අහිච්ඡත්තකාදිසං.

274 සිඛා කත්තරයට්ඨිම්හි සූචිසණ්ඩාසකෙ'පි ච
යං කිඤ්චි ගිරිකූටාදිවණ්ණමට්ටං න වට්ටති.

275 බිම්බොහනෙ භිසිමඤ්චපීඨාදිසයනාසනෙ,
සම්මුඤ්ජනිම්හි සඞ්කාරඡඩ්ඩනෙ රඞ්ගභාජනෙ,

276 පානීයභාජනෙ පාදපීඨෙ කථලිකාය ච,
පත්තාධාරපිධානෙසු තාලවණ්ටෙ ච වීජනෙ;
යං කිඤ්චි මාලාකම්මාදි වණ්ණමට්ටමවාරිතං.

---

273 274 අරණියං, අරණිභාණ්ඩයෙහි; මාලාදී, මාලා (කම්මා) දී ද; පත්තමණ්ඩලෙ, (පාතබන තිපුසීසාදිමය) පාම්බුල්ලෙහි; භත්තිකම්මං ච, (මෝරුදතී මිස සෙසු) විභත්තිකම් ද; (න වට්ටති) නො වටී; කත්තරයට්ඨිම්හි, සැරයටියෙහි; හෙට්ඨා, යට, (පිළිය) ලේඛා වයං, රේඛාදෙකක් ද; උද්ධං, මත්තෙහි; අහිච්ඡත්තකාදිසං, හිස සතුකැකුලක් බඳු සටහන් ද; සිඛා, හැර; වණ්ණමට්ටං, වනමට කමෙක් ද; සූචිසණ්ඩාසකෙ, හිදිකටු ගහණ අඬුහඬුයෙහි; ගිරිකූටාදි, මෝරුදතී ඈ; යං කිඤ්චි වණ්ණමට්ටම්පි ච, යම් කිසි රුවැති දෙයක් ද; න වට්ටති, නො වටී. (උත්තරාරණි ය අරණිධනුක ය උපරි පෙල්ලන දඬක ය යන මේ අරණිභාණ්ඩ නම්. "කතුරු යට කොළ වර හඬු කොට කරන යවලලු දු වටී මෙ" යනු විනයසන්නය යි.)

275 බිම්බොහනෙ, කන්වයිනෙහි ද; භිසිමඤ්චපීඨාදිසයනාසනෙ, බිසි ය හැඳ පුටු ය බුමුතුරුණු ය යනාදී හෝනා හිඳිනා දෑයෙහි ද; සම්මුඤ්ජනිම්හි, මුස්නෙහි ද; සඞ්කාරඡඩ්ඩනෙ, කසල හඬුයෙහි ද; රඞ්ගභාජනෙ, (රඳන්දෙණිඈ) රජනභාජනයෙහි ද;-

276 පානීයභාජනෙ, (කලකොතලාඈ) පැන්බජනෙහි ද; පාදපීඨෙ, දෙවිපාතබනපොහොරුයෙහි ද; කථලිකාය ච, නො දෙවිපාතබනපොහොරුයෙහි ද; පත්තාධාර පිධානෙසු, පාත්‍රවලලු පාත්‍රපත ද; තාලවණ්ටෙ ච, තල්වැට ද; වීජනෙ, සිවුරුස්වීජනියෙහි ද; මාලාකම්මාදි, මාලාකම්මාදිවූ; යං කිඤ්චි වණ්ණමට්ටං, (මාගම්රූ විනා) යම්කිසි රුවැති දෙයක්; අවාරිතං, නො වළක්වන ලදී.

("කිවුතායෙහි මහණනට මාගම් රූ මිස සෙසු වණ්ණමට වටී යෙත් යනු විනයසන්නය යි.)

277 සෙනාසනෙ පන ද්වාරකවාටාදිප්පභෙදනෙ
සොවණ්ණමයම්පි අනුඤ්ඤාතං වණ්ණමට්ඨම්හි කා කථා.

278 විසාණනාළිලාබුවාදිප්පභෙදෙ තෙලභාජනෙ
පුමිත්ථිරූපරහිතං වණ්ණමට්ඨමවාරිතං.

---

‘‘භෙසජ්ජනති,,

279 ජනස්ස කාතුං භෙසජ්ජං දාතුං වත්තුං න ලබ්භති
භික්ඛාචරියවිඤ්ඤත්ති සකෙහි සහධම්මිනං

280 පිතූනං තදුපට්ඨාකභික්ඛුනිස්සිතපණ්ඩුනං
ලබ්භං භෙසජ්ජකරණං වෙය්‍යාවච්චකරස්ස ච.

---

277 ද්වාරකවාටාදිප්පභෙදනෙ, දොරකවුළුදොරබා ඈ ප්‍රභෙද ඇති; සෙනාසනෙ පන, (ප්‍රාසාදදිවූ) සෙනාසනයෙහි වනාහි; සොවණ්ණමයම්පි, රන්කමුදු; අනුඤ්ඤාතං, අනුදන්නාලද; වණ්ණමට්ඨම්හි, අන්රූවැතියෙහි; කා කථා, කිය යුතු කිම.

278 විසාණනාළිලාබුවාදිප්පභෙදෙ, තෙල්හං තෙල්නළ තෙල්ලබු ඈ ප්‍රභෙද ඇති; තෙලභාජනෙ; තෙල්බඳුනෙහි; පුමිත්ථිරූපරහිතං, මාගම් පිරිමි රූ නැත්තාවූ; වණ්ණමට්ඨං, විතමෙව; අවාරිතං නොවළකනලදී.

---

‘‘භෙසජ්ජනති,,

භෙසජ්ජං යන්නෙහි (බෙහෙත්කිරීම් කරවීම් ඈ නම්)

279 ජනස්ස (නොනෑ) ජනයාහට; භෙසජ්ජං, බෙහෙත්; කාතුං, කරන්නට ද; දාතුං, දෙන්නට ද; වත්තුං, කියන්නට ද; න ලබ්භති, නො වේ; භික්ඛාචරිය, සිඟා ලද (බෙහෙදින්) විඤ්ඤත්ති, විනවාලද (බෙහෙදින්); සකෙහි, තමා අයත් (බෙහෙදින්;) සහධම්මිනං, පස්වසහධම්මිකයන්ට ද,-

280 පිතූනං, මව්පියන්ට ද; තදුපට්ඨාක, මව්පියන්ට මෙහෙ කරන්නෝ ය; භික්ඛුනිස්සිත, භික්ෂූන් නිසා වසන්නෝ ය; පණ්ඩුනං, පඬුපලාස ය යන මොවුන්ට ද; වෙය්‍යාවච්චකරස්ස ච, (තමා අයත්) මෙහෙකරුවාහට ද; භෙසජ්ජකරණං, බෙහෙත් කිරීම; ලබ්භං, වේ.

281. මහාචූළපිතා මාතා භාතා භගිනිආදිනං
දොසං සචෙ න'ත්තනියෙ දාතබ්බං තාවකාලිකං.

282. කුලදූසනවිඤ්ඤත්ති භොජ්ජකරණාදිසු
මාතාපිතූසු සම්බන්ධඤාතකෙසු න රූහති.

283. පිණ්ඩපාතො අනාමට්ඨො මාතාදීනමවාරිතො
ජනානං දමරිචොරස්ස දාතුමිස්සරියස්ස ච.

281 මහාචූළපිතා, මහලුපිය සුලුපියෝ ය; මාතා, මහලු මව් සුලු මව් ය; භාතා, මල්බෑයෝ ය; භගිනීආදිනං, නඟු බුහුන්නු ය; (ආදි ශබ්දයෙන් ගත් නෑදිමසිලෝ ය යනු) දොසං, ඒ දසදෙනාට; සචෙ (සති) උන් සතු බෙහෙත් ඇතිකල්හි; (උන් සතුබෙහෙදින් බෙහෙත් කටයුතු ය;) න අත්තනියෙ - අත්තනියෙ අසත්, උන් සතු බෙහෙත් නැතිකල්හි; තාවකාලිකං, (තාවකාලික කොට ගත්ව දී කියන විසින් හෝ, තමන්ට ඇති කළ දෙති යන ආභොග විසින් හෝ) තාවකාලික කොට; දාතබ්බං, (තමා සතු බෙහෙත්) දියයුතු; ("එසේ නො දිනි හොත් සද්ධාදෙය්‍යවිනිපාතන නම් වෙතියෙනි" යනු මෙහි සන්න යි. "සචෙ පටිදෙන්ති ගහෙතබ්බං, නො චෙ දෙන්ති න චොදෙතබ්බං" † යනු අටුවා යි.)

282 කුලදූසන, (පුෂ්පඵලදානාදීයෙන්) කුලදූෂණ ය; විඤ්ඤත්ති, (සතර පසය) විනවීම ය; භොජ්ජකරණාදිසු, බෙහෙත් කිරීම ය යනාදීන් වනාහි; මාතාපිතූසු, මව් පියන් හා; සම්බන්ධ, සත් විනා කුලපරම්පරාව දක්වා එක්බැඳිවූ; ඤාතකෙසු, නෑයන්කෙරෙහි; න රූහති, නො නැඟේ; (ආපත්තිජනක නො වේ.)

(මෙහි "ආදි" ශබ්දයෙන් අනාමට්ඨපිණ්ඩපාතදාන පරිභොගදාන පරිත්තාණදාන දූතකාර්‍ය ජඞ්ඝපෙසණික යන මෙතෙක් දෑ ගන්නා ලදී.)

283 අනාමට්ඨො, අග්‍ර නො ගන්නා ලද; පිණ්ඩපාතො, ආහාර; මාතාදිනං, මව්පියආදිවූ; ජනානං, (සව් කී) ජනයන් පිණිස ද; දමරිචොරස්ස, ගම් වනසාගන්නා ප්‍රසිද්ධ මහාසොරහට ද; ඉස්සරියස්ස ච, ඉසුරුභාවට ද; දාතුං, දෙන්නට; අවාරිතො, නො වළක්වනා ලදී.

† සචෙ, ඉදින්; පටිදෙන්ති, පෙරළා දෙත් ද; ගහෙතබ්බං, ගත යුතු. නො චෙ, ඉදින්; න දෙන්ති, නො දෙත් ද; න චොදෙතබ්බං, නො ඉල්විය යුතු.

284 තෙසං සුත්තාදකෙනෙව පරිත්තං කරෙ න 'අත්තනො
භණිතබ්බං භණාපෙන්තෙන පරිත්තං සාසනොගධං.

285 සීලං ධම්මං පරිත්තං වා ආගන්ත්වා දෙතු භාසතු
දාතුං වත්තුඤ්ච ලබ්භති ගන්ත්වා කෙනචි පෙසිතො'ති.

---

("එත්ථ පණ්ඩුපලාසස්ස ථාලකෙ පක්ඛිපිත්වා'පි දාතුං වට්ටති, තං ඨපෙත්වා අඤ්ඤස්ස අගාරිකානං මාතාපිතූනම්පි න වට්ටති. පබ්බජිතපරිභොගො හි අගාරියානං චෙතියට්ඨානසදිසො" † ඛු අටු වා. ටී.)

284 තෙසං, ඒ නෑනෑ ගිහිමිනිසුන්ගේ; සුත්තාදකෙනෙව, නූලෙන් හා දියෙන් ම; පරිත්තං කරෙ, පිරිත් කරන්නේ ය; න අත්තනො, තමා අයත් සූත්‍රාදකයෙන් නො කරන්නේ යි; භණාපෙන්තෙන, (පිරිත්) බණවන කල්හි; සාසනොගධං, ශාසනපර්‍යාපන්න වූ; පරිත්තං, (රතනපරිත්තාදි) පිරිත්; භණිතබ්බං, කිව යුතු.

285 ආගන්ත්වා, අවුත්; සීලං දෙතු, සිල්දෙත්ව යි හෝ; ධම්මං, බණ (කියත්ව යි හෝ); පරිත්තං භාසතු වා, පිරිත් බෙණෙත්ව යි හෝ; කෙනචි, (රජ යුවරජ ආදී) කිසිවකු විසින්; පෙසිතො, (ආරාධනා කොට) එවන ලද්දේ; ගන්ත්වා, ගොස්; දාතුං, (සිල්) දෙන්ට ද; වත්තුඤ්ච, (බණ) කියන්ට ද; (පිරිත් බණින්ට ද;) ලබ්භති, ලැබේ.

---

† එත්ථ, මෙහි; පණ්ඩුපලාසස්ස, පණ්ඩුපලාසයාට; ථාලකෙ, තලි තැටියෙහි; පක්ඛිපිත්වාපි, බහා ද; දාතුං, දෙන්ට; වට්ටති, වටී. තං, ඔහු; ඨපෙත්වා, හැර; අඤ්ඤස්ස, සෙසු; අගාරිකානං, ගිහිවූ; මාතාපිතූනම්පි, මවිපියන්ට පවා; න වට්ටති, (තලිතැටියෙහි බහා දෙන්ට) නො වටී. හි, යම් හෙයකින්; පබ්බජිතපරිභොගො, පැවිද්දන් පරිභොග කරන දෙය; අගාරියානං, ගිහියන්ට; චෙතියට්ඨානසදිසො, චෛත්‍යස්ථානයක් සම වේ ද; එහෙයිනි.)

"උග්ගහො,, ති-

286 කම්මචෙතියසඞ්ඝඤ්ඤපුග්ගලත්ථං ගණස්ස ච
දසභෙදම්පි රතනං උග්ගණ්හන්තස්ස දුක්කටං.
287 නිස්සග්ගි තෙසු අත්තත්ථං ද්වීසු සෙසෙසු දුක්කටං
අනාමසිත්වා වුත්තෙතු ගණං සඞ්ඝඤ්ච පුග්ගලං.
288 චෙතියස්ස නවකම්මස්ස දම්මී'ති න පටික්ඛිපෙ
වදෙ කප්පියකාරානං වදන්තෙවම්මෙ ඉති.

---

'උග්ගහො,ති,

උග්ගහො යන්නෙහි (අකැපවත් පිළිගැනුම් නම්.)

286. කම්ම, නවාම් පිණිස ද; චෙතිය, දාගැබ් පිණිස ද; සඞ්ඝ, සඞ්ඝයා පිණිස ද; අඤ්ඤපුග්ගලත්ථං, අනික්පුඟුලකු පිණිස ද; ගණස්ස ච, (සූත්‍රාන්තිකාදි) ගණයකට ද; දසභෙදම්පි රතනං, (මුතු මැණික් ඈ) දසවිධවූ රුවන් ම; උග්ගණ්හන්තස්ස, ගන්නාහට; දුක්කටං, දුකුළා වේ.

287 288 තෙසු, ඒ දසවිධවූ රත්නයන් අතුරෙහි; අත්තත්ථං, තමා පිණිස; (ගන්නාහට) ද්වීසු, (ජාතරූපරජත) දෙක්හි; නිස්සග්ගි, නිසගිපචිති වෙ යි; සෙසෙසු, සෙසු රුවන්හි; දුක්කටං, දුකුළා වේ; ගණං, ගණයක් ද; සඞ්ඝඤ්ච, සඞ්ඝයා ද; පුග්ගලං, පුද්ගලයෙකු ද; අනාමසිත්වා, නොගෙන; චෙතියස්ස, චෛත්‍යයට (දෙමි) නවකම්මස්ස දම්මීති, නවකම්යට දෙමි සි; වුත්තෙතු, කීකල්හි වනාහි; න පටික්ඛිපෙ, ප්‍රතික්ෂෙප නො කරන්නේ ය; ඉමෙ එවං වදන්තීති, මේහු මෙසේ කියති සි; කප්පියකාරානං වදෙ, කැපකරුවන්ට කියන්නේ සි.

("සචෙ'පි කොචි ජාතරූපරජතං ආනෙත්වා ඉදං සඞ්ඝස්ස දම්මි ආරාමං කරොථ චෙතියං වා භොජනසාලාදීනංවා අඤ්ඤතරන්ති වදති ඉදම්පි සම්පටිච්ඡිතුං න වට්ටති- †

---

† සචෙපි, ඉදින්ද; කොචි, කිසිවෙක්; ජාතරූපරජතං, රන් රිදී මසු කහවණු; ආනෙත්වා, ගෙනවුත්; ඉදං, මේ; සඞ්ඝස්ස, සංඝයාට; දම්මි, දෙමි; ආරාමං, ආරාමයක්; කරොථ, කරව්; චෙතියං වා, චෛත්‍යයක් හෝ; භොජනසාලාදීනං, බොජුන්හල්ආදීන් අතුරෙන්; අඤ්ඤතරං වා, එකක් හෝ; (කරොථ) ඉති, කරව් යයි; වදති, කියා නම්; ඉදං අපි, මේ ද; සම්පටිච්ඡිතුං, පිළිගන්ට; න වට්ටති, නො වටී.

289 ඛෙත්තං වත්ථුං තළාකං වා දෙන්තෙ දාසපසාදිකං
පටික්ඛිපිත්වා ගණ්හෙය්‍ය කප්පියෙන කමෙන ච
ඛෙත්තාදීනි විහාරස්ස වුත්තෙ දම්මී'ති වට්ටති.

---

සචෙ පන සඞ්ඝං වා ගණං වා පුග්ගලං වා අනාමසිත්වා ඉදං හිරඤ්ඤසුවණ්ණං චෙතියස්ස දෙම විහාරස්ස දෙම නවකම්මස්ස දෙමා'ති වදන්ති පටික්ඛිපිතුං න වට්ටති. ඉමෙ ඉදං වදන්තී'ති කප්පියකාරකානං ආචික්ඛිතබ්බං.,, † යනු අටුවා යි.)

289 ඛෙත්තං, ක්ෂේත්‍රයක් හෝ; වත්ථුං, (උදුවතු තලවතු ඈ) වත්තක් හෝ; තළාකං වා, වැවක් හෝ; දාසපසාදිකං, දාසිදාස්ගෙරි මීවුන් ඈ හෝ; දෙන්තෙ, (සඟහට ගණහට පුඟුලහට දෙමි යි) දෙන කල්හි; පටික්ඛිපිත්වා, (නො වටනේ යයි) ප්‍රතික්ෂේප කොට; කප්පියෙන කමෙන ච, (නැවත) කප්පිය ක්‍රමයෙන් ගණ්හෙය්‍ය, ගන්නේය; ඛෙත්තාදීනි, ක්ෂේත්‍රාදීන්; විහාරස්ස දම්මීති, විහාරයට දෙමි යි වුත්තෙ, කීකල්හි; වට්ටති, වටී.

("කප්පියෙන කමෙන ගහණං නාම, ඛෙත්තං දම්මි වත්ථුං දම්මි තළාකං දම්මි දාසං දම්මි ගොමහිංසඅජෙළකාදයො දම්මී'ති වුත්තෙ න වට්ටතී'ති පටික්ඛිපිත්වා ඉතො චත්තාරො පච්චයෙ පරිභුඤ්ජථා'ති වා චතුපච්චයපරිභොගත්ථාය දම්මී'ති වා සඞ්ඝො උදකං පරිභුඤ්ජිස්සතු භණ්ඩකං ධොවිස්සතූ'ති වා ආරාමිකං වෙය්‍යාවච්චකරං කප්පියකාරකං දම්මී'ති වා පඤ්චගොරසපරිභොගත්ථාය දම්මී'ති වා වුත්තෙ, අපි'ච මම තළාකං වා පොක්ඛරණිං වා සඞ්ඝස්ස දම්මී'ති වුත්තෙ සාධු උපාසක සඞ්ඝො පානීයං පිවිස්සති භණ්ඩකං ධොවිස්සති මිගපක්ඛිනො පිවිස්සන්තී'ති වත්වා වා සම්පටිච්ඡනං,, *)

---

† සචෙ පන, ඉදින් වනාහි; සංඝං වා, සංඝයා හෝ; ගණං වා, ගණයා හෝ; පුග්ගලං වා, පුද්ගලයකු හෝ; අනාමසිත්වා, සඳහන් නොකොට; ඉදං හිරඤ්ඤසුවණ්ණං, මේ රන්රිදී මුදල්; චෙතියස්ස දෙම, චෛත්‍යයට දෙමු; විහාරස්ස දෙම, විහාරයට දෙමු; නවකම්මස්ස දෙම ඉති, නවකර්මයට දෙමු යයි; වදන්ති, කියත් නම්; පටික්ඛිපිතුං, ප්‍රතික්ෂේප කරන්නට; න වට්ටති, නො වටී. ඉමෙ, මොහු; ඉදං, මෙබඳු වචනයක්; වදන්ති ඉති, කියත් යයි; කප්පියකාරකානං, කැපකරුවන්ට; ආචික්ඛිතබ්බං, කිය යුතු.

* කප්පියෙන කමෙන, කැපක්‍රමයෙන්; ගහණං නාම, ගැන්ම නම්:- ඛෙත්තං දම්මි, කෙතක් දෙමි; වත්ථුං දම්මි, වත්තක් දෙමි,

290 නවමාතිකකෙදාරතළාකකිරියා 'නවෙ
මත්තිකුද්ධරණං බන්ධො වීරිකාරො ච ආළියා.

291 අතිරෙකභාගගහණං කෙදාරෙ අනවෙ නවෙ
අපරිච්ඡින්නභාගෙ ච සස්සෙ දෙහෙත්තකෙ ඉති.
කහාපණුට්ඨාපනං ච සබ්බසම්පි අකප්පියං.

---

290 නවමාතිකකෙදාරතළාකකිරියා, අලුත්ඇළබිඳීම් කුඹුරු තැනීම් වැව් බැඳීම් ද; අනවෙ, (කැප විසින් පිළිගත්) පරණ වැව්හි; මත්තිකුද්ධරණං (ඇතුළු වැවින්) පස් කපා නැගීම් ද; බන්ධො, (යුත් පැකඩ) බැඳීම් ද; ආළියා, වැම්යර; වීරිකාරො ච, (පිඩිනකා දුම්ල තැන්) තර කිරීම් ද;—

291 අනවෙ කෙදාරෙ, පරණ කුඹුරෙහි; අතිරෙකභාගගහණං, (පෙරසිරිත් සේ නො ගෙන) වඩා භාග ගැන්ම ද; අපරිච්ඡින්නභාගෙ, (මේ බිම්සාටුවෙන් මෙතෙක් දිය යුතු යයි) නොපිරිසිඳුන් භාගඇති; නවෙ ච, අලුත් කුඹුරෙහි ද; සස්සෙ, (කළාවූ මෙතෙක්) ගොයම්හි

---

තළාකං දම්මි, වැවක් දෙමි; දාසං දම්මි, දාසයකු දෙමි; ගොමහිස අජෙළකාදයො දම්මි ඉති, ගව මහිස තිරෙළු බැටළු ආදීන් දෙමි යි; වුත්තෙ, කීකල්හි; න වට්ටති ඉති, නො වටී යයි; පටික්ඛිපිත්වා, ප්‍රතික්ෂෙප කොට; ඉතො, මෙයින්; චත්තාරො පච්චයෙ, සිව්පසය; පරිභුඤ්ජථ ඉති වා, වළඳව් යයි හෝ; චතුපච්චය පරිභොගත්ථාය, සිව්පසපරිභොගයට; දම්මි ඉති වා, දෙමි යි හෝ; සංඝො, සංඝයා; උදකං, දිය; පරිභුඤ්ජිස්සතු, වළඳාවා යි හෝ; භණ්ඩකං, බඩු; ධොවිස්සතු ඉති වා, සෝදාවා යි හෝ; ආරාමිකං, ආරාමිකයකු (දෙමි යි හෝ; වෙය්‍යාවච්චකරං, වතාවත් කරන්නකු දෙමි යි හෝ; කප්පියකාරකං, දම්මි ඉති වා, කැපකරුවකු දෙමි යි හෝ; පඤ්චගොරසපරිභොගත්ථාය, පස්ගෝරසපරිභොගය පිණිස; දම්මි ඉති වා, දෙමි යි හෝ; වුත්තෙ, කීකල්හි ද; අපි, නැතහොත්; මම, මාගේ; තළාකං වා, වැව හෝ; පොක්ඛරණිං වා, පොකුණ හෝ, සංඝස්ස, සංඝයාට; දම්මි ඉති, දෙමි යි; වුත්තෙ, කීකල්හි; සාධු උපාසක, මැනව උපාසකය; සංඝො, සංඝයා; පානීයං, පැන්; පිවිස්සති, බොන්නේය; භණ්ඩකං, බඩු; ධොවිස්සති, සෝදන්නේය; මිගපක්ඛිනො, සිව්පාවුන් හා පක්ෂීහු; පිවිස්සන්ති ඉති, පැන් බොන්නාහ යි; වත්වා වා, කියා ද; සම්පටිච්ඡනං, පිළිගැන්ම යි.

292 අවත්වා කස වපිච්චාදෙ තාවතිකාය ච භූමියා
පතිට්ඨාපෙති භූමිං වා භාගෙ දෙය්‍යාති එත්තකො.

293 භූමිභාගෙ කතං සස්සමෙත්තකෙ ගණ්හථෙත්තකං;
ගණ්හනත්ථං වදන්තෙවං පමාණං දණ්ඩරජ්ජුභි.

294 මිනනෙ රක්ඛණෙ ඨත්වා ඛලෙ තං නීහරාපනෙ
කොට්ඨාදිපටිසාමනෙ තස්සෙවෙතමකප්පියං.

295 පටිසාමෙය්‍ය පාචිත්ති යං කිඤ්චි ගිහිසන්තකං
භණ්ඩාගාරිකසීසෙන සචෙ'පි පිතුසන්තකං.

---

එත්තකො දෙය ඉති, මෙතෙක් කහවණු දෙව් යි; කහාපණුට්ඨාපනෙව, කහවණු නැගීම් ද; සබ්බසම්පි, හැම දෙන තැන ම; අකප්පියං අකැප යි.

292 කස වප ඉච්චාදිං, සීසම් වපුරව් යනාදි (අකැපතෙපුල්;) අවත්වා, නො කියා; එත්තිකාය ච භූමියා, මෙතෙක් කුඹුරෙහි; එත්තකො භාගො, මෙතෙක් කොටස්; දෙය්‍යාති, දිය යුත්තේයයි; භූමිං වා, භූමිය හෝ; පතිට්ඨාපෙති, පිහිටුවා ද.

293 එත්තකෙ භූමිභාගෙ, මෙපමණ බිම් කොටස්හි; සස්සං කතං, ගොයම කරනලද; එත්තකං ගණ්හථ, මෙපමණ භාග ගණිව යි; එවං, මෙසේ; වදන්තො, (ගොයම් කළවුන්ට) කියනකල්හි; පමාණං ගණ්හනත්ථං, (උත්සන්න නො අඩු හා සාමාන්‍ය කුඹුරෙහි) ප්‍රමාණ දන්නා පිණිස; දණ්ඩරජ්ජුභි, යටින් හා රැහැණින් -

294 මිනනෙ, මිනීමෙහි ද; ඛලෙ ඨත්වා, කමතෙහි සිට; රක්ඛණෙ, (අනුන් කොසෙයින් නො ගන්නා සේ) රැක්මෙහි ද; තං, ඒ ධාන්‍යය, නීහරාපනෙ, (කමතින්) නෙරවීමෙහි ද; කොට්ඨාදිපටිසාමනෙ, (ගෙනගිය ධාන්‍යය) කොටුවේ ආදියෙහි ලවා සැඟවීමෙහි ද; එතං, ඒ ධාන්‍යය; තස්සෙව, ඔහට ම; අකප්පියං, (ධාන්‍යවිචාරණ කළෙහෙයින්) අකැප යි.

295 පිතුසන්තකම්පි, මව්පියන් සන්තක ද වූ; ගිහිසන්තකං, ගිහිවූවුන් අයත්; යං කිඤ්චි, (කැප අකැප) යම් කිසි වස්තුවක්; භණ්ඩාගාරිකසීසෙන, භාණ්ඩාගාරිකශීර්ෂයෙන්; (රැක දෙමි යන සිතින්;) සචෙ, ඉදින්; පටිසාමෙය්‍ය, සඟවා තබා නම්; පාචිත්ති, පචිති
ඇත.

296 පිතුසන්තං කප්පියං වත්ථුමවස්සං පටිසාමියං
අත්තනො සන්තකං කත්වා ලබ්භතෙ පටිසාමිතුං.
297 දෙහී'ති පටිසාමෙත්වා වුත්තො වා'පි පටික්ඛිපෙ
පාතෙත්වාන ගතෙ ලබ්භං පලිබොධො'ති ගොපිතුං.
298 කම්මං කරොන්තා ආරාමෙ සකං වඩ්ඪකිආදයො
පරික්ඛාරං ච සයනභණ්ඩං වා රාජවල්ලභා.
299 දෙහී'ති පටිසාමෙත්වා වදන්ති යදි ඡන්දසො
න කරෙය්‍ය භයා ඨානං ගුත්තං දස්සෙතු වට්ටති.
බලක්කාරෙන පාතෙත්වා ගතෙසු පටිසාමිතුං
300 භික්ඛුං මනුස්සා සඞ්කන්ති නට්ඨෙ වත්ථුම්හි තාදිසෙ
විහාරාවසථස්සාමෙනුඤ්ඤා රතනං රතනසම්මතං.

---

296 පිතුසන්තං, මව්පියන් අයත්වූ; අවස්සං පටිසාමියං, අවශ්‍යයෙන් තගා තිබිය යුතුවූ; කප්පියං වත්ථුං, (පිළිඈ) සුදුසු වස්තුව; අත්තනො සන්තකං කත්වා; තමා සතු කොට; පටිසාමිතුං, සඟවා තබන්නට; ලබ්භතෙ, වටී.

297 පටිසාමෙත්වා, සඟවා තබා; දෙහීති, දෙව සි; වුත්තො වාපි, කියන ලද්දේ ද; පටික්ඛිපෙ, (නො වටනේ යයි) ප්‍රතික්ෂෙප කරන්නේ ය; පාතෙත්වාන, (රැක දෙව යි) තබාපියා; ගතෙ, (මව්පියන් කිපෙමින්) ගියකල්හි; පලිබොධොති, (අඩ්ඪාරාමසික්ඛාපද විසින්) පලිබොධ යයි; ගොපිතුං, රකින්ට; ලබ්භං, වටී.

298 ආරාමෙ, වෙහෙර; කම්මං කරොන්තා, කර්මාන්ත කරන්නාවූ, වඩ්ඪකී ආදයො, වඩුආදීහු; සකං පරික්ඛාරං වා, (වෑපොරෝ ඈ) තමන්ගේ පිරිකර හෝ; රාජවල්ලභා, රාජවල්ලභයෝ; සයනභණ්ඩං වා, (තමන්ගේ හෝනා කළාල් පිඩාවි ඈ) සයනභාණ්ඩ හෝ;-

299 පටිසාමෙත්වා දෙහීති, සඟවා තබාපියා දෙව යි; යදි වදන්ති, ඉදින් කියත් නම්; ඡන්දසො, (වඩුආදීන් කෙරෙහි) ස්නෙහයෙන් ද; භයා, (රාජවල්ලභයන් කෙරෙහි) භයින් ද; න කරෙය්‍ය, නො කරන්නේ යි; ගුත්තං ඨානං, රක්‍ෂාස්ථානයක්; දස්සෙතුං, (මෙහි තබව යි නො කියා මේ තැන රක්‍ෂා ඇතැ යි) දක්වන්ට; වට්ටති, වටී, බලක්කාරෙන, බලාත්කාරයෙන්; පාතෙත්වා, තබාපියා; ගතෙසු ගියකල්හි; පටිසාමිතුං, සඟවා තබන්නට; (වටී.)

300 වත්ථුම්හි, (රන්පිළී ඈ) වස්තුවක්; නට්ඨෙ; (යම්බඳු තැනෙක) නටකල්හි; මනුස්සා, (ගිහි) මිනිස්හු; භික්ඛුං, මහණහු, සඞ්කන්ති,

301 නික්ඛිපෙය්‍ය ගහෙත්වාන මග්ගෙරඤ්ඤෙපි තාදිසෙ
සාමිකානාගමං ඤත්වා පතිරූපං කරිස්සති,

---

සැක කෙරෙද් ද; තාදිසෙ, එබඳුවූ; විහාරාවසථස්සන්තො, විහාරය ඇතුළෙහි (නමාවසන) ගෙය ඇතුළෙහි (තුබූ;) රතනං, (මුතුමැණික්ආ) රුවනක් හෝ; රතනසම්මතං, රුවනැයි සලකනලද (පිළිඇ කැපවතක් හෝ-

301 ගහෙත්වාන, ගෙන; නික්ඛිපෙය්‍ය, (හිමියන් දක්නා තෙක්) තබන්නේ යි; තාදිසෙ, එබඳුවූ, (මහණුන් කෙරෙහි සැක කරන්ට ද නිසිතැන්වූ;) මග්ගෙ, මාර්ගයෙහි ද; අරඤ්ඤෙපි, අරණ්‍යයෙහි ද; (තුබූ භාණ්ඩයක් දැක) සාමිකානාගමං ඤත්වා, (මඟින් පහ ව බලා හිඳ) හිමියන්ගේ නොඊම දැන; පතිරූපං කරිස්සති, සුදුස්සක් කරන්නේ යි. ("පතිරූපන්ති රතනසම්මතෙ පංසුකූලග්ගහණං රතනෙ නිරුස්සුක්කගමනං. *

"මුත්තං මණිං වෙළුරියඤ්ච සඞ්ඛං
සිලං පවාළං රජතං සුවණ්ණං
මසාරගල්ලම්පි ච ලොහිතඞ්කං
දසප්පකාරං රතනං වදන්ති" †

"මග්ගෙ වා අරඤ්ඤෙ වා තාදිසං භණ්ඩං පස්සිත්වා මග්ගා ඔක්කම්ම නිසීදිතබ්බං, සාමිකෙසු ආගතෙසු තං ආචික්ඛිතබ්බං, සචෙ සාමිකෙ න පස්සති රතනසම්මතං පංසුකූලං ගහෙතබ්බං, රතනඤ්ච හොති තුණ්හීභූතෙන ගන්තබ්බං" †යනු මෙහි අටුවා යි.)

---

* පතිරූපං ඉති, සුදුස්ස නම්; රතනසම්මතෙ, රත්නසම්මත දෙයක්වූකල්හි; පංසුකූලගහණං, පංසුකූලවශයෙන් ගැනීම යි, රතනෙ, රත්නයක්වූකල්හි. නිරුස්සුක්කගමනං, නිරුත්සාහ ව යාම යි.

† මුත්තං, මුතු ද; මණිං, මැණික් ද; වෙළුරියං ච, වෛදූර්‍ය්‍ය ද; සඞ්ඛං, සක් ද; සිලං, ගල් ද; පවාලං, පබලු ද; රජතං, රිදී ද; සුවණ්ණං, රන් ද; මසාරගල්ලං අපි ච, මැසිරිගල් ද; ලොහිතඞ්කං, පියුම්රාමිණි ද; දසප්පකාරං, දසවිධවූ; රතනං, රත්නය; වදන්ති, කියත්.

† මග්ගෙ වා, මග හෝ; අරඤ්ඤෙ වා, වනයෙහි හෝ; තාදිසං භණ්ඩං, එබඳු බඩුවක්; පස්සිත්වා, දැක; මග්ගා, මඟින්; ඔක්කම්ම,

"දූසනගන්ථි"

302 පුප්ඵං වෙළුං ඵලං චුණ්ණං දන්තකට්ඨඤ්ච මත්තිකං
සඞ්ගහණත්ථං දදතො කුලදූසනදුක්කටං.

303 ථුල්ලච්චයං ගරුභණ්ඩං ඉස්සරෙනෙත්ථ සඞ්ඝිකං
දෙන්තස්ස දුක්කටාදීනි ථෙය්‍යා සඞ්ඝස්ස සන්තකං.

---

"දූසනගන්ථි"-

දූසනං යන්නෙහි කුලදූෂණ නාමි:-

302 පුප්ඵං,-(සපුමල් ඈ) මල් හෝ; වෙළුං, (හිදෙළුයට ඈ) හුණ හෝ; ඵලං, (තාලපනසාදි) ඵල හෝ; චුණ්ණං, (මහරිසුණු ඈ) සුණු හෝ; දන්තකට්ඨං වා, දැහැටිදඬු හෝ; මත්තිකං, (පියවිමැටි ඈ) මැටි හෝ: සඞ්ගහණත්ථං,(පසය නිසා) කුලන් සගන්නා පිණිස; දදතො දෙන්නාහට; කුලදූසනදුක්කටං, කුලදූෂණ දුකුළා වේ.

303 එත්ථ, මේ පුප්ඵාදියෙහි; සඞ්ඝිකං, සඟසතුවූ; ගරුභණ්ඩං ගරුභාණ්ඩය; ඉස්සරෙන, ඓශ්වර්‍ය්‍යයෙන්; (ඉසුරු පවත්වා) දෙන්තස්ස, (කුලසගන්නා සඳහා) දෙන්නාහට; ථුල්ලච්චයං, ථුලසී වෙයි; සඞ්ඝස්ස සන්තකං, සඟසතු පුහුලූ සතු (මල් ඈ); ථෙය්‍යා, සොරසිතින් (දෙන්තස්ස, කුලසංග්‍රහ සඳහා දෙන්නාහට;) දුක්කටාදීනි; (භාණ්ඩයෙහි අගය තුබූසේ) දුකුළා ආදීහු වෙත්.

("තත්ථ යො හරිත්වා වා හරාපෙත්වා වා පක්කොසිත්වා වා පක්කොසාපෙත්වා වා සයං වා උපගතානං යං කිඤ්චි අත්තනො සන්තකං පුප්ඵං කුලසඞ්ගහත්ථාය දෙති දුක්කටං, පරසන්තකං දෙති දුක්කටමෙව, ථෙය්‍යචිත්තෙන දෙති භණ්ඩග්ඝෙන කාරෙතබ්බො, එසෙව නයො සඞ්ඝිකෙපි' අයං පන විසෙසො සෙනාසනත්ථාය

---

ඉවත් ච, නිසීදිතබ්බං, හිඳිය යුතු; සාමිකෙසු, හිමියන්; ආගතෙසු, පාකල්හි; තං, එය; ආචික්ඛිතබ්බං, කිය යුතු. සචෙ ඉදින්; සාමිකෙ, හිමියන්; න පස්සති, නොදක්නේ නම්; රතනසම්මතං, රතනසම්මතදෙය; පංසුකූලං ගහෙතබ්බං, පංසුකූලවශයෙන් ගත යුතු; චෙ, ඉදින්; රතනං හොති, රතනයක් වේ නම්; තුණ්හීභූතෙන, නිශ්ශබ්දවූවහු විසින්; ගණ්හිතබ්බං, ගතයුතු යි.

304 කුලසඞ්ගහත්ථං රොපෙතුං රොපාපෙතුඤ්ච සබ්බථා
ඵලපුප්ඵූපගං රුක්ඛං ජග්ගිතුඤ්ච න වට්ටති.

305 නිමිත්තොභාසතො කප්පවොහාරපරියායතො
අත්තනො පරිභොගත්ථං රොපාපනාදි ලබ්භරෙ.

---

නියාමිතං ඉස්සරවතාය දදතො ථුල්ලච්චයං’’ * යනු අටුවා යි. “සෙනාසනත්ථාය නියාමිතං ගරුභණ්ඩං හොති’’ ‡ යනු මෙහි ටීකා යි. “භික්ඛුසඞ්ඝං අභිභවිත්වා ඉස්සරවතාය විස්සජ්ජෙන්තො ථුල්ලච්චයං ආපජ්ජති’’ †

304 කුලසඞ්ගහත්ථං, කුලන් සඟන්නා පිණිස; ඵලපුප්ඵූපගං රුක්ඛං, මල් හා පක් දෙන රුක්; රොපෙතුං, රොපණය කරන්නට ද; රොපාපෙතුඤ්ච, රොපණය කරවන්නට ද; ජග්ගිතුඤ්ච (වැටකිරීම් ආදී විසින්) පිළිදැග්නට ද; සබ්බථා, (කප්පියවොහාර අකප්පියවොහාරාදි) හැම පරිද්දෙන් ම; න වට්ටති, නො වටී.

305 නිමිත්ත, නිමිත්ත (කම්) විසින් ද; ඔභාසතො, ඔභාස විසින් ද; කප්පවොහාර, කප්පියවොහාර විසින් ද; පරියායතො පරියාය විසින් ද; අත්තනො, තමහට; පරිභොගත්ථං, ඵලපරිභොග

---

* තත්ථ, එහි; යො, යමෙක්; හරිත්වා වා, ගෙන ගොස් හෝ, හරාපෙත්වා වා; ගෙන්වාගෙන ගොස් හෝ; පක්කොසිත්වා වා, කැඳවා හෝ; පක්කොසාපෙත්වා වා, කැඳවවා හෝ; සයං උපගතානං වා; තමා වෙත එළඹියවුන්ට හෝ; යං කිඤ්චි, යම් කිසි; අත්තනො සන්තකං, තමා සතු; පුප්ඵං, මලක්; කුලසඞ්ගහත්ථාය, කුලසංග්‍රහ පිණිස; දෙති, දේ ද; දුක්කටං, දුකුළා වේ, පරසන්තකං, අනුන් අයිතිවූවක්; දෙති, දේ ද, දුක්කටමෙව, දුකුළා ම ය; ථෙය්‍යචිත්තෙන, සොරසිතින්; දෙති, දේ නම්; භණ්ඩග්ඝෙන, බඩුවෙහි අගැවූ පරිදි; කාරෙතබ්බො, (ඇවැත් නියම) කරවියයුතු සංඝිකෙ අපි, සඟ සතුදෙයෙහි ද; එසෙව නයො, මෙම ක්‍රම යි. අයං පන, මේ වනාහි; විසෙසො, වෙනසයි සෙනාසනත්ථාය, සෙනසුන් පිණිස; නියාමිතං, නියමකළදෙය; ඉස්සරවතාය, ඉසුරුමත්භාවයෙන්; දදතො, දෙන්නහුට; ථුල්ලච්චයං, ථුලසි වේ,

‡ සෙනාසනත්ථාය, සෙනසුන් පිණිස; නියාමිතං, නියම්කළදෙය; ගරුභණ්ඩං හොති, ගරුබඩු වේ.

† භික්ඛුසංඝං, භික්ෂුසංඝයා; අභිභවිත්වා, මැඩ; ඉස්සරවතාය. ඉසුරුමත්බැවින්; විස්සජ්ජෙන්තො, දෙන්නේ; ථුල්ලච්චයං ආපජ්ජති, ථුලසියට පැමිණේ.

306 වුත්තාව වෙජ්ජිකා ජඞ්ඝපෙසනෙ ගිහිකම්මසු
ඨපෙත්වා පිතරො භණ්ඩුං වෙය්‍යාවච්චකරං සකං.

307 දූසකාවං පදවාරෙන හරණෙ දූතසාසනං
සාසනං අගහෙත්වා'පි පඨමං වදතො පුන.

---

පිණිස; රොපාපනාදි, රොපනය කරවීම් ආදීහු; ලබ්භරෙ, වටිත්. (මෙහි "නිමිත්ත" නම් හුදලු ආදී ගෙනහැර සාමණේරාදීන් සම්පයෙහි තැබීම යි. "ඔභාස" නම් හුදලු ආදී ද මල්රුක් ද ගෙන සිටීම යි. "කප්පියවොහාර" නම් මේ රුක වන සේ දන, මේ වළ වන සේ දන යනාදි වචන යි. "පරියාය" නම් නොබෝකලකින් උපකාරයට වැටෙන හෙයින් මල්රුක්ආදීහු නුවණැත්තන් විසින් රොපනය කරවිය යුත්තාහ යනාදි වචන යි.)

306 වෙජ්ජිකා, පිළියම්; වුත්තාව, (යට) කියනලද ම ය; ජඞ්ඝපෙසනෙ, (ගිහින් කී හසුන් ගෙන යන) කකුල්මෙහෙණයෙහි (විනිශ්චය කියනු ලැබේ.) ගිහිකම්මසු, (කෘෂිවාණිජ්‍යාදිවූ) ගිහිමිනිසුන්ගේ කටයුත්තෙහි; පිතරො, මව්පියන් ද; භණ්ඩුං, පණ්ඩුපලාසයා ද; සකං වෙය්‍යාවච්චකරං, තමාගේ මෙහෙකරුවා ද; ඨපෙත්වා, තබා—

307 දූතසාසනං, ගිහින්ගේ හසුන්; හරණෙ, ගෙනයාමෙහි; පදවාරෙන, පියවර විසින්; (ගෙවත්) පෙදෙහි පෙණදෙහි; දුක්කටං; දුකුළා වෙයි; පඨමං, පළමු කොට; සාසනං, හසුන්; අගහෙත්වා, නොගෙන; පුන, නැවත, වදතොපි, කියන්නාහට ද; (දුක්කටං, දුකුළාවේ. "අගහෙත්වාපි යනුයෙහි දූ ඇවැත් ම කියමින් එව්හු කියූ හසුන් ම කියනෙම් යන බැවින් කියූ වෙත්, එව්හු කියන හසුන් පිළිසෑව් කොට කුලුණෙහි සිට නිසි විසින් තමාම කියම් කියත් හොත් නිරවැති" යනු අටුවාසන්න යි.)

("මම වචනෙන භගවතො පාදෙ වන්දථා'ති වා චෙතියං පටිමං බොධිං සඞ්ඝත්ථෙරං වන්දථා'ති වා චෙතියෙ ගන්ධපූජං කරොථ පුප්ඵපූජං කරොථා'ති වා භික්ඛූ සන්නිපාතෙථ දානං දස්සාම ධම්මං දෙසෙස්සාමා'ති වා ඊදිසෙසු ඨානෙසු කුක්කුච්චං න කාතබ්බං, කප්පියසාසනානි එතානි න ගිහීනං ගිහිකම්මපටිසංයුත්තානී" † යනු අටුවා යි.)

---

* මම වචනෙන, මාගේ වචනයෙන්; භගවතො, බුදුන්ගේ; පාදෙ වන්දථ ඉති වා, පා වඳිව් යයි හෝ; චෙතියං, චෛත්‍යය; පටිමං, ප්‍රතිමාව; බොධිං, බොධිය; සංඝත්ථෙරං, සංඝස්ථවිරයන්; වන්දථ ඉති වා, වඳිව් යයි හෝ; චෙතියෙ, චෛත්‍යයෙහි, ගන්ධපූජං, සුවඳ

308 උප්පන්නපච්චයා එවං පඤ්චන්නම්පි අකප්පියා
අභූතාරොචනාරූපසංවොහාරුග්ගතාදිසා.

309 හරාපෙත්වා හරිත්වාපි පිතූනං සෙසඤාතිනං
පත්තානං වත්ථුපූජත්ථං දාතුං පුප්ඵානි ලබ්භති
මණ්ඩනත්ථඤ්ච ලිංගාදිපූජත්ථඤ්ච න ලබ්භති.

---

308 එවං උප්පන්නපච්චයා, මෙසේ (අෂ්ටවිධවූ කුලදූෂණකර්මයන්) උපන්පසයෝ; පඤ්චන්නම්පි, පඤ්ච සහධර්මිකයන්ට ම; අකප්පියා, අකැපයෝ යි; අභූතාරොචනාරූපසංවොහාරුග්ගතාදිසා. උතුරුමිනිස්දම්ඇරජීමෙන් රන්රිදීඇපෙරළිකිරීමෙන් උපන් පස බඳුවෝ යි.

309 පිතූනං, මව්පියන්ට; හරාපෙත්වා, අනුන් අත යවා ද; හරිත්වාපි, තමා ගෙනහැර ද; පත්තානං, (මල්පුදනතැනට) සම්ප්‍රාප්තවූ; සෙසඤාතිනං, සෙසුනෑයන්ට ද; වත්ථුපූජත්ථං, තුනුරුවන් පුදනු පිණිස; පුප්ඵානි, තමා අයත් මල්; දාතුං, දෙන්නට; ලබ්භති, වටී; මණ්ඩනත්ථඤ්ච, පලඳනා පිණිස ද; ලිංගාදිපූජත්ථං ච, ශිවලිංගාදී පුදනු පිණිස ද; න ලබ්භති, නො වටී.

(“ආචරියුපජ්ඣායෙසු සගාරවා සාමණෙරා බහූනි පුප්ඵානි ආහරිත්වා රාසිං කත්වා ඨපෙන්ති. ථෙරා පාතොව සම්පත්තානං සද්ධිවිහාරිකාදීනං උපාසකානං වා ත්වං ඉදං ගණ්හ ත්වං ඉදං ගණ්හාති දෙන්ති පුප්ඵදානං නාම න හොති, චෙතියං පූජෙස්සාමා‘ති ගහෙත්වා ගච්ඡන්තා‘පි පූජං කරොන්තා‘පි තත්ථ තත්ථ සම්පත්තානං චෙතියපූජත්ථාය දෙන්ති, එතම්පි පුප්ඵදානං නාම න හොති. උපාසකෙ අක්කපුප්ඵාදීහි පූජෙන්තෙ දිස්වා විහාරෙ කණිකාරපුප්ඵාදීනි අත්ථි

---

පූජං; කරොථ, කරව්; පුප්ඵපූජං, මල්පූජා; කරොථ ඉති වා, කරව් යයි හෝ; භික්ඛූ, භික්ෂූන්; සන්නිපාතෙථ, රැස් කරව්; දානං දස්සාම, දන් දෙන්නෙමු; ධම්මං දෙසෙස්සාම ඉති වා, දහම් දෙසන්නෙමුයි හෝ; ඊදිසෙසු ඨානෙසු, මෙබඳුතන්හී; කුක්කුච්චං, කුකුස්; න කාතබ්බං, නො කළ යුතු, එතානි; මොහු; කප්පියසාසනානි, කැපහසුන් වෙති, ගිහීනං, ගෘහස්ථයන්ගේ; ගිහිකම්මපටිසංයුත්තානි න, ගෘහස්ථකර්ම පිළිබඳ නො වෙති.

310 තථා ඵලං ගිලානානං සම්පත්තිස්සරියස්ස ච
පරිබ්බයවිහීනානං දාතුං සපරසන්තකං.

311 භාජෙන්තා ඵලපුප්ඵම්හි දෙය්‍යං පත්තස්ස කස්සචි
සම්මතෙනා'පලොකෙත්වා දාතබ්බමිතරෙන තු.

---

උපාසකා තානි ගහෙත්වා පූජෙථා'ති වත්තුම්පි වට්ටති'' † යනු අටුවා යි).

310 ඵලං (තාලපනසාදි තමා අයත්) ඵල ද; තථා, එසේ මැ යි; (පුෂ්පයෙහි කීනයින් මැ යි;) ගිලානානං, ගිලන් මිනිසුන්ට ද; සම්පත්තිස්සරියස්ස ච, (තමා කරා) සම්ප්‍රාප්ත ඉසුරුහට ද; පරිබ්බයවිහීනානං, වියයට තිබි ද්‍රව්‍ය නැත්තවුන්ට ද; සපරසන්තකං, තමා හා තමා විශ්වසුන් සන්තකවූ; දාතුං, දෙන්නට (වටී, එසේ දුන නො වේ)

311 ඵලපුප්ඵම්හි, (සඟසතු) මල් හා පල්; භාජෙන්තා, බෙදන කල්හි; පත්තස්ස, (එතනට) සම්ප්‍රාප්තවූ; කස්සචි, කිසිම්කිසි සත්හට, සම්මතෙන, (මල්පල්බෙදනු කොට) සම්මතමහණුහු විසින්, දෙය්‍යං, (සඟුන් එක්කෙණෙකුන්ට දෙන වශයෙන් භාගයක් පමණ) දිය යුතු ය; ඉතරෙන තු, අසම්මතයා විසින් වනාහි; අපලොකෙත්වා, සඟුන් හැම්දෙනා ම අස්වා; දාතබ්බං, දිය යුතු යි.

---

† ආචරියුපජ්ඣායෙස, ආචාර්‍ය්‍යොපාධ්‍යායයන් කෙරෙහි; සගාරවා, ගෞරවසහිතවූ; සාමණෙරා, සාමණේරයෝ; බහූනි පුප්ඵානි; බොහෝ මල්; ආහරිත්වා, ගෙනවුත්; රාසිං කත්වා, රැස් කොට; ඨපෙන්ති, තබත්; ථෙරා, ස්ථවිරයෝ; පාතො එව, උදය ම; සම්පත්තානං, පැමිණියාවූ, සද්ධිවිහාරිකාදීනං, සද්ධිවිහාරිකාදීන්ට හෝ; උපාසකානං වා, උපාසකයන්ට හෝ; ත්වං ඉදං ගණ්හ ත්වං ඉදං ගණ්හ ඉති, තෝ මේ ගනු තෝ මේ ගනු යි; දෙන්ති, දෙත් ද; පුප්ඵදානං නාම න හොති, (මේ) පුෂ්පදාන නම් නො වේ. චෙතියං, චෛත්‍යය, පූජෙස්සාම ඉති, පුදන්නෙමු යි; ගහෙත්වා, ගෙන; ගච්ඡන්තාපි, යන්නාහු ද; පූජං, පිදීම්; කරොන්තාපි, කරන්නාහු ද; තත්ථ තත්ථ, ඒ ඒ තැන; සම්පත්තානං, පැමිණි තැනැත්තන්ට; චෙතියපූජනත්ථාය, චෛත්‍යය පිදීමට; දෙන්ති, දෙත් ද; එතම්පි, මේ ද; පුප්ඵදානං නාම න හොති, පුෂ්පදාන නම් නො වේ. උපාසකෙ, උපාසකයන්, අසනපුප්ඵාදීහි, වරාමල්ආදියෙන්; පූජෙන්තෙ, පුදන්නවුන්; දිස්වා, දැක විහාරෙ, විහාරයෙහි; කණිකාරපුප්ඵාදීනි, කිණිහිරිමල්ආදිය; අත්ථි, ඇති; උපාසකා, උපාසකවරැනි! තානි, ඒ; ගහෙත්වා, ගෙන, පූජෙථ ඉති, පුදව් යයි; වත්තුම්පි, කියන්ට ද; වට්ටති, වටී.

312 විහාරෙ වා පරිච්ඡිජ්ජ කත්වාන කතිකං තතො
දෙය්‍යං යථාපරිච්ඡෙදං ගිලානස්සෙතරස්ස වා
යාචමානස්ස කතිකං වත්වා රුක්ඛා ච දස්සියා

313 සිරීසචුණ්ණකසවාදිචුණ්ණෙ + සෙසෙ ච නිච්ඡයො
යථාවුත්තනයෙනෙව පණ්ණම්පෙත්ථ පවෙසයෙ'ති.

---

උපඩ්ඪභාගං දාතබ්බමිතිවුත්තං කුරුන්දියං,
ථොකථොකන්ති නිද්දිට්ඨං මහාපච්චරියං පන. *

312 විහාරෙ වා, විහාරයෙහි ද; පරිච්ඡිජ්ජ, (ඵල විසින් හෝ රුක් විසින් හෝ) පිරිසිඳ; කත්වාන, කතිකා කොට; තතො, ඉක්බිත්තෙන්; යාචමානස්ස ඉල්ලන්නාවූ; ගිලානස්ස, ගිලන්හට හෝ; ඉතරස්ස වා, (ඉසුරු ආදී) අන ගිලන්හට හෝ; යථාපරිච්ඡෙදං, කළපරිච්ඡෙදවූ පරිද්ඡෙදෙන්; දෙය්‍යං, (සතරපස් පසෙකක්) දිය යුත්තේ ය; කතිකං වත්වා, (මහසඟුන් කළ) කතිකා කියා, රුක්ඛා වා, වෘක්ෂයෝ හෝ; දස්සියා, (මේ ගසින් මෙතෙක් පක් ගන්නට ලැබේ යි කියා) දැක්විය යුත්තාහු යි.

(“සඞ්ඝාරාමෙපි ඵලපරිච්ඡෙදෙන වා රුක්ඛපරිච්ඡෙදෙන වා, කතිකා කාතබ්බා, තතො ගිලානමනුස්සානං වා අඤ්ඤෙසං වා ඵලං යාචන්තානං යථාපරිච්ඡෙදෙන චත්තාරි පඤ්ච ඵලානි දාතබ්බානි, රුක්ඛා වා දස්සෙතබ්බා ඉතො ගහෙතුං ලබ්භතී'ති, ඉධ ඵලානි සුන්දරානි ඉතො ඵලං ගණ්හථා'ති එවං පන න වත්තබ්බං” + යනු අටුවා යි.)

313 සිරීසචුණ්ණකසවාදිචුණ්ණෙ, මහරිසුණු කොළඳසුණු ආදී සුණුන්හි ද, සෙසෙ ච, (ඇටිය දෑහැටිදඹුය හුණුදඹුය යන) සෙස්

---

* උපඩ්ඪභාගං, අඩකොටසක්; දාතබ්බං ඉති, දිය යුතු යයි; කුරුන්දියං, කුරුන්දිය අටුවාවෙහි; වුත්තං, කියනලදී. මහාපච්චරියං පන, මහාපච්චරිය අටුවාවෙහි වනාහි; ථොකථොකං (දාතබ්බං) ඉති, ටික දිය යුතු යයි; නිද්දිට්ඨං, දක්වනලදී.

+ සඞ්ඝාරාමෙපි, සංඝාරාමයෙහි ද; ඵලපරිච්ඡෙදෙන වා, ඵල පිරිසිඳීමෙන් හෝ; රුක්ඛපරිච්ඡෙදෙන වා, රුක් පිරිසිඳීමෙන් හෝ; කතිකා කාතබ්බා, කතිකා කළයුතු. තතො, ඒ පිරිසිඳි ඵලයෙන්

+ සිරීසකසවාදීනං චුණ්ණං - චූර්ණම.

"වස්සූපනායිකාචෙව" ති:-

314 පුරිමිකා පච්ඡිමිකා දුවෙ වස්සූපනායිකා
තත්‍ථාලයපරිග්ගහො වචීභෙදො ච එදිසො.

315 "ඉමස්මිං විහාරෙ ඉමං තෙමාසං වස්සං උපෙමි"
"ඉධ වස්සං උපෙමී"ති චිත්තුප්පාදෙත්‍ථ ආලයො.

---

සෙහි ද; නිච්ඡයො, විනිශ්චය; යථාවුත්තනයොජෙය්‍ය, උක්තප්‍රකාර නය ඇත්තේ මැ යි; පණ්ණම්පි, (හුණපත් තලපත් ආදිවූ කැහැකි නොකැහැකි) පත් ද; එත්‍ථ, මේ මූලදූෂණයෙහි; පවෙසයෙ, ඇතුළත් කරන්නේ යි.

("වස්සූපනායිකාචෙව"ති,-

වස්සූපනායිකාචෙව යන්නෙහි (වසෙළඹීම් නම්).

314 පුරිමිකා, පෙරවසන; පච්ඡිමිකා, පසුවසන යි; වස්සූපනායිකා, වස්සූපනායිකාවෝ; දුවෙ, දෙදෙනෙකි; තත්‍ථ, ඒ දෙවසන්හි; වසෙළඹීම් නම්) එදිසො, මතුයෙහි කියනලද බඳුවූ; ආලයපරිග්ගහො, ආලයපරිග්‍රහය හෝ; වචීභෙදො වා, වාක්භෙදය හෝ යි.

315 එත්‍ථ, මෙහි, ඉමස්මිං විහාරෙ ඉමං තෙමාසං වස්සං උපෙමීති, ඉමස්මිං විහාරෙ ඉමං තෙමාසං වස්සං උපෙමි යි, (කීම වාක්භෙද නම) ඉධ වස්සං උපෙමීති, ඉධ වස්සං උපෙමි යි, (යන) චිත්තුප්පාදෙ, සිත් ඉපදවීම; ආලයො, ආලයපරිග්‍රහ නම්, (ආලයපරිග්‍රහ නම් වජයෙහි සත්‍ථයෙහි නාවායෙහි සෙනසුන් නොලබන්නාහට ය ලැබුණි නම්. "ඉධ වස්සං උපෙමි,, යි වාක්භෙද ම කට යුතු යි.

---

හෝ පිරිසිඳිරුකින්; ගිලානමනුස්සානං වා, ගිලන්මිනිසුන්ට හෝ; අඤ්ඤෙසං වා, (නොගිලන් ඉසුරුමතුන් ආදී) අන්‍යයන්ට හෝ; ඵලං යාචන්තානං, ඵල යාච්ඤාකරන්නාවුන්ට; යථාපරිච්ඡෙදෙන, පිරිසිඳිපරිදි; චත්තාරි පඤ්ච ඵලානි, සතර පස් ඵලයෙක්; දාතබ්බානි, දිය යුතු. ඉතො, මෙයින්; ගහෙතුං, ගන්ට; ලබ්භන්ති, ලැබේ යයි; රුක්ඛා වා, රුක් හෝ; දස්සෙතබ්බා, දක්විය යුත්තාහ. ඉධ, මෙහි; ඵලානි, ඵලයෝ; සුන්දරානි, සොඳුරු වෙති; ඉතො, මේ ගසින්; ඵලං, ඵල; ගණ්හථ ඉති, ගනිව් යයි; එවං පන, මෙසේ වනාහි; න වත්තබ්බං, නො කිය යුතු.

"සචෙ ඉධ වස්සං වසිස්සාමීති ආලයො අත්ථි, අසතියා පන වස්සං න උපෙති, ඡින්නවස්සො න හොතීති පවාරෙතුඤ්ච ලබ්භති එව" * යනු මෙහි ටීකා යි.

"වස්සං උපගච්ඡන්තෙන හි නාලකපටිපදං පටිපන්නෙනාපි පඤ්චන්නං ඡදනානං අඤ්ඤතරෙන ඡන්නෙයෙව සවාරබන්ධෙ සෙනාසනෙ උපගන්තබ්බං. වුත්තං හෙතං: න භික්ඛවෙ අසෙනාසනිකෙන වස්සං උපගන්තබ්බං යො උපගච්ඡෙය්‍ය ආපත්ති දුක්කටස්සා ති. තස්මා වස්සකාලෙ සචෙ සෙනාසනං ලභති ඉච්චෙතං කුසලං, නො චෙ ලභති හත්ථකම්මං පරියෙසිත්වාපි කාතබ්බං, හත්ථකම්මං අලභන්තෙන සාමම්පි කාතබ්බං, නත්වෙව අසෙනාසනිකෙන වස්සං උපගන්තබ්බං. අයමනුධම්මතා" † යනු අටුවා යි.

* සචෙ, ඉදින්; ඉධ, මෙහි; වස්සං, වස්; වසිස්සාමි ඉති, වසන්නෙම්සි; ආලයො අත්ථි, ආලය ඇත්තේ ද; අසතියා පන, සිහි නො කිරීමෙන් වනාහි; වස්සං න උපෙති, වස් නො එළඹේ ද; ඡින්නවස්සො, සිඳුණුවස් ඇත්තේ: න හොති ඉති, නො වේ නු යි; පවාරෙතුං ච, පවරන්ට ද; ලබ්භති එව, ලබා ම ය.

† වස්සං උපගච්ඡන්තෙන හි, වස් එළඹෙන්නහු විසින් වනාහි; නාලකපටිපදං පටිපන්නෙන අපි, නාලකප්‍රතිපදාව පුරන්නහු විසින් වුවත්; පඤ්චන්නං ඡදනානං, පස්ආකාරඡදනයෙන්; අඤ්ඤතරෙන, එකකින්; ඡන්නෙ එව, වසනලද්දාවූ ම; සවාරබන්ධෙන, දොරඅගුලු සහිතවූ; සෙනාසනෙ, සෙනසුනෙක්හි; උපගන්තබ්බං, එළඹිය යුතු. "භික්ඛවෙ, මහණෙනි; අසෙනාසනිකෙන, සෙනසුන් නැත්තහු විසින්; වස්සං න උපගන්තබ්බං, වස් නො එළඹිය යුතු; යො, යමෙක්; උපගච්ඡෙය්‍ය, එළඹේ නම්; ආපත්ති දුක්කටස්ස ඉති, දුකුළා ඇවැත් වන්නේ ය යන" මේ සිකපදයෙන්; එතං, මේ කාරණය; වුත්තං හි, වදාරන ලද මැයි. තස්මා, එහෙයින්; වස්සකාලෙ, වස්සානකාලයෙහි; සචෙ, ඉදින්; සෙනාසනං, සෙනසුනක් ලභති, ලබා නම්; ඉති එතං කුසලං, මෙසේ මේ යෙහෙකි; චෙ, ඉදින්; නො ලභති, නො ලබා නම්; හත්ථකම්මං, හස්තකර්ම; පරියෙසිත්වා අපි, සොයා ද; කාතබ්බං, (සෙනසුන්) කළ යුතු; හත්ථකම්මං, අත්කම්; අලභන්තෙන, නොලබන්නහු විසින්; සාමං අපි, තමා විසින් වුවත්; කාතබ්බං, කළ යුතු; අසෙනාසනිකෙන, සෙනසුන්නැත්තහු විසින්; න තු එව වස්සං උපගන්තබ්බං, නො ම වස් එළඹිය යුතු. අයං අනුධම්මතා, මේ වත්‍ ති.

316 නොපෙතුකාමො ආවාසං තදහු'තික්කමෙය්‍ය වා
ගමෙය්‍ය දුක්කටාපත්ති ජානං වා'නුපගච්ඡතො.

317 දුතියං උපගච්ඡෙය්‍ය ඡින්නවස්සො'නුපාගතො
න පක්කමෙය්‍ය තෙමාසං අවසිත්වාන චාරිකං

318 මාතාපිතූනමත්ථාය පඤ්චන්නං සහධම්මීනං
ගිලානතදුපට්ඨාකභත්තමෙසිස්සමොසධං

319 පුච්ඡිස්සාමි උපට්ඨිස්සං ගච්ඡෙ, නාභිරතං අහං
වූපකාසෙස්සං කුක්කුච්චං දිට්ඨිං ගරුකමාදිකං.

320 කරිස්සං වා'පි කාරෙස්සං නොදනඤ්ච විවෙචනං
උට්ඨානං වා'පි උස්සුක්කං ගන්තුමිච්ඡෙවමාදිනා
ලබ්භං සත්තාහකිච්චෙන පහිතෙ'පහිතෙ'පි වා.

---

“පඤ්ච ඡදනානි නාම ඉට්ඨකාඡදනං සිලාඡදනං සුධාඡදනං තිණ ඡදනං පණ්ණච්ඡදනං.” * අනුධම්මතා නම් වනී.)

316 නොපෙතුකාමො, වස් නො එළඹෙනු කැමති ව; ආවාසං, වස් විසිය යුතු වෙහෙර; තදහු, ඒ (වස් වසන) දවස්; අතික්කමෙය්‍ය වා, (යම් මහණෙක්) ඉක්මවන්නේ නම්, (ඔහට ද) ජානං, වසෙළඹෙන දවස්බව) දැන දැන; අනුපගච්ඡතො වා, (වෙහෙර රැද වස්) නො එළඹෙනුවහට ද; දුක්කටාපත්ති, දුකුළා ඇවැත්; ගමෙය්‍ය, වන්නී යි.)

317 ඡින්නවස්සො, (පෙරවස්හි වසෙළඹැ) සුන්වස්වූයේ ද; අනුපාගතො, (කිසි අන්තරායකින් පෙරවස්හි) නො එළඹියේ ද; දුතියං උපගච්ඡෙය්‍ය, පස්වසන්හි වසෙළඹෙන්නේ යි, තෙමාසං, (වසෙළඹි) තුන්මස; අවසිත්වාන, නො වැස; චාරිකං, ගමන්; න පක්කමෙය්‍ය, (අකරණීය ව) නො යන්නේ යි.

318 319 320 මාතාපිතූනමත්ථාය, මවුපියන් පිණිස, පඤ්චන්නං සහධම්මීනං, පස් සහදම්මියන් පිණිස; ගිලානතදුපට්ඨාකභත්තං, ගිලනුන් හා ගිලන්මෙහෙකරුවන්ට බත් ද, ඔසධං, බෙහෙත් ද, එසිස්සං, සොයමි යි හෝ; පුච්ඡිස්සාමි, (සුවදුක්) විචාරමි යි හෝ,

---

* පඤ්ච ඡදනානි නාම, පස් ඡදනයෝ නම්:- ඉට්ඨකාඡදනං, උළුපියස්ස ය; සිලාඡදනං, ගල්පියස්ස ය; සුධාඡදනං, සුණුපියස්ස ය; තිණඡදනං, තණපියස්ස ය; පණ්ණච්ඡදනං, කොළපියස්ස ය; යන මේ පස් පියසි යි.

321 සඞ්ඝකම්මෙ වජෙ ධම්මසවණත්ථං නිමන්තිතො
ගරූහි පහිතො වා'පි ගරූනං වා'පි පස්සිතුං.

---

උපට්ඨිස්සං, (ගිලනුන්ට) මෙහෙ කොරෙම් යි හෝ; (සතිකරණින් හසුන් එව්ව නො එව්ව යන් වේ); අහං, මම්; ගන්ත්වා, ගොස්; අනභිරතං, (විසභාගරූපදර්ශනාදියෙන් සස්නෙහි) උකටලීවූවහු; වූපකාසෙස්සං, එනතින් අනික්තැනකට ගෙන යම් යි හෝ; කුක්කුච්චං, (පස් සඟද්ම්යන්ට උපන් විනය පිළිබඳ) කුකුස්; නොදනස්ව, දුරුකිරීම් ද; දිට්ඨිං, (ගත්) මිථ්‍යාදෘෂ්ටි; විවෙචනං, හැරවීම් ද; ගරුකං, සඟවෙසෙස්ඇවැත්; උට්ඨානාසඳවාපි, (පරිවාසදනාදීන්) නැගීම් ද; ආදිකං උස්සුක්කං, තර්ජනීයාදිකම් සන්හිඳුවන්නට උත්සාහ; කරිස්සං වා පි, කොරෙම් යි හෝ; කාරෙස්සං, කරවම් යි හෝ; ඉති, මෙසේ; එවමාදිනා, මේ ආදිවූ; සත්තාහකිච්චෙන; සත්තාහකරණීයයෙන්; ගන්තුං, යන්නට; පහිතෙ, (කැඳවා) එවූ කල්හි ද; අපහිතෙපි වා, (කැඳවා) නො එවූ කල්හි ද; ලබ්භං, වේ.

321 සඞ්ඝකම්මෙ, තමාගේ හෝ සෙසුනහුන්ගේ හෝ සෙනසුන් මහසෑ පිළිබඳ නවාංගීඈ කුදුමහත් කටයුත්තක් ඇතිකල්හි ද; ධම්ම සවණත්ථං, බණඅසන පිණිස; නිමන්තිතො, (අව මැනවි යි හෝ අසෝදවස් රැස්වුව මැනවැ යි කතිකාවසින් හෝ) නිමන්ත්‍රිතව ද; ගරූහි, ආචාර්‍ය්‍ය උපාධ්‍යායයන් විසින්; පහිතො වාපි, (විචරබොවනාදි පිණිස) යවනලද්දේ ද; ගරූනං, ආචාර්‍ය්‍ය උපාධ්‍යායයන්; පස්සිතුං වාපි, දක්නට ද; වජෙ, (සතිකරණින්) යන්නේ යි.

වස්සං උපගතෙනෙත්ථ අනිමන්තිතභික්ඛුනා
ධම්මස්ස සවණත්ථාය ගන්තුං පන න වට්ටති.

අසුකන්නාම දිවසං සන්නිපාතො භවිස්සති
ඉච්චෙවං කතිකා පුබ්බං කතා චෙ පන වට්ටති. *

---

* එත්ථ, මෙහි; වස්සං උපගතෙන, වස් එළඹියාවූ; අනිමන්තිත භික්ඛුනා, නිමන්ත්‍රණනොලත් මහණහු විසින්; ධම්මස්ස සවණත්ථාය පන, ධර්මශ්‍රවණය පිණිස වනාහි; ගන්තුං, යන්ට; න වට්ටති, නො වේ. චෙ පන, ඉදින් වනාහි; අසුකං නාම දිවසං, අසවල් නම් දවස්හි; සන්නිපාතො භවිස්සති ඉති, රැස්වීම වන්නේ යයි; එවං, මෙසේ; පුබ්බං, පළමුව; කතිකා, කතිකා තොමෝ; කතා කරන ලද්දී නම්, වට්ටති, වේ.

322 න භණ්ඩධොවනුද්දෙසඤාතුපට්ඨාකදස්සනෙ
ලබ්භං න පාපුණෙය්‍ය 'ජ්ජ වාගමිස්සනාති'දූරගො.

323 සෙසඤාතීහි පහිතෙ භික්ඛුනිස්සිතකෙන ච
උපාසකොපාසිකාහි නිද්දිසිත්වාව පෙසිතෙ.

324 වස්සච්ඡෙදෙ අනාපත්ති අන්තරායෙ සත'ත්තනො
සඞ්ඝසාමග්ගියා වා ඉනො ඡින්නවස්සො පවාරයෙ.

225 අජ්ඣොකාසෙ ච රුක්ඛස්ස සුසිරෙ විටපෙ'පි වා
ඡවකුටිඡත්තචාටීසූපගන්තුං න වට්ටති.

---

322 භණ්ඩධොවන, (තමාගේ) සිවුරු සේදීම පිණිය ද; උද්දෙස, බණ හැදෑරීම් පිණිස ද; ඤාතුපට්ඨාකදස්සනෙ, නෑයන් උපාසක ජනයන් දක්නා පිණිස ද; න (වජෙ, සත්තාහකරණීයයෙන්) නො යන්නේ යි; අජ්ජ ච, අද ම; ආගමිස්සනාති, (සිට නැවත) එමි යි අදූරගො, නුදුරු තැනට ගිය මහණ; න පාපුණෙය්‍ය, (ඉදින් වෙහෙරට) නො පැමිණියේ වී නම් (හෙවත්) අතරමග ම; අරුණු නැංගේ වී නම්; ලබ්භං, වටි. (වස්සච්ඡෙද හා රාත්‍රිච්ඡෙදදුක්කුළා නො වේ.)

323 සෙසඤාතීහි, (මව්පියන් මිස) සෙසු නෑයන් විසින් ද; භික්ඛුනිස්සිතකෙන ච, භික්ෂූන් නිසා ජීවත්වන්නහු විසින් ද; පහිතෙ, (ස්වාමීන් එනු කැමැත්තෙමි යනාදීන් කියා) එවූකල්හි ද; උපාසකොපාසිකාහි, (නොනෑ) උපාසක උපාසිකාවන් විසින්; නිද්දිසිත්වා ච, (දන් දෙනු කැමැත්තෙමි යනාදි යම්කිසි කාරණයක්) දක්වා ම; පෙසිතෙ, කියා එවූකල්හි ද; සතිකරණීන් යන්නට වටී.

324 අත්තනො, තමහට; අන්තරායෙ සති; (රාජචෞරාදි) අන්තරායක් ඇතිකල්හි ද; සඞ්ඝසාමග්ගියා වා; සඞ්ඝයා සමඟ නොව බිඳෙන කල්හි ද; වස්සච්ඡෙදෙ, වස්බිඳීමෙහි; අනාපත්ති, ආපත්ති නැති; ඡින්නවස්සො, සුන්වස්වූයේ; ඉනො පවාරයෙ, ඉනො පවරන්නේ යි. ("වසිසෙහි කටයුතුතාත්හි සතිකරණී වටි යෙහි. එකිංසකෙණෙහි" යනු මෙහි සනාථ යි.)

325 අජ්ඣොකාසෙ ච, අබවස්හි ද; රුක්ඛස්ස සුසිරෙ, ගස්සිදුරෙහි ද; විටපෙපි වා, වෙළෙප්හි ද; ඡවකුටී, සොහොන්කිළියෙහි ද; ඡත්ත, කුඩයෙහි ද; චාටිසු, සැළියෙහි ද; උපගන්තුං, වස එළඹෙන්ට; න වට්ටති, නො වටී. (වැව්තුනක් හිඳුවා මත්තෙහි ගල් ලෑහැල්ලකින් වසනලද්දී ඡවකුටි නමු.)

326 අසේනාසනිකෙනාපි උපගන්තුං න වට්ටති
පවාරෙතුඤ්ච ලභති නාවාසත්ථවජූපගෝ'ති.

---

"අවෙභඞ්ගියන්ති"-

327 ආරාමාරාමවත්ථූනි විහාරො තස්ස වත්ථු ච
මඤ්චො පීඨං භිසී බිම්බොහනාදිසයනාසනං.

328 ලොහකුම්භී කටාහො ච ලොහභාණකවාරකො
කුඨාරී වාසි ඵරසු කුද්දාලො ච නිඛාදනං

---

326 අසේනාසනිකෙනාපි, (සර්වප්‍රකාරයෙන්) සෙනසුන් නැත් තහු විසින් ද; උපගන්තුං, වසෙළඹෙන්ට; න වට්ටති, නො වටී; ("න භික්ඛවෙ අසේනාසනිකෙන වස්සං උපගන්තබ්බං, යනු විසිඹේ කොට අයිටන් කියුහ සෙත්" යනු විනයසන්නය යි.) නාවා, නැවිහි ද; සත්ථ, සත්වාහයෙහි ද; වජ, වජයෙහි ද; උපගො, වසෙ ළැඹියේ; පවාරෙතුඤ්ච, පවරන්නට ද; ලභති, ලැබේ. (වස්සච්ඡේදනිමිත්තම්වූ ආපත්ති ද නො වේ.

"වජෙ සත්ථෙ නාවායන්ති තීසු ඨානෙසු නත්ථි වස්සච්ඡෙදෙ ආපත්ති, පවාරෙතුඤ්ච ලභති"- * යනු අටුවා යි.)

---

"අවෙභඞ්ගියන්ති"

අවෙභඞ්ගියං යන්නෙහි ගරුභණ්ඩ නම්:

327 ආරාම, පුෂ්පාරාම ඵලාරාම ද; ආරාමවත්ථූනි, ආරාමභූමි ද; විහාරො, (ප්‍රාසාද දි) සෙනසුන් ද; තස්ස වත්ථු ච, ඒ විහාරය සම්බන්ධ භූමි ද; මඤ්චො, ඇඳ ද; පීඨං, පුටු ද; භිසී, (පඤ්චවිධ) භිසිහු ද; බිම්බොහනාදිසයනාසනං, කන්වයින් ඈ හෝනා හිඳිනාදු ද.

328 ලොහකුම්භී, ලොහොසැළි ද; කටාහො ච, ලොහොකටාරම් ද; ලොහභාණකො, ලොහොහැල ද; වාරකො, ලොහොකල ද; කුඨාරී, එකණවිටි ද; වාසි, වෑ ද; ඵරසු, පොරෝ ද; කුද්දාලො ච, කුදලු ද; නිඛාදනං, නියන් ද;

---

* වජෙ, ගාලෙහි ද; සත්ථෙ, සත්වාහයෙහි ද; නාවායං ඉති, නැවෙහි ද යන; තීසු ඨානෙසු, තුන් තැන්හි; වස්සච්ඡෙදෙ, වස්සිඳීමෙහි, ආපත්ති නත්ථි, ඇවැත් නො වේ. පවාරෙතුං ච, පවරන්නට ද; ලභති, ලබයි.

329 වල්ලි වෙළු තිණං පණ්ණං මුඤ්ජ බබ්බජ මත්තිකා
දාරුමත්තිකභණ්ඩානි පඤ්ච තෙ අවිභාජියා.
330 ථුල්ලච්චයං භාජයතො භාජිතා'පි අභාජිතා
ගරුභණ්ඩානි වුච්චන්ති එතෙ'විස්සජ්ජියානි ච

---

229 වල්ලි, (වේවැල්ආදී වැල් ද; වෙළු, (මහහුණආදී) හුණ ද; තිණං, (ඉලුක්ආදී ගේසෙයන) තණ ද; පණ්ණං, (තල්පත්ආදී) පත් ද; මුඤ්ජ, මුදුතණ ද; බබ්බජ, බබුස් තණ ද; මත්තිකා, මැටි ද; දාරුමත්තිකභණ්ඩානි, දාරුභාණ්ඩමත්තිකාභාණ්ඩ ද; (යන) එතෙ පඤ්ච, මේ පඤ්ච රාශීහු; අවිභාජියා, (සඞ්ඝ ගණ පුද්ගලයන් විසින්) නො බෙදිය යුත්තාහු යි.

("විසඞ්ගහානි වෙ හොන්ති තතියං චතුසඞ්ගහං
චතුත්ථං නවකොට්ඨාසං පඤ්චමං අට්ඨභෙදනං.
ඉති පඤ්චහි රාසීහි පඤ්චනිම්මලලොචනො
පඤ්චවීසවිධං නාථො ගරුභණ්ඩං පකාසයි" *
"මංසදිබ්බධම්මබුද්ධසමන්තචක්ඛුවසෙන පඤ්චලොචනො" †)

330 භාජයතො, බෙදන්නාහට; ථුල්ලච්චයං, ථුලැයි වෙයි; භාජිතාපි, බෙදනලද්දාහු දු; අභාජිතා, නො බෙදනලද ඉවත්; එතෙ, මොහු; ගරුභණ්ඩානි, ගරුභාණ්ඩයහ යි ද; අවිස්සජ්ජියානි ච, නො දිය යුත්තාහ යි ද; (ච ශබ්දයෙන් අවෙභඩියහ යි ද;) වුච්චන්ති, කියනු ලැබෙත්.

---

* වෙ, ප්‍රථමද්විතීයගරුභාණ්ඩයෝ; විසඞ්ගහානි, කොටස් දෙකින් දෙකින් යුක්තවූවාහු; හොන්ති, වෙති; තතියං, තෙවෙනි ගරුභාණ්ඩය; චතුසඞ්ගහං, සතරකොටසකින් යුක්ත වේ; චතුත්ථං, සතරවෙනි ගරුභාණ්ඩය; නවකොට්ඨාසං, නවකොටසකින් යුක්ත වේ; පඤ්චමං, පස්වෙනි ගරුභාණ්ඩය; අට්ඨභෙදනං, අටකොටසකින් යුක්ත වේ; ඉති, මෙසේ; පඤ්චහි රාසීහි, පස් රැසකින් යුක්තවූ; පඤ්චවීසවිධං ගරුභණ්ඩං, පස්විසිආකාරවූ ගරුභාණ්ඩය; පඤ්චනිම්මලලොචනො, පස්ආකාරනිර්මලඇස්ඇති; නාථො, සර්වඥයන් වහන්සේ; පකාසයි, ප්‍රකාශකළ සේක.

† මංසදිබ්බධම්මබුද්ධසමන්තචක්ඛුවසෙන, මස්ඇස්දිවඇස්දහම්ඇස්බුදුඇස්සමතැස්වසයෙන්; පඤ්චලොචනො පස්ඇස්ඇතියේ යි.

331 වල්ලිද්ධබාහුමත්තා'පි වෙළු අට්ඨඞ්ගුලායතා
තිණාදි මුට්ඨිමත්තම්පි පණ්ණමෙකම්පිමත්තිකා.

332 පාකතා පඤ්චවණ්ණා වා සුධා කුඩකුට්ඨආදිකා
තාලපක්කප්පමාණා'පි දින්නා වා තත්ථ ජාතකා

333 රක්ඛිතා සංඝිකා රජ්ජුයොත්තාදි ච අභාජියා
භාජියා නිට්ඨිතෙ කම්මෙ සඞ්ඝිකෙ චෙතියස්ස වා.

334 පත්තාදිං භික්ඛුසාරුප්පං තථා විප්පකතාකතං
භාජියං ලොහභණ්ඩසු වාරකං පාදගණ්හකං

---

331. 332 333 අද්ධබාහුමත්තාපි, අඩබාහුවක් * පමණ ද වූ; වල්ලි, වැල් ද; අට්ඨඞ්ගුලායතා, අටඟුලක්දිගඇති; වෙළු, (පන්හිත්දඬක් පමණ ද; වූ) හුණ ද; මුට්ඨිමත්තම්පි, මිටක්පමණ ද වූ; තිණාදි, (ශේසොයන) තණ හා "ආදි" ශබ්දයෙන් ගත් මුදුතණ බබුස්තණ ද; එකම්පි, එක ද; පණ්ණං, (තල්පත්ඇ) පතෙක් ද; තාලපක්කප්පමාණා අපි, තල්පක්කපමණ ද වූ; පාකතා, පියවි හෝ; පඤ්චවණ්ණා වා, (නීල්ඇ) පස්වනක් පැඇති හෝ; මත්තිකා, මැටි ද; සුධා, සුණු ද; කුඩ්කුට්ඨආදිකා, කොකටු සඳෙලමලඇ ද; (යන මොහු) දින්නා වා, සඟහට දෙනලද්දහු හෝ; තත්ථ ජාතකා, සංඝිකභූමියෙහි උපන්නාහු හෝ, රක්ඛිතා, රක්නාලද්දහු ම; අභාජියා, නො බෙදිය යුත්තාහු යි; සංඝිකා, සඟසතුවූ; රජ්ජු, (හූනියඳ කොස්සෙන් කළ) රැහැණ ද; යොත්තාදි ච, (සමින් කළ) යොත්ආදිහු ද; (අභාජියා) නො බෙදිය යුත්තාහු යි; සංඝිකෙ කම්මෙ, සඟසතු කට යුතු ද; චෙතියස්ස වා, චෛත්‍යසන්තක කට යුතු ද; නිට්ඨිතෙ, නිමිකල්හි; භාජියා, බෙදිය යුත්තාහු යී.

("අඩ්ඪබාහූති කප්පරතො පට්ඨාය යාව අංසකූටා විදත්ථිචතුරඞ්ගුලං" + යොත්තාදි යන්නෙහි "ආදි" ශබ්දයෙන් තියඳින් කොස්සෙන් කළ එක් වැලරැහැණ ගත්හු )

334 ලොහභණ්ඩසු, ලොහභාණ්ඩයෙහි; භික්ඛුසාරුප්පං, මහණුන්ට සරුප්වූ; පත්තාදිං, පාත්‍රා (තළ) ආදී ද; තථා, එසේම, විප්පකත, කොට නො නිමි ලොහොබඩු ද; අකතං, යපලුඇ නො කළ ලොහොබඩු ද; පාදගණ්හකං, මගධනැළියෙන් පස්නැළියක් තෙල්ගන්නා; වාරකං, කළය ද; භාජියං, බෙදිය යුත්තේ යි.

---

+ අඩබාහු ඉති, අඩබාහු නම්:- කප්පරතො පට්ඨාය, වැලමිට පටන්; යාව අංසකූටා, උරහිස දක්වා; විදත්ථිචතුරඞ්ගුලං, එක්වියත්සතරඟුල්ප්‍රමාණී.

* අඩබඹයක්. පොත්

335 වෙළුම්හි භාජියා තෙලනාළි කත්තරදණ්ඩකො
ඡත්තදණ්ඩසලාකායො තථොපාහනදණ්ඩකො

336 අනුඤ්ඤාතවාසිදණ්ඩා කරණ්ඩා පාදගණ්හකො
අරණිසජ් නිසිඛාදිභික්ඛූපකරණං තථා

337 තච්ඡිතානිට්ඨිතං දාරුභණ්ඩං දන්තංච භාජියං
භික්ඛූපකරණෙ පාදඝටකො මත්තිකාමයො.

338 භාජියං කප්පියං චම්මං තෙලචම්මමභාජියං
ගරුනා ගරුභණ්ඩංච ථාවරං ථාවරෙන ච

339 ථාවරං පරිවත්තෙය්‍ය තථා කත්වා ච භුඤ්ජතු
වල්ලාදිං ඵාතිකම්මෙන ගණ්හෙ සෙසමභාජියන්ති,

---

335 වෙළුම්හි, වෙළුයෙහි; තෙලනාළි, තෙල්නැළි; භාජියා; බෙදිය යුත්තී ය; කත්තරදණ්ඩකො, සැරයටිය ද; ඡත්තදණ්ඩසලාකායො, සැත්දඬු හා ගොනැස් ද; උපාහනදණ්ඩකො, වහන්ඝොක්ක ද; තථා, එසේ මැ යි.

336 අනුඤ්ඤාතවාසිදණ්ඩා, (කරවියල්ලෙහි ලා පරිහරණ කට හැකි) අනුදත් වෑයෙහි දණ්ඩ ද; පාදගණ්හකො, පාදයක් තෙල් ගන්නා; කරණ්ඩා, කරඬුව ද; අරණිසජ් නිසිඛාදි, අරණිගාණ්ඩ අඳුන්නළ තෙල්හං ආදිවූ; භික්ඛූපකරණං, මහණපිරිකර ද; තථා, එසේ ම; (බෙදිය යුත්තේ යි,)

337 තච්ඡිතානිට්ඨිතං, සැස නො නිමන ලද; දාරුභණ්ඩං, දාරු භාණ්ඩ ද; දන්තංච, (නො සැසී හෝ කොට නො නිමි හෝ) දළ ද; භාජියං, බෙදිය යුත්තේ යි; භික්ඛූපකරණෙ, මහණපිරිකරෙහි; මත්තිකාමයො, මැටිමුවාවූ; පාදඝටකො, පාදයක් තෙල් ගන්නා, කළය; (බෙදිය යුත්තේ යි,)

338 339 කප්පියං චම්මං, කැපසම්; භාජියං, බෙදිය යුත්තේ ය, තෙලචම්මං, තෙලිසම්, අභාජියං, නො බෙදිය යුත්තේ ය; ගරුනා; (මඤ්චපීඨාදි) ගරුභාණ්ඩයෙන්; ගරුභණ්ඩංච, (මඤ්චපීඨාදි) ගරු භාණ්ඩ ද; ථාවරං ච, (ආරාමාදි) ථාවරය ද; පරිවත්තෙය්‍ය, පෙරළි කරන්නේ ය; ථාවරෙන ච, (ආරාමාදි) ථාවරයෙන් වනාහි; ථාවරං, (ආරාමාදි) ථාවරය ම, (පෙරළි කරන්නේ යි) තථා කත්වා ච, එසේ (පෙරළි) කොට ද; (ලද කැප පසය) භුඤ්ජතු, වළඳුවා; වල්ලාදිං, වැල්හුණුආදි, ඵාතිකම්මෙන්, වැඩකමින්; ගණ්හෙ, ගන්නේ ය; සෙසං, (ආරාමාදි) සෙස්ස; අභාජියං, නො බෙදිය යුත්තේ යි.

"පකිණ්ණකකථා"-

340 සවාරබන්ධනෙ ඨානෙ සොදුක්ඛලකපාසකෙ
සයන්තෙන දිවා වාරං බන්ධියං පරිවත්තකං.

341 විඤ්ඤුම්හි පුරිසෙ සන්තෙ ආභොගො වාපි කප්පති
සචෙ'ස තං විනා'කාරං සයන්තො දුක්කටං ඵුසෙ.

342 රතනානිත්ථිරූපානි ධඤ්ඤමිත්ථිපසාධනං
තුරියාවුධභණ්ඩානි ආමසන්තස්ස දුක්කටං.

---

("පාතිකාමිසං නාම සමකං වා අතිරෙකං වා කඳඹසන්තානං; එ වස්නා මල හෝ විඩා දිම හෝ පාතිකාමී නම්. ඒ මැසිපුටු ඇ සඟහට දෙමි යි කල ගුරුබඩු වෙයි. නො බෙදිය යුතු. සඟින් පිට මැඳුත්තිබැවින්, මේ සඟ් ගිමියනට වෙසෙහිනි ගණිනට දෙමි යි කල ගුරුබිහිගොතුප් කෙපෙවත බෙදේයි වෙසෙහිනි ගණිති වටි යි ද ඒකීවසෙසිනි කරති දෙස නැත අයපව්ත බෙදේයි ගත නො ලැබෙයි. මේ මැසිපුටු වෙසෙහිනි ගණිනට සඟහට දෙමි යි කී දෙස නැති. පලම්සඟිහිපෙරෙම්පිඛීසායිකල ගුරුබඩු වෙයි" යනු කංඛාවිතරණී ගැටපද යි.)

---

පකිණ්ණකකථා,-

පකිණ්ණකං යන්නෙහි (සංකිණ්ණීය නම්:)

340 සවාරබන්ධනෙ, දොර හා දොරබා ඇති; සොදුක්ඛලකපාසකෙ, වටෙවූ උතුරුලී ඇති; ඨානෙ, (සෙනසුන් අබවස්ඇ) තැන්හි: දිවා, දහවල්; සයන්තෙන, හෝනහු විසින්; පරිවත්තකං, පිරිවැටෙන; වාරං, දොර; බන්ධියං, පියාළිය යුත්තේ යි.

341 විඤ්ඤුම්හි පුරිසෙ, (නො නිදන ආරාමික සාමණේරාදි විඤ්ඤු පුරුෂයකු; සන්තෙ, (සමීපයෙහි) ඇතිකල්හි; ආභොගො වාපි, (මොහු මා රකිති යන) ආභොගය ද; කප්පති, වටී; සචෙස. තස්ස ඉසුරු පවත්නා තන්හි; තං ආකාරං විනා, (දොරපියවීම ආභොගකිරීම ය. යන) ඒ ආකාර නැතිව; සයන්තො, හෝනේ; දුක්කටං ඵුසෙ, දුකුලා ඇවිදනේ යි ("බැස හෝනා කල්හි දොර පියයි දොර නිසයිම්හෙවැ දොර තස්සා ම වරිති වටී" යනු අටුවාසනා යි.)

342 රතනානි, දශවිධරත්න ද; ඉත්ථිරූපානි, (දරුදෙල හමනාදි) මාගම්රූ ද; ධඤ්ඤං, (සප්තවිධ) ධාන්‍ය ද; ඉත්ථිපසාධනං, පිළිපත් සුදුඇ) මාගවිපළඳනා ද; තුරියාවුධභණ්ඩානි, (පිඹිනා සක්සුලල්

343 සිත්ථතෙලොදතෙලෙහි ඵණහත්ථඵණකෙහි වා
කොච්ඡෙන වාපි යො කෙසෙ ඔසණ්ඨෙය්‍යස්ස දුක්කටං.
344 න එකපාවුරණා එකත්ථරණා වා තුවට්ටයුං
තථෙකකංසෙව භුඤ්ජෙය්‍යුං එකස්මිං වාපි භාජනෙ.

---

බෙරඅෑ) තූර්යභාණ්ඩ හා (කඩු කාල් දුනු හීදඹු අෑ) ආයුධභාණ්ඩ ද ආමසන්තස්ස, (දුන දුන) අතින් ගත්තාහට, දුක්කටං, දුකුළා වේ.

(සුවණ්ණපටිමංවාපි චෙතියං හාරකූටකං
අනාමාසන්ති නිද්දිට්ඨං කුරුන්දට්ඨකථාය හි. *

ඉත්ථිසණ්ඨානෙන කතං යන තත්හි තිරච්ඡානගත මාගම් රුවිසි යටතින් පරිජෙපාහොනා නිසින්ගිරිමාගමුන් ද අනාමාස බැවින් ඒ පියලින්මැ සටන්වූ මාගම්රූ අනාමාස යි. මාගම්පැවිජියන් පිළිම කොළොත් දෙස් නැති යේත් ඇදුරෝ. මාගම්රූ ඇති පිළිජ බිත්ජී ඇතිරිළිජ මාගම්රූවිති නො ගෙන ගනුත් වටී. මාගම්කෙ ළබිරෙහි සෙතින් පැහැර පසුල්ගෙන යනබැවින්මඹුහතියෙ ජිතියි කිසිවෙකින් ඔවයි විභිජීවිය යුතුය,, යනු විනය සන්‍ය යි. රන්රිදී පබළු ආදිය කළ දගැප් පිළිමයෙහි කසල හරනට ද මොහරපිළින් පිසිනට ද වටී )

343 සිත්ථතෙලොදතෙලෙහි, හිටිමුසුතෙලින් දියමුසුතෙලින් හෝ; ඵණහත්ථඵණකෙහි වා, දත්තාමයාදී පෙණෙන් හා අත්පෙණ යයි කියනලද ඇඟිල්ලෙන් හෝ; කොච්ඡෙන වාපි, කොස්සෙන් හෝ; යො යමෙක්; කෙසෙ, කෙසයන්; ඔසණ්ඨෙය්‍ය, (අලඞ්කාර පිණිස මට්ට කොට) නමා නම්; අස්ස, ඔහට; දුක්කටං, දුකුළා වේ. (තිවී සිටි කෙස් තෙත්අතින් මට කොට තොවා නම් වරද නැති.)

(කොච්ඡන්ති උසීරමයං වා මුඤ්ජබබ්බජමයං වා. †)

344 එකපාවුරණා වා, එකක් පෙරව හෝ; එකත්ථරණා වා, එකක් අතුට හෝ; එකමඤ්චෙ වා, එක ඇඳක හෝ; තුවට්ටයුං, දෙදෙනෙක් හොවිත් නම්; න, නො වටී; (දුකුළා වේ) එකස්මිං භාජනෙ වාපි, එක් වළඳක හෝ, භුඤ්ජෙය්‍යුං, (දෙදෙනෙක්) වළඳත් නම්; තථා, එසේ ම (නො වටී.)

---

* සුවණ්ණපටිමං ච අපි, රන්පිළිම ද; හාරකූටකං චෙතියං, හරකූඵ්ඛැය ද; (හරකුලු නම් රසකතාම්‍රිශ්‍රණයෙන් වූ ලෝහයෙකි) අනාමාසං ඉති, නො ඇල්ලිය යුතු යයි, කුරුන්දට්ඨකථාය හි, කුරුන්දිය අටුවාහි, නිද්දිට්ඨං, දක්වන ලදී.

† කොච්ඡන්ති, කොස්ස නම්; උසීරමයං වා, සුවඳ හොවින් කළාවූ හෝ; මුඤ්ජබබ්බජමයං වා, මුදුතණින් බබුස් තණින් කළාවූ හෝ (කොස්ස) යි.

345 චතුරඞ්ගුලතො ඌනං අධිකට්ඨඞ්ගුලං තථා
දන්තකට්ඨං න ඛාදෙය්‍ය ලසුණං න අකල්ලකො.

---

345 චතුරඞ්ගුලතො ඌනං, (වඩු අඟුලින්) සතරඟුලකින් ඌනවූ; තථා, එසේ ම; අධිකට්ඨඞ්ගුලං, අටඟුලකින් වැඩියාවූ; දන්තකට්ඨං, දැහැටි; න ඛාදෙය්‍ය, නො කන්නේ ය; අකල්ලකො, නොගිලන් මහණ; ලසුණං, (අමුමගධ) ලූණු; න ඛාදෙය්‍ය, (කෙවල කෙව) නො කන්නේ යි.

(මගධරට උපන් භණ්ඩිකලූණු ම මෙහි ලසුණ යයි ගන්න ලදී. භණ්ඩිකලසුණ නම් සතරමිජ්ජෙයහි පටන් බොහෝ මිජ් ඇත්තේ යි. පලණ්ඩුකභඤ්ජනකාදිලසුණයෙහි මගධරට උපන්ද දොස් නැති.

“මගධරට්ඨෙ ජාත ලසුණමෙව හි ඉධ ලසුණන්ති අධිප්පෙතං. තම්පි භණ්ඩිකලසුණමෙව, න එකද්විතිමිඤ්ජකං—පලණ්ඩුකාදීනං වණ්ණතො වා මිඤ්ජාය වා නානත්තං වෙදිතබ්බං, වණ්ණතො තාව, පලණ්ඩුකො නාම පණ්ඩුවණ්ණො හොති, භඤ්ජනකො ලොහිතවණ්ණො, හරිතකො හරිතපණ්ණවණ්ණො, මිඤ්ජාය පන පලණ්ඩුකස්ස එකා මිඤ්ජා හොති. භඤ්ජනකස්ස ද්වෙ, හරිතකස්ස තිස්සො, චාපලසුණො අමිඤ්ජකො, අංකුරමත්තමෙව හි තස්ස හොති මහාපච්චරියාදිසු පන පලණ්ඩුකස්ස තීනි මිඤ්ජානි, භඤ්ජනකස්ස ද්වෙ, හරිතකස්ස එකාන්ති වුත්තං, එතෙ පලණ්ඩුකාදයො සභාවෙනෙව වට්ටන්ති, සූපසම්පාකාදිසු පන මාගධකම්පි වට්ටති, තංහි පච්චමානෙසු මුග්ගසූපාදිසු වා මච්ඡමංසවිකතියා වා තෙලෙ වා බදරසාළවාදිසු වා අම්බිලසාකාදිසු වා උත්තරිභඞ්ගෙසු වා යත්ථ කත්ථචි අන්තමසො යාගුභත්තෙපි පක්ඛිත්තං වට්ටති,, * යනු අටුවායි.

---

* මගධරට්ඨෙ ජාතලසුණං එව හි, මගධරට උපන් ලූණු ම වනාහි; ඉධ, මේ සික්ඛාපදයෙහි; ලසුණං ඉති, ලසුණ යනුවෙන්; අධිප්පෙතං, අදහස් කරන ලදී. තං අපි, එය ද; භණ්ඩිකලසුණං එව, භණ්ඩික නම් ලූණු මැ යි. න එකද්විතිමිඤ්ජකං, එක්මිදුලු (බික්) දෙමිදුලු තුන්මිදුලු ඇත්තේ නො වේ. – පලණ්ඩුකාදීනං, පලණ්ඩුක නම් ලූණුආදීන්ගේ; වණ්ණතො වා, වර්ණයෙන් හෝ; මිඤ්ජාය වා, මිදුලින් හෝ; නානත්තං, වෙනස; වෙදිතබ්බං, දතයුතු. වණ්ණතො තාව, වර්ණයෙන් වනාහි; පලණ්ඩුකො නාම, පලණ්ඩුක නම් ලූණු; පණ්ඩුවණ්ණො හොති' පඬුවන් වේ. භඤ්ජනකො, භඤ්ජනක නම් ලූණු; ලොහිතවණ්ණො ලේවන් වේ. හරිතකො, හරිතක නම්

346 හීනුක්කට්ඨෙහි උක්කට්ඨං හීනං වා ජාතිආදිහි
උජුං වා'ඤ්ඤාපදෙසෙන වදෙ දුබ්භාසිතං දවා.

---

346 හීනුක්කට්ඨෙහි, හීනඔකටුවූ; ජාතිආදිහි, ජාතිනාමගොත්‍රාදීන්; උක්කට්ඨං, ඔකටුවූ හෝ; හීනං වා, හීන්වූ හෝ (යම් කිසි එක්හට) උජුං වා ("චණ්ඩාලොසි" යනාදීන්) ඉදුරා හෝ; අඤ්ඤාපදෙසෙන, ("සන්ති ඉධෙකච්චෙ චණ්ඩාලා" යනාදීන්) පරියායෙන් හෝ, දවා, (හුදෙක්) කෙළිනාඅදහසින්; වදෙ, කියා නම්; දුබ්භාසිතං, දුබ්බැසිඇවැත් වේ.

---

ලුණු; හරිතපණ්ණවණ්ණා, නිල්කොළවන් වේ. මිඤ්ජාය පන; මිදුළින් (දුනීම) වනාහි; පලණ්ඩුකස්ස, පලණ්ඩුකයාගේ. එකා මිඤ්ජා හොති; එක් මිදුලෙක් වේ. භඤ්ජනකස්ස, භඤ්ජනකයාගේ; වෙ, දෙමිදුලෙක් වේ. හරිතකස්ස, හරිතකයාගේ; තිස්සො, තුන් මිදුලෙක් වේ; චාපලසුණො, චාප නම් ලුණු; අමිඤ්ජකො, මිදුලු නැත්තේය; තස්ස හි, ඔහුගේ වනාහි; අංකුරමත්තං එව, අංකුරමාත්‍රයෙක් ම; හොති, වේ. මහාපච්චරියාදිසු පන, මහාපච්චරියාදි අටුවායෙහි වනාහි; පලණ්ඩුකස්ස, පලණ්ඩුකයාගේ; තිස්සො මිඤ්ජා, තුන්මිදුලෙක; භඤ්ජනකස්ස; භඤ්ජනකයාගේ; වෙ, දෙමිදුලෙක; හරිතකස්ස, හරිතකයාගේ; එකා ඉති, එක්මිදුලෙකැයි. වුත්තං, කියන ලදී. එතෙ පලණ්ඩුකාදයො, මේ පලණ්ඩුකාදීහු; සභාවෙන එව, ස්වභාවයෙන් මැ; හෙවත් සූපාදියෙහි ලා පිසීමෙන් තොරව මත්; වට්ටන්ති, වටිත්. සූපසම්පාකාදිසු පන, සූපාදියෙහි ලා පිසීමෙහි වනාහි; මාගධකං අපි, මගධරට උපන් ලුණු ද. වට්ටති, වටී. තං හි, ඒ වනාහි; පච්චමානෙසු, පැසෙන්නාවූ; මුග්ගසූපාදිසු වා, මුගසූපාදියෙහි හෝ; මච්ඡමංසවිකතියා වා, මසාමස්විකෘතියෙහි හෝ; තෙලෙ වා, තෙලෙහි හෝ; බදරසාළවාදිසු වා, බදරසාල්වාදියෙහි හෝ; (බදර සාල්වා හෝ බදරසාල්ව) යනු ඩෙබරපල වියළා සුණු කොට කළ ව්‍යඤ්ජනවිකෘතියෙක් හෝ බාද්‍යවිකෘතියෙක් ල.) අම්බිලසාකාදිසු වා, ඇඹුල්පලාආදියෙහි හෝ; උත්තරිභඞ්ගෙසු වා, අග්‍රඵලයෙහි හෝ; යාගු යක්ෂ කාළවි, යම් කිසිවෙක්හි; අන්තමසො, යටත්පිරිසෙයින්; භත්තෙ අපි, කැඳබත්හි ද; පක්ඛිත්තං, බහාලන ලද්දේ; වට්ටති, වටී.

347 දීඝෙ නඛෙ ච කෙසෙ වා නාසාලොමෙ න ධාරයෙ
න ලබ්භා වීසතිමට්ඨං සම්බාධෙ ලොමහාරණං.

348 යථාවුඩ්ඪං න බාධෙය්‍ය සඞ්ඝුද්දිට්ඨං ච සඞ්ඝිකං
අධොතඅල්ලපාදෙහි න’ක්කමෙ සයනාසනං
සුධොතපාදකං වා’පි තථෙව සවුපාහනො.

347 දීඝෙ නඛෙ වා, (මසින් ඉහිරිවූ) දික් නිය ද; කෙසෙ වා, (දෙමසින් හෝ දුගුලෙන් හෝ වැඩි) දිග් කෙස් ද; නාසාලොමෙ, නැහැ (යෙන් පිටත් ව පැනෙන දික්) ලොම් ද; න ධාරයෙ, නො දරන්නේ යි; වීසතිමට්ඨං; විසිනියපොතු (ඔප් නගා) මට කිරීම් ද; සම්බාධෙ, පිළිසන්ස්ථානයෙහි; ලොමහාරණං, ලොම් හැරීම් ද; න ලබ්භා, නො වටී. (පුවක්ලෙඩිආදීන් නියමල හැර සුදු කරත් කැපුතැන්හි කොරොස් හරුත් වටී.

“සම්බාධෙ’ති පටිච්ඡන්නොකාසෙ, තස්ස විභාගදස්සනත්ථං පන උභො උපකච්ඡකා මුත්තකරණන්ති වුත්තං,,* යනු අටුවා යි. ගඩ පොළ ඈ ආබාධයක් ඇත ලොම් හරුත් වටී.)

348 සඞ්ඝුද්දිට්ඨං වා, සඞ්ඝයා උදෙසනලද හෝ; සඞ්ඝිකං වා, සඟ සතු හෝ; (මිඩු ඇතිරිලි හැඳා පුටු ඈ සෙනසුන්) යථාවුඩ්ඪං, සඟම්හලු පිළිවෙළ; න බාධෙය්‍ය, නො වළකන්නේ යි; අධොතඅල්ලපාදෙහි නොදෙව්පයින් හෝ තෙත්පයින් හෝ; සයනාසනං, (පිරියම්කළ බුමුතුරුණු ඈ) සෙනසුන්; න අක්කමෙ, නො ඇක්මෙන්නේ යි, සුධොතපාදකංවාපි, දෙව්පයින් ම ඇක්මියයුතු තැනුදු; සවුපාහනො, පයලු වහන් ඇති ව; තථෙව, එසේ ම (නො ඇක්මෙන්නේ) යි; (ආගන්තුකයන් සැතපෙන සඳහා සපයා දෙන ලද තමන් සතු චම්මඛණ්ඩ පාවාර කොජව කටසාරාදි ඇතිරිරුක්ඛමූලාදි සඞ්ඝුද්දිට්ඨ නමි

“තෙන ඛො පන සමයෙන මනුස්සා සඞ්ඝං උද්දිස්ස මණ්ඩපෙ පටියාදෙන්ති, සන්ථාරෙ පටියාදෙන්ති, ඔකාසෙ පටියාදෙන්ති, ඡබ්බග්ගියානං භික්ඛූනං අන්තෙවාසිකා භික්ඛූ සඞ්ඝිකං යෙව භගවතා යථාවුඩ්ඪං අනුඤ්ඤාතං නො උද්දිස්ස කතන්ති බුද්ධපමුඛස්ස සඞ්ඝස්ස පුරතො පුරතො ගන්ත්වා මණ්ඩපෙ පරිග්ගණ්හන්ති

* සම්බාධෙ ඉති, සම්බාධයෙහි යනු; පටිච්ඡන්නොකාසෙ, පිළිසන්ස්ථානයෙහි ය; තස්ස, ඔහුගේ; විභාගදස්සනත්ථං පන, විභාග දක්වනු පිණිස වනාහි; උභො උපකච්ඡකා, දෙකිහිලි ය; මුත්තකරණං ඉති, නිමිත්තප්‍රදෙශ ය යි; වුත්තං කියන ලදී;

සන්ථාරෙ පරිගණ්හන්ති ඔකාසෙ පරිගණ්හන්ති ඉදං අම්හාකං උපජ්ඣායානං භවිස්සති ඉදං අම්හාකං ආචරියානං භවිස්සති ඉදං අම්හාකං භවිස්සතීති=පෙ=න භික්ඛවෙ උද්දිස්ස කතම්පි යථාවුඩ්ඪං පටිබාහෙතබ්බං යො පටිබාහෙය්‍ය ආපත්ති දුක්කටස්ස,, * යනු පෙළ යි.

"යදි පන තත්‍ථ නෙවාසිකා අනත්‍ථතාය පි භූමියා ඨපෙන්ති අධොතපාදෙහි පි වලඤ්ජන්ති තථෙව වලඤ්ජිතුං වට්ටන්ති,, † යනු අටුවා යි.

"නෙවාසිකා පකතියා අනත්‍ථතාය භූමියා ඨපෙන්ති චෙව, තෙසම්පි අනාපත්ති යෙව. වාරවාතපානාදයො අපරිකම්මකතා'පි න අපස්සයිතබ්බා,, + යනු විනයසන්නය යි.)

---

*** එතෙන ඛො පන සමයෙන, එකල්හි වනාහි; මනුස්සා, මිනිස්සු; සංඝං උද්දිස්ස, සංඝයා උදෙසා; මණ්ඩපෙ පටියාදෙන්ති, මණ්ඩප පිළියෙල කෙරෙති. සන්ථාරෙ පටියාදෙන්ති, ඇතිරි පිළියෙල කෙරෙති. ඔකාසෙ පටියාදෙන්ති, ස්ථාන පිළියෙල කෙරෙති. ඡබ්බග්ගියානං භික්ඛූනං, සවග මහණුන්ගේ; අන්තෙවාසිකා භික්ඛූ, අතවැසිමහණහු; භගවතා, බුදුන් විසින්; සංඝිකං එව, සඟසතු සෙනස්න ම; යථා බුඩ්ඪං අනුඤ්ඤාතං, මහලු පිළිවෙළින් අනුදන්නා ලද්; උද්දිස්ස කතං, උදෙසා කළ සෙනස්න; නො ඉති, නො අනුදන්නා ලද්ද යි; බුඩපමුඛස්ස සංඝස්ස, බුදුපාමොක් සංඝයාට; පුරතො පුරතො ගන්ත්වා, පෙරටු ව පෙරටු ව ගොස්; මණ්ඩපෙ පරිගණ්හන්ති, මණ්ඩප අයත් කෙරෙති. සන්ථාරෙ; පරිගණ්හන්ති, ඇතිරි අයත් කෙරෙති. ඔකාසෙ පරිගණ්හන්ති, ස්ථාන අයත් කෙරෙති. ඉදං අම්හාකං. උපජ්ඣායානං භවිස්සති, මේ අපගේ උපාධ්‍යායයන්ට වන්නේ යැ. ඉදං අම්හාකං ආචරියානං භවිස්සති, මේ අපගේ ආචාර්‍ය්‍යයන්ට වන්නේ ය. ඉදං අම්හාකං භවිස්සති ඉති, මේ අපට වන්නේ යයි. -පෙ- භික්ඛවෙ, මහණෙනි; උද්දිස්ස කතං අපි, උදෙසා කළ සෙනස්න ද; යථා බුඩ්ඪං, මහලු පිළිවෙළ; න පටිබාහෙතබ්බං, නො වැළැක්විය යුතු; යො, යමෙක්; පටිබාහෙය්‍ය, වළකා නම්; ආපත්ති දුක්කටං අස්ස, (ඔහුට) දුකුළා ඇවැත් වේ.**

**† යදි පන, ඉදින් වනාහි; තත්‍ථ, එහි; නෙවාසිකා, නිවැසි මහණහු; අනත්‍ථතාය අපි භූමියා, නොඇතුළ බිම ද; ඨපෙන්ති, (පිරිකර) තබත් ද; අධොතපාදෙහි අපි, නොදෙවූපයින් ද; වලඤ්ජන්ති, වළඳත් ද; තථා එව, එසේ ම; වලඤ්ජිතුං, වළඳන්ට; වට්ටන්ති, වටී.**

**+ නෙවාසිකා, නිවැසි මහණහු; පකතියා, පියවින්; අනත්‍ථතාය භූමියා, නොඇතුළ බිම; ඨපෙන්ති එව, ඉදින් තබත් නම්; තෙසං අපි,**

319 සඞ්ඝාටියා න පල්ලත්ථෙ භිත්තාදිං න අපස්සයෙ,
පරිකම්මකතං සන්තෙ උදකෙ නො න ආචමෙ.

350 අකප්පියසමාදානෙ දවා සිලාපවිජ්ඣනෙ,
දෙසනාය සභාගාය ආවිකම්මෙ ච දුක්කටං.

---

349 සඞ්ඝාටියා, සංඝාටි නාමයෙන් ඉටු සිවුරෙන්; න පල්ලත්ථෙ, (විහාරයෙහි ද අන්තරඝරයෙහි ද) අකවටු නො අවුලුවන්නේ යි. පරිකම්මකතං, පුණුවම් ආදී හෝ සිතියම් හෝ කළ; භිත්තාදිං, බිත්ත් දෙර කවුළු ආදී; න අපස්සයෙ, (සිවුරු ආදී කිසිවකින් නො වසා සිස් වෙරින්) නො වැතිරෙන්නේ සි; උදකෙ සන්තෙ, දිය ඇති කල්හි; න ආචමෙ, (සිරුරු කිස කොට) දිය නො ගනී නම්; නො, නො වටී.

("අන්තොගාමෙ වාසත්ථාය උපගතෙන අධිට්ඨිතං සඞ්ඝාටිං විනා සෙසචීවරෙහි පල්ලත්ථිකාය නිසීදිතුං වට්ටති,, * යනු අටුවා යි.

350 අකප්පියසමාදානෙ, (පඤ්චසහධර්මිකයන්) අකැපයෙහි සමාදන් කරවීමෙහි ද; දවා, කෙළියෙන්; සිලාපවිජ්ඣනෙ, ගල්පෙරළීම් අතකුරුගැසීම් ආදියෙහි ද; සභාගාය, (වත් විසින්) සභාගාපත්තියගේ; දෙසනාය, දෙසීමෙහි ද; ආවිකම්මෙ ච, ඇරජීමෙහි ද; දුක්කටං, දුකුලා වේ. (අකප්පියසමාදාන නම් පස් සහ දම්යන්ට නො මටනා බැව් දත දත වේ කර එම් බඳු යනාදීන් අයපණෙහි සමාදන් කරවීම සි.

"න කෙවලඤ්ච පාසාණෙ, අඤ්ඤම්පි යං කිඤ්චි දාරුඛණ්ඩං වා ඉට්ඨකාඛණ්ඩං වා හත්ථෙන වා යන්තෙන වා පවිජ්ඣිතුං න වට්ටති, චෙතියාදීනං අත්ථාය පාසාණාදයො හසන්තා පවට්ටෙන්තාපි වහන්තාපි උක්ඛිපන්තාපි කම්මසමයො'ති වට්ටති" † යනු අටුවා යි. වත්තොර වැ හෙම ඇවතුදු උව දෙසත් වටි.)

---

ඔවුන්ට ද; අනාපත්ති එව, ඇවැත් නො වේ ම ය. වාරවාතපානද යො, දොරකවුළු ආදීහු; අපරිකම්මකතා අපි, පිරියම් නො කරන ලද්දහු ද; න අපස්සිතබ්බා, (අතුල් පතුල් මුත්) ඇඟ නො ගැසිය යුත්තාහ.

* අන්තොගාමෙ, ඇතුළුගම; වාසත්ථාය, විසීමට; උපගතෙන, එළඹියහු විසින්; අධිට්ඨිතං සංඝාටිං විනා, ඉටුසඟළ සිවුරු හැර; සෙසචීවරෙහි, සෙසු සිවුරෙන්; පල්ලත්ථිකාය, අකවටුගැන්වීමෙන්; නිසීදිතුං, හිඳිනට, වට්ටති, වටී.

† කෙවලං ච, හුදෙක් ම; පාසාණෙ, පාෂාණයන්; න, (පෙරළන්ට නො වටනේ) නො වේ; අඤ්ඤං අපි, අනික් ද; යං කිඤ්චි,

351 පටිස්සවවිසංවාදෙ සුද්ධචිත්තස්ස දුක්කටං
පටිස්සවක්ඛණෙයෙව පාචිත්ති ඉතරස්ස තු.

352 න රුක්ඛමභිරූහෙය්‍ය සති කිච්චෙව පොරිසං
ආපදාසු යථාකාමං කප්පති අභිරූහිතුං.

---

351 පටිස්සවවිසංවාදෙ, ("උභොපි මයං ඉධ වස්සං වසිස්සාම එකතො උද්දිසාමපෙස්සාම" යනාදීන් දුන්) පිළිගත් අගාරයක් නැති වැ නො කිරීමෙහි; සුද්ධචිත්තස්ස, කියනසඳ කොරෙමි යි යන සිත් ඇත්තාහට; දුක්කටං, දුකුළා වේ; ඉතරස්ස තු, නොකෙරෙමි යි යන සිත් නැතියහට වනාහි; පටිස්සවක්ඛණෙයෙව, පිළිගත් කෙණෙහි ම; පාචිත්ති, (මුසාවාදනිමිත්තා) පචිති වේ

352 රුක්ඛං, රුකට; නාභිරූහෙය්‍ය, නො නැගෙන්නේ ය, සති කිච්චෙව, (මලදඹුබිඳිනා ඈ) කටයුත්තක් ඇති කල්හි ම; පොරිසං, මිනිස් පමණක්; (නැගෙන්නේය) ආපදාසු, (වාලමෘගදර්ශනාදි) ආපදයක් ඇති කල්හි; යථාකාමං, කැමති පරිද්දෙන්; අභිරූහිතුං, නැගෙන්ට; කප්පති, කැප යි.

("ආපදාසූති වාළමිගාදයො වා දිස්වා මග්ගමූළ්හො වා දිසා ඔලොකෙතුකාමො හුත්වා දවදාහං වා උදකොඝං වා ආගච්ඡන්තං දිස්වා ති එවරූපාසු ආපදාසු අතිඋච්චම්පි රුක්ඛං අභිරූහිතුං වට්ටති" * යනු අටුවා යි.)

---

ක්වී කිසි; දුරුඛණ්ඩං වා, දරකඩක් හෝ; ඉට්ඨකාඛණ්ඩං වා, උළුකඩක් හෝ; හත්ථෙන වා, අතින් හෝ; යෙනකෙන වා, යනාත්‍රාසකින් හෝ; පවිජ්ඣිතුං, විදින්ට; න වට්ටති, නො වටී. චෙතියාදීනං අත්ථාය, චෛත්‍යාදිය පිණිස; පාසාණාදයො, ගල් (දරකඩ) ආදීන්; හසන්තා, සිනාසෙමින්; පවට්ටෙන්ති අපි, පෙරළත් ද; ඛිපන්ති අපි, බහාලත් ද; උක්ඛිපන්ති අපි, නගාලත් ද; කම්මසමයො ඉති, කම් සමය හෙයින්; වට්ටති, වටී.

* ආපදාසු ඉති, විපතක් ඇති කල්හි යනුයි; වාලමිගාදයො, චණ්ඩමෘගාදීන්; දිස්වා වා, දැක ද; මග්ගමූළ්හා, මංමුළා ව; දිසා ඔලොකෙතුකාමො හුත්වා වා, දිසාවන් බලනු කැමැති ව ද; දවදාහං වා, ලැව්ගින්නක් හෝ; උදකොඝං වා, සැඩපැහැරක් හෝ; ආගච්ඡන්තං, එන්නහු; දිස්වා ඉති, දැක දැයි; එවරූපාසු ආපදාසු, මෙබඳු විපත් ඇති කල්හි; අති උච්චං අපි, ඉතා උසව ද; රුක්ඛං, රුකට; අභිරූහිතුං, නැගෙන්ට; වට්ටති, වටී.

353 විනා'බාධං වජන්තස්ස දුක්කටං පරිස්සාවනං
යාචමානස්ස අද්ධානෙ අදෙන්තස්සාපි දුක්කටං.

354 ථුල්ලච්චයං ඵුසෙ අඞ්ගජාතච්ඡෙදනෙ දුක්කටං
ආබාධපච්චයා'ඤ්ඤත්‍ර සෙසඞ්ගෙ අත්තඝාතනෙ.

355 චිත්තපොත්ථකරූපානි න කරෙ න ච කාරයෙ
න වුට්ඨාපෙය්‍ය භුඤ්ජන්තං ආරාමාරඤ්ඤගෙහසු.

---

353 පරිස්සාවනං විනා, පෙරහන නැති ව; අද්ධානං, (යවත් පිරිසෙයින් අඩියොදුනක් පමණ ද වූ) දුරුමග; වජන්තස්ස, යන්නාහට; දුක්කටං, දුකුළා වේ; අද්ධානෙ, අධ්වමගෙහි; යාචමානස්ස, (තමාගේ පෙරහන නැති ව) ඉල්වන්නාහට; අදෙන්තස්සාපි, නො දෙන්නාහට ද; දුක්කටං, දුකුළා වේ

("අපරිස්සාවනකස්සෙව යො න දදාති තස්ස ආපත්ති, යො පන අත්තනො භණ්ඩෙ පරිස්සාවනෙ විජ්ජමානෙ'පි යාචති තස්ස න අකාමා දාතබ්බන්ති" යනු අටුවා යි)

354 අඞ්ගජාතච්ඡෙදනෙ, තමා නිමිති කැපීමෙන්, ථුල්ලච්චයං ඵුසෙ, තුලැසි ඇවැත් අවදනේ ය; ආබාධපච්චයා අඤ්ඤත්‍ර, (අතිසාරාදි) ආබාධකාරණයකින් විනා; සෙසඞ්ගෙ, (කන් නාසා ඈ) සෙසු අඞ්ගයන් කැපීමෙහි ද; අත්තඝාතනෙ, (ආහාරූපච්ඡෙදාදීන්) තමා මැරීමෙහි ද; දුක්කටං, දුකුළා වේ

("ආබාධෙ සති අඞ්ගුලිආදීනි ඡින්දිතුං වට්ටති යෙව"† යනු අටුවායි.)

355 චිත්තපොත්ථකරූපානි, සිතියම්රූ පොතැලිරූ; න කරෙ, නො කරන්නේ යි; න ච කාරයෙ, නො ද කරවන්නේ යි; ආරාමෙ, විහාරයෙහි ද; අරඤ්ඤෙ, අරණ්‍යයෙහි ද; ගෙහෙසු, අගාරඝරයෙහි ද; භුඤ්ජන්තං, වළඳමින් හුන් භික්ෂූන්; න උට්ඨාපෙය්‍ය, නො නඟන්නේ යි

---

* අපරිස්සාවනකස්ස එව, පෙරහනනැත්තාහට ම; යො, යමෙක්; න දදාති, (පෙරහන) නො දේ ද; තස්ස, ඔහුට; ආපත්ති, ඇවැත් වේ; යො පන, යමෙක් වනාහි; අත්තනො භණ්ඩෙ, තමා අත; පරිස්සාවනෙ, පෙරහන; විජ්ජමානෙ අපි, ඇතිකල්හි ද; යාචති, ඉල්වා ද; තස්ස, ඔහුට; අකාමා, නොකැමැත්තෙන්; න දාතබ්බං ඉති, නො දිය යුතු යි.

\+ ආබාධෙ සති, ආබාධයක් ඇති කල්හි; අඞ්ගුලිආදීනි, ඇඟිලිආදීන්; ඡින්දිතුං, කපන්ට; වට්ටති එව, වටී ම ය.

356 යානානි පුමයුත්තානි සිවිකං හත්ථවට්ටකං
පාටඞ්කිඤ්ච ගිලානස්ස කප්පතෙ අභිරූහිතුං.

357 බුද්ධං ධම්මඤ්ච සංඝඤ්ච ආරබ්භ කරණෙ දවං
දුක්කටං පරිසං වා’පි අඤ්ඤස්ස උපලාලනෙ.

---

("රූපකන්තු පුරිසිත්ථීනං තිරච්ඡානගතස්ස වා,
කාරෙන්තස්ස කරොතො වා හොති ආපත්ති දුක්කටං.
ජාතකම්පන වත්ථුං වා කාරාපෙතුං පරෙහි වා,
මාලාකම්මං ලතාකම්මං සයං කාතුම්පි වට්ටති-" *
යනු වනවිනිස යි.)

356 පුමයුත්තානි, (ගොන් ඈ) පුරුෂයන් යෙදූ (හෙවත්) පිරිමින් ලසුත; යානානි, ගැල් ද; සිවිකං, සිවිගෙය ද; හත්ථවට්ටකං, අත්වටුගැල් ද; පාටඞ්කිඤ්ච, හීදෙලු ද; අභිරූහිතුං, නැගෙන්ට; ගිලානස්ස, ගිලන්හට; කප්පතෙ, කැප යි.

("පුරිසයුත්තං ඉත්ථිසාරථි වා හොතු පුරිසසාරථි වා වට්ටති, හත්ථවට්ටකම්පන ඉත්ථියො වා වඩ්ඪන්තු පුරිසා වා වට්ටති, යෙව" † යනු අටුවා යි.)

357 බුද්ධං, බුදුන් ද; ධම්මඤ්ච, දම්ය ද; සඞ්ඝඤ්ච, සඞ්ඝයා; ආරබ්භ, අරබයා; දවං කරණෙ, පරිහාස වචන කීමෙහි ද; අඤ්ඤස්ස,

---

* පුරිසිත්ථීනං, පුරුෂයකුගේ හෝ ස්ත්‍රියකගේ හෝ; තිරච්ඡානගතස්ස වා, තිරිසනෙකුගේ හෝ; රූපං තු, රූපයක්; කාරෙන්තස්ස, කරවන්නහුට ද; කරොතො වා, කරන්නහුට ද; ආපත්ති දුක්කටං හොති, දුකුලා ඇවැත් වේ.

ජාතකං පන, ජාතක හෝ; වත්ථුං වා, කථාවස්තු හෝ; පරෙහි, අනුන්ලවා; කාරාපෙතුං වා, කරවන්ට ද; මාලාකම්මං, මල්කම් හෝ; ලතාකම්මං, ලියකම් හෝ; සයං කාතුං අපි, තෙමෙම කරන්ට ද (අනුන්ලවා කරවන්ට ද) වට්ටති, වෙයි.

† පුරිසයුත්තං, පිරිමිසතුන් යෙදූ ගැල; ඉත්ථිසාරථි වා හොතු, ස්ත්‍රියක් පදවන්නහු කොට ඇත්තේ හෝ වේවා; පුරිසසාරථි වා, පුරුෂයකු පදවන්නහු කොට ඇත්තේ හෝ වේවා; වට්ටති, වෙයි. හත්ථවට්ටකං පන, අතින් පෙරලන ගැල වනාහි; ඉත්ථියො වා වඩ්ඪන්ති, ස්ත්‍රීහු හෝ පෙරළත්වා; පුරිසා වා, පුරුෂයෝ හෝ පෙරළත්වා; වට්ටති එව, වෙයි ම ය.

358 කායං ඌරුං නිම්බත්තං වා භික්ඛුනීනං න දස්සයෙ
විවරිත්වා න සිඤ්චෙය්‍ය තා කද්දමුදකාදිනා.

359 අගණ්හන්තො ච ඔවාදං න පච්චාහරණතො'පි ච
බාලං ගිලානං ගමියං වජ්ජයිත්වාන දුක්කටං.

360 ලොකායතං න වාචෙය්‍ය පලිතං න ච ගාහයෙ
පෙලාය'පි න භුඤ්ජෙය්‍ය න කීළෙ කඤ්චි කීළනං.

---

(දුස්සීල ද වූ) අතික්කන්ගුණයේ; පරිසං, පිරිස්වූ සාමණේරාදි යම් කිසිව කු; උපලාළෙන වාපි, (තමහට උපස්ථාන කරවන පිණිස නොපට පාසිවුරු දෙන්හ යනාදින්) නැලවීමෙකි ද; දුක්කටං, දුකුලා වේ.

("කිම්මුණ්ඩො සිලාතමුණ්ඩො උදගු පරිමුණ්ඩො" "කිං බණ්ඩො අජබණ්ඩො ගොබණ්ඩො," "කිං සදිසො අජසදිසො ගොසදිසො," යනාදීන් කෙළි පිණිස කිණීම දවකාරණ නම්.)

358 කායං, ශරීරය හෝ; ඌරුං, කලවය හෝ; නිම්බත්තං වා, නිම්බත්ත හෝ; විවරිත්වා, සිවුරු පහ කොට; භික්ඛුනීනං, මෙහෙණුන් ට; න දස්සයෙ, නො දක්වන්නේ ය; තා, ඒ භික්ෂුණීන්; කද්දමුදකාදිනා; කලල් දියආදින්; න සිඤ්චෙය්‍ය, නො ඉස්සේයි.

359 බාලං, (නයුත් නො ගත හෙන) බාලයා ද; ගිලානං, (එපා හෝ අසට යොස් නො ඇරජිය හෙන) ගිලන්හු ද; ගමියං (පැළවිය දවස් බැහැර යන) ගමිකහු ද; වජ්ජයිත්වාන, හැර; ඔවාදං, (මාගම් පැවිද්දන් විසින් ඇරජි) අවවාද; අගණ්හනතො ච, නොගන්නාහට ද; න පච්චාහරණතො පි ච, නැවත අවුත් නො කියන්නාහට ද, දුක්කටං, දුකුලා වේ.

(ඔවාද නම්: භික්ඛුනීසඞ්ඝො අය්‍ය භික්ඛුසඞ්ඝස්ස පාදෙ වන්දති, ඔවාදූපසඞ්කමනඤ්ච යාචති, ලභතු කිර අය්‍ය භික්ඛුනිසඞ්ඝො ඔවාදූපසඞ්කමනං * යි අවවාද අසන පිණිස කරන ආරාධනා යි.)

360 ලොකායතං, විතණ්ඩවාදශාස්ත්‍රය; න වාචෙය්‍ය, නො හදරන්නේ ය; පලිතං, නරකෙස් ද; න ගාහයෙ, නො උදුරුවන්නේ

---

* අය්‍ය ආර්යය; භික්ඛුනීසඞ්ඝො, භික්ෂුණීසංඝතෙම; භික්ඛුසඞ්ඝස්ස, භික්ෂුසංඝයාගේ; පාදෙ වන්දති, පා වඳී; ඔවාදූපසඞ්කමනං ච, අවවාදයට එළඹීම ද; යාචති, ඉල්වයි; අය්‍ය, ආර්යය; භික්ඛුනිසඞ්ඝො, භික්ෂුණීසංඝතෙම; ඔවාදූපසඞ්කමනං, අවවාදයට එළඹීම, ලභතු කිර, ලබාවා.

361 පාරුපෙ න නිවාසෙය්‍ය ගිහිපාරුතවාසනං
සංවෙල්ලියං නිවාසෙය්‍ය දුස්සමාලිම්පයෙය්‍ය ච.

362 වඩ්ඪිං පයොජයෙ යාචෙ නාඤ්ඤත්‍රකප්පවාරිතෙ
අත්තනො පරිභොගත්ථං දින්නමඤ්ඤස්ස නො දදෙ
අග්ගං ගහෙත්වා භුත්වා වා කතිපාහං පුනො දදෙ.

---

පෙළායපි, (තඹලෝ ආදීන් කළ) පාත්‍රයෙහි තබා ද; න භුඤ්ජෙය්‍ය, නො වළඳන්නේ ය; කඤ්චි කීළනං (දුකෙළි ආ) කිසිකෙළියකුදු; න කීළෙ, නො කෙළින්නේ යි.

(ලොකායතනන්නාම සබ්බං උච්ඡිට්ඨං සබ්බං අනුච්ඡිට්ඨං සෙතො කාකො කාලො බකො ඉමිනා ච ඉමිනා ච කාරණෙනාති එවමාදි නිරත්ථකකාරණපටිසංයුත්තතිත්ථියසත්ථං. යනු ද) ආසිත්තකූපධානන්නාම තම්බලොහෙන වා රජතෙන වා කතාය පෙළාය එතං අධිවචනං, පටික්ඛිත්තත්තා පන දාරුමයාපි න වට්ටති" † යනු ද අටුවා යි. පෙළ නම් මොරවාය යෙක්)

361 ගිහිපාරුතවාසනං, ගිහින් පොරෝනා සේ හඳනා සේ; න පාරුපෙ, නො පොරවන්නේ ය; න නිවාසෙය්‍ය, නො හඳනේයි; සංවෙල්ලියං, අමුඩු කලා; න නිවාසෙය්‍ය, නො හඳනේ යි; දුස්සං ච, පිලිඳු; න ආලිම්පයෙය්‍ය, (ගිනී නො ලන්නේ ය,) නො ලවන්නේ යි;

362 වඩ්ඪිං, පොලී; න පයොජයෙ, නො වඩන්නේ ය; අඤ්ඤත්‍ර කප්පවාරිතෙ, නොනෑ නොපැවරූවන්; න යාචෙ, (සිවුරු පිඩුපා සෙනසුන්) නො ඉල්වන්නේ යි; අත්තනො පරිභොගත්ථං, තමා

---

† ලොකායතං නාම; ලොකායතශාස්ත්‍ර නම්: සබ්බං, සියල්ල; උච්ඡිට්ඨං; ඉඳුල් ය; සබ්බං, සියල්ල; අනුච්ඡිට්ඨං, නොඉඳුල්ය; කාකො සෙතො, කාකයා සුදුය; බකො කාලො, කොකා කළුය; ඉමිනා ච ඉමිනා ච කාරණෙන ඉති, මේ මේ කරුණෙන් යැයි; එවමාදිං, යනාදිවූ; නිරත්ථකකාරණපටිසංයුත්තතිත්ථියසත්ථං, නිරර්ථක කරුණෙන් යුත් තීර්ථකශාස්ත්‍ර යැයි.

ආසිත්තකූපධානං නාම, ආසිත්තකූපධාන නම්: තම්බලොහෙන වා, තාම්‍රලොහයෙන් හෝ; රජතෙන වා, රිදියෙන් හෝ; කතාය පෙළාය, කළපාත්‍රවට; එතං අධිවචනං, මේ නම. පටික්ඛිත්තත්තා පන, ප්‍රතික්ෂෙප කරන ලද බැවින් වනාහි. දාරුමයාපි, දැවයෙන් කළා ද; න වට්ටති, නො වටී.

363 උද්දිස්ස යාචනෙ රක්ඛං ඤත්වා'ඤත්වා ච දණ්ඩනං
ගීවා' ස්ස දණ්ඩිතෙ දණ්ඩො සයං දණ්ඩාපනෙ පන
දණ්ඩස්ස අග්ඝභෙදෙන ඤෙය්‍යා පාරාජිකාදිකා.

---

ගේ ම අනුභවය පිණිස; දින්නං, දෙන ලද (චීවරාදිය;) අඤ්ඤස්ස, අනික් සහධම්මිකයකුට ද; නො දදෙ, නො දෙන්නේ ය; අග්ඝං ගහෙත්වා, (පිණ්ඩපාතාදි) අගය ගෙන හෝ; කතිපාහං, කීපදවසක්; භුත්වා වා, (වහන්අෑ) වැලඳගෙන හෝ; පුනො, ඉක්බිති; දදෙ, (කැමතිතැනකට) දෙන්නේ යි.

“අත්තනො පරිභොගත්ථං දින්නකංනාම යං තුම්හෙව පරිභුඤ්ජථාති දින්නං, තං අඤ්ඤස්ස දදතො දුක්කටං, අග්ඝං ගහෙත්වා පන දාතුං වට්ටති, සචෙ අසප්පායං, සබ්බම්පි අපනෙතුං වට්ටති, චීවරං එකාහං වා ද්වීහං වා පරිභුඤ්ජිත්වා දාතුං වට්ටති, පත්තාදීසු'පි එසෙව නයො” * යනු අටුවා යි.)

363 දණ්ඩනං, දඩ ගන්නා බව; ඤත්වා, දැන හෝ; අඤ්ඤත්වා වා, නො දැන හෝ; උද්දිස්ස, (එකක්හු) උදෙසා; රක්ඛං, රක්ෂාව; යාචනෙ, ඇයජමෙහි; දණ්ඩිතෙ, (ඔහු අතින්) දඩගත් කල්හි; දණ්ඩො, නන්දඩ; අස්ස, (ඒ රක්ෂා ඉල්වූ) මහණහු; ගීවා, ණය වෙයි. (බඩුදීම් වෙයි) සයං දණ්ඩාපනෙ පන, (ඔහු අතින් මමතොත් දඩ ගන්ව යි) තමා ම දඩ ගැන්වීමෙහි වනාහි: දණ්ඩස්ස, (ගන්නා ලද) දණ්ඩ සාමයේ: අග්ඝභෙදෙන; අගවූ පරිද්දෙන්; පාරාජිකාදිකා, පරිජි ආදීහු; ඤෙය්‍යා, දතයුත්තාහු යි.

---

* අත්තනො පරිභොගත්ථං, තමාගේ පරිභොගය පිණිස; දින්නකං නාම: දෙන ලද දෙය නම්; යං, යමක්; තුම්හෙ එව, තොපි ම; පරිභුඤ්ජථ ඉති, වළඳව් යයි; දින්නං දෙන ලද ද; තං, එය; අඤ්ඤස්ස, අන්‍යයකුට; දදතො, දෙන්නාහට; දුක්කටං, දුකුළා වේ; අග්ඝං ගහෙත්වා පන, අග්‍රකොටස ගෙන වනාහි; දාතුං, දෙන්ට; වට්ටති, වටී; සචෙ ඉදින්; අසප්පායං, අසප්පාය නම්; සබ්බං අපි; සියල්ල ද; අපනෙතුං, පහකරන්ට; වට්ටති, වටී; චීවරං, සිවුර; එකාහං වා, එක්දිනක් හෝ; ද්වීහං වා, දෙදිනක් හෝ; පරිභුඤ්ජිත්වා, පරිභොග කොට; දාතුං, දෙන්ට; වට්ටති, වටී; පත්තාදීසු අපි, පාත්‍රාදීයෙහි ද; එසො එව නයො, මේ ම ක්‍රමය වේ.

364 හරෙය්‍යුං පරික්ඛාරං චොරා චොරො'ති භාසිතෙ
අනත්ථාය'ස්ස ගණ්හන්තෙ දණ්ඩං ගීවා'ස්ස තත්තකං.

---

364 පරික්ඛාරං, (සිවුරු ආදී) පිරිකර; හරෙය්‍යුං, (සොරුන්) ගෙන යන කල්හි; අස්ස, ඒ සොරහට; අනත්ථාය, අවැඩ පිණිස; චොරා චොරොති, සොරෙක සොරෙකැ යි; භාසිතෙ, කී කල්හි; දණ්ඩං ගණ්හන්තෙ, (ඒ අසා සොරහු අතින්) දඬ ගන්නා කල්හි. තත්තකං, එතෙක් දඬ; අස්ස, ඒ භික්ෂුහට; ගීවා, නය වේ.

භික්ඛුනුපස්සයෙ ගාමදාරකා ධුත්තාදයො වා යෙ කෙචි අනාචාරං වා ආචරන්ති රුක්ඛං වා ඡින්දන්ති ඵලාඵලං වා හරන්ති පරික්ඛාරෙ වා අවහරන්ති, භික්ඛුනී වොහාරිකෙ උපසඞ්කමිත්වා අම්හාකං උපස්සයෙ ඉදන්නාම කතන්ති වදති—

කෙනා'ති වුත්තෙ පන අසුකෙනා'ති වත්තුං අම්හාකං න වට්ටති, තුම්හෙ යෙව ජානිස්සථ, කෙවලඤ්හි මයං රක්ඛං යාචාම තං නො දෙථ අවහටභණ්ඩඤ්ච ආහරාපෙථා'ති වත්තබ්බං.-

එවං වුත්තෙ සචෙ පි තෙ වොහාරිකා කාරකෙ ගවෙසෙත්වා තෙසං දණ්ඩං කරොන්ති සබ්බසාපතෙය්‍යම්පි ගණ්හන්ති භික්ඛුනියා නෙව ගීවා න ආපත්ති-

යො චායං භික්ඛුනීනං වුත්තො භික්ඛූනම්පි එසෙව නයො-

යෙ පන දණ්ඩං කරිස්සන්තීති ජානන්තා'පි අනොදිස්ස කථෙන්ති, තෙ ච පරියෙසිත්වා දණ්ඩං කරොන්තියෙව න දොසො, විහාරසීමාය රුක්ඛාදීනි ඡින්දන්තානං වාසිඵරසුආදීනි ගහෙත්වා පාසාණෙහි කොට්ටෙන්ති න වට්ටති. සචෙ ධාරා භිජ්ජති කාරාපෙත්වා දාතබ්බා, උපධාවිත්වා තෙසං පරික්ඛාරෙ ගණ්හන්තීති තම්පි න කාතබ්බං, ලහුපරිවත්තං හි චිත්තං. ථෙය්‍යචෙතනාය උප්පන්නාය මූලච්ඡෙජ්ජම්පි ගච්ඡෙය්‍ය. * යනු අටුවා යි.)

---

* භික්ඛුනුපස්සයෙ, මෙහෙණවර; ගාමදාරකා, ගම්දරුවෝ හෝ; ධුත්තාදයො වා, ධූර්තාදීහු හෝ; යෙ කෙචි, යම් කිසිවෙක්; අනාචාරං වා, අනාචාර හෝ; ආචරන්ති, කෙරෙත් ද; රුක්ඛං වා ඡින්දන්ති, ගස් හෝ කපත් ද; ඵලාඵලං වා හරන්ති, පලවැල හෝ ගෙනයත් ද; පරික්ඛාරෙ වා අවහරන්ති, පිරිකර හෝ පැහැර ගනිත් ද; භික්ඛුනී, මෙහෙණී තොමෝ; වොහාරිකෙ උපසංකමිත්වා, විනිශ කරුවන් වෙත පැමිණ; අම්හාකං උපස්සයෙ, අපගේ මෙහෙණවර. ඉදං නාම කතං ඉති, මේ නම් දෙයක් කරන ලදැයි; වදති, කියා ද;-

කෙන ඉති වුත්තෙ පන, කවරකු විසින් කරන ලද දූසි විචාළ කල වනාහි; අඤ්ඤෙන ඉති වත්තුං, අසවලා විසින් කරන ලදැයි; කියන්ට; අම්හාකං, අපට; න වට්ටති, නො වටී; තුම්හෙ එව, තෙපි ම; ජානිස්සථ, දන්නෙව්; මයං හි, අපි වනාහි; කෙවලං, හුදෙක්; රක්ඛං, ආරක්ෂාව; යාචාම, ඉල්ලමු; තං, එය; නො, අපට; දෙථ, දෙව්; අවිහෙඨනත්ථං ච, පැහැරගත්බඩු ද; ආහරාපෙථ ඉති, ගෙන් වව් යයි; වත්තබ්බං, කිය යුතු;-

එවං වුත්තෙ, මෙසේ කී කල්හි, සචෙ අපි; ඉදිනුදු; තෙ වොහාරිකා, ඒ විනිශ්චයකරුවෝ; කාරකෙ ගවෙසෙත්වා, කළවුන් සොයා; තෙසං දණ්ඩං කරොන්ති, ඔවුන්ට දඬුවම් කරත් ද; සබ්බසාපතෙය්‍යං ගහිතෙ අපි, සියලු සම්පත් ගත් කල්හි දු; භික්ඛුනියා, මෙහෙණියට; නෙව ගීවා, නාය නො වේ ම ය; න ආපත්ති, ඇවැත් නො වේ;-

යො ච අයං, යම් මේ ක්‍රමයක් වනාහි; භික්ඛුනීනං, මෙහෙණින්ට; වුත්තො, කියන ලද ද; භික්ඛූනං අපි, භික්ෂූන්ට ද, එසො එව නයො, මෙ ම ක්‍රම යි;-

යො පන, යමෙක් වනාහි; දණ්ඩං කරිස්සන්ති ඉති, දඬුවම් කරන්නාහ යි; ජානන්තො පි, දන්නේ ම; අනොදිස්ස කථෙති, නම සඳහන් නො කොට කියා ද; තෙ ච, ඒ විනිශ්චයකරුවෝ ද; පරියෙසිත්වා, සොයා; දණ්ඩං කරොන්ති එව, දඬුවම් කෙරෙත් ද; න දොසො, වරද නැති; විහාරසීමාය, විහාරසීමාවෙහි; රුක්ඛාදීනි, ගස් ආදිය; ඡින්දන්තානං, කපන්නවුන්ගේ; වාසිඵරසුආදීනි, වෑපොරෝ ආදිය; ගහෙත්වා, ගෙන; පාසාණෙහි, ගලින්; කොට්ටෙන්ති, තළන් ද; න වට්ටති, නො වටී; සචෙ, ඉදින්; ධාරා භිජ්ජති, මුවහත බිඳේ; කාරාපෙත්වා දාතබ්බා, කරවා දිය යුත්තීය; උපධාවිත්වා, දුව ගොස්; තෙසං, ඔවුන්ගේ; පරික්ඛාරෙ ගණ්හන්ති, පිරිකර ගනිත් ද; තං අපි, එ ද; න කාතබ්බං, නො කළ යුතු; චිත්තං හි, සිත වනාහි; ලහුපරිවත්තං, යුහු ව පෙරළෙන්නේ යි; ථෙය්‍යචෙතනාය, සොරසිත; උප්පන්නාය, උපන් කල; මූලච්ඡෙජ්ජං අපි, පාරාජිකාපත්තියට ද; ගච්ඡෙය්‍ය, පැමිණෙන්නේ යි.

365 විඝාසුච්චාරසඞ්කාරමුත්තං ඡඩ්ඩෙය්‍ය දුක්කටං
බහි පාකාරකුඩ්ඩානං වලඤ්ජ නාවලොකිය
හරිතෙ වාපි වීහාදි නාළිකෙරාදිරොපිමෙ.

---

365 විඝාස, උක්ෂප්අෑ ඉඳුල් ද; උච්චාර, අහරමල ද; සඞ්කාර, කසළ ද; මුත්තං, වටන්දිය ද; (යන මේ) පාකාරකුඩ්ඩානං බහි, පවුරු හා බිත්තීන් පිටත්හි; නාවලොකිය, නො බලා; වලඤ්ජ, මිනිස්හසර ඇතිතැන්හි ද; වීහාදිනාළිකෙරාදිරොපිමෙ, වීහැල් ආදීන් හා පොල්පුවක්ආදීන් රොපනය කළ; හරිතෙ වාපි, නිල්ගත් කෙත්වත් හා අරම්හි ද; ඡඩ්ඩෙය්‍ය, පියා නම්; දුක්කටං, දුකුලා වේ.

("යං මනුස්සානං උපභොගපරිභොගං රොපිමන්ති, ඛෙත්තං වා හොතු නාළිකෙරාදිආරාමො වා යත්‍ථ කත්‍ථචි රොපිමහරිතට්ඨානෙ" යනු ද "අනික්ඛිත්තබීජෙසු ඛෙත්තකොණාදිසු වා අසඤ්ජාතරොපිමෙසු ඛෙත්තමරියාදාදිසු වා-මනුස්සානං කචවරඡඩ්ඩනට්ඨානෙ'පි-ඡඩ්ඩිතඛෙත්ත (පි) ඡඩ්ඩෙති වට්ටති,, * යනු ද අටුවා යි.

සාමිකෙ අපලොකෙත්වා, ඕ බැවින් හිමියන කීයෙහි ලති දෙස් නැති, එකරුණෙහි භික්ෂුණීනි අයති වතුයෙහි ලති දෙස් නැති,, යනු කංඛාවිතරණීගැටපද යි.)

---

* යං මනුස්සානං උපභොගපරිභොගං රොපිමං ඉති, යම් මිනිසුන්ගේ උපභොගපරිභොගවූ රොපණය කළ යන මෙහි; ඛෙත්තං වා හොතු, කෙතක් හෝ වේවා; නාළිකෙරාදිආරාමො වා, පොල්ආදිආරාමයෙක් හෝ වේවා; යත්‍ථ කත්‍ථචි රොපිමහරිතට්ඨානෙ, යම් කිසි රොපණය කළ හටගත් පත්‍රයෙන් නිල්වූ ස්ථානයෙක්හි; (යනු අටු යි.)

අනික්ඛිත්තබීජෙසු, නොවපුළබිජු ඇති; ඛෙත්තකොණාදිසු වා, කෙත්කොන් ආදියෙහි හෝ; අසඤ්ජාතරොපිමෙසු; හටනොගත් ගොයම්ඇති; ඛෙත්තමරියාදාදීසු වා, කෙත්මායිම්ආදියෙහි හෝ;-

මනුස්සානං කචවරඡඩ්ඩනට්ඨානෙ අපි, මිනිසුන් කසළදමන තැන්හි ද;-

ඡඩ්ඩිතඛෙත්තෙ අපි, හැරදමනලද කෙත්හි ද; ඡඩ්ඩෙති, දමා නම්; වට්ටති, වටී.

336 යොජාපෙතුං පයොජෙතුං පයුත්තානි ච පස්සිතුං
න ලබ්භං ධම්මයුත්තම්පි නච්චං ගීතං ච වාදිතං
උපහාරං කරොමාති වුත්තො වා සම්පටිච්ඡිතුං.

---

336 ධම්මයුත්තම්පි, ධර්මයෙන් යුක්ත ද වූ; නච්චං වා, නැටුම් හෝ; ගීතං වා, ගී හෝ; වාදිතං වා, බෙරගැසීම් හෝ; යොජාපෙතුං, යොදවන්නට ද; පයොජෙතුං, (තමා) යොදන්නට ද; පයුත්තානි, අනුන් විසින් යොදනලද්දවුන්; පස්සිතුං, බලන්නට ද; උපහාරං කරොමාති, පූජා කරමහයි; වුත්තො, කියල්ති; සම්පටිච්ඡිතුං වා, (මැනවැයි යනාදීන්) ගිවිස්නට ද; න ලබ්භං, නොවටී; (බුදුපුදයට නිස්සහ යි හෝ පුද කරවනු කාටුත්තෙත් යයි හෝ කියත් වටී.)

("අරියානං පරිනිබ්බානකාලෙ රතනත්තයගුණූපසංහිතං සාධුකීළිතගීතං වා අසඤ්ඤතභික්ඛූනං ධම්මභාණකගීතං වා"– (ධම්මයුත්තගීතං නාම) යනු ද, "ආරාමෙ ඨත්වා අන්තොආරාමෙ වා බහිආරාමෙ වා නච්චාදීනි පස්සති වා සුණාති වා,=සලාකභත්තාදීනං වා අත්ථාය අඤ්ඤෙන වා කෙනචි කරණීයෙන ගන්ත්වා ගතට්ඨානෙ පස්සති වා සුණාති වා,=තාදිසෙන උපද්දවෙන උපද්දුතො සමජ්ජට්ඨානං පවිසති එවං පවිසිත්වා පස්සති වා සුණාති වා අනාපත්ති" * යනු ද අටුවා යි.

---

* අරියානං, ආර්යයන්ගේ; පරිනිබ්බානකාලෙ, පිරිනිවන් කාලයෙහි; රතනත්තයගුණූපසංහිතං, තුනුරුවන් ගුණයෙන් ගළපන ලද; සාධුකීළිතගීතං වා, සාදුකෙළිගී හෝ; අසඤ්ඤතභික්ඛූනං, වාක්සංයමනැති භික්ෂූන්ගේ; ධම්මභාණකගීතං වා, දහම්කියන ගී හෝ; ධම්මයුත්තගීතං නාම, ධර්මයුක්තගීත නම්;-

ආරාමෙ ඨත්වා, අරම සිට; අන්තොආරාමෙ වා, අරමතුළ හෝ; බහිආරාමෙ වා, අරමින් පිට හෝ; නච්චාදීනි, නැටුම් ආදිය; පස්සති වා, බලා ද; සුණාති වා, අසා ද;-

සලාකභත්තාදීනං වා අත්ථාය, සලාකබත්ආදිය පිණිස හෝ; අඤ්ඤෙන කෙනචි කරණීයෙන වා, අන් කිසි කටයුත්තකින් හෝ; ගන්ත්වා, ගොස්; ගතට්ඨානෙ, ගියතැන්හි; පස්සති වා, දකී ද, සුණාති වා, අසා ද;—

තාදිසෙන උපද්දවෙන, එබඳු උවදුරකින්; උපද්දුතො, පීඩිත වූයේ; සමජ්ජට්ඨානං, නාට්‍යභූමියට; පවිසති, පිවිසේ ද; එවං පවි

367 රාජාගාරං පොක්ඛරණිං උය්‍යානං චිත්තාගාරකං
කීළනං ගච්ඡතො දට්ඨුං ආරාමං දුක්කටං කතං.

368 නාවෙ න පටිබාහෙය්‍ය සඞ්ඝෙනුඤ්ඤාත න චීවරං
නිද්ධාපෙය්‍ය ඛමාපෙය්‍ය ගුරූනා ච පණාමිතො.

369 අක්කොසනෙ පරම්මුඛා ආපත්තීහි ච සත්තහි
භික්ඛුම්පාසකං වා'පි අසද්ධෙනෙව ච දුක්කටං.

---

367 කීළනං, (රජදරුවන්) කෙළෙනා පිණිස; කතං, කරන ලද රාජාගාරං, රජගෙය ද; පොක්ඛරණිං, පොකුණ ද; උය්‍යානං, (නුවර සමීපයෙහි කළ) උයන් ද; චිත්තාගාරකං, චිත්‍රශාලා ද; ආරාමං, (රජගේ අභියස්හි කළ) අරම් ද; දට්ඨුං, බලනු පිණිස; ගච්ඡතො, යන්නාහට; දුක්කටං, (පියෙහි පියෙහි) දුකුළා වේ.

(“අජ්ඣාරාමෙ රාජාගාරාදීනි කරොන්ති තානි පස්සති, පිණ්ඩපාතාදීනමත්ථාය ගච්ඡන්තස්ස මග්ගො හොන්ති තානි පස්සති, රඤ්ඤො සන්තිකං කෙනචි කරණීයෙන ගන්ත්වා පස්සති, කෙනචි උපද්දුතො පවිසිත්වා පස්සති අනාපත්ති,, * යනු අටුවා යි.)

368 නාවෙ, සඟම්හණුන්: ආසනෙන, හුනස්නෙන්; න පටිබාහෙය්‍ය, නො පිළිබහන්නේ ය; උණ්ණාත, අවිවෙහි; චීවරං, සිවුරු; න නිද්ධාපෙය්‍ය, නො දවන්නේ ය; ගුරූනා, ආචාය්‍ය උපාධ්‍යාය යන් විසින්; පණාමිතො ච, (මෙහි නො වස යනාදීන්) ප්‍රණාමනය කරන ලද්දේ ද; ඛමාපෙය්‍ය, ක්‍ෂමා කරවන්නේ යි.

369 සත්තහි ආපත්තීහි, සත් ඇවැත් කඳින්; භික්ඛුං වා, මහණහු ද; අසද්ධෙනෙව ච, (“අස්සද්ධො අප්පසන්නො” යනාදි). සෙසු ආක්‍රොශවචනයෙන්; උපාසකං වාපි, උපාසකයා ද; පරම්මුඛා, නො සිටා, මෙසේ පිවිස; පස්සතී වා, බලා ද; සුණාති, අසා ද; අනාපත්ති, ඇවැත් නැති.

* අජ්ඣාරාමෙ, අරමතුළ; රාජාගාරාදීනි, රජගේ ආදිය; කරොන්ති, කෙරෙත් ද; තානි පස්සති, ඒ දකී ද; පිණ්ඩපාතාදීනං අත්ථාය, පිණ්ඩපාතාදිය පිණිස; ගච්ඡන්තස්ස, යන්නහුගේ; මග්ගෙ, මඟ; හොන්ති, වෙත් ද; තානි පස්සති, ඒ බලා ද; රඤ්ඤො සන්තිකං, රජහු වෙත; කෙනචි කරණීයෙන, කිසි කටයුත්තකින්; ගන්ත්වා, ගොස්; පස්සති, බලා ද; කෙනචි, කිසිවකු විසින් උපද්දුතො, පෙළන ලද්දේ; පවිසිත්වා, පිවිස; පස්සති, බලා ද; අනාපත්ති, ඇවැත් නො වේ.

370 න ලබ්භං විනිපාතෙතුං සඞ්ඝෙදෙය්‍යඤ්ච චීවරං
ලබ්භං පිතූනං සෙසානං ඤාතීනම්පි න ලබ්භති.

371 වස්සං වුත්ථො'ඤ්ඤතො'ඤ්ඤත්ථ භාගං ගණ්හෙය්‍ය දුක්කටං
පටිදෙය්‍ය නට්ඨෙ ජිණ්ණෙ ගිවා නො දෙය්‍ය චොදිතො
ධුරනික්ඛෙපතො තස්ස හොති භණ්ඩග්ඝකාරියො.

372 න සන්තරුත්තරො ගාමං කල්ලො වා සවුපාහනො
පවිසෙය්‍ය න ධාරෙය්‍ය චාමරීමකසබීජනිං.

---

හමුයෙහි; අක්කොසෙන, ආක්‍රොශකිරීමෙහි; දුක්කටං, දුකුළා වේ. (පව් ගරහන විසින් කියත් දෙස් නැති.)

370 සඞ්ඝෙදෙය්‍යං, සඟහට දුන්; චීවරඤ්ච, සිවුරු ද; "ච" ශබ්දයෙන් පිණ්ඩපාතාදී ද; විනිපාතෙතුං, (පඤ්චසහධම්මිකයන් හා දෙමව්පියන් විනා සෙස්සන්ට) දෙත්; න ලබ්භං, නො වටී; පිතූනං, මව්පියන්ට (දෙත්;) ලබ්භං, වටී; සෙසානං ඤාතීනම්පි, සෙසු නෑයන්ට ද; න ලබ්භති, නො වටී.

371 අඤ්ඤත්ථ, අනික් වෙහෙරෙක; වස්සං වුත්ථො, වස් වුසුයේ; අඤ්ඤතො, අනික් වෙහෙරකින්; භාගං, (වස්සාවාසිකචීවර) භාගයක්; ගණ්හෙය්‍ය, ගනී නම්; දුක්කටං, දුකුළා වෙයි; පටිදෙය්‍ය, නැවත (ගත්තෙනට) දෙත්නේ සි; නට්ඨෙ, (ගත්කොටස) නට කල්හි ද; ජිණ්ණෙ, දිරාගිය කල්හි ද; ගිවා, නය වේ; චොදිතො, (හිමියන් විසින්) ඉල්වන ලද්දේ; නො දෙය්‍ය, නො දේ නම්; තස්ස, ඒ (වෙහෙර සිවුරු ලැබිය යුතු) මහණුන්ගේ; ධුරනික්ඛෙපතො, ධුරනික්ෂෙපයෙන්; භණ්ඩග්ඝකාරියො හොති, බඩුයෙහි අගය වූ පරිද්දෙන් කට යුතු වේ.

372 සන්තරුත්තරො, සඟල නො ගෙන හඳනා පොරෝනා දෙක මතු වැළඳගත්තේ ද; කල්ලො, නොගිලන්වූ; සවුපාහනො වා, පයලුවහන් ඇත්තේ ද; ගාමං, ගමට; න පවිසෙය්‍ය, නො වද්නේය; චාමරිමකසබීජනිං, චමරවාලයෙන් කළ මකසබීජනිය; න ධාරෙය්‍ය, නො දරන්නේ සි.

("අඞ්ගලගුත්තවිහාරෙ චීවරං ඨපෙත්වා පවිසිතුං වට්ටති, ආරඤ්ඤකෙන පන භණ්ඩුක්ඛලිකාය පක්ඛිපිත්වා පාසාණසුසිරරුක්ඛසුසිරාදිසු පටිච්ඡන්නෙසු ඨපෙත්වා ගන්තබ්බං" * යනු අටුවා සි.)

---

* අඞ්ගලගුත්තවිහාරෙ, දොරඅගුල් ලා ආරක්ෂාකළ විහාරයෙහි, චීවරං ඨපෙත්වා, සිවුර තබා; පවිසිතුං, පිවිසෙන්ට; වට්ටති, වටී

373 අගිලානො න ඡින්දෙය්‍ය කෙසෙ කත්තරියා බහි
ආරාමතො න ධාරෙය්‍ය ඡත්තං ලබ්භති ගුත්තියා.

---

373 අගිලානො, නොගිලන් මහණ; කත්තරියා, කතුරෙන්; කෙසෙ, කෙසයන්; න ඡින්දෙය්‍ය, නො කපන්නේ ය; ආරාමතො බහි, අරමින් පිටත; ඡත්තං, කුඩය; න ධාරෙය්‍ය, නො දරන්නේ ය; ගුත්තියා (සිවුරු හා ආත්ම) රක්‍ෂා පිණිස; ලබ්භති, (ඡත්‍රධාරණය) වටී.

("ගණ්ඩවණ්ණරුසිසරොගාබාධපච්චයා (කෙසෙ කත්තරියා ඡෙදාපෙතුං වට්ටති)-යනු ද,

යස්ස කායදාහො වා පිත්තකොපො වා හොති, චක්ඛු වා දුබ්බලං, අඤ්ඤො වා කොචි ආබාධො විනා ඡත්තෙන උප්පජ්ජති, තස්ස ගාමෙ වා අරඤ්ඤෙ වා ඡත්තං වට්ටති, වෙසො පන චීවරගුත්තත්ථං වාලමිගචොරභයෙසු අත්තගුත්තත්ථම්පි වට්ටති, එකපණ්ණච්ඡත්තං පන සබ්බත්ථෙව වට්ටති" ✽ යනු ද අටුවා යි. අරු නම් දුෂ්ටව්‍රණ යි. එකපණ්ණච්ඡත්ත නම් තලපත යි.)

---

ආරඤ්ඤකෙන පන, වනවැසිමහණහු විසින් වනාහි; භණ්ඩුක්ඛලිකාය පක්ඛිපිත්වා, බඩුලනසැළියෙහි බහා; පාසාණසුසිරරුක්ඛසුසිරාදිසු, ගල්සිදුරුරුක්සිදුරුආදිවූ; පටිච්ඡන්නෙසු, පිළිසන්තැන්හි, ඨපෙත්වා, තබා; ගන්තබ්බං; යා යුතු.

✽ ගණ්ඩවණ්ණඅරුසීසරොගාබාධපච්චයා, ගඩුසඝ්වව්‍රණදුෂ්ටව්‍රණශීර්ෂරොගාදිආබාධහෙතුවෙන්; කෙසෙ, කෙසයන්, කත්තරියා, කතුරෙන්; ඡෙදාපෙතුං, කපවන්ට; වට්ටති, වටී;=

යස්ස, යම්කුගේ; කායදාහො වා, කයෙහි දහයක් හෝ වේ ද; පිත්තකොපො වා හොති, පිත්කොපයක් හෝ වේ ද; චක්ඛු වා දුබ්බලං, ඇස් හෝ දුර්වල වේ ද; අඤ්ඤො වා කොචි ආබාධො, අන්‍යවූ හෝ කිසි රොගයෙක්; විනා ඡත්තෙන, කුඩය නො ඉසලීමෙන්; උප්පජ්ජති, උපදී ද; තස්ස, ඔහුට; ගාමෙ වා, ගම්හි ද; අරඤ්ඤෙ වා, වනයෙහි ද; ඡත්තං, කුඩය; වට්ටති, වටී. වෙසො පන, වනාන්තං, වනයෙහි ද; ඡත්තං, කුඩය; වට්ටති, වටී. වෙසො පන, වශීකාලයෙහි වනාහි; චීවරගුත්තත්ථං, සිවුරුරැකීම පිණිස ද; වාලමිගචොරභයෙසු, චණ්ඩමෘගයන්ගෙන් සොරුන්ගෙන් බිය ඇති කල්හි; අත්තගුත්තත්ථං අපි, ආත්මාරක්ෂාව සඳහා ද; වට්ටති, වටී. එකපණ්ණච්ඡත්තං පන, තලපත්ආදිය වනාහි; සබ්බත්ථ එව, හැම තැන ම; වට්ටති, වටී.

374 වාහෙය්‍ය න උභතොකාජං එකන්තරිකකාජකං
සීසක්ඛන්ධකටිභාරො හත්ථොලම්බො ච ලබ්භති.

375 ආපත්තියා අනොකාසකතං චොදෙය්‍ය දුක්කටං
සුද්ධස්ස ච අවත්ථුස්මිං තථා ඔකාසකාරණෙ.

376 අට්ඨඞ්ගුලාධිකං මඤ්චපටිපාදං න ධාරයෙ
පකතඞ්ගුලෙන සත්තානං මඤ්චං වා උච්චපාදකං.

377 මූගබ්බතාදිං ගණ්හෙය්‍ය දුක්කටං තිත්ථියබ්බතං
ඛුරභණ්ඩං පරිහරෙ තථා නහාපිතපුබ්බකො.

378 යඞ්කිඤ්චි යාචිතුං හත්ථකම්මං තදනුසාරතො
ලද්ධං ගහෙතුං නිස්සක්කම්මමයාචිත්වාපි කප්පති
කාරෙතුමාහරාපෙතුං යඞ්කිඤ්චාපරසන්තකං.

---

374 උභතොකාජං, දෙකෙළවර බැඳ එල්වූ බරඇති කද; න වාහෙය්‍ය, නො උසුලන්නේ ය; එකන්තරිකකාජකං, එක්කෙළවරක බැඳ එල්වූ බරඇති කද හා දෙදෙනා උසුලන අතුරු කද ද; සීසක්ඛන්ධකටිභාරො, හිසින් දසරුවෙන් උකුලෙන් ගන්නා බර ද; හත්ථොලම්බො ච, අතින් එල්වා ගන්නා බර ද; ලබ්භති, වටී.

375 අනොකාසකතං, චොදනාව ට අවකාශනොකළ (භික්ෂු) හු; ආපත්තියා, ඇවතින්; චොදෙය්‍ය, චොදනා කෙරේ නම්; දුක්කටං, දුකුලා වෙයි; සුද්ධස්ස; ශුද්ධයා; අවත්ථුස්මිං. නිෂ්කරුණෙහි, ඔකාස කාරණෙ ච; ("කරොතු මෙ ආවුසො ඔකාසං තං අහං වත්තුකාමො"යි චොදනා කරන්නට) අවකාශ කැරවීමෙහි ද; තථා, එසේ ම; (දුකුලා වේ.)

376 සත්තානං, මිනිසුන්ගේ; පකතඞ්ගුලෙන, පියඞ්අඟුලෙන්; (හෙවත්) වඩුඅඟුලින්; අට්ඨඞ්ගුලාධිකං, අටඟුලකින් ඉතිරිවූ; මඤ්චපටිපාදං, හැඳපාඅළු ද; උච්චපාදකං, වඩුරියනින් උස්පා ඇති; මඤ්චං වා, හැඳ ද; න ධාරයෙ, නො දරන්නේ යි.

377 මූගබ්බතාදිං, මූකව්‍රතාදිවූ; තිත්ථියබ්බතං, තීර්ථකයන්ගේ ව්‍රත; ගණ්හෙය්‍ය, ගනී නම්; දුක්කටං, දුකුලා වෙයි; නහාපිතපුබ්බකො, පෙර කරනැවැම්මහණ; ඛුරභණ්ඩං, කරනැවැම්පිරිකර; පරිහරෙ, පරිහරණය කෙරේ නම්; තථා, එසේ ම; (දුකුලා වේ) (අනුන් අතින් ගෙන කෙසවප්දදි කර්මාන්ත කරත් වටී.)

378 යඞ්කිඤ්චි, (භික්ෂුව් ගෙත්තම්ඇ) යම්කිසි; හත්ථකම්මං; අතින් කටයුතු මෙහෙයක්, යාචිතුං; (හස්තකර්මයක් දෙව යි)

379 ගිහීනං ගොපකෙ දෙන්තෙ ගහෙතුං දෙති යත්තකං
ලබ්භං යථාපරිච්ඡෙදං සඞ්ඝචෙතියසන්තකෙ.

380 ද්වීහාපජ්ජෙය්‍ය ආපත්තිං කායවාචාහි වා ඡහි
අලජ්ජඤ්ඤාණකුක්කුච්චපකතත්තා සතිප්ලවා
අකප්පියෙ කප්පියෙ වා කප්පාකප්පියසඤ්ඤිතා.

---

ඉල්වන්නට ද; තදනුසාරතො, ඒ (හස්තකර්මයාච්ඤා) අනුසාරයෙන්; ලද්ධං, ලද කැපවතක්: ගහෙතුං, ගන්නට ද; නික්කම්මං, (කෘෂිවණිජ්ජාදි) කටයුත්තක් නැත්තාහු;. අයාචිත්වාපි, (හස්තකර්ම) යො ඉල්වා ද; කාරෙතුං, (කැමැති මෙහෙයක්) කරවන්ට ද; අපරසන්තකං, අනුන් අයත් නොවූ; යඞ්කිඤ්චි, (ඵලාඵලාදි) යම්කිසිවක්; ආහරාපෙතුං, (අරණ්‍යයෙන්) ගෙන්වන්නට ද, කප්පති, කැප යි.

(“හත්ථකම්මං නාම කිඤ්චි වත්ථු න හොති, තස්මා–කිම්භන්තෙ ආගතත්ථ කෙන කම්මන්ති පුච්ඡිතෙ වා අපුච්ඡිතෙ වා යාචිතුං වට්ටති, විඤ්ඤත්තිපච්චයා දොසො නත්ථි,, * යනු අටුවා යි.)

379 ගිහීනං, ගිහිමිනිසුන් අයත් ඵලාඵලාදිය; ගොපකෙ, උද්‍යානාදි රක්නාහු; දෙන්තෙ, දෙන කල්හි; යත්තකං දෙති, යම්පමණක් දේ ද; ගහෙතුං, (එපමණක්) ගනුත්; ලබ්භං, වටී; සඞ්ඝචෙතියසන්තකෙ, සංඝසන්තක චෛත්‍යසන්තකයෙහි; යථාපරිච්ඡෙදං, (දවසකට මෙතෙක් ගනු යි තමහට) පිරිසුන් සේ (ගොපකයා දෙන කල්හි;) ලබ්භං, (ගන්නට) වටී.

380 කායවාචාහි, කායවාචා යන; ද්වීහි, දෙපරිද්දෙන්; ආපත්තිං, ඇවැත්; ආපජ්ජෙය්‍ය, අවදනේ යි; (අවදනේ ද) අලජ්ජී, අලජ්ජී බැවින් හෝ; අඤ්ඤාණ, අඤ්ඤාණබැවින් හෝ; කුක්කුච්චාපකතත්තා, කුකුසින් මඩනාලදබැවින් හෝ; සතිප්ලවා, සිහිමුළායෙන් හෝ; අකප්පියෙ, අකැපයෙහි ද; කප්පියෙ වා, කැපයෙහි ද; කප්පාකප්පියසඤ්ඤිතා වා, (යථාක්‍රමයෙන්) කැප්සංඥ හෝ අකැපසංඥ හෝ ඇතිබැවින යන; ඡහි, සපරිද්දෙන් (අවදී.)

---

* හත්ථකම්මං නාම, හස්තකර්ම නම්; කිඤ්චි වත්ථු න හොති, කිසි වස්තුවක් නො වේ. තස්මා, එහෙයින්; කිං භන්තෙ ආගතත්ථ, වහන්ස! කවරහෙයකින් ආවහු ද? කෙන කම්මං ඉති, කුමකින් කටයුතු වේ ද යි; පුච්ඡිතෙ වා, විචාළ කල්හි හෝ; අපුච්ඡිතෙ වා, නො විචාළ කල්හි හෝ; යාචිතුං, ඉල්වන්ට; වට්ටති, වටී. විඤ්ඤත්තිපච්චයා, විනවීම්හෙතුවෙන්; දොසො නත්ථි, දොස් නැති·

381 අලජ්ජිඤ්ඤාණතා'පත්තිං කායවාචාහි ඡාදයෙ
ලිඞ්ගෙ සංඝෙ ගණෙ'කස්මිං චතුධා'පත්තිවුට්ඨිති.

382 පරිකථොභාසවිඤ්ඤත්ති න ලබ්භා පච්චයද්වයෙ
විඤ්ඤත්ති යෙව තතියෙ සෙසෙ සබ්බම්පි ලබ්භති.

---

381 ආපත්තිං, (මෙසේ අවන්) ඇවැත්; අලජ්ජිඤ්ඤාණතා, අලජ්ජිබැවින් හෝ; අඤ්ඤාණබැවින් හෝ; කායවාචාහි, කායවාක් දෙකින්; ඡාදයෙ, සඟවන්නේ සි; ලිඞ්ගෙ, ලිඟුපෙරළීමෙහි ය සංඝෙ, සඟමැද ය; ගණෙ, ගණමැද ය; එකස්මිං, එක්පුඟුලෙකු කෙරෙහි ය යන; චතුධා, සතරපරිද්දෙන්; ආපත්තිවුට්ඨිති, ඇවැතින් නැඟිම වේ.

382 පච්චයද්වයෙ, (චීවරපිණ්ඩපාත යන පළමු) දෙපසයෙහි; පරිකථා, පරියායකථා ද; ඔභාස, පහළ කොට කියන පසපිළිබඳ කථා ද; විඤ්ඤත්ති, විනවීම් ද; න ලබ්භා, නො වටී; තතියෙ, තුන්වන සෙනසුන් පසයෙහි; විඤ්ඤත්ති යෙව, විඤ්ඤත්තිය ම (නො වටී.) සෙසෙ, ගිලන්පසයෙහි; සබ්බම්පි, (පරිකථාදි) සියල්ල ම, ලබ්භති වටී.

("චීවරෙ පිණ්ඩපාතෙ ච නිමිත්තොභාසපරිකථාවිඤ්ඤත්තියො න වට්ටන්ති" යන අටුවායෙහි නිමිත්තාවචනසහචර පරිකථාදි ශබ්දයන්ගේ සන්නිධිබලයෙන් ලබන නිමිත්ත ශබ්දයා ද ගෙන නිමිත්තපරිකථොභාසවිඤ්ඤත්ති යයි ගත යුතු.)

("නිමිත්තන්නාම, යඞ්කිඤ්චි පරෙසං පච්චයදානසඤ්ඤාජනකං කායවචීකම්මං, බාදනීයං ගහෙත්වා ගච්ඡන්තෙ දිස්වා කිං බාදනීයං ලභිත්ථා'ති ආදිනා නයෙන තස්ස පවත්ති වෙදිතබ්බා–පරිකථා නාම, යථා තං ලභති තථා තථා පරිවත්තෙත්වා කථනං, එතරහි භික්ඛූ පිණ්ඩපාතෙන කිලමන්තීති ආදිනා නයෙන තස්ස පවත්ති වෙදිතබ්බා–ඔභාසො නාම පච්චයපටිසංයුත්තකථා, වච්ඡපාලකෙ දිස්වා කිං ඉමෙ වච්ඡා ඛීරගොවච්ඡා තක්කගොවච්ඡා'ති පුච්ඡිත්වා ඛීරගොවච්ඡා භන්තෙ'ති වුත්තෙ න ඛීරගොවච්ඡා යදි ඛීරගොවච්ඡා සියුං භික්ඛූ'පි ඛීරං ලභෙය්‍යුන්ති ආදිනා නයෙන තස්ස පවත්ති වෙදිතබ්බා— විඤ්ඤත්ති නාම අඤ්ඤාතකඅප්පවාරිතට්ඨානෙ ආහාරං දෙහීති විඤ්ඤාපනා— සෙනාසනෙ පන නිමිත්තන්නාම සෙනාසනත්ථං භූමිපරිකම්මානි කරොන්තස්ස කිම්භන්තෙ කයිරති කො කාරාපෙතීති ගිහීහි වුත්තෙ න කොචීති පටිවචනං, යං වා පනඤ්ඤම්පි එවරූපං නිමිත්තකම්මං— ඔභාසො නාම උපාසකා තුම්හෙ

කුහිං වසථාති පාසාදෙ භණන්තා'ති භික්ඛුනාම්පන උපාසකා පාසාදෙ න වට්ටතීති වචනං; යං වා පන'ඤ්ඤම්පි එවරූපං ඔභාසකම්මං—පරිකථා නාම භික්ඛුසඞ්ඝස්ස සෙනාසනං සම්බාධන්ති වචනං, යාවා පන'ඤ්ඤා'පි එවරූපා පරියායකථා-භෙසජ්ජෙ සබ්බම්පි ලබ්භති, තථා උප්පන්නම්පන භෙසජ්ජං රොගෙ වූපසන්තෙ පරිභුඤ්ජිතුං න වට්ටති, තත්ථ විනයධරා භගවතා වාරං දින්නං තස්මා වට්ටතීති වදන්ති, සුත්තන්තිකා පන කිඤ්චාපි ආපත්ති න හොති, ආජීවම්පන කොපෙති, තස්මා න වට්ටති'ච්චෙව වදන්ති" + යනු විසුද්ධිමාර්ග අටුවා යි.)

(මෙපමණකින් සතරවනපසයෙහි පරිකථාදී සතර මැ වටී, තුන්වනපසයෙහි විඤ්ඤත්ති මුත් සෙසු තුන වටී. පළමුදෙපසයෙහි හැම ම නො වටී යනු උක්ත යයි දත යුතු)

* නිමිත්තං නාම, නිමිත්ත නම්; යං කිඤ්චි, යම් කිසි; පරෙසං, අනුන්ට; පච්චයදානසඤ්ඤාජනකං, පසයදිමෙහි සංඥා උපදවන; කායවචීකම්මං, කායවාක්කර්මයකි. ඛාදනීයං ගහෙත්වා ගච්ඡන්තෙ දිසවා, කැවිලි ගෙන යන්නන් දැක; කිං ඛාදනීයං ලභිත්ථ, කිම් කැවිලි ලැබුවහු ද? ඉති ආදිනා නයෙන, මේ ආදික්‍රමයෙන්; තස්ස, ඔහුගේ; පවත්ති, පැවැත්ම; වෙදිතබ්බා, දත යුතු. පරිකථා නාම, පරිකථා නම්: යථා, යම්සේ; තං, ඒ; ලභති, ලබා ද; තථා තථා, ඒ ඒ පරිද්දෙන්; පරිවත්තෙත්වා කථනං, පෙරලා කීමයි. එතරහි භික්ඛු පිණ්ඩපාතෙන කිලමන්ති, මෙකල භික්ෂූහු පිණ්ඩපාතයෙන් වෙහෙසෙත්; ඉති ආදිනා නයෙන, මේ ආදික්‍රමයෙන්; තස්ස පවත්ති වෙදිතබ්බා, ඔහුගේ පැවැත්ම දතයුතු. ඔභාසො නාම, ඔභාස නම්: පච්චයපටිසංයුත්තකථා, පසයපිළිබඳ කථා යි. වච්ඡපාලකෙ දිස්වා, වසුපාලකයන් දැක; කිං, කිමි? ඉමෙ වච්ඡා, මේ වස්සෝ; ඛීරගොවච්ඡා, කිරිදෙනුන් වස්සෝ ද; තක්කගොවච්ඡා ඉති, මෝරුදෙනුන් වස්සෝ දැයි; පුච්ඡිත්වා, පිළිවිස; ඛීරගොවච්ඡා භන්තෙ ඉති, කිරිදෙනුන් වස්සෝ ය වහන්සැ යි; වුත්තෙ, කීකල්හි; න ඛීරගොවච්ඡා, කිරිදෙනුන් වස්සෝ නො වෙති; යදි ඛීරගොවච්ඡා සියුං, ඉදින් කිරිදෙනුන් වස්සෝ වෙත් නම්; භික්ඛූ අපි ඛීරං ලභෙය්‍යුං, මහණුහු ද කිරි ලබන් නාහ; ඉති ආදිනා නයෙන, මේ ආදි ක්‍රමයෙන්; තස්ස පවත්ති වෙදිතබ්බා, ඔහු පැවතුම් දත යුතු. විඤ්ඤත්ති නාම, විඤ්ඤත්ති නම්: අඤ්ඤාතකඅප්පවාරිතට්ඨානෙ, නොනෑනොපැවරූතැන; ආහාරං දෙථ ඉති, අහර දෙව යි; විඤ්ඤාපනා. ඉල්වීම යි.

383 න රූහත'ච්චයෙ දානං පඤ්චන්නං සහධම්මිනං
සඞ්ඝස්සෙව ච තං හොති ගිහීනං පන රූහති

---

383 පඤ්චන්නං සහධම්මිනං, පඤ්චසහධර්මිකයන්ගේ; අච්චයෙ දානං, (මා මළකල්හි මාගේ පිරිකර උපාධ්‍යායයන්ට දෙමි යනාදි තමන් ඇවෑමෙහි දීම; න රූහති, නො නැඟෙයි; තං, ඒ චීවරාදිවස්තුව; සඞ්ඝස්සෙව ච හොති, සංඝසන්තක ම වෙයි; ගිහීනං පන, ගිහිවිනිසුන්ගේ (තමන් ඇවෑමෙහි දීම) වනාහි; රූහති, නැඟේ.

---

සෙනාසනෙ පන, සෙනස්නෙහි වනාහි; නිමිත්තං නාම, නිමිත්ත නම්; සෙනාසනත්ථං, සෙනසුන් පිණිස; භූමිපරිකම්මාදිං කාරෙන්තස්ස, බිම්පිරියම් කරන්නාහුව; කිං භන්තෙ කරීයති, කුමක් වහන්ස! කරනු ලැබේ දැ? කො කාරාපෙති ඉති, කවරෙක් කරවා ද යි; ගිහීහි, ගිහියන්; වුත්තෙ, කීකල; න කොචි ඉති, කිසිවෙක් නො කරවා යයි; පච්චුච්චනං, පිළිවදනි, අඤ්ඤං අපි, අනිකුදු; එවරූපං, මෙබඳු; යං වා පන, යමක් හෝ වේ ද? (තං, ඒ;) නිමිත්තකම්මං, නිමිත්තකර්ම නම් ඔභාසො නාම, ඔභාස නම්: උපාසකා, තුම්හෙ කුහිං වසථ ඉති, උපාසකයෙනි! තෙපි කොහි වසව් දැයි; පාසාදෙ භන්තෙ ඉති, පහයෙහි වසමු වහන්සැ යි;

උපාසකා! උපාසකයෙනි! භික්ඛූනං පන, භික්ෂූන්ට වනාහි; පාසාදො න වට්ටති ඉති, පහයක් නො වටනේ දැයි; වචනං, කීමයි. අඤ්ඤං අපි, අනිකුදු; එවරූපං, මෙබඳු; යං වා පන, යම් වචනයක් හෝ වේ ද; (එය) ඔභාසකම්මං, ඔභාසකර්ම නම්. පරිකථා නාම, පරිකථා නම්: භික්ඛුසංඝස්ස සෙනාසනං සම්බාධං ඉති, භික්ෂුසංඝයාට සෙනසුන් ගැහැටය යනාදී; වචනං, කීම යි. අඤ්ඤං අපි, අනිකුදු; එවරූපා, මෙබඳු; යා වා පන පරියායකථා, යම් පරියායකථාවක් හෝ වේ ද; (ඒ පරිකථා නම්.) භෙසජ්ජෙ, බෙහෙත්පසයෙහි; සබ්බං අපි, මේ සියල්ල ම; ලබ්භති, ලැබේ; තථා උප්පන්නං භෙසජ්ජං පන, එසේ උපන් බෙහෙත් වනාහි; රොගෙ වූපසන්තෙ, රොගය සුවවූකල; පරිභුඤ්ජිතුං, වළඳන්ට; න වට්ටති, නො වටී. තත්ථ, එහි; විනයධරා, විනයධරයෝ; භගවතා ද්වාරං දින්නං, බුදුන් විසින් ද්වාරය දෙන ලදී; තස්මා, එහෙයින්; වට්ටති ඉති, වටී යයි; වදන්ති, කියත්; සුත්තන්තිකා පන, සූත්‍රාන්තිකයෝ වනාහි; කිඤ්චාපි ආපත්ති න හොති, කිසිලෙසකින් ඇවැත් නො වේ; ආජීවං පන කොපෙති, ආජීවය වනාහි දූෂිත කෙරේ; තස්මා, එහෙයින්; න වට්ටති ඉති එව, නො වටී යයි ම; වදන්ති, කියති.

384 භික්ඛු වා සාමණේරො වා කාලං කයිරාථුපස්සයෙ
භික්ඛුසඞ්ඝොව දායජ්ජො තත්ථ සෙසෙප්‍යයං නයො

385 පුරිමස්සේවිමං දින්නං දෙහි නෙත්වා'සුකස්සීති
පච්ඡිමස්සෙව දම්මී'ති දින්නං ඤත්වා ඉමං විධිං
ගණ්හෙ විස්සාසගාහා වා 'ධිට්ඨෙ මතකචීවරං.

---

(''සචෙ පඤ්චසු සහධම්මිකෙසු යො කොචි කාලං කරොන්තො මමච්චයෙන මය්හං පරික්ඛාරො උපජ්ඣායස්ස හොතු ආචරියස්ස හොතු සද්ධිවිහාරිකස්ස හොතු අන්තෙවාසිකස්ස හොතු මාතු හොතු පිතු හොතු අඤ්ඤස්ස වා කස්සචි හොතූ'ති වදති තෙසං න හොති, සඞ්ඝස්සෙව හොති, න හි පඤ්චන්නං සහධම්මිකානං අච්චයෙන දානං රූහති, ගිහීනම්පන රූහති,, * යනු අටුවා යි.)

384 භික්ඛු වා, භික්ෂුවෙක් හෝ; සාමණේරො වා, සාමණේරයෙක් හෝ; උපස්සයෙ, මෙහෙණවර; කාලං කයිරාථ, මළේ වි නම්; භික්ඛුසඞ්ඝොව, භික්ඛුසඞ්ඝ ම; තත්ථ, ඒ දෙදෙනා සතු පිරිකර; දායජ්ජං, හිමි ය; සෙසෙපි, භික්ඛුනී සික්ඛමානා සාමණේරීන් (භික්ෂුවිහාරයෙහි) මළ කල්හි දු; අයං නයො, මේ ම නය යි; (උන් සතු පිරිකර භික්ෂුණීසඞ්ඝ ම හිමි ය යි සේයි)

385 ඉමං නෙත්වා අසුකස්ස දෙහීති, මේ ගෙන ගොස් අසවල්හට දෙව යි; දින්නං දෙන ලද (චීවරාදිය;) පුරිමස්සෙව, (ලබන්නහු (අතට නො ගිය තාක් කල්) දායකයා සන්තක ම ය; දම්මීති දින්නං

---

* සචෙ, ඉදින්; පඤ්චසු සහධම්මිකෙසු, පස් සහදම්මියන්ගෙන්; යො කොචි, යම් කිසිවෙක්; කාලං කරොන්තො, මිය යන්නේ; මම අච්චයෙන, මාගේ ඇවෑමෙන්; මය්හං පරික්ඛාරො, මාගේ පිරිකර; උපජ්ඣායස්ස හොතු, උපාධ්‍යායහට වේ වා; ආචරියස්ස හොතු, ආචාර්‍ය්‍යහට වේ වා; සද්ධිවිහාරිකස්ස හොතු, සද්ධිවිහාරිකහට වේ වා, අන්තෙවාසිකස්ස හොතු, අතවැසිහට වේ වා; මාතු හොතු, මවට වේ වා; පිතු හොතු; පියාට වේ වා; අඤ්ඤස්ස කස්සචි වා හොතු ඉති, අන් කිසිවකුට හෝ වේ ව යි; වදති, කියා ද; තෙසං න හොති, ඔවුන්ට (අයිති) නො වේ. සඞ්ඝස්ස එව හොති, සංඝයාට ම (අයිති) වේ; හි, යම් හෙයකින්; පඤ්චන්නං සහධම්මිකානං, පස් සහදම්මියන්ගේ; අච්චයෙන දානං, ඇවෑමෙන් දීම; න රූහති, නො හැගේ ද (එහෙයිනි.) ගිහීනං පන, ගිහීන්ගේ (අච්චයදානය) වනාහි; රූහති, හැගේ.

386 ලොහභණ්ඩ පහරණිං දාරුභණ්ඩ ච දාරුජං
පත්තං පාදුකපල්ලඞ්කං ආසන්දිං මත්තිකාමයෙ
ඨපෙත්වා කප්පති සබ්බං කතකං කුම්භකාරිකන්ති.

"දෙසනා"ති,–

387 වාචා යො භික්ඛුභාවස්ස සා පාරාජිකදෙසනා
යථාවුත්තාන උට්ඨානං ගරුකාපත්තිදෙසනා.

---

(මේ අසවල්හට) දෙමි යි දෙන ලද්දේ; පච්ඡිමෙ සොච, (දුන් තැන පටන්) පිරිකර ලබන්නහු සන්තක මැයි; ඉමං විධිං, මේ විධානය; ඤත්වා, දැන; (මෙවත් මෙකී ප්‍රකාරයෙන් හිමියන්) හැඳින; විස්සාසග්ගාහා වා, (ජීවත්වන හිමියන් කෙරෙහි) විශ්වාසග්‍රාහයෙන් හෝ; ගණ්හෙ, ගන්නේ ය; මතකචීවරං (වා, ලා මළ හොත්) මතකචීවර කොට හෝ; අධිට්ඨෙ, ඉටන්නේ යි; (අන් මහණුන් නැත හොත් මේ මට පැමිණේ යි සිතින් සැලකීම අධිට්ඨාන නමි.)

386 ලොහභණ්ඩ, ලොහභාණ්ඩයෙහි; පහරණිං; ආයුධ ද, දාරුභණ්ඩ, දාරුභාණ්ඩයෙහි; දාරුජං, දාරුමයවූ; පත්තං, පාත්‍ර ද; පාදුක, (පය ලා සක්මන් කට හැකි) මරවැඩිය ද; පල්ලඞ්කං, (ඇරැවි දුවූ ව්‍යාල රූපඇති) පර්‍ය්‍යඞ්කය ද; ආසන්දිං, පමණ ඉකුත් දික් පහලා පුටුව ද; මත්තිකාමයෙ, මැටියෙන් කළ භාණ්ඩයෙහි; කතකං, කතමල්ලකය ද; කුම්භකාරිකා, සබ්බමත්තිකාමයකුටිය ද; ඨපෙත්වා, තබා; සබ්බං (සෙසු ලොහභාණ්ඩය දාරුභාණ්ඩය මත්තිකාභාණ්ඩය යන) සියල්ල; කප්පති, කැපයි.

("කතකං නාම පදුමකණ්ණිකාකාරං පාදඝංසනත්ථං කණ්ටකෙ උට්ඨාපෙත්වා කතං, තං වට්ටං වා හොතු චතුරස්සාදිභෙදං වා බාහුලිකානුයොගත්තා පටික්ඛිත්තමෙව නෙව පටිග්ගහෙතුං න පරිභුඤ්ජිතුං වට්ටති" * යනු අටුවා යි.)

දෙසනා ති,

දෙසනා යන්නෙහි; (ආපත්තිදෙසනා නම:)

387. භික්ඛුභාවස්ස, භික්ෂුවේශයාගේ; යො වාචා, (ගෘහස්ථාදි භාවයට පැමිණීමෙන්) යම් පරිත්‍යාගයෙක් ඇද්ද; සා, හෝ තොමෝ; පාරාජිකදෙසනා, පාරාජිකාදෙශනා නම් වේ; යථා වුත්තාන, යටකී පරිද්දෙන්; උට්ඨානං, (ආපත්තීන්) නැඟීම; ගරුකාපත්තිදෙසනා, සඞ්ඝාදිසෙසාපත්ති දෙසනා නම් වේ යි

---

* කතකං නාම, කතක නම්: පදුමකණ්ණිකාකාරං, පියුම්කෙමි ආකාර කොට; පාදඝංසනත්ථං, පාගටනු පිණිස; කණ්ටකෙ උඩ්,

388 උක්කුටිකං නිසීදිත්වා පග්ගණ්හිත්වාන අඤ්ජලිං
ථුල්ලච්චයාදිං දෙසෙය්‍ය එවමේකස්ස සන්තිකෙ.

(7) "අහම්භන්තෙ එකං ථුල්ලච්චයාපත්තිං ආපජ්ජිං තං තුම්හමූලෙ පටිදෙසෙමී"ති වත්වා, තෙන "පස්සසි ආවුසො තං ආපත්ති"න්ති වුත්තෙ, "ආම භන්තෙ පස්සාමී"ති වත්වා, පුන තෙන "ආයතිං ආවුසො සංවරෙය්‍යාසී"ති වුත්තෙ, "සාධු සුට්ඨු භන්තෙ සංවරිස්සාමී"ති වත්තබ්බං.

388 උක්කුටිකං නිසීදිත්වා, එළිල්ලෙන් හිඳ; අඤ්ජලිං පග්ගණ්හිත්වාන, ඇඳිලි බැඳ; එකස්ස සන්තිකෙ, එක් මහණකුහු කෙරෙහි; එවං, මෙසේ; ථුල්ලච්චයාදිං, ථුල්ලච්චයාදි ඇවැත්, දෙසෙය්‍ය, දෙසන්නේ යි.

(7) අහම්භන්තෙ-පෙ-පටිදෙසෙමීති, "අහම්භන්තෙ එකං ථුල්ලච්චයාපත්තිං ආපජ්ජිං තං තුම්හමූලෙ පටිදෙසෙමී"යි; වත්වා, කියා; තෙන, ඔහු විසින්; පස්සසි ආවුසො තං ආපත්තින්ති, "පස්සසි ආවුසො තං ආපත්තිං" යි; වුත්තෙ, කීකල්හි; ආම භන්තෙ පස්සාමීති, "ආම භන්තෙ පස්සාමි" යි; වත්වා, කියා; පුන, නැවත; තෙන, ඔහු විසින්; ආයතිං ආවුසො සංවරෙය්‍යාසීති, "ආයතිං ආවුසො සංවරෙය්‍යාසී" යි; වුත්තෙ, කීකල්හි; සාධු සුට්ඨු භන්තෙ සංවරිස්සාමීති, "සාධු සුට්ඨු භන්තෙ සංවරිස්සාමි"යි; වත්තබ්බං, කිය යුතු.

(භන්තෙ, ස්වාමිය; අහං, මම; එකං ථුල්ලච්චයාපත්තිං, එක් තුලැසි ඇවතක්; ආපජ්ජිං, අවන්මි; තං, ඒ; තුම්හමූලෙ, තොප කෙරෙහි; පටිදෙසෙමීති, දෙසමි යි; වත්වා කියා; තෙන, ඔහු විසින්; ආවුසො; ඇවත; තං ආපත්තිං, ඒ ඇවත; පස්සසීති, දක්හි දැ යි; වුත්තෙ, කීකල්හී; භන්තෙ, ස්වාමිය; ආම, එසේ යි, පස්සාමීති, දක්මි යි; වත්වා; කියා; පුන, නැවත; තෙන, ඔහු විසින්; ආවුසො, ඇවත; ආයතිං, මත්තෙහි; සංවරෙය්‍යාසීති, සංවරයෙහි සිටිහි දැ යි; වුත්තෙ, කී සඳ;

පෙත්වා, කටු නගා, කතං, කරනලද උපකරණයකි. තං, එය; වට්ටං වා හොතු, වට හෝ වේවා; චතුරස්සාදිභෙදං වා, සතරැස් ආදි විශෙෂ හෝ වේ වා; බාහුලිකානුයොගත්තා, ප්‍රත්‍යයබහුලතානුයොගයට හෙතුබැවින්; පටික්ඛිත්තං එව, ප්‍රතික්ෂෙප කරනලද්දේ ම ය. නෙව පටිග්ගහෙතුං, නො ම පිළිගන්ට; න පරිභුඤ්ජිතුං, නො පරිභොග කරන්ට; වට්ටති, වේ.

8 අහම්භන්තෙ ද්වෙ ථුල්ලච්චයාපත්තියො ආපජ්ජිං-පෙ-අහම්භන්තෙ සම්බහුලා ථුල්ලච්චයාපත්තියො ආපජ්ජිං, තා තුම්හමූලෙ පටිදෙසෙමී"ති-පෙ-වත්තබ්බං.

(9) නිස්සග්ගියෙසු පන "ඉදම්මෙ භන්තෙ චීවරං දසාහාතික්කන්තං නිස්සග්ගියං, ඉමාහං ආයස්මතො නිස්සජ්ජාමී"ති. "ඉමානි මෙ භන්තෙ චීවරානි පෙ—එතම්මෙ භන්තෙ චීවරං—පෙ—එතානි මෙ භන්තෙ චීවරානි දසාහාතික්කන්තානි නිස්සග්ගියානි, එතානාහං ආයස්මතො නිස්සජ්ජාමී"ති.

389 නිස්සජ්ජිත්වාන දෙසෙය්‍ය ආපත්තිං තෙන භික්ඛුනා,
පටිග්ගහෙත්වා ආපත්තිං දෙය්‍යං නිස්සට්ඨචීවරං,
"ඉමං-ඉමානි-එතං-එතානි චීවරානි ආයස්මතො දම්මී"ති.

---

භන්තෙ, ස්වාමිය; සාධු, යහපතැ යි, සුට්ඨු, මනා කොට; සංවරිස්සාමීති, සංවරයෙහි පිහිටිමි යි, වත්තබ්බං; කිය යුතු යි; යනු මෙහි අර්ථයි.

(8) ද්වෙ ථුල්ලච්චයාපත්තියො, ථුල්ලච්චයාපත්ති දෙකක්; සම්බහුලා ථුල්ලච්චයාපත්තියො, බොහෝ ථුල්ලච්චයාපත්තීන්;

(9) නිස්සග්ගියෙසු පන, නිසගි (පචිති) යෙහි වනාහි; ඉදම්මෙ භන්තෙ චීවරං—පෙ—නිස්සජ්ජාමීති, (සම්පයෙහි එක් සිවුරක්වුව) "ඉදම්මෙ භන්තෙ චීවරං දසාහාතික්කන්තං නිස්සග්ගියං ඉමාහං ආයස්මතො නිස්සජ්ජාමි" කියා ද; ඉමානි මෙ භන්තෙ චීවරානි-පෙ-(බොහෝ වුව) "ඉමානි මෙ භන්තෙ චීවරානි දසාහාතික්කන්තානි නිස්සග්ගියානි ඉමානාහං ආයස්මතො නිස්සජ්ජාමි" කියා ද; එතම්මෙ භන්තෙ චීවරං-පෙ-(දුරැ එකක් වුව) "එතම්මෙ භන්තෙ චීවරං දසාහාතික්කන්තං නිස්සග්ගියං එතාහං ආයස්මතො නිස්සජ්ජාමි" කියා ද; එතානි මෙ භන්තෙ චීවරානි—පෙ—නිස්සජ්ජාමීති, (බොහෝ වුව) "එතානි මෙ භන්තෙ චීවරානි දසාහාතික්කන්තානි නිස්සග්ගියානි එතානාහං ආයස්මතො නිස්සජ්ජාමි" කියා ද.

389 නිස්සජ්ජිත්වාන, (වස්තුව මෙසේ) නිසඳා; ආපත්තිං (අවත්) ඇවැත්; දෙසෙය්‍ය, දෙසන්නේ යි; තෙන භික්ඛුනා, (සිවුර නිසඳන ලද) ඒ භික්ෂුහු විසින්; ආපත්තිං, ඇවැත්; පටිග්ගහෙත්වා, පිළිගෙන; නිස්සට්ඨචීවරං, නිසඳුසිවුර; ඉමං-පෙ-දම්මීති, "ඉමං-ඉමානි-එතං-එතානි චීවරානි ආයස්මතො දම්මී"යි කියා, දෙය්‍යං, දිය යුත්තේ යි.

(10) ඉදං මෙ භන්තෙ චීවරං රත්තිං විප්පවුත්ථං අඤ්ඤත්‍ර භික්ඛු සම්මුතියා නිස්සග්ගියං, ඉමාහං ආයස්මතො නිස්සජ්ජාමීති,

---

("සචෙ එකං චීවරං හොති "අහමහං භන්තෙ එකං නිස්සග්ගියං පාචිත්තියං ආපන්නො තං පටිදෙසෙමී"ති. සචෙ බහූනි "අහමහ භන්තෙ සම්බහුලා නිස්සග්ගියා පාචිත්තියා ආපන්නො තා පටිදෙසෙමී"ති වත්වා තෙන "පස්සසි ආවුසො"ති වුත්තෙ "ආම පස්සාමී"ති වත්වා "ආයතිං ආවුසො සංවරෙය්‍යාසී"ති වුත්තෙ "සාධු සුට්ඨු සංවරිස්සාමී"* යි-

මෙසේයින් ඇවැත්, දෙසූකල්හි ඇවැත් පිළිගන්නහු විසින් (සම්පතයහි එක සිවුරක් වුව "ඉමං චීවරං ආයස්මතො දම්මි"යි, කියා ද; බොහෝ වුව "ඉමානි චීවරානි ආයස්මතො දම්මි" යි කියා ද; දුර එකක් වුව "එතං චීවරං ආයස්මතො දම්මි'යි, කියා ද; බොහෝ වුව "එතානි චීවරානි ආයස්මතො දම්මි' යිකියා ද නිසඳුසිවුර දිය යුතු. භන්තෙ, ස්වාමීනි! මෙ, මාගේ;, ඉදං චීවරං, මේ (අතිරේක) චීවරය; දසාහාතික්කන්තං, දසදවසක් ඉක්මුණේ ය; නිස්සග්ගියං, නිසඳිය යුත්තේ ය; අහං, මම; ඉමං, මේ සිවුර; ආයස්මතො, ඇවැත් හට; නිස්සජාමි. නිසජමි; භන්තෙ, ස්වාමීනි; මෙ, මාගේ; ඉමානි චීවරානි, මේ චීවරයෝ; දසාහාතික්කන්තානි, දසදවසක් ඉක්මුණාහ; නිස්සග්ගියානි, නිසජිය යුත්තාහ; ඉමානි, මේ චීවරයන්; —පෙ—එතං චීවරං, ඒ සිවුර; එතානි චීවරානි, ඒ චීවරයෝ; -පෙ-එතානි, ඒ චීවරයන්; ආයස්මතො, ඇවැත් හට; නිස්සජාමි, නිසජමි යි. (මෙසේයින් යට පාඨයන් ඇඟී දත යුතු.)

(10) භන්තෙ, ස්වාමීනි! මෙ, මාගේ; ඉදං චීවරං, මේ සිවුර; භික්ඛු සම්මුතියා අඤ්ඤත්‍ර, මහණසම්මුති නැති ව; රත්තිං, රාත්‍රියෙහි; විප්ප

---

* සචෙ, ඉදින්; එකං චීවරං හොති, එක් සිවුරක් වේ නම්; භන්තෙ, වහන්ස! අහං, මම; එකං නිස්සග්ගියං පාචිත්තියං, එක් නිසගි පචිතියකට; ආපන්නො; පැමිණියෙමි; තං, එය; පටිදෙසෙමි ඉති, දෙසමි යි; සචෙ, ඉදින්; බහූනි චීවරානි හොන්ති, බොහෝ සිවුරු වෙත් නම්; භන්තෙ, වහන්ස; අහං, මම; සම්බහුලා නිස්සග්ගියා පාචිත්තියා, බොහෝ නිසගි පචිතීන්ට; ආපන්නො, පැමිණියෙමි; තා, ඒ පචිතීන්; පටිදෙසෙමි ඉති, දෙසමි යි; වත්වා, කියා; තෙන, ඒ (ඇවැත් පිළිගන්නහු) විසින්; පස්සසි ආවුසො ඉති, දක්හි ඇවැතැ යි; වුත්තෙ, කී කල්හි; ආම පස්සාමි ඉති, එසේ ය දකිමි යි; වත්වා, කියා; ආවුසො, ඇවැත, ආයතිං, මතු; සංවරෙය්‍යාසි ඉති, සංවරයෙහි සිටිහි දැයි; වුත්තෙ, කී කල්හි; සාධු, යහපත; සුට්ඨු, මනාකොට සංවරිස්සාමි, සංවරයෙහි සිටිමි.

(11) ඉදං මෙ භන්තෙ අකාලචීවරං මාසාතික්කන්තං නිස්සග්ගියං, -පෙ-

(12) ඉදං මෙ භන්තෙ පුරාණචීවරං අඤ්ඤාතිකාය භික්ඛුනියා ධොවාපිතං නිස්සග්ගියං.

(13) ඉදං මෙ භන්තෙ චීවරං අඤ්ඤාතිකාය භික්ඛුනියා හත්ථතො පටිග්ගහිතං අඤ්ඤත්‍ර පාරිවට්ටකා නිස්සග්ගියං.

---

වුත්තං, විශේෂ ව වසන ලද; නිස්සග්ගියං, නිසජිය යුත්තේ ය; අහං, මම; ඉමං මේ සිවුර; ආයස්මතො, ඇවැත්හට; නිස්සජ්ජාමීති, නිසජමි යි.

(11) අකාලචීවරං, නොකල් සිවුර; මාසාතික්කන්තං, මසක් ඉක්මුණේය. "අකාලචීවරං නාම අනත්ථතෙ කඨිනෙ එකාදසමාසෙ උප්පන්නං, අත්ථතෙ කඨිනෙ සත්තමාසෙ උප්පන්නං, කාලෙ'පි ආදිස්ස දින්නං".*

(12) පුරාණචීවරං, (වැලඳගත්) පරණසිවුර; අඤ්ඤාතිකාය භික්ඛුනියා, නොනෑමෙහෙණකල වා; ධොවාපිතං, සෝදවන ලද.

අඤ්ඤාතිකා නාම, මාතිතො වා පිතිතො වා යාව සත්තමා කුලපරිවට්ටා අසම්බද්ධා. පුරාණචීවරං නාම සකිං නිවත්ථං වා සකිං පාරුතං වා.†

(13) අඤ්ඤාතිකාය භික්ඛුනියා හත්ථතො, නොනෑ මෙහෙණක අතින්; පාරිවට්ටකා අඤ්ඤත්‍ර, පාරිවට්ටකයක් නැති ව; (සටත්පිරිසෙයින් අර්ථකඩ කුදු නො දී) පටිග්ගහිතං, පිළිගන්නා ලද.

---

* අකාලචීවරං නාම, නොකල්සිවුරැ නම්; අනත්ථතෙ කඨිනෙ, කඨිනය නොඅතුළ කල්හි; එකාදසමාසෙ උප්පන්නං, (ඉල්මස හැර ඉතිරි) එකොළොස් මස තුළ උපන් සිවුරැ යි අත්ථතෙ කඨිනෙ, අතුළ කඨිනය ඇති කල; සත්තමාසෙ උප්පන්නං, (ඉල්ආදි පස්මස හැර සෙසු) සත්මස තුළ උපන් සිවුරැ යි, කාලෙ අපි, (ඉල්මස්) කල්හි ද; ආදිස්ස දින්නං, (අකාලචීවර යයි) නියම කොට දෙන ලද්දේ (නොකල් සිවුරැ නම්.)

† අඤ්ඤාතිකා නාම, නොනෑ (මෙහෙණ) නම්: මාතිතො වා, මව්පසින් හෝ; පිතිතො වා, පියපසින් හෝ; යාව සත්තමා කුලපරිවට්ටා, සත්වන කුලපරපුර දක්වා; අසම්බද්ධා, නොබැඳුණු තැනැත්තී යි,

පුරාණචීවරං නාම, පරණසිවුර නම්: සකිං නිවත්ථං වා, වරක් හැඳගලද හෝ; සකිං පාරුතං වා, වරක් පොරවන ලද හෝ (සිවුර) යි.

(14) ඉදං මෙ භන්තෙ චීවරං අඤ්ඤාතකං ගහපතිකං අඤ්ඤත්‍ර සමයා විඤ්ඤාපිතං නිස්සග්ගියං.

(15) ඉදං මෙ භන්තෙ චීවරං අඤ්ඤාතකං ගහපතිකං තතුත්තරිං විඤ්ඤාපිතං නිස්සග්ගියං,

(16) ඉදං මෙ භන්තෙ චීවරං පුබ්බෙ අප්පවාරිතො අඤ්ඤාතකං ගහපතිකං උපසංකමිත්වා විකප්පං ආපන්නං නිස්සග්ගියං.

(17) ඉදං මෙ භන්තෙ චීවරං පුබ්බෙ අප්පවාරිතො අඤ්ඤාතකෙ ගහපතිකෙ උපසංකමිත්වා විකප්පං ආපන්නං නිස්සග්ගියං.

(18) ඉදං මෙ භන්තෙ චීවරං අතිරෙක තික්ඛත්තුං චොදනාය අතිරෙකඡක්ඛත්තුං ඨානෙන අභිනිප්ඵාදිතං නිස්සග්ගියං.

(19) ඉදං මෙ භන්තෙ සන්ථතං කොසියමිස්සකං කාරාපිතං නිස්සග්ගියං,

---

(14) අඤ්ඤාතකං, නොනෑ; ගහපතිකං, ගිහිමිනිසකු; සමයා අඤ්ඤත්‍ර, (අසුන් සිවුරෑ නවසිවුරෑ ඇති) සමය මිස; විඤ්ඤාපිතං, විඤ්ඤාපනය කරවන ලද.

(15) තතුත්තරිං, කීපමණෙකින් වඩා (හෙවත්) හඳනා පොරෝනා පමණෙකින් වැඩියක්; විඤ්ඤාපිතං, විඤවන ලද.

(16) පුබ්බෙ, පළමු; අප්පවාරිතො, (එබඳු සිවුරකින් අපි ද කෙබඳු සිවුරක් ගෙන දෙම් දැයි) නො පවරන ලදු ව; අඤ්ඤාතකං ගහපතිකං, නොනෑ ගිහිමිනිසකු කරා; උපසඞ්කමිත්වා, එළඹ; විකප්පං (මෙ සිවුරෑ මිලයෙන් දිගින් පුළුලින් මෙබඳු හෝ මෙබඳු සිවුරක් ගෙන දෙව යන) අර්ථවිධානයට; ආපන්නං, පමුණුවන ලද.

(17) අඤ්ඤාතකෙ ගහපතිකෙ, නොනෑ ගිහිමිනිසුන් කරා; උපසඞ්කමිත්වා, එළඹ;

(18) අතිරෙකතික්ඛත්තුං, තුන්වරකට අධික කොට, චොදනාය, (ඇවත සිවුරෙන් මට අපි ඇත යන) චොදනාවෙන්; අතිරෙකඡක්ඛත්තුං, සවරකට අධික කොට; ඨානෙන, (තුෂ්ණීම්භූතව) සිටීමෙන්; අභිනිප්ඵාදිතං, නිපදවන ලද,

(19) ඉදං සන්ථතං, මේ සන්ථතය; කොසියමිස්සකං, තිසිරිසු මුසු කොට; කාරාපිතං, කරවන ලද.

(20) ඉදං මෙ භන්තෙ සුද්ධකාළකානං එළකලොමානං සන්ථතං කාරාපිතං නිස්සග්ගියං.

(21) ඉදං මෙ භන්තෙ සන්ථතං අනාදියිත්වා තුලං ඔදාතානං තුලං ගොචරියානං කාරාපිතං නිස්සග්ගියං.

(22) ඉදං මෙ භන්තෙ සන්ථතං ඌනකඡබ්බස්සානි කාරාපිතං අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා නිස්සග්ගියං.

(23) ඉදං මෙ භන්තෙ නිසීදනසන්ථතං අනාදියිත්වා පුරාණසන්ථතස්ස සාමන්තා සුගතවිදත්ථිං කාරාපිතං නිස්සග්ගියං.

(24) ඉමානි මෙ භන්තෙ එළකලොමානි තියොජනපරමං අතික්කාමිතානි නිස්සග්ගියානි.

---

(**"සන්ථතන්නාම සමෙ භූමිභාගෙ කොසියංසූනි උපරූපරි සන්ථරිත්වා කඤ්ජිකාදීහි සිඤ්චිත්වා කතං අවායිමං"** *)

(20) ඉදං සන්ථතං, මේ සන්ථතය; සුද්ධකාළකානං, හුදෙක් කළුවූ; එළකලොමානං, එළුලොමින්; කාරාපිතං, කරවන ලද.

(21) ඔදාතානං, සුදු එළුලොමින්; තුලං, භාගයක් ද; ගොචරියානං, කිඹුල්වන් එළුලොමින්; තුලං, භාගයක් ද; අනාදියිත්වා, නො ගෙන.

(22) භික්ඛුසම්මුතියා අඤ්ඤත්‍ර, මහණසම්මුති නැති ව; ඌනඡබ්බස්සානි, කළතැන් පටන් සහවුරුද්දක් නො පිරෙන තෙක්; කාරාපිතං, කරවන ලද.

(23) පුරාණසන්ථතස්ස, (අනුභවකරන ලද) පරණසන්ථතයාගේ; සාමන්තා, එක්පසකින්; සුගතවිදත්ථිං, සුගත් වියතක් පමණ; අනාදියිත්වා, නො ගෙන.

(24) ඉමානි එළකලොමානි, මේ එළකලෝමයෝ; තියොජනපරමං, තුන්යොදනක්පමණතැන්; අතික්කාමිතානි, ඉක්මවන ලදහ.

---

* **සන්ථතං නාම, සන්ථතය නම්:**-සමෙ භූමිභාගෙ, සමවූ භූමිභාගයෙක්හි; කොසියංසූනි, තිසිරිකෙඳි; උපරූපරි, මතුමත්තෙහි; සන්ථරිත්වා, අතුරා; කඤ්ජිකාදීහි, කැඳආදියෙන්; සිඤ්චිත්වා, ඉස; කතං, කරන ලද; අවායිමං, විවීමෙන් තොර ව සාදන ලද ඇතිරියකි.

(25) ඉමානි මෙ භන්තෙ එළකලොමානි අඤ්ඤාතිකාය භික්ඛුණියා ධොවාපිතානි නිස්සග්ගියානි.

(26) අහං භන්තෙ රූපියං පටිග්ගණ්හිං ඉදං මෙ භන්තෙ නිස්සග්ගියං ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමී''ති.

(27) අහං භන්තෙ නානප්පකාරකං රූපියසංවොහාරං සමාපජ්ජිං ඉදං මෙ භන්තෙ නිස්සග්ගියං ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමී''ති.

390 නිස්සජ්ජිත්වාන ආපත්තිං දෙසෙය්‍යා'ථ ගිහිං වදෙ
ජානාහි'මන්ති ඉමිනා සො වදෙය්‍ය හරාමි කිං.

391 අවත්වා 'මන්ති තෙලාදි වදෙ භික්ඛූන කප්පියං
යං ආහරති සො තෙන පරිවත්තෙත්වා * කප්පියං.

392 ලබ්භං ඨපෙත්වා වෙ පෙතෙ සෙසෙහි පරිභුඤ්ජිතුං
තතො අඤ්ඤෙන ලද්ධො'පි භාගො තෙසං න කප්පති

---

(25) අඤ්ඤාතිකාය භික්ඛුණියා, නො නෑමෙහෙණක ලවා; ධොවාපිතානි, සෝදවන ලදහ

(26) රූපියං, රන්රිදීමසුකහවණු; පටිග්ගණ්හිං, ගත්මි.

(27) නානප්පකාරකං (කතාකතාදි විසින්) නොයෙක් ප්‍රකාරවූ; රූපියසංවොහාරං, රන්රිදීමසුකහවණු පෙරළිකිරීමට; සමාපජ්ජිං, පැමිණියෙමි; භන්තෙ, ස්වාමිය; මෙ, මාවිසින්; ඉදං, මේ; නිස්සග්ගියං. නිසජිය යුත්තේ ය; අහං මම; ඉමං, මේ; නිස්සජ්ජාමීති, නිසජම් යි.

390 නිස්සජ්ජිත්වාන, වස්තුව නිසජා; ආපත්තිං, (අවන්) ඇවැත්; දෙසෙය්‍ය, දෙසන්නේ ය; අථ, (ඇවැත් දෙසූ) ඉක්බිති; ගිහිං, (එතනට පැමිණි) ගිහිමිනිසකුට; ඉමං ජානාහීති, මෙ දන්ව යි; වදෙ; කියන්නේ ය; සො, හෙතෙම; ඉමිනා, මෙයින්; කිං හරාමි, කුමක් ගෙනෙනවු දැයි; වදෙය්‍ය, කියා නම්.

391 ඉමන්ති, මේ (ගෙනෙව) යි; අවත්වා, නො කියා; භික්ඛූනං, මහණුන්ට; තෙලාදි, තෙල් (මී සකුරු) ආදිය; කප්පියං, කැප යයි; වදෙ, කියන්නේ ය; සො, හෙතෙම; තෙන, ඒ (නිසඳු) වතින්; පරිවත්තෙත්වා, පෙරළි කොට; යං කප්පියං, යම් කැපවතක්; ආහරති, ගෙනේ ද; (තං, ඒ කැපවත.)

392 එතෙ වෙපි ඨපෙත්වා, (රූපියපටිග්ගාහක රූපියසංවොහාරක) ඒ දෙදෙන මැ තබා; සෙසෙහි, සෙසු මහණුන් විසින්; පරිභුඤ්ජ

---

* පරිවත්තෙත්වාන ඇතැම්.

393 රුක්ඛච්ඡායා'පගතමත්තෙ තං නිබ්බත්තනා න කප්පති,
නිස්සට්ඨප්පටිලද්ධම්පි ආදිතො සන්ථතත්තයං.

394 නො චෙ ලභෙථ එවං සො ඉමං ඡඩ්ඩෙහි සංසියො
එවම්පි භික්ඛු ඡඩ්ඩෙය්‍ය නො චෙ ලබ්භෙය්‍ය සම්මතො.

395 එතානි දුතියං පත්තං සඞ්ඝෙ සෙසානි ලබ්භරෙ,
සඞ්ඝෙ'කස්මිං ගණෙ වත්ථුං ලබ්භං භාසන්තරෙන'පි

(28) අහං භන්තෙ නානප්පකාරකං කයවික්කයං සමාපජ්ජිං
ඉදං මෙ භණ්ඩං නිස්සග්ගියං

---

තුං, වලඳන්නට; ලබ්භං, වටී; තතො, ඒ (නිසඳුවත් පෙරළි කොට ගෙනා කැපවතින්; අඤ්ඤෙන, අනිකකු විසින්; (යටත්පිරිසෙයින් ආරාමිකයකුදු විසින්) ලද්ධො භාගොපි, ලද කොටසකු දු; තෙසං, ඒ දෙදෙන හට; න කප්පති, නො වටී. (බොහෝ කියා කිමෙක් ද?)

393 අන්තමසො, යටත්පිරිසෙයින්; තංනිබ්බත්තනා, ඒ වස්තු වෙන් උපන්; රුක්ඛච්ඡායාපි, ගස්සෙවනකුදු; න කප්පති, (ඒ දෙදෙනාට) නො වටී. නිස්සට්ඨපටිලද්ධං, නිසඳ නැවත ලද්දවූ; ආදිතො, ආදියෙහි; සන්ථතත්තයම්පි, (කොසිය ය සුද්ධකාලක ය ද්වෙභාග ය යන) සන්ථත තුන ද; (න කප්පති, "අඤ්ඤෙන කතං පටිලභිත්වා පරිභුඤ්ජති ආපත්ති දුක්කටස්ස"යි වදාළ බැවින් හැමදෙන හට ම නො වටී.)

394 එවං, මෙසේ (කීසෙයින්) නො චෙ ලභෙථ, ඉදින් නො ලැබී නම්; සො, ඒ ගිහිමිනිස්; ඉමං ඡඩ්ඩෙහි, මේ දමයි; සංසියො, (සඟුන් විසින්) කිය යුත්තේ ය; එවම්පි, මෙසෙයිනුදු; නො චෙ ලබ්භෙය්‍ය, ඉදින් නො ලැබේ නම්; සම්මතො (මහසඟුන් විසින් රූපියඡඩ්ඩක සම්මුතියෙන්) සම්මත් නා ලද්දවූ; භික්ඛු, මහණතෙම; ඡඩ්ඩයෙය්‍ය, (හුණුතැන් සලකුණු නො කොට අසුචියක් මෙන්) දමන්නේ යි.

395 එතානි, පිළිගන්නා ලද රූපිය ය පෙරළි කරනලද රූපිය ය යන නිසගිවස්තූන් ද; දුතියං පත්තං (ඌනපඤ්චබන්ධනපාත්‍රයක් ඇති ව විනවන ලද) දෙවන පාත්‍රය ද; සඞ්ඝෙ, සඟමැද, (නිසදන්නේ ය) සෙසානි, සෙසු නිසගි වස්තූහු; සඞ්ඝෙ, සඟමැද ද; එකස්මිං, එක්පුගුලෙකු කෙරෙහි ද; ගණෙ, ගණමැද ද; වත්ථුං ලබ්භරෙ, නිසදන්ට ලැබෙති; භාසන්තරෙනපි, (පෙළ කියන්නට නොහිස් සඟු විසින් දෙමළබස් ඈ) අන්බසිනුදු; ලබ්භං, (නිසදත්) වටී මැ යි.

(28) නානප්පකාරකං (චීවරාදිකැපබඩු විසින්) අනෙකප්‍රකාරවූ; කයවික්කයං, ගනුදෙනු; සමාපජ්ජිං, සමවන්නිමි.

(29) අයං මෙ භන්තෙ පත්තො දසාහාතික්කන්තො නිස්සග්ගියො.

(30) අයං මෙ භන්තෙ පත්තො ඌනපඤ්චබන්ධනෙන පත්තෙන චෙතාපිතො නිස්සග්ගියො ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමීති.

396 නිස්සජ්ජිත්වාන දෙසෙය්‍ය ආපත්තිං පත්තගාහකං සම්මන්නිත්වාන සංඝස්ස පත්තන්තං තස්ස දාපයෙ.

(31) ඉදං මෙ භන්තෙ භෙසජ්ජං සත්තාහාතික්කන්තං නිස්සග්ගියං.

(32) ඉදං මෙ භන්තෙ වස්සිකසාටිකචීවරං අතිරෙකමාසෙ සෙසෙ ගිම්හානෙ පරියිට්ඨං අතිරෙකද්ධමාසෙ සෙසෙ ගිම්හානෙ කත්වා පරිදහිතං නිස්සග්ගියං.

(33) ඉදං මෙ භන්තෙ චීවරං භික්ඛුස්ස සාමං දත්වා පුන අච්ඡින්නං නිස්සග්ගියං.

---

(29) අයම්පත්තො, මේ පාත්‍රය; දසාහාතික්කන්තො, (ඉවත් විකපුත් නැති ව) දසදවසක් ඉක්මුණේ ය.

(30) ඌනපඤ්චබන්ධනෙන පත්තෙන, උනුපස්බාත් පාඇති ය ව; චෙතාපිතො, ඉල්වා ගන්නාලද; නිස්සග්ගියො, නිසජීයයුත්තේ ය; අහං, මම; ඉමං, මේ පාත්‍රය; සඞ්ඝස්ස, සඟහට; නිස්සජාමීති, නිසජමි යි.

396 නිස්සජ්ජිත්වාන, (මෙසේ පාත්‍රය) නිසදා; ආපත්තිං, (අවත්) ඇවැත්; දෙසෙය්‍ය, දෙසන්නේ ය; පත්තගාහකං, පාත්‍ර ගන්වන මහණක්හු; සම්මන්නිත්වාන, (ඤත්තිද්විතීය කර්මයෙන්) සැමන; සඞ්ඝස්ස, සංඝයාගේ; පත්තන්තං, පයහීනපාත්‍රය; (හැම දෙනා ගන්වා කෙළවර ලද පාත්‍රය;) තස්ස, ඕහට; දාපයෙ, දෙවන්නේ යි.

(31) ඉදං භෙසජ්ජං, මේ බෙහෙද; සත්තාහාතික්කන්තං, සත්දවසක් ඉක්මුණේ ය.

(32) ඉදං, වස්සිකසාටිකචීවරං, මේ වැසිසළුසිවුර; ගිම්හානෙ, ගිමන්හි; අතිරෙකමාසෙ, මසකට අධිකයක්; සෙසෙ, සිටිකල්හි; පරියිට්ඨං ("කාලො වස්සිකසාටිකාය" යනාදීන්) පිරියස්නා ලද; ගිම්හානෙ, ගිමන්හි; අතිරෙකඞ්ඪමාසෙ, අඩමසකට අධිකයක්; සෙසෙ, සිටිකල්හි; කත්වා, (ගෙත්තම් රදන් කප්බින්දු දීමෙන්) කොට නිමවා; පරිදහිතං, වැළඳගන්නා ලද්දේ ය.

(33) භික්ඛුස්ස, භික්ෂුහට; සාමං දත්වා, (වෙයාවච්චාදි කැමැති ව) තමා විසින් ම දී; පුන, නැවත; අච්ඡින්නං, (නො කරන හෙයින් සකසංඥයෙන්) අසිදු ගන්නා ලද.

(34) ඉදම්මෙ භන්තෙ චීවරං සාමං සුත්තං විඤ්ඤාපෙත්වා තන්තවායෙහි වායාපිතං නිස්සග්ගියං.

(35) ඉදම්මෙ භන්තෙ චීවරං පුබ්බෙ අප්පවාරිතො අඤ්ඤාතකස්ස ගහපතිකස්ස තන්තවායෙ උපසඞ්කමිත්වා විකප්පං ආපන්නං නිස්සග්ගියං.

(36) ඉදම්මෙ භන්තෙ අච්චෙකචීවරං චීවරකාලසමයං අතික්කාමිතං, නිස්සග්ගියං.

(37) ඉදම්මෙ භන්තෙ චීවරං අතිරෙකඡාරත්තං විප්පවුත්ථං අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා නිස්සග්ගියං.

---

(34) සාමං, තමා විසින් ම; සුත්තං විඤ්ඤාපෙත්වා, (සිවුරුපිණිස) හූ ඉල්වාගෙන; තන්තවායෙහි, (නොනෑනොපැවරූ) වියන්නන් ලවා; වායාපිතං, වියවන ලද.

(සුත්තන්ති ඡබ්බිධං ඛොමසුත්තාදිං වා තෙසං අනුලොමං වා විඤ්ඤාපෙත්වාති චීවරත්ථාය යාචිත්වා. * යනු අටුවා යි.)

(35) පුබ්බෙ, පෙර; අප්පවාරිතො, චීවරසාමීනු විසින් නො පවරන ලදු ව; අඤ්ඤාතකස්ස ගහපතිකස්ස, නොනෑ ගිහිමිනිසක්හු ගේ; තන්තවායෙ, වියන්නවුන් කරා; උපසඞ්කමිත්වා, එළඹ; විකප්පං, (දිගපුළුල ඇති කොට කරව යනාදී විසින්) අධිකවිධානයට; ආපන්නං, පමුණුවන ලද.

(36) අච්චෙකචීවරං, (ගමිකගිලානාදීන් විසින් වස්සාවාසික දෙමි හයි කියා දෙනලද) අත්‍යායිකචීවරය; චීවරකාලසමයං, සිවුරු කල් ඇති සමය; අතික්කාමිතං, ඉක්මවන ලද.

("චීවරකාලසමයන්ති අනත්ථතෙ කඨිනෙ වස්සානස්ස පච්ඡිමො මාසො. අත්ථතෙ පඤ්ච මාසා." †)

(37) භික්ඛුසම්මුතියා අඤ්ඤත්‍ර, මහණසම්මුතියක් නැති ව; අතිරෙකඡාරත්තං, සදවසකට වඩා; විප්පවුත්ථං වියො ව වසනලද.

---

* සුත්තං ඉති, හූ යයි; ඛොමසුත්තාදිං, ඛොමයෙන් නිපන් හූ ආදී; ඡබ්බිධං වා, සයකොටස හෝ; තෙසං අනුලොමං වා, ඔවුන්ගේ අනුලොම් හූ හෝ; (කියනලදී.) විඤ්ඤාපෙත්වා ඉති, විඤ්ඤාපෙත්වා යන්නෙහි අර්ථ; චීවරත්ථාය යාචිත්වා, සිවුරු පිණිස ඉල්වා, (යනු යි)

† චීවරකාලසමයං ඉති, චීවරකාලසමය යනු; අනත්ථතෙ කඨිනෙ, කඨිනය නොඅතුළ කල්හි; වස්සානස්ස පච්ඡිමො මාසො, වස්සානයාගේ අවසාන මාසය යි. අත්ථතෙ, කඨිනය අතුළ කල්හි; පඤ්ච මාසා, (කඨිනක්ෂෙත්‍රවූ) පස් මාසයෝ යි.

(38) ඉදං මෙ භන්තෙ ජානං සඞ්ඝිකං ලාභං පරිණතං අත්තනො පරිණාමිතං නිස්සග්ගියං ඉමාහං ආයස්මතො නිස්සජ්ජාමී ති.

397 සෙසං සබ්බං යථායොගං ආදිම්හි විය යොජයෙ.

(39) අහම්භන්තෙ එකං පාචිත්තියාපත්තිං ආපජ්ජිං, ද්වෙ—පෙ—සම්බහුලා පාචිත්තියාපත්තියො ආපජ්ජිං.

(40) "ගාරය්හං භන්තෙ ධම්මං ආපජ්ජිං අසප්පායං පාටිදෙසනීයං තං පටිදෙසෙමී" ති තෙන පස්සසි ආවුසො තං ධම්මන්ති" වත්තබ්බං.

(41) අහම්භන්තෙ එකං දුක්කටාපත්තිං ආපජ්ජිං, ද්වෙ —පෙ—සම්බහුලා දුක්කටාපත්තියො ආපජ්ජිං.

---

(38) මෙ, මා විසින්; පරිණතං, (දෙම්හ කරම්හ යනාදීන්) සඟහට පිරිනැමුණු; සංඝිකං, (පරිණතහෙයින් ම) සඞ්ඝසන්තකවූ; ඉදං ලාභං, මේ (චීවරාදි) ප්‍රත්‍යය; ජානං, දැන දැන; අත්තනො, තමහට; පරිණාමිතං, (මට දෙව යනාදීන්) පිරිනමනලද; නිස්සග්ගියං, නිසජිය යුතු ය; අහං, මම; ඉමං, මේ; ආයස්මතො, ඇවැත්හට; නිස්සජ්ජාමී ති, නිසජමි යි (මෙසේ කියා නිසජිය යුතු.)

397 සෙසං සබ්බං, සෙසු සියල්ල; යථායොගං, යෙදෙනයෙදෙන සේ; ආදිම්හි විය. පළමු (නිස්සග්ගියෙහි කී) සෙයින් ම; යොජයෙ, යොදන්නේ යි.

(39) එකං පාචිත්තියාපත්තිං, පචිති ආපත්ති එකක්; ද්වෙ, (පාචිත්තියාපත්ති) දෙකක්; සම්බහුලා පාචිත්තියාපත්තියො, බොහෝ පාචිත්තියාපත්තීන්; ආපජ්ජිං, අවන්මි.

(40) භන්තෙ, ස්වාමීනි; ගාරය්හං, නිඳා කට යුතුවූ; අසප්පායං, සැප නොවන්නාවූ; පාටිදෙසනීයං ධම්මං, පාටිදෙසනීයාපත්තියක්; ආපජ්ජිං, අවන්මි, තං, ඒ; පටිදෙසෙමී'ති, දෙසමි යි; (කිය යුත්තේ ය) තෙන, ඒ පිළිගන්නහු විසින්; පස්සසි ආවුසො තං ධම්මන්ති, "පස්සසි ආවුසො තං ධම්මං" කියා; වත්තබ්බං, කිය යුතු යි.

(41) එකං දුක්කටාපත්තිං, දුක්කටාපත්ති එකක්. ද්වෙ, (දුක්කටාපත්ති) දෙකක්. සම්බහුලා දුක්කටාපත්තියො, බොහෝ දුක්කටාපත්තීන්; ආපජ්ජිං, අවන්මි.

(42) අහං භන්තෙ එකං දුබ්භාසිතාපත්තිං ආපජ්ජිං, ද්වෙ –පෙ– සම්බහුලා දුබ්භාසිතාපත්තියො ආපජ්ජිං තා තුම්හමූලෙ පටිදෙසෙමී, ති.

(43) අහං භන්තෙ ද්වෙ නානාවත්ථුකා ථුල්ලච්චයාපත්තියො ආපජ්ජිං, සම්බහුලා නානාවත්ථුකා ථුල්ලච්චයාපත්තියො ආපජ්ජිං, තා තුම්හමූලෙ පටිදෙසෙමී”ති වත්වා තෙන “පස්සසි ආවුසො තා ආපත්තියො”ති වුත්තෙ “ආම භන්තෙ පස්සාමී”ති වත්වා පුන තෙන “ආයතිං ආවුසො සංවරෙය්‍යාසී”ති වුත්තෙ “සාධු සුට්ඨු භන්තෙ සංවරිස්සාමී”ති වත්තබ්බං.

398 අදෙසනාගාමිනියං අනාපත්තිඤ්ච දෙසිතං
නානාසංවාසනිස්සීමට්ඨිතානං චතුපඤ්චහි
මනසා'පකතත්තානං නානෙකා'ති න දෙසයෙ'ති.

---

(42) එකං දුබ්භාසිතාපත්තිං, දුබ්භාසිතාපත්ති එකක්. ද්වෙ, (දුබ්භාසිතාපත්ති) දෙකක්. සම්බහුලා දුබ්භාසිතාපත්තියො, බොහෝ දුබ්භාසිතාපත්තීන්.

(43) නානාවත්ථුකා, නානාවස්තු ඇති; ද්වෙ ථුල්ලච්චයාපත්තියො, ථුල්ලච්චයාපත්තීන් දෙදෙනකු; නානාවත්ථුකා, නානාවස්තු ඇති; සම්බහුලා ථුල්ලච්චයාපත්තියො, බොහෝ ථුල්ලච්චයාපත්තීන්; ආපජ්ජිං—පෙ—පටිදෙසෙමීති, “අහම්භන්තෙ සම්බහුලා නානාවත්ථුකා ථුල්ලච්චයාපත්තියො ආපජ්ජිං තා තුම්හමූලෙ පටිදෙසෙමී”යි වත්වා, කියා; තෙන, ඔහු විසින්; පස්සසි ආවුසො තා ආපත්තියො ති, පස්සසි ආවුසො තා ආපත්තියො යි; වුත්තෙ, කී කල්හි; ආම භන්තෙ පස්සාමීති, ආම භන්තෙ පස්සාමි යි; වත්වා කියා; පුන, නැවත; තෙන, ඔහු විසින්; ආයතිං ආවුසො සංවරෙය්‍යාසීති, ආයතිං ආවුසො සංවරෙය්‍යාසි යි; වුත්තෙ, කී කල්හි; සාධු සුට්ඨු භන්තෙ සංවරිස්සාමීති, සාධු සුට්ඨු භන්තෙ සංවරිස්සාමි යි; වත්තබ්බං, කිය යුතු යි.

398 අදෙසනාගාමිනියං, දෙසනාගාමිනී නොවන පරිජි හා සඟවශෙසස් ද; අනාපත්තිඤ්ච; නිරවැත් ද; දෙසිතං, දෙසූ ඇවැත් ද; නානාසංවාසනිස්සීමට්ඨිතානං (සන්තිකෙ,) නානාසංවාසයන් හා සමග බහිසිම සිටියන් කෙරෙහි ද; චතුපඤ්චහි, සතරපස්දෙනකු එක් ව ද; මනසා, (හුදෙක්) සිතින් ද; අපකතත්තානං (සන්තිකෙ,) පරිජිඅවන්නන් පොහෝපවුරුණු සිටුවනලදුවන් කෙරෙහි ද; නානා, බොහෝ ආපත්තීන්; එකා ඉති, එකආපත්තියෙකැ යි ද; න දෙසයෙ, නො දෙසන්නේ යි.

"ඡන්දදානාදී"ති-

399 භෙරිං ඝණ්ඩිං ච තාළෙත්වා කම්මප්පත්තා සමාගතෙ
සඞ්ඝෙ හරෙය්‍ය ඡන්දං වා පාරිසුද්ධිං පවාරණං.

400 එකං භික්ඛුමුපාගම්ම නිසීදිත්වාන උක්කුටිං
අඤ්ජලිං පග්ගහෙත්වාන දදෙ ඡන්දං විචක්ඛණො

(44) "ඡන්දං දම්මි, ඡන්දං මෙ හර, ඡන්දං මෙ ආරොචෙහී"ති වත්තබ්බං.

(45) පාරිසුද්ධිං දෙන්තෙන "පාරිසුද්ධිං දම්මි, පාරිසුද්ධිං මෙ හර, පාරිසුද්ධිං මෙ ආරොචෙහී"ති වත්තබ්බං.

---

"ඡන්දදානාදී"ති-

ඡන්දදානාදි යන්නෙහි, (සැඳ පිරිසිදු පවුරුණුදීම් නම්.)

399 භෙරිං, බෙර හෝ; ඝණ්ඩිං වා, ගෙඩිය හෝ; තාළෙත්වා, ගසා; කම්මප්පත්තා, සඞ්ඝකර්මයට නිසිවූ; සඞ්ඝෙ, චතුර්වර්ගාදිසඞ්ඝයා; සමාගතෙ, රැස්වූ කල්හි; ඡන්දං වා, සැඳ හෝ; පාරිසුද්ධිං, පිරිසිදු හෝ; පවාරණං, පවුරුණු හෝ; හරෙය්‍ය, ගෙනයන්නේ යි.

400 එකං භික්ඛුං, එක් මහණක්හු [illegible]ා; උපාගම්ම, එළඹ; උක්කුටිං, එලිල්ලෙන්; නිසීදිත්වාන, හිඳ; අඤ්ජලිං පග්ගහෙත්වාන, ඇඳිලි බැඳ; ඡන්දං, අදහස; විචක්ඛණො, නුවණැත්තේ; දදෙ, දෙන්නේ යි.

(44) ඡන්දං—පෙ— ආරොචෙහීති, "ඡන්දං දම්මි, ඡන්දං මෙ හර, ඡන්දං මෙ ආරොචෙහි"යි; වත්තබ්බං, කියයුතු යි. ඡන්දං, අදහස; දම්මි, දෙමි; මෙ, මාගේ; ඡන්දං, අදහස; හර, ගෙන යා; මෙ, මාගේ; ඡන්දං, අදහස; ආරොචෙහි, අරොව්; (යනු මෙහි අර්ථ යි.)

(45) පාරිසුද්ධිං දෙන්තෙන, පිරිසුදු දෙන්නහු විසින්; පාරිසුද්ධිං—පෙ—ආරොචෙහීති, "පාරිසුද්ධිං දම්මි, පාරිසුද්ධිං මෙ හර, පාරිසුද්ධිං මෙ ආරොචෙහි"යි; වත්තබ්බං, කියයුතු යි. පාරිසුද්ධිං, පිරිසිදු; දම්මි, දෙමි; මෙ, මාගේ; පාරිසුද්ධිං, පිරිසිදුබව; හර, ගෙන යා; මෙ, මාගේ; පාරිසුද්ධිං, පිරිසිදුබව; ආරොචෙහි, අරොව්; (යනු මෙහි අර්ථ යි.)

401 පාරිසුද්ධිප්පදානේන සම්පාදේති උපෝසථං
සඞ්ඝස්ස අත්තනො චා'පි සෙසකම්මං විබාධති.

402 ඡන්දදානේන සඞ්ඝස්ස වයං සාධෙති නා'ත්තනො
තස්මා ඡන්දං දදන්තේන දාතබ්බා පාරිසුද්ධි'පි.

403 හරෙය්‍යෙකො බහුන්නම්පි නො හරෙය්‍ය පරම්පරා
පරම්පරාහටා * ඡන්දපාරිසුද්ධි න ගච්ඡති.

---

401 පාරිසුද්ධිප්පදානේන, පිරිසුදුදීමෙන්; සඞ්ඝස්ස, සඟහට ද අත්තනොචාපි, තමහට ද; උපෝසථං, පොහොය; සම්පාදේති, සපයයි; සෙසකම්මං, (සංඝයාගේ අපලොකනාදි) සෙසු සඞ්ඝකම්ම; විබාධති, කොප්‍ය කෙරේ.

402 ඡන්දදානේන, (හුදු) සැඳදීමෙන්; සඞ්ඝස්ස, සඟහට; වයං පොහොය හා සෙසු සඞ්ඝකම්ම; සාධෙති, සපයයි; නාත්තනො, තමහට පොහෝ නො සපයා; තස්මා, තමා පොහෝ නොකළා නම් වනහෙයින්; ඡන්දං දදන්තේන, (පොහෝදවස්) සැඳ දෙන්නහු විසින්; පාරිසුද්ධිපි, පිරිසුදු දු; දාතබ්බා, දියයුත්තී යි.

403 එකො, එක්මහණෙක්; බහුන්නම්පි, බොහෝ දෙනෙකුගේ ද; (සැඳපිරිසුදු) හරෙය්‍ය, ගෙනයන්නේ ය; පරම්පරා, පරම්පරායෙන්; නො හරෙය්‍ය, නො ගෙනයන්නේ යි; පරම්පරාහටා, පම්පරායෙන් ගෙන යන ලද; ඡන්දපාරිසුද්ධි, සැඳපිරිසුදු; න ගච්ඡති (සඟමැදට) නො යේ.

("එකෙන බහුන්නම්පි ආහටා පාරිසුද්ධි ආහටාව 'හොති, සචෙ පන සො අන්තරා මග්ගෙ අඤ්ඤං භික්ඛුං දිස්වා යෙසං තෙන පාරිසුද්ධි ගහිතා තෙසඤ්ච අත්තනො ච පාරිසුද්ධිං දෙති, තස්සෙව පාරිසුද්ධි ආගච්ඡති, ඉතරා පන බිළාලසංඛලිකපාරිසුද්ධි නාම හොති, සා න ආගච්ඡති" † යනු අටුවා යි.)

---

† එකෙන, එක්භික්ෂුවක් විසින්; බහුන්නං අපි, බොහෝ භික්ෂූන්ගේ ද; පාරිසුද්ධි, පාරිශුද්ධිය; ආහටා, ගෙන එන ලද්දී; ආහටා එව හොති, ගෙන එන ලද්දී ම වේ. සචෙ පන, ඉදින් වනාහි; සො, ඒ (පාරිසුද්ධිහාරක)තෙම; අන්තරා මග්ගෙ, අතරමගදී; අඤ්ඤං භික්ඛුං,

* පරංපරාහතා- තියාද පාඨයි.

404 සබ්බුපචාරං කත්වාන එවං දෙය්‍යාපවාරණා.

(46) "පවාරණං දම්මි, පවාරණං මෙහර, පවාරණං මෙ ආරොචෙහි, මමත්ථාය පවාරෙහී"ති වත්තබ්බං.

405 ආරොචෙත්වා'ථ සො සඞ්ඝං පවාරෙය්‍යෙවමාගතො.

---

404 සබ්බුපචාරං කත්වාන,(සිවුරු එකස්කිරීම් ආදිවූ) සියලුඋප චාර කොට; පවාරණා, පවුරුණු තොමෝ; එවං,මෙසේ; දෙය්‍යා, දිය යුත්තී සි.

(46) පවාරණං දම්මි—පෙ—පවාරෙහීති, "පවාරණං දම්මි, පවාරණං මෙ හර, පවාරණං මෙ ආරොචෙහි, මමත්ථාය පවාරෙහි"යි. වත්තබ්බං, කිය යුතු යි. පවාරණං දම්මි, පවුරුණු දෙමි; මෙ,මාගේ; පවාරණං, පවුරුණු; හර, ගෙනයා; මෙ, මාගේ; පවාරණං, පවුරුණු; ආරොචෙහි, අරොජ; මමත්ථාය, මා පිණිස; පවාරෙහි පවරු; (යනු මෙහි අර්ථ යි.)

405 ආගතො, (පවුරුණු ගෙන) ආ; සො, ඒ මහණ; ආරොචෙත්වා, (මෙනම් මහණහු විසින් පවුරුණු දෙනලද්දී සි සඟහට)අරොජා; අථ, ඉක්බිති; එවං, මෙසේ; (ඉත්ථන්නාමො භන්තෙ යනාදි විසින්) සඞ්ඝං, සංඝයා; පවාරෙය්‍ය, පවරන්නේ යි.

---

අන් මහණක්හු; දිස්වා, දැක; තෙන, ඔහු විසින්, යෙසං, යම් කෙනෙකුන්ගේ; පාරිසුද්ධි, පාරිශුද්ධිය; ගහිතා, ගත්තාලද්දී ද; තෙසං ච, ඔවුන්ගේ ද; අත්තනො ච, තමාගේ ද; පාරිසුද්ධිං, පාරිශුද්ධිය; දෙති, දේද; තස්ස එව, ඔහුගේ ම; පාරිසුද්ධි, පාරිශුද්ධිය; ආගච්ඡති, සංඝයා වෙත පැමිණේ; ඉතරා පන, ඉතිරි (භික්ෂූන්ගේ) පාරිශුද්ධිය වනාහි, බිළාලසඞ්ඛලිකා පාරිසුද්ධි නාම හොති, විඩාලශෘඞ්ඛල පාරිශුද්ධි නම් වේ; (දම්වැලෙක්හි ප්‍රථම පුරුක හෙවත් මුදුව දෙවෙනි පුරුක ඉක්ම නොයන්නා සේ පාරිසුද්ධිදායක සංඛ්‍යාත පළමුතැන්ගේ පාරිශුද්ධිය ඒ පිළිගත් පාරිශුද්ධිහාරකසංඛ්‍යාත දෙවෙනිතැන් ඉක්ම නොයනසවභාව ඇත්තීය යනුයි. මෙහි බිළාල ශබ්ද උපලක්ෂණමාත්‍රහෙයින් යම්කිසි දම්වැලක් ගැණේ.) සා, ඒ (විඩාලශෘඞ්ඛල පාරිශුද්ධි) තොමෝ; න ආගච්ඡති, සඟ වෙත නො පැමිණේ.

(47) "ඉත්ථන්නාමො භන්තෙ සඞ්ඝං පවාරෙති, දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා වදන්තු තං ආයස්මන්තො අනුකම්පං උපාදාය පස්සන්තො පටිකරිස්සතී"ති.

406 ගහෙත්වා පාරිසුද්ධිං වා ඡන්දං වා'පි පවාරණං
හාරකො සඞ්ඝමප්පත්වා විබ්භමෙය්‍ය මරෙය්‍ය වා.
407 සාමණෙරාදිභාවං වා පටිජානෙය්‍ය නාහටා
පත්වා සඞ්ඝං තථා හෙය්‍ය ආහටා හොති හාරකො.
408 සඞ්ඝප්පත්තො පමත්තො වා සුත්තො නාරොචයෙය්‍ය වා
අනාපත්ති ච සඤ්චිච්ච නාරොචෙන්තස්ස දුක්කටන්ති.

---

(47) ඉත්ථන්නාමො—පෙ—පටිකරිස්සතීති, "ඉත්ථන්නාමො භන්තෙ සඞ්ඝං පවාරෙති, දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා වදන්තු තං ආයස්මන්තො අනුකම්පං උපාදාය, පස්සන්තො පටිකරිස්සති"යි පවරන්නේ යි භන්තෙ, ස්වාමිය; ඉත්ථන්නාමො, මෙනම් මහණ; සඞ්ඝං, සංඝයා; පවාරෙති, පවරයි; ආයස්මන්තො, ඇවැත්හු; අනුකම්පං උපාදාය, කරුණා පිණිස; දිට්ඨෙන වා, දුටුදෙයකින් හෝ; සුතෙන වා, ඇසූදෙයකින් හෝ; පරිසඞ්කාය වා, සැකයකින් හෝ; තං, ඔහට; වදන්තු, කියත් වා; පස්සන්තො, දක්නේ; පටිකරිස්සතීති, පහළ කරන්නේ යි යනු මෙහි අර්ථ යි.

406-407= පාරිසුද්ධිං වා, පිරිසුදු හෝ; ඡන්දං වා, සැද හෝ; පවාරණං අපි, පවුරුණු හෝ; ගහෙත්වා, ගෙන; හාරකො, සඟමැදට ගෙන යන මහණ; සඞ්ඝං අප්පත්වා, සංඝයා අත්පසට නො පැමිණ; විබ්භමෙය්‍ය, ගිහි වී නම් හෝ; මරෙය්‍ය වා, මෙළේ වී නම්හෝ; සාමණෙරාදිභාවං, සාමණෙරාදිභාවය; පටිජානෙය්‍ය වා, ප්‍රතිඥ කෙරේ නම් හෝ; නාහටා, ගෙන යන ලද්දී නො වේ; හාරකො, සැදපිරිසුදු ගෙන යන්නේ; සංඝං පත්වා, සඞ්ඝයා අත්පසට පැමිණ; තථා හෙය්‍ය, එසේ ගෘහස්ථාදිභාවයට පැමිණියේ වී නම්; ආහටා හොති, ගෙන එන ලද වේ.

408 සඞ්ඝප්පත්තො, සංඝයා කරා එළඹියේ; පමත්තො වා, පමා වූයේ හෝ; සුත්තො වා, නිදන්නේ හෝ; නාරොචයෙය්‍ය, මෙනම් මහණහු විසින් සැදපිරිසුදුපවුරුණු දෙන ලද යි නො අරොජා නම්; අනාපත්ති ච, ආපත්ති නැත් ම ය; සඤ්චිච්ච, දැන දැන; නාරොචෙන්තස්ස, නො අරොජන්නාහට; දුක්කටං, දුකුළා වේ.

## උපොසථොති-

409 ද්වෙ උපොසථා චාතුද්දසො පණ්ණරසො ඉති
සුත්තුද්දෙසමධිට්ඨාන පාරිසුද්ධිවසා තයො.

410 සුත්තුද්දෙසො'ව සඞ්ඝස්ස අධිට්ඨාන උපොසථො
පුග්ගලස්සෙව සෙසානං පාරිසුද්ධි උපොසථො.

411 පුබ්බකිච්චෙව පුබ්බකරණෙ × පත්තකල්ලෙ සමානිතෙ
සුත්තං උද්දිස්සති සඞ්ඝො පඤ්චධා සො විභාවිතො.

---

## උපොසථොති-

උපොසථො යන්නෙහි පොහෝ නම්:

409 චාතුද්දසො, තුදුස්වක් පොහොය; පණ්ණරසො ඉති, පසළොස්වක් පොහොය යි; ද්වෙ උපොසථා, උපොසථයෝ දෙදෙනෙකි; සුත්තුද්දෙස, පාමොක් උදුරුවන විසින්; අධිට්ඨාන, ඉටන් විසින්; පාරිසුද්ධිවසා, පිරිසුදුපොහො විසින්; තයො, තුන්දෙනෙකි.

410 සුත්තුද්දෙසො, පාමොක් උදුරුවන පොහොය; සඞ්ඝස්සෙව, සඟහට ම ය; අධිට්ඨානඋපොසථො, ඉටන්පොහොය; පුග්ගලස්සෙව, පුද්ගලයාහට ම ය; පාරිසුද්ධිඋපොසථො, පිරිසුදු පොහොය; සෙසානං, සෙසු තුන්දෙනහට දෙදෙන හට මැයි.

411 පුබ්බකිච්චෙව, (ඡන්දාරොචනාදිවූ) පූර්වකෘත්‍ය ද; පුබ්බකරණෙ, (සම්මජ්ජනාදිවූ) පූර්වකරණ ද; පත්තකල්ලෙ, (උපොසථාදිවූ) ප්‍රාප්තකාලය ද; සමානිතෙ, පිළියෙළකළ කල්හි; සඞ්ඝො, (චතුර්වර්ගාදි) සංඝ තෙමේ; සුත්තං උද්දිස්සති, පාමොක් උදුරුවන්නේ ය; සො; ඒ සූත්‍රොද්දෙශය; පඤ්චධා, (නිදානොද්දෙශාදි) පස්පරිද්දකින්; විභාවිතො, විභාග කරන ලදී.

(සම්මජ්ජනී පදීපො ච උදකං ආසනෙන ච
උපොසථස්ස එතානි පුබ්බකරණන්ති වුච්චති. +

ඡන්දපාරිසුද්ධි උතුක්ඛානං භික්ඛුගණනා ච ඔවාදො
උපොසථස්ස එතානි පුබ්බකිච්චන්ති වුච්චති. †

---

\+ සම්මජ්ජනී, හැමදීම ද; පදීපො ච, පහන්දැල්වීම ද; ආසනෙන, අසුන්පැනවීම හා; උදකං ච, (පානීය පරිභොජනීය) පැන් තැබීම ද; එතානි, යන මේ සතරවත්; උපොසථස්ස, උපොසථයට; පුබ්බකරණං ඉති වුච්චති, (සංඝයාගේ රැස්වීමට පළමු කට යුතුහෙයින්) පූර්වකරණ යයි කියනු ලැබේ.

† ඡන්දපාරිසුද්ධි, ඡන්දය හා පාරිසුද්ධිය ගෙන ඊම ද; උතුක්ඛානං, සෘතු පිළිවෙළින් පැමිණි උපොසථය කීම ද; භික්ඛුගණනා ච (උපොසථය සඳහා රැස්වූ)භික්ෂූන් ගණන් කිරීම ද. ඔවාදො,මෙහෙණීන්ට අවවාද දීම ද; එතානි, යන මේ පස; උපොසථස්ස, උපොසථයට; පුබ්බකිච්චං ඉති වුච්චති, (පාමොක් උදුරුවීමෙන් පළමු කට යුතුහෙයින්) පූර්වකෘත්‍ය යයි කියනු ලැබේ.

× පුබ්බකිච්චෙ ච කරණෙ. බුරුම

412 විනා'න්තරායං සඞ්ඛෙපෙනුද්දෙසො විනිවාරිතො
ථෙරොව ඉස්සරො වීසු උද්දෙසෙස්වෙත්ථතීසු වා
විසදෙසු ති වුත්තත්තා අවත්තන්තෙ'පි වට්ටති.

---

"සබ්බපඨමං කත්තබ්බං පුබ්බකරණං, තදනන්තරං කත්තබ්බං පුබ්බකිච්චන්නාම." *

උපොසථො යාවතිකා ච භික්ඛූ
කම්මප්පත්තා සභාගාපත්තියො ච,
න විජ්ජන්ති වජ්ජනීයා ච පුග්ගලා,
තස්මිං න හොන්ති පත්තකල්ලන්ති වුච්චති. +

(නිදානුද්දෙස, පාරාජිකුද්දෙස, සඞ්ඝාදිසෙසුද්දෙස, අනියතුද්දෙස, විත්ථාරුද්දෙස, යයි මෙසෙයින් පසෙක් වේ.)

412 අන්තරායං විනා, (රාජන්තරායාදි) අන්තරායක් නැති ව; සඞ්ඛෙපෙන, සංක්ෂෙපයෙන්; උද්දෙසො, පාමොක් උදෙසීම; විනිවාරිතො, වළකනලද්දේය; එත්ථ උද්දෙසෙසු, මේ පස්වැදෑරුම් උද්දෙශයන් අතුරෙහි; වීසුවා, දෙකක්හෝ; තීසු වා, තුනක් හෝ විසදෙසු, වනපොත්කල්හි; ථෙරොව, තෙර ම; ඉස්සරොති, (පාමොකට) හිමි යයි; වුත්තත්තා, වදාළහෙයින්; අවත්තන්තෙපි, හැම නොපුහුණු කල්හි දු; වට්ටති, (අන්තරාය විනා ම සංක්ෂෙපයෙන් උසුරුවීම) වටී.

(අන්තරාය නම්: රාජන්තරාය, චොරන්තරාය, අග්‍යන්තරාය, උදකන්තරාය, මනුස්සන්තරාය, අමනුස්සන්තරාය, වාළන්තරාය, සිරිංසපන්තරාය, ජීවිතන්තරාය, බ්‍රහ්මචරියන්තරාය, යන මේ දශය යි.)

---

* සබ්බපඨමං, හැමට පළමු; කත්තබ්බං, කළ යුතු දෙය; පුබ්බකරණං, පුබ්බකරණ නම් වේ. තදනන්තරං, ඊට අනතුරුව; කත්තබ්බං, කළ යුතු දෙය; පුබ්බකිච්චං නාම, පුබ්බකිච්ච නම් වේ.

+ උපොසථො, තුන් උපොසථදිනයෙන් එකක් වේ ද; යාවතිකා ච භික්ඛූ කම්මප්පත්තා, උපොසථකර්මයට පොහෝනාපමණ භික්ෂූහු වෙත් ද; සභාගාපත්තියො ච න විජ්ජන්ති, (විකල්බොජුන් ඈ) සමානසතුවෙන්; අවන් ඇවැත් නො වෙත් ද; වජ්ජනීයා ච පුග්ගලා තස්මිං න හොන්ති, (අත්පසින් බැහැරකළ යුතුවූ (ගෘහස්ථාදි එක්විසි) පුද්ගලයෝ එහි (අත්පසතුළ) නො වෙත් ද; පත්තකල්ලං ඉති වුච්චති, (මෙසේ ඇති කල්හි උපොසථකර්මයා සුතුකල්ඇත්තේ යයි කියනු ලැබේ.

413 ආගච්ඡෙය්‍යුං යදි සමා උද්දිසන්තෙ'ථ ථොකිකා
උද්දිට්ඨං තං සුඋද්දිට්ඨං සොතබ්බමවසෙසකං.

414 උද්දිට්ඨමත්තෙ සකලායෙකච්චායුට්ඨිතාය වා
පාරිසුද්ධිං කරෙය්‍යුං සන්තිකෙ බහුකා'ථ චෙ
කත්වා සබ්බවිකප්පෙසු පුබ්බකිච්චං පුනුද්දිසෙ.

415 ආවාසිකානං පණ්ණරසො ඉතරෙසං සචෙ 'තරො
සමොනෙතරෙ'නුවත්තන්තු පුරිමානං සචෙ, ධිකා
පුරිමා අනුවත්තන්තු තෙසං සෙසෙ'ප්‍යයං නයො.

---

413 උද්දිසන්තෙ, (පාමොක්) උසුරුවන සඳ; සමා, (ආවාසිකයන් හා) සමවූ හෝ; අථ, නැවත; ථොකිකා, මඳවූ හෝ; (අමුතු මහණහු) යදි ආගච්ඡෙය්‍යුං, ඉදින් අවු නම්; (යං,) යමක්; උද්දිට්ඨං, උසුරුවන ලද ද; තං, ඒ; සුඋද්දිට්ඨං, මනා කොට උසුරුවන ලද; අවසෙසකං, නො උදෙසූතැන්; සොතබ්බං, (ආවාසිකයන් හා එක් ව හිඳ) ඇසිය යුතු යි·

414 උද්දිට්ඨමත්තෙ, පාමොක් උසුරුවා හුන්කෙණෙහි හෝ; සකලාය වා, හැමදෙනා හෝ; එකච්චාය, සමහරකෙණෙකුන් හෝ; උට්ඨිතාය, නැගි සිටි සඳ; (ආගච්ඡෙය්‍යු,) සම හෝ මඳ හෝ අමුතු සංඝයා ආ නම්; එසං සන්තිකෙ, ඒ පෙහෝකළවුන් කෙරෙහි; පාරිසුද්ධිං කරෙය්‍යු, පිරිසුදු (පොහෝ) කරන්නේ යි; අථ, නැවත; බහුකා වෙ, ඉදින් (අමුතු මහණහු) බොහෝ වූ නම්; සබ්බවිකප්පෙසු, "උද්දිසන්තෙ උද්දිට්ඨමත්තෙ" යනාදී සියලු විධානයන්හි; පුබ්බකිච්චං කත්වා, පූර්වකෘත්‍යය කොට, පුන, නැවත; උද්දිසෙ, (ආදියෙහි පටන් පාමොක්) උසුරුවන්නේ යි.

415 ආවාසිකානං ආවාසිකයන්ට; පණ්ණරසො, පණුරසි පොහොය; ඉතරෙසං, ආගන්තුකයන්ට, සචෙතරො, ඉදින් තුදුස් වක් පොහෝ වී නම්; සමා, සමවූ හෝ; ඌනා, මඳවූ හෝ ඉතරෙ, ආගන්තුකයෝ; පුරිමානං, ආවාසිකයන්ට, අනුවත්තන්තු අනුවෙත්වා; ("අජ්ජ පොසථො පණ්ණරසො"යි, පොහෝ කරන කල්හි ඉවසත්වා) සචෙධිකා, ඉදින් (ආගන්තුකයෝ) බොහෝවූ නම්; තෙසං, ඒ ආගන්තුකයන්ට; පුරිමා, ආවාසිකයෝ; අනුවත්තන්තු, අනුවෙත්වා, ("අජ්ජ පොසථො චාතුද්දසො"යි පොහෝ කරන කල්හි ඉවසත්වා;) සෙසෙපි, ආවාසිකයන්ට තුදුස්වක් පොහොය ආගන්තුකයන්ට පණුරසිවූ කල්හි ද; අයං නයො මෙ ම නය යි.

416 අවාසිකානං පාටිපදෙ ඉතරෙසං උපොසථො
සමථොකානං සාමග්ගිං මූලට්ඨා දෙන්තු කාමතො
බහි ගන්ත්වාන කාතබ්බො නො වෙ දෙන්ති උපොසථො

417 දෙය්‍යා 'තිවජ්ජාය සාමග්ගි බහූසු බහි වා වජෙ
ආගන්තුකානං පාටිපදෙ එවමෙව නයං නයෙ.

---

416 ආවාසිකානං, ආවාසිකයන්ට; පාටිපදෙ, පෑළවිදවස්; ඉතරෙසං, ආගන්තුකයන්ට; උපොසථො, පොහෝදවස් වී නම්; මූලට්ඨා, ආවාසිකයෝ; සමථොකානං, තමන් හා සමවූ හෝ මදවූ හෝ ආගන්තුකයන්ට; සාමග්ගිං, කායසාමග්‍රිය; කාමතො, (තමන්ගේ) ඉච්ඡායෙන්; දෙන්තු, දෙත්වා; නො වෙ දෙන්ති, ඉදින් නො දෙත් නම්; බහි ගන්ත්වාන, (ආගන්තුකයන් විසින් සීමින්) බැහැර ගොස්; උපොසථො, පොහොය; කාතබ්බො, කට යුත්තේ යි.

417 බහූසු, (ආගන්තුකයන්) බොහෝ කල්හි; අතිවජ්ජාය, අතිවජ්ජායෙහුදු; (නොකැමැති සේ ද) සමග්ගි, (කාය) සාමග්‍රිය හෝ, දෙය්‍යා, දිය යුත්තී ය, බහි වා, පිට(සීමට)හෝ; වජෙ යන්නේ යි; ආගන්තුකානං පාටිපදෙ, (ආවාසිකයන්ට පොහෝදවස ආගන්තුකයන්ට පෑළවී කල්හි; නයං, මෙහි නය; එවමෙව, මෙසේ ම, නයෙ, දන්නේයි.

("ඉධ පන භික්ඛවෙ ආවාසිකානං භික්ඛූනං පණ්ණරසො හොති. ආගන්තුකානං පාටිපදො, සචෙ ආවාසිකා බහුතරා හොන්ති, ආගන්තුකෙහි ආවාසිකානං සාමග්ගී වා දාතබ්බා, නිස්සීමං වා ගන්තබ්බං, සචෙ සමසමා හොන්ති ආගන්තුකෙහි ආවාසිකානං සාමග්ගී වා දාතබ්බා නිස්සීමං වා ගන්තබ්බං, සචෙ ආගන්තුකා බහුතරා හොන්ති ආගන්තුකෙහි ආවාසිකානං න අකාමා දාතබ්බා සාමග්ගී; ආවාසිකෙහි නිස්සීමං ගන්ත්වා උපොසථො කාතබ්බො," * යනු පෙළ යි.)

---

* භික්ඛවෙ, මහණෙනි; ඉධ පන, මේ උපොසථකර්මයෙහි වනාහි; ආවාසිකානං භික්ඛූනං, ආවාසික භික්ෂූන්ට; පණ්ණරසො හොති, පණ්ණරසිය වේ ද; ආගන්තුකානං, ආගන්තුකභික්ෂූන්ට; පාටිපදො, පෑලවිය වේ ද; සචෙ, ඉදින්; ආවාසිකා, ආවාසිකයෝ; බහුතරා හොන්ති, අධික වෙත් ද; ආගන්තුකෙහි, ආගන්තුකයන් විසින්; ආවාසිකානං, ආවාසිකයන්ට; සාමග්ගී වා දාතබ්බා, සාමග්‍රිය හෝ දිය යුත්තී ය; නිස්සීමං වා ගන්තබ්බං, සීමාවෙන් පිටත හෝ

418 සාවෙය්‍ය සුත්තං සංවිච්ච අසාවෙන්තස්ස දුක්කටං
සම්මජ්ජිතුං පදීපෙතුං පඤ්ඤපෙතුං දකාසනං
න කරෙය්‍ය තථා කල්ලො මහාථෙරෙන පෙසිතො.

---

418 සුත්තං, (නමා උසුරුවන) පාමොක්; සාවෙය්‍ය, (පිරිසද) අස්වන්නේ ය; සංවිච්ච, දැන දැන; අසාවෙන්තස්ස, නො අස්වන්නාහට; දුක්කටං, දුකුලා වේ; සම්මජ්ජිතුං, (පොහෝගෙය) හමදනට ද; පදීපෙතුං, පහන් නගන්නට ද; පඤ්ඤපෙතුං දකාසනං, නහන පැන් බොන පැන් හා අසුන් පනවන්නට ද; මහාථෙරෙන, මහතෙරුන් විසින්; පෙසිතො, මෙහෙයනලද්දවූ; කල්ලො, නොගිලන් මහණ; න කරෙය්‍ය, නො කෙරේ නම්; තථා, එසේ ම

(දුකුලා වේ.)

("සචෙ ආණත්තො සම්මුඤ්ජනිං තාවකාලිකම්පි න ලභති සාඛාභඞ්ගං කප්පියං කාරෙත්වා සම්මජ්ජිතබ්බං, තම්පි අලභන්තස්ස ලද්ධකප්පියං හොති- *

ආසනෙසු අසති කටසාරකො'පි තට්ටිකායො'පි පඤ්ඤපෙතුං වට්ටති, තට්ටිකාසු'පි අසති සාඛාභඞ්ගානි කප්පියං කාරෙත්වා පඤ්ඤපෙතබ්බානි, කප්පියකාරකං අලභන්තස්ස ලද්ධකප්පියං හොති-

---

යා යුතුය; සචෙ, ඉදින්; සමසමා හොන්ති, (දෙපක්ෂය) සමසම වෙත් ද; ආගන්තුකෙහි, ආගන්තුකයන් විසින්; ආවාසිකානං, ආවාසිකයන්ට; සාමග්ගී වා දාතබ්බා, සාමග්‍රිය හෝ දිය යුත්තී ය; නිස්සීමං වා ගන්තබ්බං, සීමාවෙන් පිටත හෝ යා යුතු ය; සචෙ, ඉදින්; ආගන්තුකා, ආගන්තුකයෝ; බහුතරා හොන්ති, අධික වෙත් ද; ආගන්තුකෙහි, ආගන්තුකයන් විසින්; ආවාසිකානං, ආවාසිකයන්ට; අකාමා, නො කැමැත්තෙන්; සාමග්ගී, සාමග්‍රිය; න දාතබ්බා, නො දිය යුත්තී ය; ආවාසිකෙහි, ආවාසිකයන් විසින්; නිස්සීමං ගන්ත්වා, සීමාවෙන් පිටත ගොස්; උපොසථො කාතබ්බො, පොහොය කළ යුතු ය.

* සචෙ, ඉදින්; ආණත්තො, අණලත් තැනැත්තේ; සම්මුඤ්ජනිං, මුස්නක්; තාවකාලිකම්පි, තාවකාලික ව ද; න ලභති, නො ලබා නම්; සාඛාභඞ්ගං, කොළ අත්තක්; කප්පියං කාරෙත්වා, කැප කරවා; සම්මජ්ජිතබ්බං, හැමැන්ද යුතු; තම්පි, එ ද; අලභන්තස්ස, නොලබන්නාහට; ලද්ධකප්පියං හොති, ලද පරිදි කැප වේ.

419 සම්මජ්ජිත්වා පදීපෙත්වා ‘පට්ඨපෙත්වා දකාසනං
ගණඤත්තිං ඨපෙත්වෙවං කත්තබ්බා තීහු පොසථො.

(48) "සුණන්තු මෙ ආයස්මන්තා අජ්ජුපොසථො පණ්ණරසො යදායස්මන්තානං පත්තකල්ලං මයං අඤ්ඤමඤ්ඤං පාරිසුද්ධිං උපොසථං කරෙය්‍යාමාති."

---

සචෙ තෙලාදීනි තානි පරියෙසිතබ්බානි පරියෙසිත්වා අලභන්තස්ස ලද්ධකප්පියං හොති, අපි ච කපාලෙ අග්ගි'පි ජාලෙතබ්බො" † (යනු අටුවා යි.)

419 තීහි, තුන්දෙනා විසින්; සම්මජ්ජිත්වා, (පොහොය්ගෙය) හැමද; පදීපෙත්වා, පහන් නගා; දකාසනං, නහන පැන් බොන පැන් හා අසුන්; උපට්ඨපෙත්වා, එළවා තබා; එවං, මෙසේ; ගණඤත්තිං, ගණඤත්තිය; ඨපෙත්වා, තබා; උපොසථො, පොහොය; කත්තබ්බො, කට යුත්තේ යි.

(48) (පණ්ණරසී පොහෝ වී නම් "සුණන්තු මෙ ආයස්මන්තා අජ්ජුපොසථො පණ්ණරසො" යනාදීන් ඤත්ති තිබිය යුතු, තුදුස්වක් පොහෝ වී නම් "අජ්ජුපොසථො චාතුද්දසො"යි යෙදිය යුතු) ආයස්මන්තා, ඇවැත්නි; මේ, මා කියන්නක්; සුණන්තු, අසත්වා; අජ්ජ, අද; පණ්ණරසො උපොසථො, පණ්ණරසී පොහෝදවස ය; යදි, ඉදින්; ආයස්මන්තානං, ඇවතුන්ට; පත්තකල්ලං, (පොහෝකම්) සපත්කල් ඇත්තේ වී නම්; මයං, අපි; අඤ්ඤමඤ්ඤං, ඔවුනොවුන්; පාරිසුද්ධිං උපොසථං, පිරිසුදු පොහෝ; කරෙය්‍යාමාති, කරමු ය; * (යනු මෙහි අර්ථ යි.)

---

ආසනෙසු අසති, අසුන් නැති කල්හි; කටසාරකෙපි, කලාල් ද; තට්ටිකායොපි, තට්ටු ද; පඤ්ඤපෙතුං, පනවන්ට; වට්ටති, වටී; තට්ටිකාසුපි, තට්ටු ද; අසති, නැති කල්හි; සාඛාභඞ්ගානි, කොළ අතු; කප්පියං කාරෙත්වා, කැප කරවා; පඤ්ඤපෙතබ්බානි, පැනවිය යුත්තාහ; කප්පියකාරකං, කැපකරන්නකු; අලභන්තස්ස, නොලබන්නහුට; ලද්ධකප්පියං හොති, ලද පරිදි කැප වේ.

†සචෙ, ඉදින්; තෙලාදීනි, තෙල් ආදීහු; තානි, නො වෙත් නම්; පරියෙසිතබ්බානි, සෙවිය යුත්තාහ. පරියෙසිත්වා, සොයා; අලභන්තස්ස, නොලබන්නාහට; ලද්ධකප්පියං හොති, ලද පරිදි කැප වේ; අපි ච, යළි ද; කපාලෙ, කබලෙහි; අග්ගි අපි, ගිනි වුවත්; ජාලෙතබ්බං, දැල්විය යුතු.

420 එකංසං උත්තරාසඞ්ගං කත්වා ථෙරෙන උක්කුටිං
නිසීදිත්වා 'ඤ්ජලිං තෙන 'වං පග්ගය්හ සමුදීරියා.

"පරිසුද්ධො අහං ආවුසො පරිසුද්ධො'ති මං ධාරෙථා"ති වදෙ යාව තතියකං.

421 සමත්තපුබ්බාරම්භෙන තෙ නවෙනෙවමීරියා

"පරිසුද්ධො අහං භන්තෙ පරිසුද්ධො'ති මං ධාරෙථා"ති වදෙ යාව තතියකං.

422 ද්වීසු ථෙරෙන කත්තබ්බං කත්වෙවමීරියො නවො.

"පරිසුද්ධො අහං ආවුසො පරිසුද්ධො'ති මං ධාරෙහී"ති තික්ඛත්තුං වත්තබ්බො.

423 නවෙන ථෙරො තික්ඛත්තුං එවමස්ස උදීරියො.

"පරිසුද්ධො අහං භන්තෙ පරිසුද්ධො"ති මං ධාරෙථා"ති.

---

420 උත්තරාසඞ්ගං, පොරෝණාව; එකංසං කත්වා, එකස් කොට බහාලා; ථෙරෙන, මහල්ලන් විසින්; උක්කුටි (ක)ං නිසීදිත්වා, එළිල්ලෙන් හිඳ; අඤ්ජලිං පග්ගය්හ, ඇදිලි බැඳ; තෙ, ඒ දෙදෙන; එවං සමුදීරියා, මෙසේ කිය යුත්තාහු යි. පරිසුද්ධො අහං ආවුසො පරිසුද්ධොති මං ධාරෙථාති, "පරිසුද්ධො අහං ආවුසො පරිසුද්ධොති මං ධාරෙථ"යි; යාව තතියකං, තුන්යළක්; වදෙ, කියන්නේ යි. ආවුසො, ඇවැත්නි; අහං, මම; පරිසුද්ධො, පිරිසුදුමි; පරිසුද්ධොති, පිරිසුදු ය යි; මං මා; ධාරෙථ, දරව්; සලකව්. (යනු මෙහි අර්ථ යි.)

421 සමත්තපුබ්බාරම්භෙන, (සිවුරු එකස්කිරීම් ආදි විසින්) නිමි පූර්වකෘත්‍යය ඇති; නවෙන, සඟ මහණහු විසින්; තෙ, ඒ දෙදෙන; එවං, මෙසේ; ඊරියා, කිය යුත්තාහු යි. පරිසුද්ධො -පෙ- ධාරෙථ, යී. යාව තතියකං, තුන්යළක්; වදෙ, කියන්නේ යි.

422 ද්වීසු, දෙදෙනා අතුරෙහි; ථෙරෙන, මහල්ලන් විසින්; කත්තබ්බං, (පූර්වකරණාදි) කටයුතු; කත්වා, කොට; නවො, සඟ මහණ; එවමීරියො, පරිසුද්ධො —පෙ— ධාරෙහි, යී මෙසේ කිය යුත්තේ යි.

423 නවෙන, සඟ මහණහු විසින්, ථෙරො, වැඩිමහලු මහණ; තික්ඛත්තුං, තුන්වරක්; එවං, (පරිසුද්ධො —පෙ— ධාරෙථ, යි) මෙසේ; උදීරියො අස්ස, කිය යුතු වන්නේ ය.

424 පුබ්බකිච්චං සමාපෙත්වා අධිට්ඨෙය්‍යෙවමෙකකො.

"අජ්ජ මෙ උපොසථො පණ්ණරසො"ති වා "චාතුද්දසො"ති වා "අධිට්ඨාමී"ති වත්තබ්බං. නො චෙ අධිට්ඨෙය්‍ය දුක්කටං.

425 යත්‍ථ වසන්ති චත්තාරො තයො වා යදි වා දුවෙ
පාරිසුද්ධිං හරිත්වාන එකෙකස්සිතරීතරෙ
තං තං උපොසථං කයිරුං සියා ආපත්ති දුක්කටං.

426 වග්ගෙ සමග්ගෙ වග්ගො'ති සඤ්ඤිනො විමතිස්ස වා
දුක්කටං කරොතො භෙදාධිප්පායෙන ථුල්ලච්චයං
වග්ගෙ සමග්ගෙ'නාපත්ති සමග්ගා ඉති සඤ්ඤිනො.

---

424 එකො, හුදකලා මහණ; පුබ්බකිච්චං සමාපෙත්වා' (සම්මජ්ජනාදි) පූර්වකෘත්‍ය නිමවා; එවං, මෙසේ; අධිට්ඨෙය්‍ය, ඉටන්නේ යි. අජ්ජ මෙ උපොසථො පණ්ණරසොති වා චාතුද්දසොති වා අධිට්ඨාමීති, (පසළොස්වක් වූව)"අජ්ජ මෙ උපොසථො පණ්ණරසො අධිට්ඨාමි" කියා හෝ; තුදුස්වක් වූව) "අජ්ජ මෙ උපොසථො චාතුද්දසො අධිට්ඨාමි" කියා හෝ; වත්තබ්බං, කිය යුතු යි; නො චෙ අධිට්ඨෙය්‍ය, ඉදින් නො ඉටා නම්; දුක්කටං දුකුළා වේ; අජ්ජ, අද; මෙ, මට; උපොසථො පොහොය; පණ්ණරසොති වා පණුරසී ය යි හෝ; චාතුද්දසොති වා, චාතුද්දසී ය යි හෝ; අධිට්ඨාමීති, ඉටමි. (යනු මෙහි අර්ථ යි.)

425 යත්‍ථ, යම් විහාරයෙක්හි; චත්තාරො, සතරදෙනෙක් හෝ; තයො වා, තුන්දෙනෙක් හෝ; දුවෙ වා, දෙදෙනෙක් හෝ; වසන්ති, වෙසෙද්ද; (තත්‍ථ,) ඒ විහාරයෙහි; එකෙකස්ස, එකක් එකක් හුගේ, පාරිසුද්ධිං, පිරිසුදු; හරිත්වාන ගෙනහැර; ඉතරීතරෙ, (තුන්දෙනක දෙදෙනක එක්කෙනෙක යන) අතික් අතික් මහණහු; තං තං උපොසථං, සඞ්ඝපොහොය ගණපොහොය පුග්ගල්පොහොය යන) ඒ ඒ පොහොය; යදි කයිරුං, ඉදින් කොළෝ වූහු නම්; දුක්කටං ආපත්ති, දුකුළා ඇවැත්; සියා, වන්නී යි.

426 වග්ගෙ, වර්ගසඞ්ඝයා කෙරෙහි ද; සමග්ගෙ, සමගසඞ්ඝයා කෙරෙහි ද; වග්ගොඉති සඤ්ඤිනො, වර්ගී ය යන සංඥා ඇත්තාහට ද; විමතිස්ස වා, විමති ඇත්තාහට ද; දුක්කටං, දුකුළා වේ; භෙදාධිප්පායෙන, නොආ භික්ෂූන් ඇතිබව දැන දැන "නස්සන්තෙතෙ විනස්සන්තෙතෙ කො තෙහි අත්‍ථො" යන බිඳුනාඅභිප්‍රායෙන්; කරොතො, පොහෝ කරන්නාහට; ථුල්ලච්චයං, ථුලැසි වෙ යි; වග්ගෙ, වර්ගසඞ්ඝයා කෙරෙහි ද; සමග්ගෙ, සමගසඞ්ඝයා කෙරෙහි ද; සමග්ගා ඉති, සමග යන; සඤ්ඤිනො, සිත් ඇත්තාහට; අනාපත්ති, ඇවැත් නැති.

427 උක්ඛිත්තස්ස ගහට්ඨස්ස සෙසානං සහධම්මිනං.
පාරාජිකස්සාභබ්බස්ස සික්ඛානික්ඛිත්තකස්ස ච.

428 නිසින්නපරිසායඤ්ච සභාගාපත්තිකො තථා
ඡන්දෙන පරිවුත්ථෙන පාතිමොක්ඛං න උද්දිසෙ.

---

427-428-උක්ඛිත්තස්ස, උකෙව්නිකම් කරනලද්දහු විසින් ද; ගහට්ඨස්ස, ගිහිම්නිසකු විසින් ද; සෙසානං සහධම්මිනං, භික්ෂුහු මිස සෙසු සහධම්මිකයන් විසින් ද; පාරාජිකස්ස, පරිජිඅවන්නහු විසින් ද; අභබ්බස්ස, පණ්ඩකාදි අභව්‍යපුද්ගලයන් විසින් ද; සික්ඛානික්ඛිත්තකස්ස ච, සිඛපස්විකුවහු විසින් ද; යන මොවුන් විසින්; නිසින්නපරිසායඤ්ච, හිඳිනාලද පරිෂද්හි ද; තථා, එසේම; සභාගාපත්තිකො, වස්තුසභාග ඇවැත් ඇති සඞ්ඝයා ද; පරිවුත්ථෙන ඡන්දෙන, ලැගිසඳ ඇති ව ද; පාතිමොක්ඛං, පාමොක්; න උද්දිසෙ, නො; උසුරුවන්නේ යි.

“චතුබ්බිධං පාරිවාසියං පරිසපාරිවාසියං රත්තිපාරිවාසියං ඡන්දපාරිවාසියං අජ්ඣාසයපාරිවාසියන්ති, පරිසපාරිවාසියං නාම භික්ඛූ කෙනචිදෙව කරණීයෙන සන්නිපතිතා හොන්ති, අථ මෙඝො වා උට්ඨහති උස්සාරණා වා කයිරති මනුස්සා වා අජ්ඣොත්ථරන්තා ආගච්ඡන්ති, භික්ඛූ අනොකාසො මයං අඤ්ඤත්‍ර ගච්ඡාමාති ඡන්දං අවිස්සජ්ජෙත්වාව උට්ඨහන්ති ඉදං පරිසපාරිවාසියං, කිඤ්චාපි පරිසපාරිවාසියං ඡන්දස්ස පන අවිස්සට්ඨත්තා කම්මං කාතුං වට්ටති, පුන භික්ඛූ උපොසථාදීනි කරිස්සාමාති රත්තියං සන්නිපතිත්වා යාව සබ්බෙ සන්නිපතන්ති තාව ධම්මං සුණිස්සාමාති එකං අජ්ඣෙසන්ති තස්මිං ධම්මකථං කථෙන්තෙයෙව අරුණො උග්ගච්ඡති සචෙ චාතුද්දසිකං උපොසථං කරිස්සාමාති නිසින්නා පණ්ණරසො’ති කාතුං වට්ටති, සචෙ පණ්ණරසිකං කාතුං නිසින්නා පාටිපදෙ අනුපොසථෙ උපොසථං කාතුං න වට්ටති, අඤ්ඤම්පන සඞ්ඝකිච්චං කාතුං වට්ටති, ඉදං රත්තිපාරිවාසියං නාම, පුන භික්ඛූ කිඤ්චිදෙව අබ්භානාදිසඞ්ඝකම්මං කරිස්සාමා’ති නිසින්නා හොන්ති, තත්‍ර ‘එකො නක්ඛත්තපාඨකො භික්ඛු එවං වදති, අජ්ජ නක්ඛත්තං දාරුණං මා ඉමං කම්මං කරොථා’ති, තෙ තස්ස වචනෙන ඡන්දං විස්සජ්ජෙත්වා තත්ථෙව නිසින්නා හොන්ති, අථ’ඤ්ඤො ආගන්ත්වා “නක්ඛත්තං පතිමානෙන්තං අත්ථො බාලං උපච්චගා’ති” කිං නක්ඛත්තෙන කරොථා’ති වදති

ඉදං ඡන්දපාරිවාසියං චෙව අජ්ඣාසයපාරිවාසියඤ්ච, එතස්මිං පාරිවාසියෙ පුනඡන්දපාරිසුද්ධිං අනානෙත්වා කම්මං කාතුං න වට්ටති" * යනු අටුවා යි.

* පාරිවාසියං, විහිද පැවැත්ම හෙවත් ඉක්ම පැවැත්ම; චතුබ්බිධං, සතරප්‍රකාර වේ. පරිසපාරිවාසියං, පිරිස් ඉක්ම පැවැත්ම ය; රත්තිපාරිවාසියං, රෑ ඉක්ම පැවැත්ම ය; ඡන්දපාරිවාසියං; සඳ ඉක්ම පැවැත්ම ය; අජ්ඣාසයපාරිවාසියං ඉති, අදහස ඉක්ම පැවැත්ම ය; (යන සතර යි.) පරිසපාරිවාසියං නාම, පිරිස් ඉක්ම පැවතීම නම්: භික්ඛූ, මහණහු; කෙනචිදෙව කරණීයෙන, කිසියම් කටයුත්තකින්; සන්නිපතිතා හොන්ති, රැස්වූවාහු වෙත් ද; අථ, එකල්හි; මෙඝො වා, මෙඝය හෝ, උට්ඨහති නගී ද; උස්සාරණා වා, (රජ ඇමති ආදීන්ගේ පැමිණීම නිමිති කොට පිරිස්) දුරලීම හෝ; කයිරති, කරනු ලැබේ ද; මනුස්සා වා, මිනිස්සු හෝ; අජ්ඣොත්ථරන්තා, වැතිරෙමින්; ආගච්ඡන්ති, එත් ද; භික්ඛූ, භික්ෂූහු; අනොකාසො, අවසර නැත; මයං, අපි; අඤ්ඤත්‍ර, අන් තැනක, ගච්ඡාම ඉති, යමු යි; ඡන්දං අවිස්සජ්ජෙත්වාව, සඳ නො විහිද ම; උට්ඨහන්ති නැගී සිටිත් ද; ඉදං, මේ; පරිසපාරිවාසියං, පිරිස් විහිද පැවැත්ම යි. කිඤ්චාපි, මෙහි කිසිලෙසකින්; පරිසපාරිවාසියං, පිරිස් විහිද පැවැත්ම වේ ද; (එහෙත්) ඡන්දස්ස පන, ඡන්දය වනාහි; අවිස්සට්ඨත්තා, නො විහිදි බැවින්; කම්මං කාතුං වට්ටති, කම් කරන්ට වටී, පුන, නැවත; භික්ඛූ, මහණහු; උපොසථාදීනි, උපොසථාදිය; කරිස්සාම ඉති, කරමු යි; රත්තියං, රාත්‍රියෙහි; සන්නිපතිත්වා, රැස් ව; යාව, යම්තාක්; සබ්බෙ, සියල්ලෝ; සන්නිපතන්ති, රැස් වෙත් ද; තාව, ඒතාක්; ධම්මං සුණිස්සාම ඉති, බණ අසමු යි; ඒකං, එක් මහණක්හට; අජ්ඣෙසන්ති, ආරාධනා කෙරෙත් ද; තස්මිං, ඔහු; ධම්මකථං කථෙන්තෙ යෙව, බණ කියන කල්හි ම; අරුණො උග්ගච්ඡති, අරුණ නගී ද; සචෙ, ඉදින්; චාතුද්දසිකං උපොසථං, තුදුස්වක් පොහොය; කරිස්සාම ඉති, කරමු යි; නිසින්නා, හුන්නාහු නම්; පණ්ණරසො ඉති; පණ්ණරසී යයි; කාතුං, කරන්ට; වට්ටති, වටී; සචෙ, ඉදින්; පණ්ණරසිකං කාතුං, පණ්ණරසී පොහොය කරන්ට; නිසින්නා, හුන්නාහු නම්; පාටිපදෙ, පෑළවියෙහි; අනුපොසථෙ, පොහෝනුවූ දිනයෙහි; උපොසථං කාතුං, පොහොය කරන්ට; න වට්ටති, නො වටී; අඤ්ඤං පන සඞ්ඝකිච්චං, අනික් සඞ්ඝකම් වනාහි; කාතුං වට්ටති, කරන්ට වටී; ඉදං රත්තිපාරිවාසියං නාම, මේ රෑ විහිද පැවැත්ම නමි. පුන

429 අදෙසයිත්වාපන්නං නාවිකත්වාන වෙමතිං
අනුපොසථෙ'පි වා කාතුං 'පොසථො න ච කප්පති.

430 අවසිතොපොසථාවාසා න වජෙ තදහූ විනා
අන්තරායං ච සඞ්ඝං වා 'ධිට්ඨාතුං සීමමෙව වා 'ති.

---

429 ආපන්නං, අවන් ඇවැත්; අදෙසයිත්වාන, නො දෙසා ද; වෙමතිං, විමතිඇති ඇවැත්; නාවිකත්වාන; නො අරොජා ද; අනුපොසථෙ'පි වා, පොහෝ නොවන දවස්හි ද; උපොසථො, පොහොය; කාතුං, කරන්නට; න ච කප්පති, නොම වටී.

430 අවසිතොපොසථාවාසා, නො සිදී පවත්නා සංඝුපොසථ ඇති වෙහෙරින්; තදහු, ඒ පොහෝ දවස්; අන්තරායං වා, රාජන්තරායාදි අන්තරායක් හෝ; සඞ්ඝං වා, සංඝපහොනක මහණුන් හෝ; විනා, නැති ව; න වජෙ, නො යන්නේ ය; අධිට්ඨාතුං, ඉටන් පොහෝ කරන පිණිස; සීමමෙව වා, සීමාවකට ද; නොයන්නේ යි.

---

නැවත; භික්ඛූ, භික්ෂූහු; කිඤ්චිදෙව, කිසියම්; අබ්භානාදිසංඝකම්මං, අබ්භානාදිසංඝකර්මයක්; කරිස්සාම ඉති, කරමු යි; නිසින්නා හොන්ති, හුන්නාහු වෙත් ද; තත්‍ර, එහි, එකො, එක්; නක්ඛත්තපාඨකො භික්ඛු; නැකැත් හඳුරනමහණෙක්, එවං වදති, මෙසේ කියයි; අජ්ජ, අද; නක්ඛත්තං, නැකත; දාරුණං, දරුණු ය; ඉමං කම්මං, මේ කර්මය; මා කරොථ ඉති, නො කරව් යයි; තෙ, ඒ භික්ෂූහු; තස්ස වචනේන, ඔහුගේ වචනයෙන්; ඡන්දං විස්සජ්ජෙත්වා, සඳ විහිද; තත්ථෙව නිසින්නා හොන්ති, එහි ම හුන්නාහු වෙත් ද; අථ, ඉක්බිති; අඤ්ඤො, අනික් මහණෙක්; ආගන්ත්වා, අවුත්; නක්ඛත්තං, පතිමානෙන්තං, නැකැත් බලන්නාවූ; බාලං, බාලනැනැත්තනු; අයං, අඥය තෙම; උපච්චගා ඉති, ඉක්ම ගියේ යයි; (කියා) නක්ඛත්තෙන, නැකතින්; කිං, කිම; කරොථ ඉති, කරව් යයි; වදති, කියා ද; ඉදං, මේ; ඡන්දපාරිවාසියං චෙව, සඳ විහිද පැවැත්ම ද; අජ්ඣාසයපාරිවාසියං ච, අදහස විහිද පැවත්ම ද වේ; එතස්මිං පාරිවාසියෙ, මේ (සඳ අදහස්) විහිද පැවැත්මෙහි; පුන, නැවත; ඡන්දපාරිසුද්ධිං අනානෙත්වා, ඡන්දය හා පාරිසුද්ධිය නො ගෙන්වා; කම්මං කාතුං, කර්ම කරන්ට; න වට්ටති, නො වටී.

"සබ්බන්තිමෙන පරිච්ඡෙදෙන අත්තචතුත්ථෙන වා අන්තරායෙ වා සති ගන්තුං වට්ටති–

සචෙ විහාරෙ උපොසථං කරොන්ති උපොසථාධිට්ඨානත්ථං සීමා'පි නදී'පි න ගන්තබ්බා, සචෙ පනෙත්ථ කොචි භික්ඛු හොති තස්ස සන්තිකං ගන්තුං වට්ටති, විස්සට්ඨඋපොසථා'පි ආවාසා ගන්තුං වට්ටති, එවං ගතො අධිට්ඨාතුම්පි ලභති, ආරඤ්ඤකෙනාපි භික්ඛුනා උපොසථදිවසෙ ගාමෙ පිණ්ඩාය චරිත්වා අත්තනො විහාරමෙව ආගන්තබ්බං, සචෙ අඤ්ඤං විහාරං ඔක්කමති තත්ථ උපොසථං කත්වාව ආගන්තබ්බං අකත්වා න වට්ටති—

යං ජානෙය්‍ය අජ්ජෙව තත්ථ ගන්තුං සක්කොමීති එවරූපො ආවාසො ගන්තබ්බො තත්ථ භික්ඛූහි සද්ධිං උපොසථං කරොන්තෙනාපි හි ඉමිනා නෙව උපොසථන්තරායො කතො භවිස්සති" * යනු අටුවා යි.

---

* සබ්බන්තිමෙන පරිච්ඡෙදෙන, හැමට යටත් පිරිසෙයින්; අත්තචතුත්ථෙන වා, තමා සතරවැනි කොට ඇත්තහු විසින් හෝ; අන්තරායෙ සති වා, අන්තරායක් ඇති කල හෝ; ගන්තුං වට්ටති, (නොසිදි සංඝු පොසථ ඇති වෙහෙර සිට) යන්ට වටී.

සචෙ, ඉදින්; විහාරෙ, වෙහෙර; උපොසථං කරොන්ති, පොහොය කෙරෙත් නම්; උපොසථාධිට්ඨානත්ථං, පොහොය ඉටනු පිණිස; සීමා අපි, සීමාවකට ද; නදී අපි, නදියකට ද; න ගන්තබ්බා, නො යා යුතු; සචෙ පන, ඉදින් වනාහි; එත්ථ, මෙහි; කොචි භික්ඛු හොති, කිසි භික්ෂු නමක් වේ නම්; තස්ස සන්තිකං ගන්තුං වට්ටති, ඔහු වෙත යන්ට වටී; විස්සට්ඨඋපොසථා ආවාසා අපි, විහිදි පොහොය ඇති ආවාසයෙන් ද; ගන්තුං වට්ටති, යන්ට වටී. එවං ගතො, මෙසේ ගියේ; අධිට්ඨාතුම්පි, (පොහෝ,) ඉටන්ට ද; ලභති, ලබයි; ආරඤ්ඤකෙන අපි භික්ඛුනා, අරන්වැසි මහණ විසින් ද; උපොසථදිවසෙ, පොහෝදින, ගාමෙ, ගම්හි, පිණ්ඩාය චරිත්වා, පඩු පිණිස හැසිර; අත්තනො විහාරං එව, තමා වසන වෙහෙරට ම; ආගන්තබ්බං, ආ යුතු; සචෙ, ඉදින්; අඤ්ඤං විහාරං, අන් වෙහෙරකට; ඔක්කමති, ඇතුල් වේ නම්; තත්ථ, එහි; උපොසථං කත්වා එව, පොහොය කොට ම; ආගන්තබ්බං, ආ යුතු. අකත්වා, නොකොට; න වට්ටති, (එන්ට) නො වටී,

අජ්ජ එව, අද ම; තත්ථ, එහි; ගන්තුං, යන්ට; සක්කොමි ඉති, හැක්කෙමි යි; යං, යම් විහාරයක්; ජානෙය්‍ය, දනී ද. එවරූපො

"දිනකාරකකත්තබ්බාකාරානන්තුවසා පන
නව උපොසථා වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා.

චාතුද්දසො පණ්ණරසො සාමග්ගි ච උපොසථො
දිවසෙනෙව නිද්දිට්ඨා තයොපෙතෙ උපොසථා.

සංඝො උපොසථො චෙව ගණො පුග්ගලුපොසථො
කාරකානං වසෙනෙව තයො වුත්තා උපොසථා.

සුත්තුද්දෙසාභිධානො ච පාරිසුද්ධි උපොසථො
අධිට්ඨානො'ති නිද්දිට්ඨා තයො කම්මෙනුපොසථා."†

ආවාසො, මෙබඳු ආවාසයට; ගන්තබ්බො, යා යුතු; තත්‍ථ භික්ඛූහි සද්ධිං, එහි වැසි භික්ෂූන් සමග; උපොසථං, පොහොය; කරොන්තෙන අපි, කරන්නහු විසින් ද; හි, යම් හෙයකින්; ඉමිනා, මේ මහණහු විසින්; උපොසථන්තරායො, උපොසථයට අන්තරායෙක්; නෙව කතො, නො ම කරනලද්දේ; භවිස්සති වන්නේ ද; එහෙයිනි.

† ආදිච්චබන්ධුනා, සූර්‍ය්‍යබන්ධුවූ; බුද්ධෙන, බුදුන් විසින්; දින කාරකකත්තබ්බාකාරානං තු වසා පන, දින ය කාරක ය කළ යුතු ආකාර ය යන මොවුන්ගේ වශයෙන් වනාහි; නව උපොසථා වුත්තා, නව උපොසථ කෙනෙක් වදාරන ලදහ.

චාතුද්දසො, තුදුස්වක් පොහොය; පණ්ණරසො, පඤ්ඤරසී පොහොය; සාමග්ගී උපොසථො ච, සමගි පොහොය යන; එතෙ තයො අපි උපොසථා, මේ තුන් උපොසථයෝ ම; දිවසෙන එව, දවස්වශයෙන් ම; නිද්දිට්ඨා, දක්වන ලදහ.

සංඝො උපොසථො චෙව, සංඝ උපොසථය; ගණො (උපොසථො,) ගණ උපොසථය; පුග්ගලො උපොසථො, පුග්ගල උපොසථය යන; තයො උපොසථා, තුන් උපොසථයෝ; කාරකානං වසෙන එව, කාරකයන්ගේ වශයෙන් ම; වුත්තා, වදාරන ලදහ.

සුත්තුද්දෙසාභිධානො ච, සුත්තුද්දෙස නම් උපොසථ ය, පාරිසුද්ධි උපොසථො, පාරිසුද්ධි උපොසථ ය; අධිට්ඨානො ඉති, අධිට්ඨාන උපොසථ ය යන; තයො උපොසථා, තුන් උපොසථයෝ; කම්මෙන, කළයුතු ආකාර වශයෙන්; නිද්දිට්ඨා, දක්වන ලදහ.

"පවාරණා" ති-

431 ද්විනනං තිණ්ණං චතුන්නඤ්ච අඤ්ඤමඤ්ඤපවාරණා
එකස්ස ච අධිට්ඨානං සෙසා සඞ්ඝපවාරණා.

432 පුබ්බකිච්චෙ පුබ්බකරණෙ පත්තකල්ලෙ සමාහිතෙ
ඤත්තිං ඨපෙත්වා සඞ්ඝෙන කත්තබ්බෙවං පවාරණා.

(49) "සුණාතු මෙ භන්තෙ සඞ්ඝො, අජ්ජ පවාරණා (පණ්ණරසී) යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (තෙවාචිකං,) පවාරෙය්‍යා" ති

---

පවාරණා,,ති-

පවාරණා යන්නෙහි පවුරුණු නම්:

431 ද්විනනං, දෙදෙනාහට ද; තිණ්ණං, තුන්දෙනාහට ද; චතුන්නඤ්ච, සතරදෙනාහට ද; අඤ්ඤමඤ්ඤපවාරණා, අන්‍යෝන්‍ය පවුරුණු ය; එකස්ස ච, එකක්හට වනාහි; අධිට්ඨානං, ඉටන් පවුරුණු ය; සෙසා (පස්දෙනා කෙරෙහි පටන් කරන) සෙසු පවුරුණු; සඞ්ඝපවාරණා, සඟපවුරුණු යි.

432 පුබ්බකිච්චෙ, පූර්වකෘත්‍ය ද; පුබ්බකරණෙ, පූර්වකරණ ද; පත්තකල්ලෙ, ප්‍රාප්තකාල ද; සමාහිතෙ, පිළියෙල කළ කල්හි; ඤත්තිං ඨපෙත්වා, ඥප්තිය තබා; සඞ්ඝෙන, සඞ්ඝයා විසින්; එවං, මෙසේ; පවාරණා, පාවාරණා තොමෝ; කත්තබ්බා, කට යුත්තී යි.

("සම්මජ්ජනී පදීපො ච උදකං ආසනෙන ච
පවාරණාය එතානි පුබ්බකරණන්ති වුච්චති.
ඡන්දපවාරණා උතුක්ඛානං භික්ඛුගණනා ච ඔවාදො
පවාරණාය එතානි පුබ්බකිච්චන්ති වුච්චති
පවාරණා යාවතිකා ච භික්ඛූ
කම්මප්පත්තා සභාගාපත්තියො ච
න විජ්ජන්ති වජ්ජනීයා ච පුග්ගලා
තස්මිං න හොන්ති පත්තකල්ලන්ති වුච්චති."*

මෙකී සෙයින් පූර්වකරණ පූර්වකෘත්‍ය ප්‍රාප්තකාල දතයුතු)

(49) සුණාතු මෙ භන්තෙ සඞ්ඝො-පෙ-පවාරෙය්‍ය යන්නෙහි පසළොස්වක තෙවාචික කොට පවරත් හොත් "සුණාතු මෙ භන්තෙ සඞ්ඝො, අජ්ජ පවාරණා පණ්ණරසී, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො තෙවාචිකං පවාරෙය්‍ය" යි ඥප්ති තිබියයුතු. ද්වෙවාචික කොට පවරත් "සුණාතු මෙ භන්තෙ -පෙ- සඞ්ඝො ද්වෙවාචිකං පවාරෙය්‍ය" එකවාචික කොට පවරත් "සුණාතු මෙ භන්තෙ

---

* මෙහි අර්ථ සව උපොසථනිර්දේශයෙහි කී නියෙන් දත යුතු

433 ඒකංසං චීවරං කත්වා නිසීදිත්වාන උක්කුටිං
ථෙරෙන අඤ්ජලිං සංඝො පග්ගය්හ සමුදීරියො.

(50) "සඞ්ඝං ආවුසො පවාරෙමි, දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා, වදන්තු මං ආයස්මන්තො අනුකම්පං උපාදාය, පස්සන්තො පටිකරිස්සාමි, දුතියම්පි ආවුසො සඞ්ඝං පවාරෙමි -පෙ- තතියම්පි ආවුසො සඞ්ඝං පවාරෙමි—පෙ—පටිකරිස්සාමී" ති.

434 පවාරෙන්තෙසු ථෙරෙසු නිසජ්ජු'ක්කුටිකං නවො
පවාරෙති සයං යාව උක්කුටිකො'ව අච්ඡතු
පුබ්බාරම්භං සමාපෙත්වා නවො සඞ්ඝමුදීරයෙ.

---

පෙ- සංඝො එකවාචිකං පවාරෙය්‍ය"යි ඤත්ති තිබිය යුතු. තුදුස්වක් පවුරුණු වුව "සුණාතු මෙ භන්තෙ සංඝො අජ්ජ පවාරණා චාතුද්දසී, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සංඝො තෙවාචිකං පවාරෙය්‍ය" යනාදි විසින් යටකී පරිද්දෙන් ඤත්ති තිබිය යුතු. භන්තෙ, වහන්ස; සඞ්ඝො සංඝ තෙමේ; මෙ, මා කියන්නක්; සුණාතු, අසාවා; අජ්ජ, අද; (පණ්ණරසී) පවාරණා, පණ්ණරසි පවුරුණු ය; යදි, ඉදින්; සඞ්ඝස්ස, සඟහට; පත්තකල්ලං, (පවුරුණුකම්) සපත්කල් ඇත්තේ වී නම්; සංඝො, සංඝතෙමේ; (තෙවාචිකං) පවාරෙය්‍ය, තුන්යළක් කියා පවරන්නේ ය; යනු මෙහි අර්ථ යි.

433 (ථෙරෙන, තෙරුන් විසින්; චීවරං එකංසං කත්වා, සිවුරු එකස් කොට; උක්කුටිං නිසීදිත්වාන, එළිල්ලෙන් හිඳ; අඤ්ජලිං පග්ගය්හ ඇඳිලි බැඳ; සඞ්ඝො, සඞ්ඝ තෙමේ; සමුදීරියො, (මෙසේ) කියනු ලැබිය යුතු.)

(50) ආවුසො, ඇවැත්නි; සඞ්ඝං, සංඝයා; පවාරෙමි, පවරමි; ආයස්මන්තො, ආයුෂ්මත්හු; අනුකම්පං උපාදාය, කරුණා පිණිස; දිට්ඨෙන වා, දුටුදෙයකින් හෝ; සුතෙන වා, ඇසූදෙයකින් හෝ; පරිසංකාය වා, සැකකළදෙයකින් හෝ; මං, මට; වදන්තු, කියත්වා; පස්සන්තො, දක්නෙම්; පටිකරිස්සාමි, (අවත් ඇවැත්) පහළ කෙරෙමි—දුතියම්පි, දෙවනවට ද; තතියම්පි, තුන්වනවට ද.

434 ථෙරෙසු, මහල්ලන්; උක්කුටිකං, එළිල්ලෙන්; නිසජ්ජ, හිඳ; පවාරෙන්තෙසු, පවරනකල්හි; නවො, සග මහණ; සයං, තෙමේ; යාව පවාරෙති, යම්තාක් පවරාද; උක්කුටිකොව අච්ඡතු; (ඒතාක්) එළිල්ලෙන් ම හිඳීවා; පුබ්බාරම්භං, පූර්වකෘත්‍යය; සමාපෙත්වා, නිමවා; නවො, සග මහණ; සංඝං, සඞ්ඝයාහට; උදීරයෙ; (මෙසේ) කියන්නේ යි.

"සඞ්ඝං භන්තෙ පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා-පෙ-දුතියම්පි භන්තෙ සඞ්ඝං පවාරෙමි-පෙ-තතියම්පි භන්තෙ සඞ්ඝං පවාරෙමි-පෙ-පටිකරිස්සාමී"ති.

435 දානෙන ධම්මසාකච්ඡා කලහෙහි ච රත්තියා
තෙවාචිකාය ඔකාසෙ'සති ඛෙපිතභාවතො
අන්තරායෙ දසවිධෙ ඤත්තිං ඨත්වා'නුරූපතො.

(51) "සුණාතු මෙ භන්තෙ සඞ්ඝො, මනුස්සෙහි දානං දෙන්තෙහි, භික්ඛූහි ධම්මං සාකච්ඡන්තෙහි; කලහං කරොන්තෙහි, යෙභුය්‍යෙන රත්ති ඛෙපිතා, සචෙ සඞ්ඝො තෙවාචිකං පවාරෙස්සති, අප්පවාරිතොව සඞ්ඝො භවිස්සති, අථායං රත්ති විභායිස්සතී" ති වා-අයං රාජන්තරායො,-පෙ-අයං බ්‍රහ්මචරියන්තරායො, සචෙ සඞ්ඝො තෙවාචිකං පවාරෙස්සති, අප්පවාරිතොව සඞ්ඝො භවිස්සති අථායං බ්‍රහ්මචරියන්තරායො භවිස්සති යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො ද්වෙවාචිකං, එකවාචිකං, සමානවස්සිකං, පවාරෙය්‍යා'ති.

---

435 දානෙන, (ගිහිමිනිසුන්ගේ දන්දීමෙන් ද; ධම්මසාකච්ඡා, (ඒ ඒ භික්ෂූන්ගේ) ධර්මසාකච්ඡායෙන් ද; කලහෙහි ච, කලහයෙන් ද; රත්තියා ඛෙපිතභාවතො, රාත්‍රිය ගෙවුණු බැවින්; තෙවාචිකාය, තෙවාචිකපවුරුණට; ඔකාසෙ අසති, අවකාශයක් නැති කල්හි, දසවිධෙ අන්තරායෙ, දශවිධ අන්තරාය ද (ඇතිකල්හි;) අනුරූපතො, සුදුසුපරිද්දෙන්; ඤත්තිං ඨත්වා, ඤත්ති තබා, (පවාරෙය්‍ය,) පවරන්නේ යි (කෙසේ ද යත්) ඒ දක්වන්නේ "සුණාතු මෙ භන්තෙ" යනාදි කීහු.)

(51) භන්තෙ, ස්වාමිය; සඞ්ඝො, සංඝ තෙමේ; මෙ, මා කියන්නා, සුණාතු, අසාවා; දානං දෙන්තෙහි, දන්දෙන; මනුස්සෙහි, මිනිසුන් විසින්, ධම්මං සාකච්ඡන්තෙහි, ධර්ම සංසන්දනය කරන; කලහං කරොන්තෙහි, කලහ කරන; භික්ඛූහි, මහණුන් විසින්; යෙභුය්‍යෙන; බොහෝ සෙයින්; රත්ති, රාත්‍රී තොමෝ; ඛෙපිතා, ගෙවන ලද; සචෙ, ඉදින්; සඞ්ඝො, සංඝ තෙමේ; තෙවාචිකං, තෙවාචික කොට පවාරෙස්සති, පවරා නම්; සඞ්ඝො, සංඝතෙම; අප්පවාරිතොව, නො පවරන ලද්දේ ම; භවිස්සති, වන්නේය; අථ, නැවත; අයං, රත්ති, මේ රාත්‍රිතොමෝ; විභායිස්සතීති වා, අළුවන්නේ යයි හෝ; අයං රාජන්තරායො, මේ රාජාන්තරාය ය -පෙ- අයං බ්‍රහ්මචරියන්තරායො, මේ බ්‍රහ්මචරියාන්තරාය ය; සචෙ සඞ්ඝො තෙවාචිකං පවාරෙස්සති, ඉදින් සංඝ තෙමේ තෙවාචික කොට පවරා නම්;

436 පවාරෙය්‍යානුරූපෙන යථාඨපිතඤත්තියා
ආගමෙච්ඡය්‍යං යදි සම්මා ආදිකා චෙත්ථ ආහරෙ
එවං තිවත්තුවෙගො සො ඤත්තිං වත්වා පවාරයෙ.

---

සඞ්ඝො, සංඝ තෙමේ; අප්පවාරිතොව, නොපවරන ලද්දේ ම; භවිස්සති, වන්නේ ය; අථ, නැවත; අයං බ්‍රහ්මචරියන්තරායො භවිස්සති, මේ බ්‍රහ්මචරියන්තරාය වන්නේය; යදි, ඉදින්; සඞ්ඝස්ස; සඟහට; පත්තකල්ලං, (පවුරුණුකම්) සපත් කල්ඇත්තේ වී නම්; සඞ්ඝො, සංඝ තෙමේ; ද්වෙවාචිකං, දෙයලක් කියා; එකවාචිකං, එක්යලක් කියා; සමානවස්සිකං, සමානවස්සික කොට; පවාරෙය්‍යාති, පවරන්නේ යි.

436 යථාඨපිතඤත්තියා, ඤත්ති තිබූ පරිද්දෙන්; අනුරූපෙන, නිසියෙයින්; පවාරෙය්‍ය, පවරන්නේ යි; ආගමෙච්ඡය්‍යං යදි සම්මා ආදිකා ච, (යට උපොසථයෙහි කියන ලද) “ආගමෙච්ඡය්‍යං යදි සම්මා” යනාදි ගාථාවන් ද; එත්ථ, මේ පවුරුණට; ආහරෙ, ගෙනෙන්නේයි. (දුන ධම්මකථාවාදීයට වෙනවෙන මෙසෙයින් ඤත්ති තිබිය යුතු.)

“සුණාතු මෙ භන්තෙ සඞ්ඝො, මනුස්සෙහි දානං දෙන්තෙහි යෙභුය්‍යෙන රත්ති ඛෙපිතා සචෙ සඞ්ඝො තෙවාචිකං පවාරෙස්සති, අප්පවාරිතොව සඞ්ඝො භවිස්සති, අථායං රත්ති විභායිස්සති යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො ද්වෙවාචිකං පවාරෙය්‍ය” “සුණාතු මෙ භන්තෙ සඞ්ඝො, භික්ඛූහි ධම්මං සාකච්ඡන්තෙහි, යෙභුය්‍යෙන -පෙ- සඞ්ඝො ද්වෙවාචිකං පවාරෙය්‍ය” “සුණාතු මෙ භන්තෙ සඞ්ඝො, භික්ඛූහි කලහං කරොන්තෙහි, යෙභුය්‍යෙන -පෙ- සඞ්ඝො ද්වෙවාචිකං පවාරෙය්‍ය” “සුණාතු මෙ භන්තෙ සඞ්ඝො අයං රාජන්තරායො, සචෙ සඞ්ඝො තෙවාචිකං පවාරෙස්සති, අප්පවාරිතොව සඞ්ඝො භවිස්සති, අථායං රාජන්තරායො භවිස්සති, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො ද්වෙවාචිකං පවාරෙය්‍ය.

“සුණාතු මෙ භන්තෙ සඞ්ඝො අයං චොරන්තරායො -පෙ- අයං අග්ගන්තරායො -පෙ- අයං උදකන්තරායො -පෙ- අයං මනුස්සන්තරායො -පෙ- අයං අමනුස්සන්තරායො -පෙ- අයං වාළන්තරායො -පෙ- අයං සිරිංසපන්තරායො -පෙ- අයං ජීවිතන්තරායො -පෙ- අයං බ්‍රහ්මචරියන්තරායො, සචෙ සඞ්ඝො තෙවාචිකං පවාරෙස්සති, අප්පවාරිතොව සඞ්ඝො භවිස්සති, අථායං බ්‍රහ්මචරියන්තරායො භවිස්සති, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො, ද්වෙවාචිකං පවාරෙය්‍ය”යි.

"සුණන්තු මෙ ආයස්මන්තා, අජ්ජ පවාරණා (පණ්ණරසී,) යදා
යස්මන්තානං පත්තකල්ලං, මයං අඤ්ඤමඤ්ඤං පවාරෙය්‍යාමා" ති.

437 එකංසං උත්තරාසඞ්ගං කත්වා ථෙරෙන උක්කුටිං
නිසිදිත්වාඤ්ජලිං තෙ'වං පගය්හ සමුදීරියා *

අහං ආවුසො ආයස්මන්තෙ පවාරෙමි, දිට්ඨෙන වා සුතෙන වා පරිසංකාය වා වදන්තු මං ආයස්මන්තො අනුකම්පං උපාදාය, පස්සන්තො පටිකරිස්සාමි, දුතියම්පි-තතියම්පි අහං ආවුසො ආයස්මන්තෙ පවාරෙමි, දිට්ඨෙන වා සුතෙන වා පරිසංකාය වා වදන්තු මං ආයස්මන්තො අනුකම්පං උපාදාය පස්සන්තො පටිකරිස්සාමී"ති. නවෙනාපි "අහං භන්තෙ ආයස්මන්තෙ පවාරෙමි-පෙ-පටිකරිස්සාමි. දුතියම්පි -පෙ- පටිකරිස්සාමි.' තතියම්පි අහං භන්තෙ ආයස්මන්තෙ පවාරෙමි-පෙ-පටිකරිස්සාමී"ති.

438 වීසු ථෙරෙන වත්තබ්බං නවෙන ත්වෙවමීරියො.*

"අහං ආවුසො ආයස්මන්තං පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසංකාය වා වදතු මං ආයස්මා අනුකම්පං උපාදාය පස්සන්තො පටිකරිස්සාමි. දුතියම්පි-පෙ-තතියම්පි ආවුසො අහං ආයස්මන්තං පවාරෙමි -පෙ-පටිකරිස්සාමී"ති. නවෙනාපි "අහම්භන්තෙ ආයස්මන්තං පවාරෙමි-පෙ-පටිකරිස්සාමි. දුතියම්පි-පෙ-තතියම්පි-පෙ-පටිකරිස්සාමී"ති.

439 පුබ්බකිච්චං සමාපෙත්වා අධිට්ඨෙය්‍යෙවමෙකකො, *

---

(මෙහෙයින් ම එකවාචික සමානවස්සිකයනට ද වෙන වෙන ඤත්තියොජන සේ දත යුතු )

"එකවාචාය වුට්ඨිතායාති එකච්චෙසු යථා නිසින්නෙසු එකච්චෙසු සකසකට්ඨානං ගතෙසු ආගච්ඡන්ති සම්සමා, තෙසං සන්තිකෙ පවාරෙතබ්බන්ති ගතෙ අනානෙත්වා නිසින්නානං යෙව සන්තිකෙ -සබ්බාය වුට්ඨිතාය පරිසාය ආගච්ඡන්ති සම්සමා, තෙසං සන්තිකෙ පවාරෙතබ්බන්ති යදි සබ්බෙ වුට්ඨහිත්වා ගතා සන්නිපාතෙතුං න සක්කා එකච්චෙ සන්නිපාතෙත්වා පවාරෙතුං වට්ටතීති වදන්ති, තස්මා ඤත්තිං ඨපෙත්වා කත්තබ්බසඞ්ඝකම්මාභාවා විසුං න හොති කිර-උපොසථක්ඛන්ධකෙපි එසෙව නයො" යනු විනය සන්නස යි)

සො, ඒ; තිචතුවිසෙනා, තුන්දෙනෙකු සතරදෙනෙකු සම්බන්ධිවූ ගණයා; ඤත්තිං ඨපෙත්වා ඤත්තිය තබා; ඒවං, මෙසේ; පවා-රෙය, පවරන්නෙන් යි.

---

* මෙහි අර්ථ 420 422=424 වෙනි ගාථාදිහි මෙනි.

(52) "අජ්ජ මෙ පවරණා චාතුද්දසී"ති වා "පණ්ණරසී"ති වා" අධිට්ඨාමී"ති වත්තබ්බං.

440 යස්මිං වසන්ති වා පඤ්ච චත්තාරො වා තයො ද්වෙ
පවාරණං හරිත්වාන එකෙකස්සි'තරීතරෙ.

441 තං තං පවාරණං කයිරුං සියා ආපත්ති දුක්කටං
සෙසා උපොසථෙ වුත්තා ගාථායො චෙත්ථ ආහරෙ.

442 පවාරිතෙ ච සඞ්ඝම්හි පාරිසුද්ධිං උපොසථං
කරෙය්‍ය ජීනතාවසෙසො ච අවුත්ථො වා'නුපාගතො.

443 චාතුමාසිනියා වා'පි කතෙ සඞ්ඝනුපොසථෙ
වුත්ථවස්සා පවාරෙය්‍යුං සචෙ අප්පතරා සියුන්ති..

---

(52) අජ්ජ මෙ පවරණාති ආදිමහි සචෙ චාතුද්දසිකා "අජ්ජ මෙ පවාරණා චාතුද්දසී අධිට්ඨාමීති සචෙ පණ්ණරසිකා අජ්ජ මෙම පවාරණා පණ්ණරසී අධිට්ඨාමී"ති එවං අධිට්ඨාතබ්බං.

අජ්ජ, අද; මෙ, මාගේ; පවාරණා, පවුරුණු; චාතුද්දසීති වා; චාතුද්දසී යයි හෝ; පණ්ණරසීති වා, පණ්ණරසී යයි හෝ; (කියා) අධිට්ඨාමීති, ඉටමි යි; වත්තබ්බං, කිය යුතු.

440-441 යස්මිං, යම් විහාරයක; පඤ්ච වා, පස්දෙනෙක් හෝ; චත්තාරො වා, සතරදෙනෙක් හෝ; තයො, තුන්දෙනෙක් හෝ, ද්වෙ, දෙදෙනෙක් හෝ; වසන්ති, වෙසෙද්ද; (තස්මිං, ඒ විහාරයෙහි;) එකෙකස්ස, එකක් එකක්හුගේ; පවාරණං හරිත්වාන, පවුරුණු ගෙන හැර; ඉතරීතරෙ, (සතරදෙනෙක තුන්දෙනෙක දෙදෙනෙක යන) අනික් අනික් මහණහු; තං තං පවාරණං, (සඟපවුරුණු ය ගණපවුරුණු ය පුගුල් පවුරුණු ය යන) ඒ ඒ පවුරුණු; කයිරුං, කොළොත් නම්; දුක්කටං ආපත්ති, දුකුළා ඇවැත්; සියා, වන්නී සි; උපොසථෙ, උපොසථයෙහි; වුත්තා, කියනලද; සෙසා ගාථායො, (වග්ගෙ සමග්ගෙ වග්ගාති සඤ්ඤිනො යනාදි) සෙසු ගාථාවන්; එත්ථ ච, මේ පවුරුණට ද; ආහරෙ, ගෙනෙන්නේයි.

442 සඞ්ඝම්හි, පෙරවසන්හි වස්විසූ සංඝයා; පවාරිතෙ, පැවරූ කල්හි; ජීනතාවසෙසා ච, පෙරවසන වසෙළඹුන්වස්වූයෙ ද; අවුත්ථො ච, පස්වසන වසෙළඹ වස් වෙසෙමින් සිටියේ ද; අනුපාගතො, සිහි නැති ව වස් නොඑළඹියේ ද; පාරිසුද්ධිං උපොසථං, පිරිසුදු පොහෝ; කරෙය්‍ය, කරන්නේ සි.

443 චාතුමාසිනියා වා පි, සාරමසින් වන තිල්මස පවුරුණුහි ද; සඞ්ඝෙන, පෙරවස්හි වස් විසූ සඟහු විසින්; උපොසථෙ කතෙ, පො;

හෝ කළ කල්හි; වුත්ථවස්සා, පස් වසන වස් විසූ මහණහු; සචෙ ඉදින්; අප්පතරා සියුං, මඳවූ නම්; පවාරෙය්‍යුං, පවරන්නාහු යි.

("කත්තිකචාතුමාසිනිපවාරණාය පන සචෙ පඨමවස්සූපගතෙහි මහාපවාරණාය පවාරිතෙහි පච්ඡා උපගතා අධිකතරා වා සම සමා වා හොන්ති, පවාරණා ඤත්තිං ඨපෙත්වා පවාරෙතබ්බං, තෙහි පවාරිතෙ පච්ඡා ඉතරෙහි පාරිසුද්ධි උපොසථො කාතබ්බො, අථ මහාපවාරණාය පවාරිතා බහූ හොන්ති, පච්ඡා වස්සූපගතා ථොකතරා වා එකො වා, පාතිමොක්ඛෙ උද්දිට්ඨෙ පච්ඡා තෙසං සන්තිකෙ තෙහි පවාරෙතබ්බං"* යනු අටුවා යි.

" චාතුද්දසී පඤ්චදසී සාමග්ගී ච පවාරණා
තෙවාචී වෙකවාචී ච සඞ්ඝෙ ච ගණපුග්ගලෙ
එතා පන මුනින්දෙන වුත්තා නව පවාරණා" †

---

* කත්තිකචාතුමාසිනිපවාරණාය පන, ඉල්මස්හි සාර මසින් වන පවුරුණෙහි වනාහි; සචෙ, ඉදින්; පඨමවස්සූපගතෙහි, පෙරවස් එළඹියාවූ; මහාපවාරණාය, මහාපවාරණයෙන්; පවාරිතෙහි, පැවරුවින් කෙරෙන්; පච්ඡා උපගතා, පසුවස් එළඹියාහු; අධික තරා වා, ඉතා වැඩිවූවාහු හෝ; සමසමා වා, සමසමවූවාහු හෝ; හොන්ති, වෙත් නම්; පවාරණාඤත්තිං ඨපෙත්වා, පවුරුණුඤත්ති තබා; පවාරෙතබ්බං, පැවරිය යුතු. තෙහි පවාරිතෙ, ඔවුන් විසින් පැවරූ කල්හි; පච්ඡා, පසුව; ඉතරෙහි, සෙස්සන් විසින්; පාරිසුද්ධි උපොසථො කාතබ්බො, පිරිසුදු පොහෝ කළ යුතු. අථ, යළි; මහාපවාරණාය පවාරිතා, මහපවුරුණෙන් පැවරූවෝ; බහූ හොන්ති, බොහෝ වෙත් නම්; පච්ඡා වස්සූපගතා, පසුවස් එළඹියෝ; ථොකතරා වා, ඉතා මඳ හෝ වෙත් නම්; එකො වා, එකෙක් හෝ වේ නම්; පාතිමොක්ඛෙ උද්දිට්ඨෙ, (පෙරවස් එළඹියවුන් විසින්) පාමොක් උදෙසූ කල්හි; පච්ඡා, පසුව; තෙසං සන්තිකෙ, ඔවුන් සමීපයෙහි; තෙහි, ඒ පසුවස් එළඹියවුන් විසින්; පවාරෙතබ්බං, පැවරිය යුතු.

† චාතුද්දසී, තුදුස්වක්පවුරුණු ය; පඤ්චදසී, පණුරසී පවුරුණු ය; සාමග්ගී පවාරණා ච, සමගිපවුරුණු ය; තෙවාචී, තෙවාචිකපවුරුණු ය; චී, වෙවාචික පවුරුණු ය; එකවාචී ච, එකවාචිකපවුරුණු ය; සඞ්ඝෙ ච, සඞ්ඝපවුරුණු ය; ගණෙ, ගණපවුරුණු ය; පුග්ගලෙ, පුගුල් පවුරුණු ය යන; එතා පන නව පවාරණා, මේ නව පවුරුණු වනාහි; මුනින්දෙන, සර්වඥයන්වහන්සේ විසින්; වුත්තා, වදාරන ලදැ.

"සංවරො"ති-

444 චක්ඛුසොතාදිභෙදෙහි රූපසද්දාදිගොචරෙ
අභිජ්ඣාදොමනස්සාදිප්පවත්තිං විනිවාරය.

445 නිග්ගණ්හන්තො සකං චිත්තං කිටඨාදිං විය දුප්පසුං
සතිමා සම්පජානොව චරෙ සබ්බිරියාපථෙ'ති.

"සුද්ධී"ති-

446 දෙසනා සංවරො එට්ඨි පච්චවෙක්ඛණභෙදතො
සුද්ධි චතුබ්බිධා පාතිමොක්ඛසංවරසම්මතං
දෙසනාය විසුද්ධත්තා දෙසනා සුද්ධි වුච්චති.

---

"සංවරො"ති-

සංවරො යන්නෙහි ඉන්ද්‍රියසංවර නම්:

444 චක්ඛුසොතාදිභෙදෙහි චක්ෂුඃශ්‍රොත්‍රාදිභෙද ඇති සදෙරින්; රූපසද්දාදිගොචරෙ, රූපශබ්දාදි වූ ඉෂ්ටානිෂ්ටාරම්මණයෙහි; අභිජ්ඣාදොමනස්සාදි, අභිධ්‍යාදෞර්මනස්‍යාදි ක්ලෙශයන්ගේ; පවත්තිං, උත්පත්තිය; විනිවාරයෙ, වළකන්නේ යි. සදෙර නම්: චක්ඛු සොත ඝාණ ජිව්හා කාය මනො යන මේ සය යි. ගොචර නම්: රූප සද්ද ගන්ධ රස ඵොට්ඨබ්බ ධම්ම යන මේ සය යි

445 කිටඨාදිං, නොයෙක් තැනින් වැද ගොයම් කන; දුප්පසුං විය, කුළුගොණකු මෙන්; සකං චිත්තං, (නොඑක් අරමුණු බලා දිවන) තමාගේ කුළුසිත; නිග්ගණ්හන්තො, වළකන්නේ යි; සතිමා, (ඒ සදෙර එළවූ) සිහිඇති ව ම; සම්පජානො එව, නුවණැති ව ම; සබ්බිරියාපථෙ, සියලු ඉරියව්වෙහි; චරෙ, හැසිරෙන්නේ යි.

"යථා පුඤ්ඤසමභවං ඵලං පුඤ්ඤන්ති වුත්තං එවම්දං පුඤ්ඤං පවඩ්ඪතී'ති, එවං කිටඨට්ඨානෙ උප්පන්නස්ස කිටඨන්ති වුත්තං"†

"සුද්ධී"ති-

සුද්ධි යන්නෙහි ශුද්ධි නම්:

446 දෙසනා, දෙසනාසුද්ධිය; සංවරො, සංවරසුද්ධිය, එට්ඨි, එසන සුද්ධිය; පච්චවෙක්ඛණ, ප්‍රත්‍යවෙක්ෂා ශුද්ධිය යන මොවුන්ගේ; භෙදතො, ප්‍රභෙදවිශීන්; සුද්ධි, ශුද්ධිතොමෝ; චතුබ්බිධා; සතර වැදෑරුම් වේ.

---

† යථා, යම්සේ; පුඤ්ඤසමභවං ඵලං, පිනින් උපන් ඵලය; එවම්දං පුඤ්ඤං පවඩ්ඪති ඉති, එවම්දං පුඤ්ඤං පවට්ටති යනාදි තැන්හි; පුඤ්ඤං ඉති වුත්තං, පින් යයි කියන ලද ද; එවං, මෙපරිද්දෙන්; කිටඨට්ඨානෙ, සානලදතැන්හි; උප්පන්නස්ස, උපන් ගොයමට; කිටඨං ඉති වුත්තං, මෙහි කිටඨ යයි කියන ලදී.

447 න පුනෙ'වං කරිස්සන්ති චිත්තාධිට්ඨානසංවරා
වුත්තො සංවරසුද්ධීති සුජ්ඣතී'න්ද්‍රියසංවරො.

448 පහායානෙසනං ධම්මෙනු'ප්පාදෙන්තස්ස එට්ඨියා
සුද්ධත්තා එට්ඨිසුද්ධීති වුත්තමාජීව නිස්සිතං.

449 යොනිසො පටිසංඛාය චීවරං පටිසෙවති
එවමාදි යථාවුත්තපච්චවෙක්ඛණසුජ්ඣනා
පච්චවෙක්ඛණසුද්ධීති වුත්තං පච්චයනිස්සිතන්ති.

---

"සන්තොසො"ති–

450 අප්පෙන අනවජ්ජෙන සන්තුට්ඨො සුලභෙන ච
මත්තඤ්ඤූ සුභරො හුත්වා චරෙ සද්ධම්මගාරවො.

---

පාතිමොක්ඛසංවරසම්මතං, ප්‍රාතිමොක්‍ෂසංවර යයි සලකනලද ශීලය; දෙසනාය; අවන් ඇවැත් දෙසීමෙන්; විසුද්ධත්තා, පිරිසිදුවන බැවින්; දෙසනාසුද්ධීති, දෙසනාසුද්ධි යයි; වුච්චති, කියනු ලැබේ.

447 ඉන්ද්‍රියසංවරො, ඉන්ද්‍රියසංවරය; න පුනෙවං කරිස්සන්ති, නැවත එසේ නොකරමි යන; චිත්තාධිට්ඨානසංවරා, සිතින් ඉටන සංවරය හෙතු කොට ගෙන; සුජ්ඣතීති, පිරිසුදු වේ නුයි; සංවරසුද්ධීති, සංවරසුද්ධි යයි; වුත්තො, කියන ලදී.

448 ආජීවනිස්සිතං, ආජීව නිඃශ්‍රිතශීලය, අනෙසනං, නො සුදුසු පරිද්දෙන් පසත් පිරියෙස්ලීම; පහාය, හැර; ධම්මෙන; පිණ්ඩපාතචරණාදි ධර්‍මයෙන්; උප්පාදෙන්තස්ස, (චතුර්විධප්‍රත්‍යය) උපදවන්නහුගේ; එට්ඨියා, පර්‍යෙෂණයෙන්; සුද්ධත්තා, පිරිසුදු බැවින්; එට්ඨිසුද්ධීති වුත්තං, එසනසුද්ධි යයි කියන ලදී.

449 පච්චයනිස්සිතං, ප්‍රත්‍යයනිඃශ්‍රිතශීලය; යොනිසො, නුවණින්; පටිසංඛාය, ප්‍රයොජන වෙන් වෙන් කොට සලකා; චීවරං, සිවුරු; පටිසෙවති, වැළඳ ගනී යන; එවමාදි, මේ ආදිවූ; යථාවුත්ත පච්චවෙක්ඛණ, ඒ ඒ පසයට වදාළ පස්විකුමෙන්; සුජ්ඣනා, පිරිසුදු වනබැවින්; පච්චවෙක්ඛණසුද්ධීති, ප්‍රත්‍යවෙක්‍ෂාශුද්ධි යයි; වුත්තං, කියන ලදී.

"සන්තොසො"ති,—

සන්තොසො යන්නෙහි (ප්‍රත්‍යයසන්තොෂ නම්:)

450 අප්පෙන, (මඳක් වටනා බැවින්) ස්වල්පවූ; අනවජ්ජෙන, නිරවද්‍යවූ; සුලභෙන ච, (ගිය ගිය දිසායෙහි ලැබෙන හෙයින්) සුලභවූ (පාංශුකූල චීවරාදි ප්‍රත්‍යයෙන්;) සන්තුට්ඨො, (යථාලාභ යථාබල යථාසාරුප්ප විසින්) සන්තුෂ්ට ව; මත්තඤ්ඤූ, (පරියෙ

451 අතීතං නානුසොචන්තො නප්පජප්පමනාගතං
පච්චුප්පන්නෙන යාපෙන්තො සන්තුට්ඨොති පවුච්චතීති.

---

"චතුරාරක්ඛා"ති-

452 බුද්ධානුස්සති මෙත්තා ච අසුභං මරණස්සති
ආරකත්තාදිනා'රහං සම්මා සාමංව බුද්ධතො.

453 සම්මාසම්බුද්ධඉති වා'නුස්සතී යා පුනප්පුනං
නවභෙදෙ භගවතො බුද්ධානුස්සති සා ගුණෙ.

454 සීමට්ඨසඞ්ඝෙ සීමට්ඨදෙවතාසු ච ඉස්සරෙ
ජනෙ ගොචරගාමම්හි තත්ථු'පාදාය මානුසෙ.

455 සබ්බසත්තෙසු සුඛිතා හොන්තා'වෙරා'ති ආදිනා
පරිච්ඡිජ්ජ පරිච්ඡිජ්ජ භාවනා මෙත්තභාවනා.

---

සත පටිග්ගහණ පරිභොග විස්සජ්ජන විසින් ප්‍රත්‍යයෙහි) පමණ දන්නා; සුභරො, හුත්වා,(මනා කොමනා බොහෝ පසයෙන් යැපෙන බැවින්) සුපොෂ්‍ය ච; සද්ධම්මගාරවො, සද්ධර්මය ගුරු කොට ඇත්තේ; චරෙ, දවස් යවන්නේ යි.

451 අතීතං,ඉකුත් මනා පසය පිණිස; නානුසොචන්තො, නො සොස්නේ; අනාගතං, අනාගතපසය පිණිස; නප්පජප්පං, නො පතන්නේ; පච්චුප්පන්නෙන; වර්තමානයෙහි (සුදුසු පරිද්දෙන් ලද) පසයෙන්; යාපෙන්තො, යැපෙන්නේ;සන්තුට්ඨොති පවුච්චති, සන්තුෂ්ට යයි කියනු ලැබේ.

---

"චතුරාරක්ඛා"ති-

චතුරාරක්ඛා යන්නෙහි (සිව් අරක් නම්:)

452 බුද්ධානුස්සති. බුද්ධානුස්මෘති ද; මෙත්තා ච, මෛත්‍රී ද; අසුභං, අසුභ ද; මරණස්සති, මරණානුස්මෘති ද, (යන මොහු සිව්අරක් නම්හු;) ආරකත්තාදිනා, ක්ලේශයන් කෙරෙන් දුරු හෙයින් (කෙලෙස් සතුරන් නැසූ හෙයිනැයි) යනාදීන්; අරහං (ඉතිවා,) රහතැයි හෝ; සම්මා, මනා කොට; සාමංච, තමා විසින් ම; බුද්ධතො, සර්ව ධර්මයන් දත් විසින්;-

453 සම්මාසම්බුද්ධො ඉති වා, සම්‍යක්සම්බුද්ධ යයි හෝ; භගවතො, භාග්‍යවතුන්ගේ; නවභෙදෙ ගුණෙ, නවප්‍රභෙදඇති ගුණයන්; පුනප්පුනං, නැවත නැවත; යා අනුස්සති, යම් අනුස්මෘතියක් ඇද්ද; සා, හෝ තොමෝ, බුද්ධානුස්සති, බුද්ධානුස්මෘති නම්.

454 සීමට්ඨසංඝෙ, (තමා හා එක සීම වසන සංඝයා කෙරෙහි ද; සීමට්ඨදෙවතාසු ච, (එක) සීම වසන දෙවියන් කෙරෙහි ද; ගොචරගාමම්හි, ගොචරග්‍රාමයෙහි; ඉස්සරෙ ජනෙ, ඉසුරු ජනයා කෙරෙහි ද; තත්‍ර, ඒ ගොදුරුගම්හි; මානුසෙ උපාදය, මිනිසුන් ආදි කොට;-

456 වණ්ණසණ්ඨානඔකාසදිසතො පරිච්ඡෙදතො *
වවත්ථපෙත්වා කෙසාදි කොට්ඨාසෙ අනුපුබ්බතො.

457 නාතිසීඝං නාතිසනිකං † වික්ඛෙපං පටිබාහයං
පණ්ණත්තිං සමතික්කම්ම මුඤ්චන්තස්සානුපුබ්බතො.

458 වණ්ණාසයසණ්ඨානගන්ධොකාසෙහි භාවනා
පටික්කූලා'ති කොට්ඨාසෙ උද්ධුමාතාදිවත්ථුසු
ගහෙත්වා අසුභාකාරං පවත්තා භාවනා'සුභං.

---

455 සබ්බසත්තෙසු, සව්සතුන් කෙරෙහි ද; සුඛිතා හොන්තු, (මා හා එකසිම්හි වසන සබ්‍රම්සරහු) සුවපත් වෙත්ව යි; අවෙරා හොන්තු ඉති, වෛරනැති වෙත්වා යන; ආදිනා, මේ ආදියෙන්; පරිච්ඡිජ්ජ පරිච්ඡිජ්ජ, පිරිසිඳ පිරිසිඳ; භාවනා, (කරන) භාවනා තොමෝ; මෙත්තා භාවනා, මෛත්‍රීභාවනා නමු.

456 වණ්ණ, වර්ණ විසින් ද; සණ්ඨාන, සටහන් විසින් ද; ඔකාස, (පිහිටි) අවකාශ විසින් ද; දිසතො, දිසා විසින් ද; පරිච්ඡෙදතො, පරිච්ඡෙද විසින් ද; කෙසාදිකොට්ඨාසෙ, කෙසලොමාදි කොට්ඨාසයන්; වවත්ථපෙත්වා, නිශ්චය කොට; අනුපුබ්බතො; (සජ්ඣායකාලාදියෙහි පටන් "කෙසා ලොමා නඛා" යනාදි) පිළිවෙළින් ;–

457 නාතිසීඝං, ඉතා සිඝ්‍ර නො කොට; නාතිසනිකං, ඉතා ලස් නො කොට; වික්ඛෙපං, (නානාලම්බනයෙහි චිත්ත) වික්ෂෙපය; පටිබාහයං, වළකමින්; (නැවත නැවත පිරිවහා) පණ්ණත්තිං සමතික්කම්ම, (කොටසුන් පහළවූ කල්හි පිළිකුල් බැව්හි සිත් පිහිටුවා මෙනෙහි කිරීමෙන් කෙස ය රොම ය යනාදි) පණත් ඉක්ම; අනුපුබ්බතො, අනුක්‍රමයෙන්; මුඤ්චන්තස්ස, පිළිකුල් විසින් නො මැට හෙන කොටස්) හරනහුගේ;–

458 වණ්ණ, වර්ණ විසින් ද; ආසය, ඇසුරු විසින් ද; සණ්ඨාන, සටහන් විසින් ද; ගන්ධ, ගඳ විසින් ද; ඔකාසෙහි, (පිහිටි) අවකාශ විසින් ද; කොට්ඨාසෙ, (කෙස් ඈ දෙතිස්) කොටසුන්; පටික්කූලාති, පිළිකුල්හ යි; භාවනා, (කරන) භාවනා ද: උද්ධුමාතාදිවත්ථුසු, උද්ධුමාතකවිනීලකාදිවූ දශඅශුභවස්තුයෙහි; අසුභාකාරං, පිළිකුල් ආකාරය; ගහෙත්වා, ගෙන; පවත්තා, ප්‍රවෘත්තවූ; භාවනා, භාවනා ද; අසුභං, අසුභ නම්.

---

* පරිඡෙදතො. බුරුම. † නාතිසීඝඤ්ච සනිකං. බුරුම.

459 මරණමෙම භවිස්සති ජීවිතං උපරුජ්ඣති
මරණං මරණං වා'ති භාවයිත්වාන යොනිසො.

460 වධකස්සෙවුපට්ඨානා සම්පත්තීනං විපත්තිතො
උපසංහරතො කාය බහුසාධාරණා තථා.

461 ආයුදුබ්බලතො කාල වවත්ථානස්ස'භාවතො
අද්ධානස්ස පරිච්ඡෙදා භාවනා මරණස්සතී'ති.

"විපස්සනා"ති-

462 නාමරූපං පරිග්ගය්හ තතො තස්ස ච පච්චයං
හුත්වා අභාවතො'නිච්චා උදයබ්බය පීළනා

463 දුක්ඛා අවසවත්තිත්තා අනත්තා'ති තිලක්ඛණං
ආරොපෙත්වාන සඞ්ඛාරෙ සම්මසන්තො පුනප්පුනං
පාපුණෙය්‍යානුපුබ්බෙන සබ්බසංයොජනක්ඛයන්ති.

---

459 මරණං මෙ භවිස්සති, මට මරණ වන්නේ යයි හෝ; ජීවිතං උපරුජ්ඣති, ජීවිතෙන්ද්‍රිය බිඳේ යි හෝ; මරණං මරණං වාති, මරණය මරණය යි හෝ; යොනිසො, උපායෙන්; භාවයිත්වාන, (මරණසි) භාවනා කොට; (උපචාරධ්‍යාන තො උපදුත් හොත්)-

460 වධකස්සෙව, වධකයෙකු මෙන්; උපට්ඨානා, මරණ එළඹ සිටි හෙයින් ද; සම්පත්තීනං, (ආරොග්‍ය යෞවන ජීවිතාදි) සම්පත්තීන්ගේ; විපත්තිතො, විපත්තියට පැමිණෙන හෙයින් ද; උපසංහරතො, (මහාසම්මතාදීන් හා එක් කොට තමහට මරණ) එළවන හෙයින් ද; කායබහුසාධාරණා, ශරීරය අධ්‍යාත්මිකබාහිර බොහෝ උපද්‍රවයන්ට සාධාරණ හෙයින් ද; තථා, එසේ ම;-

461 ආයුදුබ්බලතො, (අස්සාසපස්සාසඉරියාපථාදි පිළිබඳ ව) ආයුෂදුර්වලහෙයින් ද; කාලවවත්ථානස්ස අභාවතො, (පෙරවරු ය පස්වරු ය යනාදි විසින්) මරණකාලයාගේ නිශ්චයක් නැති හෙයින් ද; අද්ධානස්ස, ජීවිතප්‍රවෘත්තිකාලයාගේ; පරිච්ඡේදා, පරිච්ඡේද විසින් ද, හෙවත් හවුරුදු සියයක් හෝ මදක් වඩා හෝ ජීවත්වෙමි යයි යන නියම හෙයින් ද; භාවනා, (කරන) භාවනා තොමෝ; මරණස්සති, මරණසී තමු.

"විපස්සනා"ති-

විපස්සනා යන්නෙහි (විවසුන් නම්:)

462 නාමරූපං, නාමය හා රූපය; පරිග්ගය්හ, (චතුධාතුවවත්ථානාදි විසින්) පරිග්‍රහ කොට; තතො, ඉක්බිත්තෙන්; තස්ස, ඒ නාමරූපයහට; පච්චයඤ්ච, (අවිද්‍යාදි) ප්‍රත්‍යය ද (පිරිසිඳ;) හුත්වා අභාවතො, ඇති ව නැතිවන බැවින්; අනිච්චා, අනිත්‍යයහ; උදයබ්බයපීළනා, උදැවියෙන් පෙළෙන හෙයින්;-

463 දුක්ඛා, දුඃඛයහ; අවසවත්තිත්තා, තමා වසය නොවන බැවින්; අනත්තාති, අනාත්මයහ යි; තිලක්ඛණං, තුන්ලකුණු;

464 අධිසීලාධිචිත්තාන මධිපඤ්ඤාය සික්ඛනා
භික්ඛුකිච්චමතො බුද්ධ සික්ඛායං සමුදාහටා.

465 මහතො කිත්තිසද්දස්ස යස්ස ලොකවිචාරිනො.
පරිස්සමො න සම්භොති මාළුතස්සෙව නිච්චසො

466 තෙන ධම්මසිරිකෙන තම්බපණ්ණියකෙතුනා
ථෙරෙන රචිතා ධම්ම විනයඤ්ඤූපසංසිතා.

467 එත්තාවතා'යං නිට්ඨානං බුද්ධසික්ඛා උපාගතා
පඤ්චමත්තෙහි ගාථානං සතෙහි පරිමාණතො'ති.

බුද්ධසික්ඛා නිට්ඨිතා.

---

ආරොපෙත්වාන, නගා; සංඛාරෙ, (ත්‍රෛභූමික) සංස්කාරයන්; පුනප්පුනං, නැවත නැවත; සම්මසන්තො, විදර්ශනා කරන යොගාවචර තෙම; අනුපුබ්බෙන, අනුක්‍රමයෙන්; හෙවත් ශීලවිශුද්ධ්‍යාදි සප්තවිශුද්ධිපරම්පරායෙන්; සබ්බසංයොජනක්ඛයං, සියලු සංයොජනයන්ගේ ක්ෂයාන්තයෙහි උපදනා හෙයින් සංයොජනක්ෂය යයි කියන ලද රහත්ඵලයට; පාපුණෙය්‍ය, පැමිණෙන්නේ යි.

464 අධිසීලාධිචිත්තානං, අධිසීල අධිචිත්තයන්ගේ ද; අධිපඤ්ඤාය, අධිප්‍රඥාවගේ ද; සික්ඛනා, හික්මීම; භික්ඛුකිච්චං, (යම්හෙයකින්) භික්ෂූන් විසින් කටයුතු ද; අතො, එහෙයින්; අයං බුද්ධසික්ඛා, මේ ක්ෂුද්‍රශික්ෂා තොමෝ; සමුදාහටා, කියන ලදී.

465 යස්ස, යමක්හුගේ; නිච්චසො, සතතයෙන්; ලොකවිචාරිනො, ලෙව්හි හැසිරෙන්නාවූ; මහතො, මහත්වූ; කිත්තිසද්දස්ස, කීර්තිශබ්දයට; මාළුතස්සෙව, මාරුතයට මෙන්; පරිස්සමො, පරිශ්‍රමයෙක් පැකිලීමෙක්; න සම්භොති, නැද්ද.

466 ධම්මසිරිකෙන, ධර්මශ්‍රී නම් වූ; තම්බපණ්ණියකෙතුනා, ලඞ්කාවීපයට ධ්වජයක් බඳු වූ; තෙන ථෙරෙන, ඒ තෙරුන් විසින්; රචිතා, බඳනා ලද්දා වූ; ධම්මවිනයඤ්ඤූපසංසිතා, ධර්මවිනය දන්නවුන් විසින් පසස්නා ලද්දා වූ;–

467 අයං බුද්ධසික්ඛා, මේ ක්ෂුද්‍රශික්ෂා තොමෝ; එත්තාවතා, මෙතෙකින්; පරිමාණතො, පරිමාණ හෙයින්; ගාථානං පඤ්චමත්තෙහි සතෙහි, ගාථාවන් සම්බන්ධ වූ පන්සියයක් පමණින් හෙවත් පන්සියයක් පමණ ගාථායෙන්; නිට්ඨානං, පරිසමාප්තියට; උපාගතා, එළඹුණු.

කුදුසික පදාර්ථ නිමි.

# ශුද්ධිපත්‍රය.

| පිට | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 2 | 31 | ණකාරයෙන් | ණාකාරයන් |
| 7 | 34 | ඇත්තෙහියා | ඇත්තෙහිය; |
| 9 | 32 | කාමත | කාමතා |
| 10 | 33 | රහත්න් | රහතන් |
| 11 | 2 | භ්‍යඤ්ජනො | බ්‍යඤ්ජනො |
| „ | 31 | දූසකය,ද | දූසකයා ද |
| 12 | 17 | මහණො, සමණ; | සමණො, මහණ; |
| 14 | 32 | පරිදි | පරිජී |
| 17 | 11 | අනුරුත් | අනුරුද් |
| 18 | 6 | සාවික | සාවිකා |
| 19 | 8 | රදෘ | රදෘ |
| 23 | 17 | යුත්තෝසි.) | යුත්තෝය.) එකංවා, එක්සිවුරෙක් හෝ; (කපාතට යුත්තෝයි) |
| 24 | 20 | ලබ්භති | ලබ්භං |
| 25 | 14 | රයා | රය) |
| „ | 26 | ග්‍රහය | ග්‍රාහය |
| „ | 31 | කාරකා | කාරකං |
| 27 | 2 | (ගාථාවට මුලින් 'රජනානිචාති' යනු යෙදියයුතු.) | |
| 28 | 20 | උක්කට්ඨකො | උක්කට්ඨතො |
| 29 | 5 | නිඩ්ඩහෙ | නිඬ්ඩහෙ |
| „ | 24 | මිඨ | මීඨ |
| 30 | 21 | තම්බ, ලොහොය; | තම්බ |
| 33 | 25 | පුච්ජනතං | පුච්ඡතතං |
| „ | 30 | කමි | කමින් |
| 37 | 15 | මීදෙහි | මිදෙහි |
| 38 | 34 | කරන | කකාරන |
| 39 | 2 | ච | ච |
| 40 | 5 | සුපෙය්‍ය | සූපෙය්‍ය |
| „ | 6 | නීය්‍යාස | නිය්‍යාස |

| පිට | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 40 | 16 | රුද | දුරුද |
| 44 | 27 | කාලිකා | කාලිකං |
| 46 | 24 | ආදි | ආදී |
| 47 | 5 | සචිත්තක | සචිත්තකං |
| ,, | 12 | මාංසයෙහි; | මාංසයෙහි; ථුල්ලච්චයං, ථුල්ලැයි (වෙයි) සෙසෙසු, අවශෙෂ මාංසයෙහි; |
| ,, | 31 | අකැප | නිසගි |
| 48 | 3 | දුක්කටනු | දුක්කටවනු |
| ,, | 14 | කරයි | කරවයි |
| ,, | 31 | අප්පිතය | අප්පිතාය |
| ,, | 37 | වස්ස | වස්ස |
| 50 | 16 | පත්ත | පත්තං |
| ,, | 36 | අත—බඩුවෙහි | අතට—බඩුව |
| ,, | 37 | හස්තය—බඩුවෙහි | හස්තයට—බඩුව |
| 52 | 28 | චිමිලිකා | චිලිමිකා |
| ,, | 37 | විකපමි | විකාපමි |
| 53 | 22-26 | චිමිලි | චිලිමි |
| ,, | 27 | සිමිලි | සිලිමි |
| 56 | 3-11 | වත්ති | වත්ති |
| 58 | 7 | ගහපති | ගහපතී |
| 59 | 18 | "ගොනිසාදිකා...පමාණං" * යනුඅටුවායි. | (මේපාඨය60පිටේ14පෙළ අන්තයෙහි වියයුතු.) |
| 61 | 6-24-25 | වරිය | වෙර |
| 64 | 6-21 | තහංත | තහාත |
| 68 | 19 | පතුලු | පතුළු |
| 70 | 17 | ද වෙත් | වෙත් |
| 71 | 5-22 | පුඤ්ජකා | පුඤ්ජකා |
| 72 | 15 | දියමුනු | දියවුනු |
| 75 | 23 | කැටි | කැටිසි |
| 76 | 20 | මසැදුව | මසැදුවා |
| 81 | 6 | සාසකො | වාසකො |
| 84 | 9 | තහාත | තහාත |
| 89 | 24 | ධර්මික | ධාර්මික |
| 93 | 30 | ආචාර්යීක් | ආචාර්යීයෙක් |

| පිට | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 95 | 4 | විධා–තම්මායා | විධා–තම්මයා |
| „ | 12 | මද්දවිණ | මද්දවීත |
| 96 | 34 | සක්ඛාරං | සක්ඛරා |
| 97 | 4 | ඛණතෙ | ඛනතෙ |
| 98 | 3 | දසං | දිසං |
| 104 | 32 | වණ | වන |
| 113 | 3 | ගාමං | ගමං |
| 115 | 25 | සෙර—ඩෙසත | සොර—ගෙසත |
| 118 | 20 | ඉයස | යෙසු |
| 120 | 28 | ඉතෙ—ලබ්භති | ඉතො—ලබ්භතිඉති |
| „ | 29 | දුක්ඛිය | දූක්ඛිය |
| 123 | 3–21 | ගරුතං | ගරුතං |
| 125 | 15 | නිත්තමි | නිමිත්ත |
| 131 | 6 | අකලලකො | න අකාලලකො |
| „ | 9 | ගන්ථ | ගන්ථා |
| 132 | 27 | සාල්වා හෝ | සාල්ව හෝ |
| 133 | 12 | සුද්ධ | ශුද්ධ |
| 134 | 24 | අම්භාක. | අම්හාකං |
| 135 | 14 | ධර්මික | ධාර්මික |
| „ | 26 | වාතපාත | වාතපාතා |
| 136 | 13 | මලදඹු | මලදඹු |
| „ | 24 | දරකඩ | දැරකඩ |
| 138 | 18 | සඛසයා; අද | (සඛසයා ද; ආ |
| 139 | 12 | සඛසා | සඛෙසා |
| „ | 28 | වත්තේ | වත්තේය |
| 151 | 18 | විසුද්ධත්තීයෙ | විසුද්ධත්තියො |
| 153 | 3 | රුහිති | රුහති |
| 168 | 19 | ඇඳලි | ඇඳිලි |
| 172 | 29 | පදහත් | පහත් ද |
| 173 | 31 | සමාතසතු | සමාතවසතු |
| „ | 34 | කම්යා | කාම්ය) |
| 190 | 2–12 | පවරණා | පවාරණා |
| „ | 4 | වසනති | වසනති |

සුගමවූ ඇතැම් අක්ෂර දෝෂයෝ ශුද්ධිපත්‍රයට නොගන්නා ලද්දුහ.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු